82 වන කාණ්ඩය
15 වන කලාපය

ඉරිදා
1968 නොවැම්බර් 24

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2685]

පළමුවන වර කියවන ලද පනත් කෙටුම්පත් [තී. 2726] :

ජාතික තරුණ ස්වේච්ඡා සේවා (සංශෝධන) පනත් කෙටුම්පත

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත [තී. 2727] :

දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී.

කල් තැබීමේ යෝජනාව [තී. 2845]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 2853]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 82
இல. 15

ஞாயிற்றுக்கிழமை
24 நவம்பர் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2685]

முதன்முறை மதிப்பிடப்பட்ட மசோதாக்கள் [ப. 2726] :

தாமாகச் சேவை செய்ய முன்வரும் தேசிய இளைஞர் சேவை (திருத்த) மசோதா

நிதி (திருத்த) மசோதா

காணி அபிவிருத்தி (திருத்த) மசோதா [ப. 2727] :

இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை [ப. 2845]

வினுக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 2853]

---

Volume 82
No. 15

Sunday
24th November 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 2685]

BILLS READ THE FIRST TIME [Col. 2726] :

Voluntary National Youth Service (Amendment) Bill
Finance (Amendment) Bill

LAND DEVELOPMENT (AMENDMENT) BILL [Col. 2727] :
Second Reading—Debate adjourned

ADJOURNMENT MOTION [Col. 2845]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 2853]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

## House of Representatives

1968 නොවැම්බර් 24 වන ඉරිදා

ஞாயிற்றுக்கிழமை, 24 நவம்பர் 1968

*Sunday, 24th November 1968*

---

**පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.**

*சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.*

*The House met at 10* A.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශය

*மூதவையிலிருந்து வந்த செய்தி*

## MESSAGE FROM THE SENATE

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I have received a Message from the Senate. The Clerk of the House will read it.

**පහත දැක්වෙන සන්දේශය මන්ත්‍රී මණ්ඩලයේ ලේකම් විසින් කියවන ලදී.**

*சபைச் செயலதிகாரி பின்வரும் செய்தியை வாசித்தார் :*

*The Clerk of the House read the following Message :*

"මතු පළවන කෙටුම්පත් පනතට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සංශෝධන නොමැතිව එකඟවී ඇත :

Co-operative Societies (Temporary Provisions."

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

*வினாக்களுக்கு வாய்மூல விடைகள்*

## ORAL ANSWERS TO QUESTIONS

### 5 ශ්‍රී 1490 ජීප් රථය පෞද්ගලික කටයුතු සඳහා යෙදවීම

5 ஸ்ரீ 1490 ஜீப்பைத் தனிப்பட்டோர் தேவைக்குப் பாவித்தல்

**PRIVATE USE OF JEEP NO. 5 SRI 1490**

1. ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

පළාත් පාලන ඇමති හා ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පළාත් පාලන අමාත්‍යාංශයට අයත් අංක 5 ශ්‍රී 1490 දරන ජීප් රථය 1968 අගෝස්තු 24 වැනි දිනදී, හිටපු පළාත් පාලන ඇමතිගේ නියමය පරිදි හුදෙක් පුද්ගලික කටයුතු සඳහාම යොදවනු ලැබූ බව එතුමා දන්නවාද? (ආ) අනුරාධපුර තැපැල් කාර්යාලය අසලදී, හිටපු ඇමතිගේ බෑනා හමුවන ලෙස, අනුරාධපුර සහකාර පළාත් පාලන කොමසාරිස් කේ. ඒ. කරුණාරත්න මහතාට නියම කරනු ලැබූ බව එතුමා දන්නවාද? (ඉ) 1968 අගෝස්තු 24 වැනි දිනදී එම පිරිස විල්පත්තු ප්‍රදේශයට ගෙන යාම සඳහාත් සාමාන්‍යයෙන් එම ප්‍රදේශයේ සංචාරය සඳහාත්, කරුණාරත්න මහතා එකී ජීප් රථය පාවිච්චි කළ බව එතුමා දන්නවාද? (ඊ) 1968 අගෝස්තු 24 වැනි දිනදී මෙම පිරිසේ විනෝදය පිණිස කරුණාරත්න මහතා, නිල ජීප් රථයක් පාවිච්චි කරමින් එදින තමාගේ මුළු කාලය යෙදවූ බව එතුමා දන්නවාද? (උ) එතුමා මේ ගැන පරීක්ෂා කර බලනවාද?

*உள்ளூராட்சி அமைச்சரும், தகவல் ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியுமானவரைக் கேட்ட வினா: (அ) முன்னை நாள் உள்ளூராட்சி அமைச்சரின் ஆணையின் பேரில் உள்ளூராட்சி அமைச்சுக்குச் சொந்தமானதும் 5 ஸ்ரீ 1490 இலக்கமுடையதுமான "ஜீப்" வண்டி தனிப்பட்டோர் தேவைக்காக 1968 ஆம் ஆண்டு ஆகஸ்ட் மாதம் 24 ஆம் தேதி பாவிக்கப்பட்டதை அறிவாரா? (ஆ) முன்னை நாள் அமைச்சரின் மருமகனை அநுராதபுரம் தபாற் கந்தோருக்கருகாமையில் சந்திக்குமாறு உள்ளூராட்சி உதவி ஆணையாளரான திரு. கே. ஏ. கருணாரத்னவுக்கு ஆணையிடப்பட்டதை அறிவாரா? (இ) இவர்களை வில்பத்திற்கு கொண்டு செல்லவும் பொதுவாக நகர் காட்டுவதற்கும் இவ்வண்டியை திரு. கருணாரத்ன பாவித்தார் என்பதை அறிவாரா? (ஈ) உத்தியோகபூர்வமான "ஜீப்" வண்டியைப் பாவித்து 1968 ஆம் ஆண்டு ஆகஸ்ட் மாதம் 24 ஆந் தேதி*



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය. එන්. එම්. පෙරේරා]

பூராவும் திரு. கருணாரத்ன இவர்களோடு தமது காலத்தைக் கழித்ததை அறிவாரா? (உ) இதைப்பற்றி விசாரிப்பாரா ?

asked the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that on the 24th of August 1968, Jeep No. 5 Sri 1490 belonging to the Ministry of Local Government was used for purely private purposes on the instructions of the *ex*-Minister of Local Government? (*b*) Is he aware that Mr. K. A. Karunaratne, the Assistant Commissioner of Local Government, Anuradhapura, was instructed to meet the son-in-law of the *ex*-Minister near the Post Office, Anuradhapura? (*c*) Is he aware that Mr. Karunaratne utilized the jeep to take the party concerned to Wilpattu area and generally for sight seeing purposes in the area on the 24th of August 1968? (*d*) Is he aware that Mr. Karunaratne used his full time in order to entertain this party on the 24th of August 1968, utilizing an official jeep for the purpose? (*e*) Will he inquire into this?

ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒளிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

(*a*) No. (*b*) No. (*c*) The son of the *ex*-Minister went to Wilpattu from Anuradhapura in the same private van in which he went there from Colombo. (*d*) Mr. Karunaratne, A.C.L.G., did not use his entire time with the visitor. He attended to official work at Nochchiyagama for which he used the official jeep. In his spare time, however, he had entertained the visitor. (*e*) Does not arise.



ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

Will the Minister please re-inquire into this because I was myself at Anuradhapura and got the information direct.

ගරු ප්‍රේමදාස

(கௌரவ பிரேமதாச)

(The Hon. Premadasa)

I looked into the matter personally and I am satisfied.

කේ. බී. රත්නායක මයා. (අනුරාධපුර)

(திரு. கே. பி. ரத்னயக்க—அனுராதபுரம்)

(Mr. K. B. Ratnayake—Anuradhapura)

ගරු ඇමතිතුමා විල්පත්තු සංචාරයේ යෙදෙන බව දැන ගන්නට පසුද ඒ නිලධාරියා නොච්චියාගම රාජකාරිය සොදා ගත්තෙ ?

ගරු ප්‍රේමදාස

(கௌரவ பிரேமதாச)

(The Hon. Premadasa)

ඒ ගැන මම දන්නෙ නැහැ.

## අකුරණ කොට්ඨාශයේ හල්ලොළුව මහා විද්‍යාලය ආදී පාසල් ගොඩනැගිලි ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව

அக்குறணைத் தொகுதி ஹல்லொலுவ மகாவித்தியாலயமும் ஏனைய பாடசாலைகளும் : கட்டட ஒப்பந்தங்கள்

## HALLOLUWA MAHA VIDYALAYA AND OTHER SCHOOLS, AKURANA ELECTORATE : CONTRACTS FOR BUILDINGS

6. හේමචන්ද්‍ර සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. Hemachandra Sirisena—First Akurana)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) මහ/හල්ලොළුව මහා විද්‍යාලය, මහ/වැවල පරාක්‍රම විද්‍යාලය, මහ/නුගවෙල ළදරු පාසැල යන අකුරණ ඡන්ද කොට්ඨාශයට අයත් පාසැල් වලට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද ගොඩනැගිලි ඉදි කිරීමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කටයුතු අඩක් පමණක් නිමකර, ඉන් පසුව දැනට කාලයක සිට වැඩ නවත්වා තිබෙන බව එතුමා දන්නවාද? (ආ) එකී ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද? (ඉ) එක් එක් කර්මාන්තය සඳහා දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද? (ඊ) මේ අනුව ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාවද, ඔවුන්ගේ නම් හා ලිපිනයන් ද, ඔවුන්ගේ ඇස්තමේන්තු ද වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරනවාද? (උ) එකී ගොඩනැගිලිවල නිමකර තිබෙන වැඩ කොටස්වත් අවශ්‍යතාවන්ට අනුකූලව කර නැති බව එතුමා දන්නවාද? (ඌ) කොන්ත්‍රාත්කරුවන්ගේ ලාභය සඳහා, කොන්දේසි වලට පට නැතිව බාල වර්ගයේ දැව හා බදාම මිශ්‍රණයන් යොදා ගොඩනැගිලි ඉදිකර තිබෙන බව එතුමා දන්නවාද? (එ) මේ පිළිබඳව යථා තත්ත්වය තවදුරටත් අවබෝධ කර ගැනීම පිණිස කොළඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියෙකු හා අකුරණ පළමු වැනි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සමග ගොස් එක් එක් ගොඩනැගිල්ල ගැන පරීක්ෂණයක් පවත්වා සිදු වී ඇති අක්‍රමිකතාවයන් සොයා බැලීමට එතුමා ඉක්මණින් පියවර ගන්නවාද? (ඒ) එසේ නම්, ඒ කවදාද? නොඑසේ නම් ඒ මන්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அக்குறணை தேர்தல் தொகுதியைச் சேர்ந்தனவாகிய மஹா/ஹல்லொலுவ மஹா வித்தியாலயம், மஹா/வேவல பராக்கிரம வித்தியாலயம், மஹா/நுகவெல பாலர் பாடசாலை ஆகிய பாடசாலைகளுக்கு தேவையானவையும் கல்வித் திணைக்களத்தினால் அங்கீகரிக்கப்பட்டனவுமான கட்டடங்களைக் கட்டும் வேலைகள் ஆரம்பிக்கப்பட்டு ஒரு பகுதி வேலைகளை மட்டும் முடித்துவிட்டுத் தற்போது பலகாலமாக அவ்வேலைகள் நிறுத்தப்பட்டிருக்கிற தென்பதை அவர் அறிவாரா? (ஆ) அக்கட்டட ஒப்பந்தக்காரர்களின் பெயர்களும் விலாசங்களும் யாவை? (இ) ஒவ்வொரு கட்டடத்திற்கும் திணைக்களத்தினால் ஒதுக்கப்பட்டுள்ள பணம் எவ்வளவு? (ஈ) இதற்கிணங்க ஒப்பந்தங்கள் சமர்ப்பித்த குத்தகைக்காரர்களின் எண்ணிக்கையையும் அவர்களின் பெயர்களையும் விலாசங்களையும் ஒவ்வொருவர்களுடைய மதிப்பீடுகளையும் அவர் வெவ்வேறாகச் சபையில் சமர்ப்பிப்பாரா? (உ) மேற்கூறிய கட்டட வேலைகள் தற்சமயம் நிறுத்தப்பட்டிருப்பதோடு முடிக்கப்பட்டுள்ள வேலைகளும் முறையாக முடிக்கப்படாமலிருப்பதை அவர் ஒப்புக்கொள்கிறாரா? (ஊ) அதிக லாப நோக்கத்தோடு நிபந்தனைகளுக்கு மாறாக இளக்க மரங்களையும் சாந்துக்கலவைகளையும் ஒப்பந்தக்காரர் உபயோகித்து கட்டடங்கள் கட்டியிருப்பதை அவர் அறிவாரா? (எ) இவ்விடயம் பற்றி மேலும் அறியும் பொருட்டு விசாரணைக்காக கொழும்புக் கல்வி திணைக்களத்தின் உயர்தர அதிகாரி ஒருவர், அக்குறணைத் தொகுதியின் முதலாவது அங்கத்தவர் ஆகியோருடன் அவர் சென்று ஒவ்வொரு கட்டடத்தையும் ஆராய்ந்து நடந்துள்ள ஊழல்களை அறிய அவர் விரைவில் நடவடிக்கை எடுப்பாரா? (ஏ) ஆமெனில் எப்பொழுது? அன்றேல் ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that the construction of buildings approved by the Education Department for the මහ/Halloluwa Maha Vidyalaya, the මහ/Wewala Parakrama Vidyalaya and the මහ/Nugawela Infant School in the Akurana electorate was party completed and that thereafter the work has been at a standstill for some time? (*b*) What are the names and addresses of the contractors who contracted to do this work? (*c*) What was the department's estimate for each of the buildings? (*d*) Will he state how many contractors tendered for this work, their names and addresses and the amounts tendered by each of them? (e) Is he aware that even the work which has been done on these buildings, does not conform to requirements? (*f*) Is he aware that the conditions specified in the contract have not been fulfilled, in that, inferior timber and inferior mortar have been used by the contractors

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]

with a view to increasing their profits ? (*g*) Will he take early action to visit each of these buildings along with a high-ranking official from the Education Department in Colombo and the First Member of Parliament for Akurana for the purpose of conducting an inquiry into the construction of each building and examining the irregularities that have occurred, with a view to getting further information in regard to this mater ? (*h*) If so, when ? If not, why ?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமினி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamini Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

Sir, it is a long answer. May I table it ?

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Yes.

**සභාමේසය මත තබන ලද පිළිතුර මෙසේයි :**

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு :*

*The Answer tabled is as follows :*

(අ) **මහ/හල්ඔලුව මහා විද්‍යාලය—ගුරු නිවාසය** වැඩ නවත්වා තිබෙන බව ඇත්තකි. කොන්ත්‍රාත් ගිවිසුම පරිදි කටයුතු නො කළ හෙයින් කොන්ත්‍රාත් කරුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදි. ඉතිරි වැඩ නැවත තක්සේරු කොට වෙනත් කොන්ත්‍රාත් කරුවෙකු තෝරා වැඩ පැවරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

**මහ/වැවල පරාක්‍රම විද්‍යාලය—ගොඩනැගිල්ල** වැඩ නිම කොට ඇත.

**මහ/නුගවෙල ළදරු විද්‍යාලය—අලුත්වැඩියා කිරීම**

ඇස්තමේන්තුවට අයත් වැඩවලින් 1/4 ක් පමණ කිරීමෙන් පසු වැඩ නවත්වා ඇත. එහෙයින් කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදී. ඉතිරි වැඩ නැවත තක්සේරුකොට ගුරු දෙගුරු සමිතිය ලවා නිම කරවා ගැනීමට කටයුතු කර ඇත.

(ආ) **මහ/හල්ඔලුව මහා විද්‍යාලය—ගුරු නිවාසය**

ඩී. කේ. ජිනවංශ මහතා—දූල්වල, හල්ඔලුව.

**මහ/වැවල පරාක්‍රම විද්‍යාලය—ගොඩනැගිල්ල**

ඩබ්ලිව්. ඇස්. ඒ. මුණවීර මහතා, 49, මහනුවර පාර, ගුරුදෙනිය.

**මහ/නුගවෙල ළදරු විද්‍යාලය—අලුත්වැඩියා කිරීම්**

වී. පී. ද අල්විස් මහතා, 291, කටුගස්තොට පාර, මහනුවර.

(ඉ) මහ/හල්ඔලුව මහා විද්‍යාලය—ගුරු නිවාසය රු. 13,191.20, මහ/වැවල පරාක්‍රම විද්‍යාලය—පාසැල් ගොඩනැගිල්ල—රු. 14,462.97, මහ/නුගවෙල ළදරු විද්‍යාලය—අලුත් වැඩියා කිරීම්—රු. 8,951.93.

(ඊ) මෙම වැඩ සම්බන්ධයෙන් ඉහත සඳහන් කොන්ත්‍රාත්කරුවන්ගේ ටෙන්ඩර් හැර වෙනත් ටෙන්ඩර් නො තිබුණි. ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් ගණන් මෙසේ ය.

මහ/හල්ඔලුව ම. වි.—ගුරු නිවාසය, ඩී. කේ. ජිනවංශ, රු. 13,089.50, මහ/වැවල පරාක්‍රම වි.—ගොඩනැගිල්ල—ඩබ්. ඇස්. ඒ. මුණවීර, රු. 14,420.27, මහ/නුගවෙල ළදරු විද්‍යාලය—අලුත් වැඩියා—වී. පී. ද අල්විස්, රු. 8,950.00.

(උ) මෙහි පහත (එ) පිළිතුර බලනු මැනවි.

(ඌ) මෙහි පහත (එ) පිළිතුර බලනු මැනවි.

(එ) ගරු අකුරණ පළමුවැනි මන්ත්‍රීතුමාත් සමග මෙම ගොඩනැගිලි සෝදිසි කර බලා චෝදිත අක්‍රමිකතා පිළිබඳ වාර්තා කිරීමට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාඨශාලා ගොඩනැගිලි අධිකාරි ඉංජිනේරුවරයාට නියම කර තිබේ.

(ඒ) ඉතා ඉක්මණින්ම අකුරණ ගරු මන්ත්‍රීතුමා සමග සාකච්ඡා කොට දිනයක් නියම කර ගැනීමෙන් පසුව.

(அ) **க/கல்லொலுவ மகா வித்தியாலயம்—ஆசிரியர் குடிமனை.**—வேலை ஒரு மட்டத்தில் அபிவிருத்தி அடையாது ஒரே நிலையில் இருந்தது. ஒப்பந்தம் சம்பந்தமான உடன்படிக்கையின் பிரகாரம் ஒப்பந்தகாரன் வேலை செய்யாததால், ஒப்பந்தம் நிராகரிக்கப்பட்டது. எஞ்சியிருந்த கட்டட வேலைகள் தொடர்பில் மதிப்பீடு மீளத் தயாரிக்கப்பட்டு வேலையை வேறொரு ஒப்பந்தகாரனிடம் ஒப்படைக்க நடவடிக்கை எடுக்கப்படுகிறது.

**க/வேவல பராக்கிரம வித்தியாலயக் கட்டடம்.**—கட்டட வேலைகள் பூரணமாக நிறைவேற்றப்பட்டுள்ளன.

**க/நுகவெல பாலர் பாடசாலை—கட்டடங்களுக்கான திருத்த வேலைகள்.**—மதிப்பீடு தயாரிக்கப்பட்ட வேலைகளில் ¼ பங்கை முடித்தபின் வேலை நிறுத்தப்பட்டது. எனவே ஒப்பந்தம் நிராகரிக்கப்பட்டது ; எஞ்சியிருந்த வேலைகளுக்கு மதிப்பீடுகள் புதிதாகத் தயாரிக்கப்பட்டு பாடசாலையின் பெற்றோர் ஆசிரியர் சங்கத்தால் வேலையைச் செய்து முடிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுகிறது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ஆ) க/கல்லொலுவ மகா வித்தியாலயம்—ஆசிரியர் குடிமனை.—திரு. டி. கே. ஜினவன்ச, துல்வல, கல்லொலுவ.

க/வேவல பராக்கிரம வித்தியாலயக் கட்டடம்.—திரு. டபிள்யு. எஸ். ஏ. முனவீர, 49, கண்டி, வீதி குருதெனிய.

க/நுகவெல பாலர் பாடசாலை—திருத்த வேலை கள்.- திரு. டி. பி. டீ. அல்விஸ், 291, கட்டுகாஸ்தோட்ட வீதி, கண்டி.

(இ) க/கல்லொலுவ மகா வித்தியாலயம்—ஆசிரியர் குடிமனை—ரூபா 13,191.70, க/வேவல பராக்கிரம வித்தியாலயம்—பாடசாலைக் கட்டடம்—ரூபா 14,462.97, க/நுகவெல பாலர் பாடசாலை—திருத்த வேலைகள்—ரூபா 8,957.93.

(ஈ) மேற்குறித்த ஒப்பந்தகாரர்கள் மாத்திரமே இவ் வேலைகளுக்குக் கேள்விகள் அனுப்பினர்கள். ஒவ்வொருவரும் கேட்டிருந்த தொகைகள் பின்வருமாறு கும் : க/கல்லொலுவ மகா வித்தியாலயம்—ஆசிரியர் குடிமனை—டி. கே. ஜினவன்ச—ரூபா 13,089.50, க/வேவல பராக்கிரம வித்தியாலயம்—பாடசாலைக் கட்டடம்—டபிள்யு. எஸ். ஏ. முனவீர—ரூபா 14,420.27, க/நுகவெல பாலர் பாடசாலை—திருத்த வேலைகள்—வி. பி. டீ. அல்விஸ்—ரூபா 8,950.00 (உ) கீழே (எ) ஆம் வினாவிற்கான விடையைப் பார்க்கவும். (ஊ) கீழே (எ) ம் வினாவிற்கான விடையைப் பார்க்கவும். (எ) அக்குறணை பாராளுமன்ற அங்கத்தவருடன் சென்று கட்டடங்களைப் பரிசிலனை செய்து அறிக்கை சமர்ப்பிக்குமாறு கல்வி, கலாச்சார அலுவல்கள் அமைச்சின் அத்தியட்ச எந்திரவியலாளர் வேண்டப்பட்டுள்ளார். (ஏ) அக்குறணை பாராளுமன்ற அங்கத்தவருடன் கலந்தாலோசித்து ஒரு தேதியை நிர்ணயித்துக் கூடிய விரைவில்.

(*a*) *K/Halloluwa Maha Vidyalaya—Teachers' quarters.*

The work has been at a standstill. As the contractor did not work in keeping with the agreement in respect of the contract, the contract was cancelled. The remaining building operations have been re-estimated for and action is being taken to hand over the work to another contractor.

*K/Wewala Parakrama Vidyalaya—building.*

Building operations have been completed fully.

*K/Nugawela Infant School—Repairs to buildings.*

The work was stopped after completing about one-fourth of the estimated operations. Hence the contract was cancelled. Fresh estimates have been prepared for the remaining operations and actions is being taken to get the work completed by the parent-teacher association of the school.

(*b*) *K/Halloluwa Maha Vidyalaya—Teachers' quarters.*

Mr. D. K. Jinawansa, Dulwala, Galoluwa.

*K/Wewala Parakrama Vidyalaya—building.*

Mr. W. S. A. Munaweera, 49, Kandy Rd., Gurudeniya.

*K/Nugawala Infant School—Repairs.*

Mr. D. P. de Alwis, 291, Katugastota Road, Kandy.

(*c*) K/Halloluwa Maha Vidyalaya—Teacher's Quarters—Rs. 13,191.70.

K/Wewala Parakrama Vidyalaya—School building—Rs. 14,462.97.

K/Nugawela Infant School—Repairs—Rs. 8,957.93.

(*d*) These works were tendered for by the above contractors only. The amounts tendered by each of them are as follows :

K/Halloluwa M. V.—Teachers' quarters —D. K. Jinawansa—Rs. 13,089.50.

K/Wewala Parakrama Vidyalaya—School building—W. S. A. Munaweera—Rs. 14,420.27.

K/Nugawela Infant School—Repairs—V. P. de Alwis—Rs. 8,950.00.

(*e*) Please see reply at (*g*) below.

(*f*) Please see reply at (*g*) below.

(*g*) The Superintending Engineer of the Ministry of Education has been asked to inspect the buildings together with the hon'ble Member for Akurana and report on the alleged irregularities.

(*h*) Very soon, after a date has been fixed in consultation with the M.P. for Akurana.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 7.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

I want a couple of weeks' time to answer this Question. I have still not got the particulars.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 8.

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

I want three weeks' time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 9.

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

I want a week's time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## අකුරණ කොට්ඨාශයේ බීඩි ඔතන්නන්ගේ සමුපකාර සමිති

*பீடித் தயாரிப்பாளர் கூட்டுறவுச் சங்கம், அக்குறணைத் தொகுதி*

## BEEDI WRAPPERS' CO-OPERATIVE SOCIETIES, AKURANA ELECTORATE

13. **හේමචන්ද්‍ර සිරිසේන මයා.**
*(திரு. ஹேமச்சந்திர சிரிசேன)*
(Mr. Hemachandra Sirisena)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) "බීඩි ඔතන්නන්ගේ සමුපකාර සමිති" වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා, 1966 වර්ෂයේ මුල භාගයේ සිට මේ දක්වා අකුරණ ඡන්ද කොට්ඨාශය තුළ වැසියන්ගෙන් ලැබී ඇති සම්පූර්ණ අයදුම් පත්‍ර ප්‍රමාණය කොපමණද? (ආ) අයදුම් කරන ලද එක් එක් සංවිධානයේ නම, ලිපිනය හා නියෝජනය කරන සාමාජික සංඛ්‍යාව සහ අයදුම් පත්‍රය දෙපාර්තමේන්තුව වෙත ලැබුණු දිනය වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරනවාද? (ඉ) එකී අයදුම්කරුවන්ගෙන් මෙතෙක් ලියාපදිංචි කරන ලද සමිති නම් වශයෙන් හා මෙම සමිති ලියාපදිංචි කිරීමේදී දෙපාර්තමේන්තුව අනුගමනය කරන ලද ප්‍රතිපත්තින් කුමක්ද යන වග එතුමා මෙම සභාවට පැහැදිලි කරනවාද?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1966 ம் ஆண்டின் ஆரம்பகாலத்திலிருந்து இதுவரை "பீடித் தயாரிப்பாளர் கூட்டுறவுச் சங்கமாக" பதிவுசெய்து கொள்ளுமாறு, அக்குறணைத் தொகுதி மக்களிடமிருந்து கிடைத்துள்ள விண்ணப்பங்கள் எத்தனை? (ஆ) விண்ணப்பித்த ஒவ்வொரு சங்கத்தின் பெயர், முகவரி, அங்கத்தவர்களின் எண்ணிக்கை, விண்ணப்பங்கள் திணைக்களத்திற்குக் கிடைத்த தேதி என்பனவற்றை வெவ்வேறாக அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா? (இ) மேற்கூறிய விண்ணப்பதாரிகளில் இதுவரை பதிவு செய்யப்பட்ட சங்கங்களின் பெயர்களையும், அவற்றைப் பதிவுசெய்வதற்குத் திணைக்களம் பின்பற்றிய கொள்கையாது என்பதையும் அவர் தெளிவுபடுத்துவாரா?*

asked the Minister of Home Affairs: (a) How many applications for the registration of beedi wrappers co-operative societies have been received from the Akurana Electorate since early 1966? (b) In respect of each of these applications, will he state the name of the society making the application, its address and membership, and also the date on which the application was received by the department? (c) Will he state the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

names of the societies whose applications for registration have been successful, and the policy followed by the department in determining whether a society should be registered or not?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

(අ) සමිති තුනයි. (ආ) 1. යටිහලගල වි. සේ. ස. සමිතිය—පල්ලේගම, සාමාජික සංඛ්‍යාව 63—ස. සං. උ. කො. නිර්දේශය 68. 5. 15 දින ලැබී ඇත. 2. දොරණෑගම වි. සේ. ස. සමිතිය, මැදවල—සාමාජික සංඛ්‍යාව 50—ස. සං. උ. කො. නිර්දේශය 68.5.8 දින ලැබී ඇත. 3. කුරුගොඩ වි. සේ. ස. සමිතිය අකුරණ—සාමාජික සංඛ්‍යාව 45—ස. සං. උ. කො. නිර්දේශය 68. 9. 3 දින ලැබී ඇත. (ඉ) යටිහලගල වි සේ. ස. සමිතියට හා දොරණෑගම වි. සේ. ස. සමිති ලියාපදිංචි කර ඇත. බීඩි එතුම් කොළ මිලදී ගැනීමේ බලපත්‍ර ලබා ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම සඳහා සමුපකාර සමිතිවලින්, ලැබුනු ඉල්ලුම්පත් පලාතේ සමුපකාර සංවර්ධන උප කොමසාරිස් වෙත ඔහුගේ නිර්දේශ සඳහා යවන ලදි. සමුපකාර සංවර්ධන උප කොමසාරිස් විසින් නිර්දේශ කරන ලද සමිතිවලට මේ දෙපාර්තමේන්තුව මගින් බලපත්‍ර නිකුත් කරන ලදි. බීඩි එතුම්කොල ආනයනය කිරීම වෙනුවෙන් වූ විදේශ විනිමය සීමාසහිත බැවින්, මෙම දෙපාර්තමේන්තුව මගින් බලපත්‍ර නිකුත් කිරීම සඳහා සමුපකාර සමිති ලියාපදිංචි කිරීම සීමා කිරීමට සිදුවිය. මේ අනුව 68.8.31 දින හෝ ඉන් පෙර මෙම කාර්යාලයට ලැබෙන නිර්දේශයන් පමණක් මේ සඳහා සලකා බලනු ලබන බව ග්‍රාම/අ. විසින් 68.8.4 වැනි දින ස. සං. කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත දන්වන ලදි. ඉහත සඳහන් කුරුගොඩ වි. සේ. ස. සමිතිය සම්බන්ධ ස. සං. උ. කොමසාරිස්ගේ 68.9.1 දින දරන නිර්දේශය මෙම කාර්යාලයට ලැබී ඇත්තේ 68.9.3 දිනදීය. එසේ හෙයින් මෙම සමිතියට බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා සලකා බැලීමට නොහැකි විය.

වාචික පිළිතුරු

## පොලිස් වෙඩි පහර කෑ ගැට්ටුවානේ ළමයින්ට වන්දි

## கெற்றுவனவில் பொலிஸ் சுட்ட பிள்ளைகளுக்கு நஷ்டஈடு

## COMPENSATION FOR CHILDREN SHOT BY POLICE AT GETTUWANA

**14. ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) කුරුණෑගල, ප්‍රකාශනය කළ වරද කරුවකු අත් අඩංගුවට ගැනීමට 1968 මැයි 18 වන දින පිටත්ව ගිය පොලිස් භට කණ්ඩායමක් ගැට්ටුවාන ගමේ ගෙයක් ඇතුළත සිටි ළමයින් දෙදෙනෙකුට වෙඩි තබා බරපතළ තුවාල සිදු කළ බවත්; (ii) තුවාල ලද එක් ළමයෙක් මිය ගිය බවත් අනෙක් ළමයා ආරෝග්‍ය ශාලාවේ සිටින බවත්; (iii) මිය ගිය ළමයාගේ මරණයට හේතුව පොලිස් කොස්තාපල් අප්පුහාමි විසින් නොසැළකිලිමත්ව තුවක්කුවක් පාවිච්චි කිරීම යයි තමා සිතන බවත්, එසේ වුවද සාපරාධී නොසැළකිලිමත් බවක් විනැයි තමා තීරණය නොකරන බවත් විභාගය පැවැත්වූ මහෙස්ත්‍රාත්වරයා ප්‍රකාශ කළ බවත් එතුමා දන්නේද? (ආ) මෙම අසරණ පුද්ගලයින්ට දරීමට සිදුවූ දුක ගැන සලකා මිය ගිය ළමයාගේ පියාට කිසියම් වන්දි මුදලක් ගෙවීමට රජය අදහස් කරන්නේද? (ඉ) තවමත් ප්‍රතිකාර ලබමින් සිටින ළමයා වෙනුවෙන්, වෛද්‍යාධාර සඳහා කිසියම් වන්දි මුදලක් ලබා දීමට එතුමා අදහස් කරන්නේද?

*பிரதம அமைச்சரையும், பாதுகாப்பு, வெளி விவகார அமைச்சரையும், திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரையுங் கேட்ட வினா: (அ) (i) 1968, மே மாதம் 18 ஆந் தேதி, குருநாக்கலில், பிரசித்தப்படுத்திய குற்றவாளி ஒருவரைக் கைது செய்ய வெனச் சென்ற பொலிசு குழாத்தினர், கெற்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

அவன எனுங் கிராமத்தில் வீட்டுக்குள் இருந்த இரண்டு பிள்ளைகளைச் சுட்டு அவர்களைப் படுகாயப்படுத்தியிருக்கிருர்கள் என்பதையும்; (ii) காயமுற்ற பிள்ளைகளில் ஒருவர் இறந்தாரென்பதையும், மற்றவர் ஆசுப்பத்திரியிலிருக்கிருரென்பதையும்; (iii) கொசுத்தாப்பு அப்புகாமியின் அசட்டையான துப்பாக்கிப் பிரயோகத்தால்தான் அவர் இறந்தார் என்பதே தமது கருத்து என்றும் ஆனல் இதில் குற்றத்திற்குரிய அசட்டையிருந்ததென்று தாம் கூறவில்லையென்றும் விசாரணை நடத்திய நீதவான் தீர்ப்புக் கூறினுரென்பதையும் அவர் அறிவாரா? (ஆ) இந்த வறிய மக்களுக்கு விளைவிக்கப்பட்டுள்ள துன்பங் காரணமாக, காலமடைந்த பிள்ளையின் தந்தைக்கு ஏதாவது நஷ்டஈடு வழங்க அரசாங்கம் ஆலோசித்திருக்கின்றதா? (இ) இன்னமும் சிகிச்சை பெற்றுவரும் பிள்ளையின் வைத்திய சிகிச்சைக்கு நஷ்டஈடு வழங்க அவர் ஆலோசித்துள்ளாரா?

asked the Prime Minister & Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs: (*a*) Is he aware that—(i) on the 18th May 1968 a police party that went to arrest a proclaimed offender in Kurunegala shot at and seriously injured two children who were inside the house in the village of Gettuwana; (ii) one of the children injured died and the other is in hospital; (iii) the magistrate who held the inquiry declared that he is of the opinion that the deceased died due to the negligent use of a firearm by Constable Appuhamy, but he does not hold that there was criminal negligence? (*b*) In view of the suffering caused to these poor people, does the Government propose to pay any compensation to the father of the dead child? (*c*) Does he propose to grant some compensation for the medical treatment in regard to the child who is still undergoing treatment?

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

(*a*) (i) P.C. 7594 Appuhamy, one of the police party, shot at Francis Fernando, a dangerous criminal wanted for gang robbery who was armed and who shot at the police, but the shots missed him and killed one child and injured another. (ii) Yes. (iii) Yes. (*b*) and (*c*) There is no provision in law to pay compensation, but the question whether an *ex-gratia* payment can be made will be examined.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

The injured child requires to be paid compensation.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

It was a slight injury. One child died. The injury on the other child was hardly an injury; it was slight.

## රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව: ඩයස් සමරකෝන් මහතාගේ පත්වීම

அரசாங்கப் பொறியியற் கூட்டுத்தாபனம்: திரு. டயஸ் சமரக்கூன் நியமனம்

## STATE ENGINEERING CORPORATION: APPOINTMENT OF MR. DIAS SAMARAKOON

15. **ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාවේ සහකාර සාමාන්‍යාධිකාරි (පරිපාලන) වශයෙන් ඩයස් සමරකෝන් මහතා පත්කර තිබෙන බව එතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දන්නවාද ? (ආ) ඔහු, විශ්‍රාම ලත් සිවිල් සේවකයෙක්ද ? (ඉ) ඔහුගේ වයස කීයද ? (ඊ) මේ තනතුරු සඳහා විශ්‍රාම ලත් කෙනෙකු යොදවනවා වෙනුවට, සුදුසුකම් ලත් තරුණයකු පත් කළ නොහැක්කේ මන්ද ?

கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா : (அ) அரசாங்கப் பொறியியற் கூட்டுத்தாபனத்தின் உதவிப் பொது முகாமையாளர் (நிர்வாகம்) பதவிக்கு திரு. டயஸ் சமரக்கூன் நியமிக்கப்பட்டுள்ளார் என்பதை அவர் அறிவாரா ? (ஆ) அவர் ஓய்வு பெற்ற ஒரு சிவில் சேவையாளரா ? (இ) அவரது வயதென்ன ? (ஈ) ஓய்வு பெற்ற ஒருவருக்குப் பதிலாக இப்பதவிக்கு தகைமை பெற்ற இளைஞர் ஒருவரை நியமிக்க முடியாததேன் ?

asked the Minister of Industries and Fisheries : (*a*) Is he aware that Mr. Dias Samarakoon has been appointed as Assistant General Manager (Administration) of the State Engineering Corporation ? (*b*) Is he a retired civil servant ? (*c*) What is his age ? (*d*) Why is it not possible to employ a qualified young man for this post instead of employing a retired man ?

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**

*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

(*a*) Yes. (*b*) Yes. (*c*) 62. (*d*) Mr. Samarakoon is an officer with wide admininstrative experience in various responsible posts in the Ceylon Civil Service and later in the Ceylon administrative Service. His experience in two large technical departments—as Deputy Port Commissioner and Chief Administrative Officer, C. G. R.—is of particular relevance and importance to the State Engineering Corporation, which is a developing technical organisation. Personnel and administrative matters in this organisation are of particular complexity due to the nature of work and manner of its execution.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

Who performed these functions before this gentleman was appointed ?

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**

*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*

(The Hon. D. P. R. Gunawardena)

I need notice for it. There are over 10,000 employees in the State Engineering Corporation.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

I agree.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**

*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*

(The Hon. D. P. R. Gunawardena)

If you give notice, I shall get the particulars.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

All I am asking is, is it not possible to recruit a younger person ? There is so much unemployment ; graduates are unemployed. They might very well recruit a person instead of getting a retired man to do this job.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**

*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*

(The Hon. D. P. R. Gunawardena)

Mr. Samarakoon was appointed at first for a pèriod of two years from 19.5.66, and it was extended for a further period of one year with my approval.

There are several retired officers re-employed both under Government and State corporations. Some of them are much older than Mr. Samarakone. To mention a few :

Mr. M. Vairavapillai, 65 years (born 12.4.1903), River Valleys Development Board, on a special salary without reduction of pension ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

Mr. F. P. de Z. Siriwardena, 64 years (born 2.4.1904), Agrarian Services Department, without reduction of pension ;

Mr. H. V. F. Abeykoon, 63 years (born 6.4.1905), Gal Oya Development Board ;

Mr. S. de S. Thenuwara, 62 years (born 10.12.1905), Treasury ;

Mr. K. A. Ratnapala, 62 years (born 4.1.1906), Ministry of Education ;

Mr. P. A. Gurusinghe, 62 years (born 22.1.1906), State Engineering Corporation.

I found it very difficuilt to get a person with the ncessary experience. That is the reason why we have asked him to continue in service. As a matter of fact, age is no reason, if yon cannot find a person with the necessary experience, to get rid of a person. You know, President De Gaulle is 78, Ho Chi Minh is 79, Ulbricht of the German Democratic Republic is 76. I am myself 68, and the hon. Member for Yatiyantota is by no means young because he is also in his sixties.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

We are all young men under 70! Is that why the Minister takes only retired men for these jobs ?

## වලපනේ ආඳාවල ජන රංජන කලායතනය

ஜனரஞ்சன கலை நிலையம், ஆந்தாவல, வலப்பனை

JANA RANJANA INSTITUTE OF ARTS, ANDAWALA, WALAPANE

18. **ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)*
(Mr. T. B. M. Herath—Walapane)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) නුවරඑළියේ ඇති රජයේ ආධාර ලබන කලායතනවල නම් හා ඒවා ලබන වාර්ෂික ආදායම් ප්‍රමානය වෙන වෙනම කොපමණද ? (ආ) වලපනේ ආඳාවල ජනරංජන කලායතනය එහි දියුණු තත්ත්වයට සරිලන වාර්ෂික ආධාරයක් නොලබන බව එතුමා දන්නවාද ? (ඉ) එම කලායතනයට දැනට දෙන ආධාරය වැඩි කිරීමට එතුමා ක්‍රියා කරනවාද ? නොඑසේ නම්, ඒ මන්ද ?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா : (அ) நுவரெலியாவிலுள்ள, அரசினர் உதவி பெறும் கலைநிறுவனங்களின் பெயர்களையும், அவற்றின் வருட வருமானத்தையும் குறிப்பிடுவாரா ? (ஆ) வலப்பனை ஆந்தாவல ஜனரஞ்சன கலை நிலையம் அதன் அபிவிருத்திக்குத்தக்க, வருட உதவித் தொகையைப் பெறவில்லையென்பதை அவர் அறிவாரா ? (இ) அந்தக் கலை நிலையத்துக்கு தற்பொழுது வழங்கும் உதவித் தொகையை உயர்த்த அவர் நடவடிக்கை எடுப்பாரா ? இல்லையெனில், ஏன் ?*

asked the Minister of Education and Cultural Affairs : (*a*) Will he state the names of state aided institutes of fine arts in Nuwara Eliya and the annual income of each such institution ? (*b*) Is he aware that the Jana Ranjana Institute of Arts in Andawala, Walapane does not receive an annual grant in keeping with the standard that it has achieved ? (*c*) Will he take steps to increase the grant that is given to this institution at present ? If not, why ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

(අ) නුවරඑළි දිස්ත්‍රික්කයේ රජයෙන් ආධාර ලබන කලායතන ගණන 4 කි. එනම් :—

1. විද්‍යාරත්න කලායතනය—තෙරිපැහැ, හල්ගුරන් ඔය.
2. අරග්ගම නැටුම් පාසැල—අරග්ගම, හඟුරන් කෙත.
3. රත්සිනා නෘත්‍ය විදුහල—දම්පොල, හඟුරන් කෙත.
4. ජනරංජන නැටුම් කලායතනය—ආඳාවල, මුංවත්ත.

මේවාට ලැබෙන වාර්ෂික ආදායම ගැන විස්තර දිය නොහැක. එහෙත් සංස්කෘතික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් දී ඇති ආධාර මෙසේය :

(i) 1961-1967 දක්වා විද්‍යාරත්න කලායතනයට රු. 600 බැගින් ගෙවා ඇත.

(ii) 1959-1961 තෙක් රු. 1,200 බැගින් හා 1962-1966 දක්වා රු. 750 බැගින් අරග්ගම නැටුම් පාසැලට ගෙවා ඇත.

(iii) 1958-1960 තෙක් රු. 1,200 බැගින් හා 1961-1962 තෙක් රු. 750 බැගින් ද 1963-1966 දක්වා රු. 600 ගණනේ ද රන්සිනා නැටුම් පාසැලට දී තිබේ.

(iv) 1964-1967 දක්වා රු. 300 බැගින් ජනරංජන නැටුම් පාසැලට ආධාර දී තිබේ.

(ආ) ඔව්, එහෙත් දිවයිනේ පිහිටි කලායතනවලට ගෙවීම සඳහා ඇති මුදල් ප්‍රමාණය සීමිත වීම නිසා ඉහත සඳහන් ආධාරය පමණක් ගෙවීමට සිදුවී තිබේ. (ඉ) මේ ගැන සළකා බලනු ඇත.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

දිවයිනේ කලායතනවලට ආධාර වශයෙන් දෙන සම්පූර්ණ මුදල කොපමණද කියා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා සඳහන් කරනවාද ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

මට කල් දෙනව නම් හොයා බලා කියන්න පුළුවනි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 19.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)

මේ ඉල්ලා තිබෙන තොරතුරු ලැබෙන්නට මාසයක් කල් ගතවන නිසා පිළිතුරු සැපයීමට මාසයක් කල් ඉල්ලනවා.



**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කල් ගියාට කමක් නැහැ. ඉක්මණින් හාල් සලාකය දෙන්නට ඕනෑ.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## හොරකැලේ ගම්සභා පාරේ කැකුළකඩේ කොටස

ஹொரக்கெல்ல கி. ச. தெரு, கெக்குலக்கட

**HORAKELLE V. C. ROAD, KEKULAKADE**

21. **ආර්. සිංගල්ටන්-සැමන් මයා.** (පත් කරන ලද මන්ත්‍රී)
*(திரு. ஆர். சிங்கல்டன்-சமன்—நியமன அங்கத்தவர்)*
(Mr. R. Singleton-Salmon—Appointed Member)

පළාත් පාලන ඇමති හා ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) හොරකැලේ ගම්සභා පාරේ කුකුළකඩේ පිහිටි කොටසෙහි, 1966 නොවැම්බරයේ සිට, බලහත්කාරයෙන් පදිංචිවූවන් විසින් දෙකෙළවරේ කටුකම්බි වැටවල් සාදා එම පාර නීති විරෝධී ලෙස මහජනයාට වසා දමා තිබෙන බව එතුමා දන්නවාද ? (ආ) මෙම පාර නැවත විවෘත කරවීමට, කුරුණෑගල දිසාපති, ගිරිඋල්ලේ ආඩිගම වත්තේ කළමනාකරු වෙත එවූ අංක 3451/1571 හා 67.8.29 දින දරන ලියුමෙන් පොරොන්දු වූ බව එතුමා දන්නවාද ? (ඉ) කුලියාපිටියේ පොලිස් මූලස්ථාන පරීක්ෂක හා හමන්ගල්ල ගම්කාර්ය සභාවේ සභාපති ද මේ හා සමානම පොරොන්දු දී තිබෙන බව එතුමා දන්නවාද ? (ඊ) ඉහත දක්වෙන (ආ) හා (ඉ) යටතේ සඳහන් කොට ඇති පරිදි පොරොන්දු දී ඇතත්, මේ දක්වා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කර නැති බව එතුමා දන්නවාද ? (උ) මේ පාරේ බාධක ඉවත් කොට එය මහජන පාවිච්චිය සඳහා යළිත් විවෘත කරවීමට අවශ්‍ය පියවර එතුමා ගන්නවාද ? (ඌ) එසේ නම් කවදාද ? නො එසේ නම් ඒ මන්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිංගල්ටන්-සැමන් මයා.]

உள்ளூராட்சி அமைச்சரும், தகவல் ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியு மானவரைக் கேட்ட வினு : (அ) அத்து மீறிக் குடியிருப்பவர்கள் தெருவின் இரு அந்தங்களி லும் முட்கம்பி வேலி அமைத்திருப்பதால் 1966 நவம்பர் தொடக்கம் கெக்குலக்கட கிரா மத்தில் உள்ள ஹொரக்கெல்ல கிராமச் சபைத் தெருவின் ஒரு பாகம் பொதுப் போக்குவரத் துக்குச் சட்டவிரோதமாக மூடப்பட்டுள்ள தென்பதை அவர் அறிவாரா ? (ஆ) குருநாகல் அரசாங்க அதிபர் கிரியுல்லே ஆண்டிகம தோட்ட முகாமையாளருக்கு அனுப்பிய 29.8.67 தேதியிட்ட 3451/1571 ஆம் இலக்க கடிதத்தில் இந்தத் தெருவை மீளத் திறப்ப தாக வாக்குறுதி அளித்ததை அவர் அறி வாரா ? (இ) குளியாப்பிட்டி பொலிசு தலைமை அலுவலகப் பரிசோதகரும் ஹமங்கல்ல கிராம சபைத் தலைவரும் இதேவிதமான வாக்குறுதி களை அளித்துள்ளதை அவர் அறிவாரா ? (ஈ) மேலே (அ), (ஆ) வில் குறிப்பிடப்பட்டுள்ள வாறு வாக்குறுதிகள் அளிக்கப்பட்டிருந்தும், இதுவரை ஒரு நடவடிக்கையும் எடுக்கப்பட வில்லை என்பதை அவர் அறிவாரா ? (உ) இந்த தெருவின் தடைகளை அகற்றி அதைப் பொது மக்களின் உபயோகத்துக்கு மீண்டும் திறந்து விடுவதற்கு வேண்டிய நடவடிக்கைகளை அவர் எடுப்பாரா ? (ஊ) ஆம் எனில் எப்போது ? இல்லை எனில், ஏன் ?

asked the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (a) Is he aware that since November, 1966, part of the Horakelle V. C. Road in Kekulakade has been illegally closed to the publib by squatters who have erected barbed wire fences at each end ? (b) Is he aware that the G. A., Kurunegala, in his letter No. 3451/1571 dated 29.8.67, addressed to the Manager, Andigama Estate, Giriulla, undertook to have this road re-opened ? (c) Is he aware that the H. Q. I. Police, Kuliyapitiya, and the Chairman, Hamangalla V. C., have given similar undertakings ? (d) Is he aware that despite the assurances referred to in (b) and (c) above, no action has been taken to date ? (e) Will he take the necessary steps to have this road cleared of obstruction and re-opened for the use of the public ? (f) If so, when ? If not, why ?

**ගරු ප්‍රේමදාස**
*(கௌரவ பிரேமதாச)*
(The Hon. Premadasa)

(a) Yes. (b) Not aware. (c) No. But the Chairman, V.C., Hamangalla, has been trying to reopen the road. (d) No. The V.C. has come up against certain legal difficulties. (e) Yes. This will be looked into. (f) As Crown land is involved, the G. A. Kurunegala, has already been requested to take suitable action.

**දෙහිඕවිට ඒ. ජී. පී. ගුණවර්ධන මහතා**
*திரு. ஏ. ஜீ. பீ. குணவர்த்தன, தெகியோவிற்ற*
**MR. A. G. P. GUNAWARDANE, DEHIOWITA**

2. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර—ඩී. පී. ආර්. වීරසේකර මයා.—දෙහිඕවිට—වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற—சார்பாக)*
(Mr. Leslie Goonewardene—Panadura—Panadura— on behalf of Mr. D. P. R. Weerasekera—Dehiowita)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) (i) 1966 අගෝස්තු මාස යේ පවත්වන ලද අංක 7/20569 කම්කරු විනිශ්චය සභා පරීක්ෂණයෙන් දෙහිඕවිට ඒ. ජී. ප්‍රේමනන්ද ගුණවර්ධන මහතාට රු. 668 ක් හා ගාස්තුද ගෙවීමට තීන්දු වූ බවත් ; (ii) ලැබිය යුතු මුදල වගඋත්තර කරු විසින් නොගෙවන ලද අවස්ථාවේදී, කළුතර කම්කරු කාර්යාලය මගින් මෙම මුදල අයකර දීමට පියවර ගැනීමට පොරොන්දු වූ නමුත් (යොමු අංක KT/ML/254/66 16.11.66) මේ දක්වාම කිසිම පියවරක් ගෙන නැති බවත් ; (iii) 1968 සැප්තැම්බර් මාසයේදී මේ ගැන අව ධානය යොමු කරන ලද නමුදු කිසිම ප්‍රති ඵලයක් නොලත් බවත් එතුමා දන්න වාද ? (ආ) දැවුරුද්දක් ගතවී ඇති මෙම කාරණය අවසාන වශයෙන් සමථයකට පත්කර ගැනීමට එතුමා පියවර ගන්න වාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினு: (அ) (i) 7/20569 ஆம் இலக்க, தொழில்முறை மன்ற விசாரணை ஒன்றின் பலனுக, 1966, ஆகஸ்ட் மாதத்தில், தெகியோவிற்றவைச் சேர்ந்த ஏ. ஜீ. பிரேமானந்த குணவர்த்தனுவுக்கு 668 ரூபாவும், செலவுத் தொகையும் வழங்கப்பட வேண்டியிருந்ததையும்; (ii) பிரதிவாதி உரிய தொகையைக் கொடுக்கத்தவறியபோது, களுத்துறை தொழிற் கந்தோர் இத்தொகையை அறவிட நடவடிக்கையெடுப்பதாக உறுதியளித்திருந்தும் (தொடர்பு 16.11.66 தேதியிட்ட இல. கேரி எம்எல்/254/66) இதுவரை எவ்வித நடவடிக்கையும் எடுக்கப்படவில்லையென்பதையும்; (iii) 1968 செத்தெம்பர் மாதத்தில் ஒரு நினைவூட்டுரை அனுப்பப்பட்டபோதிலும், பயன் கிடைக்கவில்லையென்பதையும்; அவர் அறிவாரா? (ஆ) இரண்டு வருஷங்களாகத் தீர்க்கப்படாமலிருக்கும் இவ்விஷயத்திற்கு ஒரு இறுதி இணக்கங்காண அவர் நடவடிக்கைகள் எடுப்பாரா?

asked the Minister of Labour and Employment: (*a*) Is he aware that—(i) a Labour Tribunal Inquiry No. 7/20569, resulted in an award of Rs. 668 plus costs being awarded to A. G. Premananda Gunawardane of Dehiowita in August 1966; (ii) when the defendant failed to pay the amount due, the Labour Office, Kalutara, promised to take action to recover this amount (Reference No. KT/ML/254/66 of 16.11.66) but up to now no action has been taken; (iii) a remainder sent in September 1968 has brought no results? (*b*) Will he take steps to make a final settlement of this two-year old case?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකිරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) (i) ඔව්. (ii) මෙය සත්‍යයෙන් තොර ප්‍රකාශයකි. වගඋත්තරකරු නියමිත මුදල ගෙවීමට අපොහොසත්වූ හෙයින්, ඔහුට විරුද්ධව 67.7.5 වැනි දින කළුතර මහේස්ත්‍රාත් උසාවියේ (කළුතර, මහේස්ත්‍රාත් උසාවි නඩු අංකය: 31493) නඩු පවරන ලදී. මෙම නඩුව 67.8.12, 67.9.17, 67.10.24, 67.11.23 සහ 67.12.22 යන දිනයන්හිදී කථා කරනලද මුත් පිස්කල් නිලධාරියාට සිතාසි බාරදිය නොහැකිව තිබුණෙන් 67.12.22 වන දින නඩුව, නඩු පොතෙන් කපා හරින ලදී. (iii) නැත. මේ සම්බන්ධයෙන් අවධානය යොමුවී ඇති බැව් ඉල්ලුම්කරුට දන්වා යවන ලදී. (ආ) ඔව්. අළුතින් පැමිණිලිපතක් උසාවියට ඉදිරිපත් කරනු ලබන අතර කළුතර, සහකාර කම්කරු කොමසාරිස් විත්තිකරු වෙත සිතාසි බාරදීමට මහන්සි ගන්නවා ඇත.

## සංස්කෘතික දූත පිරිස්

## கலாசாரத் தூதுக் குழுக்கள்

## CULTURAL DELEGATIONS

3. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ) (රාජා කුලතිලක මයා.—තෙල්දෙනිය—වෙනුවට)

(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. ராஜா குலத்திலக்க—தெல்தெனிய—சார்பாக)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. Raja Kulatillake—Teldeniya)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1948 සිට මේ වන තුරු සංස්කෘතික දූත පිරිස් කීයක් ඒ ඒ අවුරුදුවලදී ලංකාවට අවුත් තිබේද? ඒ මොන රටවලින්ද? (ආ) 1948 සිට මේ වන තුරු ලංකාවෙන් ඒ ඒ අවුරුදුවල කුමන රටවලට සංස්කෘතික පිරිස් යවා තිබේද? (ඉ) විදේශීය සංස්කෘතික සම්බන්ධතා දියුණු කිරීම පිණිස මේ රජයේ ප්‍රතිපත්තියක් තිබේද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினு: (அ) 1948 இல் இருந்து இதுவரை எத்தனை கலாசார தூதுக்குழுக்கள் அந்தந்த வருடங்களில் இலங்கைக்கு வந்துள்ளன? அவை எந்த நாடுகளிலிருந்து? (ஆ) 1958 இல் இருந்து இதுவரை இலங்கையிலிருந்து அந்தந்த வருடங்களில் எந்த நாடுகளுக்குக் கலாசார தூதுக்குழுக்கள்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[ද සොයිසා සිරිවර්ධන මයා.]

அனுப்பப்பட்டுள்ளன ? (இ) வெளிநாட்டு கலாசாரத் தொடர்புகளை வளர்ப்பதற்கான கொள்கை இவ்வரசாங்கத்திடம் உண்டா ?

asked the Minister of Education and Cultural Affairs : (*a*) How many cultural delegations have visited Ceylon in each of the years from 1948 to date and from what countries did they come ? (*b*) What are the countries to which cultural delegations were sent from Ceylon in each of the years from 1948 to date ? (*c*) Does the Government have a policy of developing cultural contacts with foreign countries ?

වාචික පිළිතුරු

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

This too is a very long Answer. May I table it ?

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

It may be tabled.

**සභා මේසය මත තබන ලද පිළිතුර මෙසේය :**

சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு :

*The Answer tabled is as follows :*

(අ) සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ 1956 සිටය. එදින සිට පැමිණි සංස්කෘතික දූත පිරිස් සංඛ්‍යාව 9 කි.

පිටරට වලින් ලංකාවට පැමිණි සංස්කෘතික දූත පිරිස් පිළිබඳ විස්තර

| | පැමිණි වර්ෂය | රටවල් | දූත පිරිසේ විස්තර |
|---|---|---|---|
| 1. | 1959 සැප්තැම්බර් ... | චීනය ... | සර්කස් කණ්ඩායමක් |
| 2. | 1962 ජනවාරි ... | ඉන්දියාව ... | බානාලි, සරාබායි ප්‍රධාන නළු නිලියන් හා ගායක වාදකයින් ගෙන් සමන්විත පිරිසක් |
| 3. | 1963–64 ... | චීනය ... | චීන කරනම් කණ්ඩායමක් |
| 4. | 1964–65 ... | චීනය ... | චීන සර්කස් කණ්ඩායමක් |
| 5. | 1964–65 ... | ජර්මනිය ... | ජර්මන් සර්කස් කණ්ඩායමක් |
| 6. | 1964–65 ... | රුසියාව ... | සෝවියට් මුද්‍රා නාට්‍ය කණ්ඩායමක් |
| 7. | 1964–65 ... | ඉන්දියාව ... | කතක් නාට්‍ය කණ්ඩායමක් |
| 8. | 1966 ... | රුසියාව ... | සෝවියට් සර්කස් හා විවිධ ප්‍රසංග නාට්‍ය කණ්ඩායම |
| 9. | 1966 ... | ඕස්ට්‍රේලියාව ... | ''වින්ටුකිස්'' නමැති ඕස්ට්‍රේලියානු රූකඩ නැටුම් කණ්ඩායම |

(ආ) ලංකාවෙන් පිටරට යවන ලද දූත පිරිස් පිළිබඳ විස්තර

| | පැමිණි වර්ෂය | රටවල් | දූත පිරිසේ විස්තර |
|---|---|---|---|
| 1. | 1965 ... | එංගලන්තය ... | පොදුරාජ්‍ය මණ්ඩලීය කලා උළෙලට නැටුම් කණ්ඩායමක් |
| 2. | 1965 ... | නවසීලන්තය ... | ලාංකික නැටුම් කණ්ඩායමක් |
| 3. | 1965 ... | ඕස්ට්‍රේලියාව ... | ලාංකික නැටුම් කණ්ඩායමක් |
| 4. | 1967 ... | කැනඩාව ... | මොන්ට්‍රියල්හි පවත්වන ලද ''එක්ස්පෝ 67'' ප්‍රදර්ශනයට ලාංකික නැටුම් කණ්ඩායමක් |

(ඉ) ඔව්, එනම් සංස්කෘතික සම්බන්ධතා ගිවිසුම් වලට අත්සන් තැබීමෙන් දූත පිරිස් හුවමාරු කිරීම, ශිෂ්‍යත්ව පිරිනැමීම, ජාත්‍යන්තර චිත්‍ර හා චිත්‍රපටි ප්‍රදර්ශන වලට ඇතුලත්වීම, සම්මේලන වලට නියෝජිතයන් යැවීම ආදියෙන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(அ) கலாச்சாரப் பகுதி 1956 ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டது. அக்காலம் தொடக்கம் 9 கலாச்சார பேராளர் குழுக்கள் இலங்கைக்கு வந்துள்ளன.

**இலங்கைக்கு வந்துள்ள வெளிநாட்டு கலாசார பேராளர் குழுக்கள் பற்றிய விபரங்கள்**

| நாட்டின் பெயர் | வருடம் | விவரணம் |
|---|---|---|
| 1. சீனு | .. 1959, செப்டெம்பர் | .. வட்டரங்காட்டிக் கோட்டி |
| 2. இந்தியா | .. 1962, ஜனவரி | .. புறுனுவி சாராபாய்—நடன, பல்லியக் கோட்டி |
| 3. சீனு | .. 1963/64 | .. சீனு கரணவித்தைக் கோட்டி |
| 4. சீனு | .. 1964/65 | .. சீனு வட்டரங்காட்டிக் கோட்டி |
| 5. ஜேர்மனி | .. 1964/65 | .. ஜேர்மன் வட்டரங்காட்டின் கோட்டி |
| 6. ருஷியா | .. 1964/65 | .. ருஷியா பல்லியம் |
| 7. இந்தியா | .. 1964/65 | .. " கற்ருக் ", நடனக் கோட்டி |
| 8. ருஷியா | .. 1966 | .. ருஷியா வட்டரங்காட்டி, களியாட்டக் கோட்டி |
| 9. அவுஸ்திரேலியா | .. 1966 | .. அவுஸ்திரேலிய " தின்றுக்கீஸ் " பாவைக்கூத்துக் கோட்டி |

(ஆ) இலங்கையிலிருந்து வெளி நாடுகளுக்கு அனுப்பப்பட்ட பேராளர் குழுக்கள் பற்றிய விபரங்கள் :

| நாட்டின் பெயர் | வருடம் | விவரணம் |
|---|---|---|
| 1. இலங்கிலாந்து | .. 1965 | .. பொது நலவரசு கலைவிழாவுக்கு நடனக்கோட்டி |
| 2. நியூசிலாந்து | .. 1965 | .. இலங்கை நடனக்கோட்டி |
| 3. அவுஸ்திரேலியா | .. 1965 | .. இலங்கை நடனக்கோட்டி |
| 4. கனேடா | .. 1967 | .. மொன்றீயல் நகரத்தில் நடைபெற்ற " 67 ம் ஆண்டு எக்ஸ்போ " கண்காட்சிக்கு இலங்கை நடனக்கோட்டி |

(இ) ஆம். கலாச்சார உடன்படிக்கைகள், கலாச்சார பேராளர் குழுக்கள் பரிமாறுதல், புலமைப் பரிசில்கள் அளித்தல், சர்வதேச சலனப்பட விழாக்களிலும் கலை விழாக்களிலும் பங்கு பற்றுதல், கருத்தரங்குகளுக்கு பிரதிநிதிகளை அனுப்பி வைத்தல் ஆகியவை மூலம்.

(*a*) The Cultural Department was started in 1956. Since then nine cultural delegations have visited Ceylon.

DETAILS OF FOREIGN CULTURAL DELEGATIONS THAT HAVE VISITED CEYLON

| *Name of Country* | *Year* | *Description* |
|---|---|---|
| 1. China | .. September 1959 | .. Circus Troupe |
| 2. India | .. January 1962 | .. Brunali Sarabai Troupe of Dancers and Orchestra |
| 3. China | .. 1963/64 | .. Chinese Acrobatic Troupe |
| 4. China | .. 1964/65 | .. Chinese Circus Troupe |
| 5. Germany | .. 1964/65 | .. German Circus Troupe |
| 6. Russia | .. 1964/65 | .. Russian Ballet |
| 7. India | .. 1964/65 | .. Katak Dance Troupe |
| 8. Russia | .. 1966 | .. Russian Circus & Variety Entertainment Troupe |
| 9. Australia | .. 1966 | .. " Tintookees " Australian Puppet Troupe |

(*b*) Details of Cultural Delegations Sent From Ceylon to Foreign Countries

| *Name of Country* | *Year* | *Description* |
|---|---|---|
| 1. England | .. 1965 | .. Dance Troupe to Commonwealth Art Festival |
| 2. New Zealand | .. 1965 | .. Ceylonese Dance Troupe |
| 3. Australia | .. 1965 | .. Ceylonese Dance Troupe |
| 4. Canada | .. 1967 | .. Ceylonese Dance Troupe to Expo. 67 at Montreal |

(*c*) Yes. By entering into cultural pacts, exchange of cultural delegations, offering of scholarships, taking part in international film festivals and art festivals, sending representatives to seminars, etc.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අනියම් ලිපිකරුවන්

பதிவுக்காரியகர்த்தர் காரியாலய தற்காலிக எழுது வினைஞர்

## CASUAL CLERKS, REGISTRAR-GENERAL'S DEPARTMENT

**4. ද සොයිසා සිරිවර්ධන මයා.** (සෝමරත්න සෙනරත් මයා.—අම්පාරෙයි—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. சோமரத்ன செனரத்—அம்பாறை—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Somaratne Senerath—Amparai)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) (i) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවි අවුරුදු ගණනාවක් මුළුල්ලේ ලිපිකරුවන් කීප දෙනෙකුන් ඔවුන්ගේ සේවය දිගටම උවමනා නමුත් සදහටම අනියම් සේවයේ තබා ගෙන ඔවුනට දවස් පඩි ගෙවන බවත් ; (ii) මේ අයද ස්ථිර සේවයේ සිටින අය කරන වැඩ හා සමාන වැඩම කරන හෙයින් ඔවුනට ඉතා සුළු පඩියක් ගෙවීම කම්කරු ශ්‍රමය අයුතු ලෙස මෙහෙය වීමක් බවත් ; (iii) එම අය අවුරුදු බොහෝ ගණනක් සේවය කර ඇතත් අනියම් නිවාඩු පවා නොමැතිව, වරප්‍රසාද නොලත් ගණයට වැටී ඇති බවත් එතුමා දන්නේද ? (ආ) සෑහෙන වැටුප් ක්‍රමයක් මත මූලික වරප්‍රසාදත් සහිතව ඔවුන් ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා එතුමා ගැනීමට අදහස් කරන ක්‍රියා මාර්ගය කුමක් ද ?

*நிதி அமைச்சரைக் கேட்ட வினா : (அ) (i) பதிவுக் காரியகர்த்தர் காரியாலயத்தில் பெருந் தொகையான தற்காலிக எழுதுவினைஞர்கள், நாளாந்த வேதனத்தில் வருடக்கணக்காக அமர்த்தப்பட்டிருக்கிறார்கள் என்பதையும், அவர்கள் சேவை மேலும் தொடர்ந்து தேவையாயிருக்கு மென்பதையும் ; (ii) இவர்கள் நிரந்தர எழுதுவினைஞர்களைப் போன்று ஒரே விதமான வேலைகளைச் செய்தும், மிகவும் குறைவான சம்பளம் பெறுகிறார்களென்பதையும் உழைப்புக்கேற்ற ஊதியம் பெறுவதில்லையென்பதையும் ; (iii) சலுகையற்ற இவர்களுக்கு வேதனத்துடன் பெறக்கூடிய சந்தர்ப்ப லீவுதானும் கிடைக்காதென்பதையும் அறிவாரா ? (ஆ) இவர்களை நியாயமான வேதனத்துடன் நிரந்தரசேவையிற் சேர்த்துக்கொள்ள என்ன நடவடிக்கை எடுக்க உத்தேசிக்கப்பட்டிருக்கிறது*

asked the Minister of Finance: (*a*) Is he aware that (i) there are a number of clerks in the Registrar-General's Department employed on a casual basis, on daily pay for a number of years in spite of the fact that their services will be required in the future too ? (ii) they do identically the same work as the permanent clerks, but are paid very low wages—amounting to exploitation of labour ? (iii) they are an under-previleged lot who are not entitled to even casual leave with pay in spite of their long years of service ? (*b*) What action is being contemplated to absorb them into permanent service on a reasonable salary scale with other elementary privileges ?

**විමලසේන මයා.**

*(திரு. விமலசேன)*

(Mr. Wimalasena)

(*a*) (i) Yes. (ii) No. They are engaged only on copying work, but are paid the standard wage applicable to all daily-paid casual clerks employed in the Public Service. (iii) No ; casual employees are not normally entitled to any leave privileges, but purely as a concession, the Registrar-General has been instructed to allow these casual clerks of his department the same leave privileges as are applicable to other categories of daily-paid employees, in accordance with the Financial Regulations of Government. (*b*) A scheme has been formulated and forwarded for consideration by the Cabinet.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**හෝමාගම මහා විද්‍යාලයේ කේ. ඩී. ප්‍රේමවතී ගුරු මහත්මිය**

திருமதி. கே. டி. பிரேமவதி, ஹோமாகம மகா வித்தியாலயம்

**MRS. K. D. PREMAWATHIE, HOMAGAMA MAHA VIDYALAYA**

5. ද සොයිසා සිරිවර්ධන මයා.—(ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)

(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய—சார்பாக)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) (i) දැනට කො/හෝමාගම මහා විද්‍යාලයේ සේවය කරන කේ. ඩී. ප්‍රේමවතී මහත්මියට අන්තර් මධ්‍ය සහතිකය යටතේ වැටුප් ගෙවීමට අධ්‍යාපන අධ්‍යක්ෂතුමා විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බවත් ; (ii) මෙකී තීරණය යටතේ ඇය කො/පනාගොඩ පරාක්‍රම විද්‍යාලයේ සිට කො/හෝමාගම මහා විද්‍යාලයට මාරු කර යවන ලද බවත් එතුමා දන්නවාද ? (ආ) ඇය හෝමාගම මහා විද්‍යාලයට මාරු කර යවන ලද්දේ කවදා සිටද ? (ඉ) මෙතෙක් ඇයට එම සහතිකයට හිමි වැටුප් ගෙවීමට ක්‍රියා නොකර ඇත්තේ මන්ද ? (ඊ) ඇයට අන්තර් මධ්‍ය සහතිකය යටතේ වැටුප් නොගෙවනවා නම්, 1965 ජනවාරි 1 වැනිදා සිට මේ දක්වා අලුතෙන් එම සහතිකයට හිමි වැටුපෙහි පිහිටු වූ ගුරුවරුන් සිටින බව හෝ නොසිටින බව හෝ සඳහන් කරනවාද ? (උ) අන්තර් මධ්‍ය සහතිකයට හිමි වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පසු ගිය අවුරුදු තුන තුළ නිකුත් කරන ලද නියෝගවල හෝ චක්‍රලේඛවල හෝ පිටපත් එතුමා ඉදිරිපත් කරනවාද ?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா : (அ) (i) இப்போது கொ/ஹோமாகம மகா வித்தியாலயத்தில் சேவை செய்யும் திருமதி கே. டீ. பிரேமவதி அவர்களுக்கு "இன்டர்மீடியட்" தராதரத்தின் கீழ் சம்பளம் கொடுப்பதற்கு கல்வி அத்தியட்சகர் அனுமதி கொடுத்துள்ளாரென்பதையும், (ii) இத்தீர்மானத்தின் கீழ் அவர் கொ/பனுகொட பராக்கிரம வித்தியாலயத்திலிருந்து கொ/ஹோமாகம வித்தியாலயத்திற்கு மாற்றப்பட்டாரென்பதையும் அவர் அறிவாரா ? (ஆ) அவர் எப்போது ஹோமாகம மகா வித்தியாலயத்திற்கு மாற்றப்பட்டார் ? (இ) இதுவரை அவருக்கு அத்தாராதரத்திற்குரிய சம்பளத்தைக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்காததேன் ? (ஈ) அவருக்கு "இன்டர்மீடியட்" தராதரப்பத்திரத்தின் கீழ் சம்பளம் கொடுக்காவிடின் 1965 ஜனவரி 1 ஆம் தேதி தொடக்கம் இதுவரை புதிதாக அத்தராதரத்திற்குரிய சம்பளத்திலமர்த்தப்பட்ட ஆசிரியர் உண்டோ இல்லையோ வென்பதைக் குறிப்பிடுவாரா ? (உ) "இன்டர்மீடியட்" தராதரத்திற்குரிய சம்பளத்தைக் கொடுப்பது சம்பந்தமாகக் கடந்த மூன்று வருடங்களுள் வெளியிடப்பட்ட கட்டளைகளினது அல்லது சுற்றறிக்கைகளினது பிரதிகளை அவர் சமர்ப்பிப்பாரா ?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that (i) the Director of Education has approved the payment of salary on the Intermediate Certificate scale to Mrs. K. D. Premawathie, who is at present on the staff of C/Homagama Maha Vidyalaya ? (ii) consequent on this decision she was transferred from C/Panagoda Parakrama Vidyalaya to C/Homagama Maha Vidyalaya ? (*b*) With effect from what date was she transferred to Homagama Maha Vidyalaya ? (*c*) Why has no action been taken to pay her the salary due on her certificate ? (*d*) If she will not be paid the salary due on the Intermediate Certificate, will he state whether any teacher has been placed on the Intermediate salary scale since 1st January, 1965 ? (*e*) Will he table copies of all directives and circulars issued during the last three years on the subject of the payment of the salary scale due on the Intermediate Certificate ?

**ජයසූරිය මයා.**

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

(*a*) (i) Yes. (ii) Yes. (*b*) With effect from 15.1.66. (*c*) Action is being taken. (*d*) Does not arise. (*e*) Tabled.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉංගිරියේ ආර්. සීමොන් සිංඤෝ මහතා**

*திரு. ஆர். சீமோன்சிஞ்ஞோ, இங்கிரிய*

**MR. R. SEEMON SINGHO, INGIRIYA**

10. **ද සොයිසා සිරිවර්ධන මයා.** (රත්න සිරි වික්‍රමනායක මයා.—හොරණ—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரத்னஸிரி விக்ரமநாயக்க—ஹொறன—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Ratnasiri Wickramanayaka—Horana)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) ඉංගිරියේ පදිංචි ආර්. සීමොන් සිංඤෝ මහතාට විරුද්ධව ඉංගිරියේ වන නිලධාරි විසින් හොරණ මහේස්ත්‍රාත් උසාවියේ අංක 36004 යටතේ නඩුවක් පැවරුව බවත්; (ii) එම නඩුවෙන් සිංඤෝ මහතාට රු. 15 ක දඩයක් නියම කරන ලද බවත්; (iii) සීමොන් සිංඤෝ මහතාට විරුද්ධව නැවත වරක් අංක 43754 යටතේ ලීවගයක් ඉරීම සම්බන්ධව නඩු පැවරූ බවත්; (iv) මේ නඩුවෙන් ඔහු නිදහස් වූ බවත්; (v) අංක 45720 යටතේ ඉඩම් කැබැල්ල එළි කිරීම සම්බන්ධව පැවරූ නඩුවෙන් සීමොන් සිංඤෝ මහතා නිදහස් වූ බවත්; (vi) නැවත වරක් මේ වරදටම ඉංගිරියේ වන නිලධාරි විසින් අංක 49051 යටතේ නඩු පවරා ඇති බවත් එතුමා දන්නවාද? (ආ) මේ හිරිහැර කිරීම නැවැත්වීමට කටයුතු කරනවාද? නොඑසේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) இங்கிரியவில் வசிக்கும் திரு. ஆர். சீமோன்சிஞ்ஞோவுக்கு எதிராக இங்கிரிய வன இலாகா உத்தியோகத்தரினுல் ஹொறணை மாஜிஸ்டிரேட் கோட்டில் இலக்கம் 36004 கீழ் வழக்கு ஒன்று தொடரப்பட்டதையும்; (ii) அவ்வழக்கில் திரு. சீமோன் சிஞ்ஞோவுக்கு 15 ரூபா அபராதம் விதிக்கப்பட்டதையும்; (iii) திரு. சீமோன்சிஞ்ஞோவுக்கு எதிராக மீண்டுமொருமுறை இலக்கம் 43754 இன் கீழ் பலகைகள் சிலவற்றை அரிந்தது சம்பந்தமாக வழக்குத் தொடரப்பட்டதையும்; (iv) அவ்வழக்கில் அவர் விடுதலையடைந்தார் என்பதையும்; (v) இலக்கம் 45720 இன் கீழ் காணித்துண்டை துப்பரவாக்கியது சம்பந்தமாக தொடரப்பட்ட வழக்கில் திரு. சீமோன்சிஞ்ஞோ விடுதலை செய்யப்பட்டார் என்பதையும்; (vi) மீண்டும் ஒருமுறை இக்குற்றத்துக்காக இங்கிரிய வன இலாகா உத்தியோகத்தர்களினுல் இலக்கம் 49051 இன் கீழ் வழக்கு தொடரப்பட்டிருப்பதையும் அவர் அறிவாரா? (ஆ) இவ்வாறு துன்புறுத்துவதை நிறுத்த நடவடிக்கை எடுப்பாரா? அன்றேல் ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that—(i) the Forest Officer, Ingiriya, filed action in case No. 36004 in the Magistrate's Court, Horana, against Mr. R. Seemon Singho of Ingiriya; (ii) Mr. Seemon Singho was fined Rs. 15 in this case; (iii) another case, No. 43754, was filed against Mr. Seemon Singho in connection with the sawing of some timber; (iv) he was discharged in that case; (v) Mr. Seemon Singho was discharged in Case No. 45720 where he was charged in connection with the clearing of a block of land; (vi) the Forest Officer, Ingiriya, has filed action No. 49051 regarding the same matter? (*b*) Will he take action to stop this harassment? If not, why?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(*a*) (i) Yes. (ii) Yes. (iii) Yes. (iv) Yes. The magistrate in this case made an order that the timber involved should be confiscated. He further observed that he did not believe the evidence of the accused. (v) Since being convicted in MC Horana Case No. 36004, Mr. Seemon Singho refused to vacate the area. He has enlarged the encroachment to one acre and he has built and occupied a wattle and daub house. He has also planted the encroachment area with rubber. The Range Forest Officer, Ingiriya, charged him once again in MC. Horana Case No. 45720. This case was postponed a number of times at the request of the counsel appearing for the accused and it was taken up on a day

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

on which the Range Forest Officer was on leave. The prosecuting officer deputizing on behalf of the Range Forest Officer failed to lead evidene in terms of the charges and the accused was discharged. (vi) Mr. Seemon Singho is now being charged in MC. Horana case No. 49051 on an amended plaint for occupying a house on Crown land. (b) About 20 acres from this particular section of Kurana Madakada Forest Reserve has been encroached in isolated blocks and all persons involved, inclusive of Mr. Seeman Singho, have been prosecuted. No exceptions have been made. During the course of the trial in MC. Horana Case No. 43754 mentioned at (iv) above Mr. Seemon Singho admitted to court that he and his wife possessed private land elsewhere and the timber in the particular case was to be used to build their house on the private land. Hence Mr. Seemon Singho cannot be considered landless.

### ඉංගිරිය රෝහලේ ගිලන් රථය

இங்கிரிய ஆசுபத்திரி நோயாளர் வண்டி

### AMBULANCE OF INGIRIYA HOSPITAL

11. ද සොයිසා සිරිවර්ධන මයා. (රත්න සිරි වික්‍රමනායක මයා. වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரத்னஸிரி விக்ரமநாயக்க சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Ratnasiri Wickramanayaka—Horana)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) ඉංගිරිය රෝහලේ ගිලන් රථය එම රෝහලෙන් අන් තැනකට ගෙනයාම සම්බන්ධව 1968.2.20 දින එතුමා වෙත දන්වූ බවත්; (ii) එම රථය දින දහයකින් පමණ ආපසු එවන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඔහුගේ අංක සීඒ/ටීආර්ඒ/57 සහ 1968.2.25 වන දින දරන ලිපියෙන් ප්‍රකාශ කර ඇති බවත්; එතුමා දන්නවාද? (ආ) අද වන තුරු ආපසු ලැබී නැති මෙම රථය ආපසු ලැබෙන්ට සලස් වන්නේ කවදාද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) இங்கிரிய ஆசுபத்திரியில் இருந்த நோயாளர் வண்டி அவ்வாசுபத்திரியிலிருந்து வேறொரு இடத்துக்கு எடுத்துச் செல்லப்பட்டது சம்பந்தமாக 1968.2.20 ஆம் தேதி அவருக்கு தெரியப்படுத்தப்பட்ட தென்பதையும்; (ii) அவ்வண்டியை 10 தினங்களுக்குள் மீண்டும் அனுப்புவதாக சுகாதார சேவை அதிபர் அவரின் ஸீ.ஏ./ரீ.ஆர்ஏ/57 ஆம் இலக்க 1968.2.25 ஆம் தேதிக் கடிதத்தில் கூறியிருக்கிறார் என்பதையும் அவர் அறிவாரா? (ஆ) இன்றுவரையும் கிடைக்காமலிருக்கும் இவ்வண்டியை மீண்டும் கிடைக்க எப்பொழுது ஏற்பாடு செய்வார்?*

asked the Minister of Health: (a) Is he aware that (i) he was informed on 20.2.1968 of the removal of the ambulance of the Ingiriya Hospital to another place; (ii) the Director of Health Services stated in his letter CA/TRA/57 of 25.2.1968 that the ambulance would be returned in about 10 days? (b) When will the ambulance be returned to the hospital?

විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

*(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

(a) (i) Yes, as a substitute for the Panadura ambulance which met with an accident. (ii) Yes, on the advice of the firm which undertook to complete the repairs of the Panadura vehicle in 10 days time; but they were unable to do so as certain items of spares were not available; (b) The Ingiriya vehicle itself had met with an accident later and is under repairs now. The vehicle will be returned immediately the repairs are over. In the meantime a relief vehicle is attached to Ingiriya.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### කිඹුලාපිටියට මධ්‍ය බෙහෙත් ශාලාවක්
கிம்புலப்பிற்றிக்கு மருந்தகம்
DISPENSARY FOR KIMBULAPITIYA

16. ද සොයිසා සිරිවර්ධන මයා. (ජයකොඩි මයා. වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ஜயக்கொடி சார்பாக)*

**(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Jayakody)**

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත් කුරු කෝරළේ 'බී' කොට්ඨාශයේ කිඹුලා පිටිය ගමේ හොරහේන ජනපදයේ පිහිටි අක්කර දෙකක් රජයට තිබෙන බවත්; (ii) කිඹුලපිටිය-දගොන්න යන ජනපද දෙකේ සහ අවට ගම්වාසීන්ට ප්‍රයෝජනවත් මධ්‍ය බෙහෙත් ශාලාවක් නොමැති බවත්; එතුමා දන්නවාද? (ආ) මේ ප්‍රදේශයේ ජනතාවට බෙහෙත් ගැනීම සඳහා සැතපුම් 7 ක් පමණ යෑමට තිබෙන බැවින් ඉහත කී ඉඩමේ මධ්‍ය බෙහෙත් ශාලාවක් පිහිටුවීමට එතුමා කටයුතු කරනවාද? (ඉ) නො එසේ නම්, ඒ මන්ද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) கொழும்பு மாவட்டத்தில் அலுத்குரு கோரளையின் "பி" பிரிவைச்சேர்ந்த கிம்புலப் பிற்றிக் கிராமத்தில் ஹொரஹேனைக் குடியேற்றத்திட்டத்தில் 2 ஏக்கர் முடிக்குரிய காணியிருப்பதையும், (ii) கிம்புலப்பிற்றி-தாகொன்ன குடியேற்றத் திட்டங்களிரண்டுக்கும், சுற்றிவரவிருக்கும் கிராம வாசிகளுக்கும் உதவத்தக்க மத்திய மருந்தகமொன்று இல்லையென்பதையும் அவர் அறிவாரா? (ஆ) இப் பிரதேச மக்கள் வைத்திய உதவி பெறுவதற்காக சுமார் 7 மைல் தூரம் செல்ல வேண்டியிருப்பதால், மேற்கூறிய காணியில் ஒரு மத்திய மருந்தகத்தை அமைத்துக் கொடுப்பதற்கு ஆவன செய்வாரா? (இ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Health: (*a*) Is he aware (i) that there are two acres of land belonging to the Crown in the Horahena Colony in the village of Kimbulapitiya in Division "B" of the Aluthkurukorale North in Colombo District; (ii) that there is no central dispensary to serve the needs of the Kimbulapitiya and Dagonna colonies and the surrounding villages? (*b*) Since the residents of these areas have to travel about 7 miles to obtain medical treatment, will he take action to set up a central dispensary in the aforesaid Crown land? (*c*) If not, why?

විමලා කන්නන්ගර මිය.

*(திருமதி விமலா கன்னங்கர)*

(Mrs. Wimala Kannangara)

(a) (i) Yes. (ii) There is no central dispensary. However there are two visiting stations, one at Dagonna and the other one at Kimbulapitiya, to serve the residents of that area. (*b*) As this area is adequately served by the peripheral unit at Minuwangoda and the Government Hospital at Negombo and the C.D. at Halpe-Katana and due to the poor attendance at the existing visiting stations at Dagonna and Kimbulapitiya the establishment of a central dispensary at Kimbulapitiya is not justified. (*c*) (*b*) above refers.

### ගොඩිගමුවේ ජී. සරෝලිස් පෙරේරා මහතා
திரு. ஜி. சரோலிஸ் பெரேரா, கொடிகமுவை
MR. G. SAROLIS PERERA, GODIGAMUWA

17. ද සොයිසා සිරිවර්ධන මයා. (වික්‍රමනායක මයා. වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. விக்ரமநாயக்க சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Wickramanayaka)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) වැල්මිල්ල හන්දියේ ගොඩිගමුවේ පදිංචි ජී. සරෝලිස් පෙරේරා මහත්මයාට ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිවාස ආධාර වශයෙන් දැනට රු. 100 ක් දී ඇති බවත්; (ii) ඉතුරු මුදල් තවම ගෙවා නැති බවත්; එතුමා දන්නවාද? (ආ) දෙපාර්තමේන්තුවේ සැලැස්මට වඩා ගෙය ලොකු නිසා ගෙවන්නට බැරි බව ප්‍රකාශ කිරීම අසාධාරණයක් නොවේද? (ඉ) ගෙය ලොකු කිරීමෙන් ඒ අනුව ගෙවීම් මේ අය බලපොරොත්තු නොවෙන නිසා, දෙපාර්තමේන්තුවේ සැලැස්මට දෙන ප්‍රමාණය දීමට එතුමා කටයුතු කරනවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) வெல்மில்லச் சந்தியில்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கொடிகமுவையில் வசிக்கும் திரு. ஜி. பெரேராவுக்கு காணி அபிவிருத்திக் கட்டளைச் சட்டத்தின் கீழ் வீட்டுப்படியாக தற்பொழுது ரூபா 100 வழங்கப்பட்டுள்ளதெனவும், (ii) எஞ்சிய தொகை இன்னும் வழங்கப்படவில்லையெனவும் அவர் அறிவாரா ? (ஆ) திணைக்களத்தின் வரிவடிவப் படத்திலும் பார்க்க வீடு பெரிதாக இருப்பதால் பணம் வழங்கப்பட முடியாதெனக் கூறுவது நியாயமில்லை என்பதை அறிவாரா ? (இ) வீட்டைப் பெரிதாக்கியதால் மேலதிக பணத்தை எதிர்பார்க்கவில்லையாகையால், திணைக்களத்தின் வரிவடிப்படத்திற்கிணங்க, வழங்கப்படும் தொகையை அளிப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா ?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware (i) that Mr. G. Sarolis Perera residing at Welmilla Junction in Godigamuwa has now been paid Rs. 100 as housing assistance under the Land Development Ordinance? (ii) that the balance money has not yet been paid? (*b*) Is he aware that it is unjust to state that no payment can be made as the house is bigger than provided for in the departmental plan? (*c*) As this person does not expect any extra assistance consequent on his building a larger house, will he take steps to pay him the amount payable on the departmental plan?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

(*a*) (i) Yes. (ii) Yes. (*b*) Normally allottees are expected to conform to the type plans in constructing their cottages, and only minor variations are allowed. (*c*) The Land Commissioner has since authorized the payment of the balance subsidies.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 20.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

Sir, the Answer to this question is not yet ready. I need one month's time to answer this Question.



**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

### BILLS PRESENTED

### ජාතික තරුණ ස්වේච්ඡා සේවා (සංශෝධන) පනත් කෙටුම්පත

தாமாகச் சேவை செய்ய முன்வரும் தேசிய இளைஞர் சேவை (திருத்த) மசோதா

VOLUNTARY NATIONAL YOUTH SERVICE (AMENDMENT) BILL

"to amend the Voluntary National Youth Service Act, No. 11 of 1967."

**පිළිගන්වන ලද්දේ රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍ය තුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම් ගරු ජේ. ආර්. ජයවර්ධන විසිනි. 1968 දෙසැම්බර් 6 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.**

கௌரவ ஜே. ஆர். ஜயவர்தன, இராஜாங்க அமைச்சரும், பிரதம அமைச்சரினதும், பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியும் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1968 டிசம்பர் 6, வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. J. R. Jayewardene, Minister of State, and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs; to be read a Second time upon Friday, 6th December* 1968, *and to be printed.*

### මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත

நிதி (திருத்த) மசோதா

FINANCE (AMENDMENT) BILL

"to amend the Finance Act, No. 11 of 1963."

**පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු යූ. බී. වන්නිනායක විසිනි. 1968 දෙසැම්බර් 6 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

நிதி அமைச்சர் கௌரவ யூ. பி. வன்னிநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1968 டிசம்பர் 6, வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப் பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. U. B. Wanninayake, Minister of Finance; to be read a Second time upon Friday, 6th December 1968, and to be printed*

## ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත

*காணி அபிவிருத்தி (திருத்த) மசோதா*

## LAND DEVELOPMENT (AMENDMENT) BILL

**කල් තබන විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 23.]**

**"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා.]**

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

நவம்பர் 23 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப்படுமாக" [கௌரவ சீ. பீ. டி சில்வா]

வினா, மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[23rd November]*

"That the Bill be now read a Second time."—[*The Hon. C. P. de Silva.*]

*Question again proposed.*

පූ. භා. 10.22

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹெரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, ඉඩම් සංවර්ධන ආඥා පනතට ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති සංශෝධන පිළිබඳව පැවැත්වෙන මෙම විවාදයේදී මා ඊයේ පෙන්වා දුන්නාක් මෙන්, මෙම සංශෝධන සම්මත කර ගනු ලැබීමෙන් පමණක් මේ රටේ ජනතාව බලාපොරොත්තු වන අන්දමට ඉඩම් ප්‍රතිපත්තියෙහි වෙනසක් කිරීමට පුළුවන්කමක් නැති බව ප්‍රකාශ කරන අතරම දැනට තිබේන ඉඩම් සංවර්ධන ආඥා පනතේ ඇති දුර්වලතා පිරිමසා ගැනීමට මෙය කිසිසේත් ප්‍රමාණවත් වන්නේ නැති බවද සඳහන් කරන්න කැමතියි. ඒ අතරම මා ඊයේ විශේෂයෙන් පෙන්නා දුන්නා, ගරු ඇමතිතුමාටත්, එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් බලතල ලැබෙන විට, ඒ බලතල පාවිච්චි කරමින් ඉඩම් බෙදීම සහ ඉඩම් බෙදීමේ ප්‍රතිපත්ති සකස් කිරීම ප්‍රාදේශීය කමිටුවලට පැවරීමෙන් මේ රටේ ජනතාවට පළල් ලෙස, පොදු ලෙස අයුක්ති සිදු වන බව. එසේ නම් ඉඩම් කච්චේරිවලින් තොරව, එමගින් ඉඩම් දීමට සුදුසු පුද්ගලයන් තෝරන්නේ නැතුව ඉඩම් බෙදා දීමට මෙම සංශෝධනවලින් ඇමතිතුමා ඉල්ලා සිටින බලය පැවරීමෙන් ඉතාමත් භයානක තත්ත්වයක් ඇති වන්න පුළුවන් බව පෙන්නා දෙන්න සිදු වී තිබෙනවා. ඇතැම් අවස්ථාවලදී, ප්‍රදේශයේ ග්‍රාම සේවකයන්, මහජන ආයතනවල නියෝජිතයන් ඉදිරියේ ප්‍රසිද්ධ වශයෙන් විභාග පවත්වා ඉඩම් බෙදා දුන්නත්, එබඳු අවස්ථාවලදීත් සත්‍ය කරුණු හෙළි නොවන බව පෙනී යනවා.

මේ අන්දමට සත්‍ය කරුණු අනාවරණය නොවීමෙන් නුසුදුසු පුද්ගලයන්ට ඉඩම් ලැබී ඇති අවස්ථා සිය දහස් ගණනක් අපට පෙන්වා දෙන්න පුළුවන් කම තිබෙනවා. ඒ විධියට ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීමේදී පවා නියම කරුණු අනාවරණය නොවනවා නම් මෙබඳු වගන්තියකින්, ඉඩම් කච්චේරිවලින් හැර අන් කිසි විධියකින් පුද්ගලයන් තේරීමට බලතල ගරු ඇමතිතුමාට පවරා දෙනවා නම් එබඳු ක්‍රියාවකට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට සිදු වන බව සඳහන් කළ යුතුමයි. ගරු කථානායකතුමනි, රජයේ ඉඩම් මේ රටේ ජීවත්වන මහජනතාවට අයත් ඉඩම්; පොදු ඉඩම්; සාංඝික ඉඩම් නොවුණත් ඒ හා සමාන ඉඩම්. කොටින්ම රජයේ ඉඩම් ජන සතු ඉඩම් වශයෙන් හඳුන්වා දෙන්න පුළුවනි. නමුත් රජය සතු, මහජනතාව සතු මෙම ඉඩම් කොල්ල කා ගැනීමේ ව්‍යාපාරයක් දැනට ගෙන යන බව සමහර විට තමුන්නාන්සේත් දන්නවා ඇති. එය එසේ නම්, මෙම මංකොල්ල කෑමේ ව්‍යාපාරය නැති කර සාධාරණ අන්දමට ඉඩම් නැති කාටත් ඉඩම් කැබැල්ලක් ලබාගැනීමට දැනට ඇති අවහිරකම් මගහැරලීමේ අදහසින් සංශෝධන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැලැස්මක් ඇති කර ගැනීම අපේ බලාපොරොත්තුව වුණත් ගරු ඇමතිතුමා, ඉඩම් කච්චේරි පැවැත්වීමේ ක්‍රමයට අතිරේකව වෙනත් ක්‍රමවලින් ඉඩම් දීමට පුද්ගලයන් තෝරා ගැනීමට බලතල ලබාගැනීමට උත්සාහ දැරීමෙන් ඉතාම භයානක තත්ත්වයක් අනාගතයේදී ඇති වන බව පෙන්වා දෙන්න සිදු වී තිබෙනවා.

එපමණක් නොවෙයි, වෙනත් වගන්තියකින් ඇමතිතුමා බලය ඉල්ලා තිබෙනවා නියෝගවලින් නියම කරනු ලැබිය හැකි පුද්ගල පන්තිවලට ඉඩම් සතු කර දීමට. ඉඩම් කච්චේරි පවත්වන්නේ නැතුව පුද්ගලයන්ට, පුද්ගල පන්තිවලට ඉඩම් සතු කර දීමට බලතල ඉල්ලා සිටිනවා නම්, ඒ අන්දමට ඉඩම් කච්චේරි නොමැතිව පුද්ගලයන්ට රජයේ ඉඩම් පවරා දීමට බලතල දීම හා පුද්ගල පංක්තිවලට ඉඩම් පවරා දීමට බලතල දීම මේ රටේ ඉඩම් ප්‍රතිප්‍රත්තියට ඉතාමත් භයානක ලෙසින් බල පෑ හැකි කාරණා වන බව මතක් කර දෙන්න කැමතියි. මෙබඳු බලතල ලබා දීම නිසා, දකුණු පළාත, බස්නාහිර පළාත, මධ්‍යම පළාත ඔය ආදී පළාත්වල ඉඩම් නොමැතිකමින් පෙළෙන විශාල ජනකායකට උතුර සහ නැගෙනහිර පළාත්වල ඉඩම් කැබැල්ලක්වත් ලබා ගැනීමට නොහැකි වී යන්න ඉඩ තිබෙනවා. මේ රටේ රජයේ ඉඩම් පිළිබඳව මහජනතාවට ඇති පොදු අයිතිය සම්පූර්ණයෙන්ම නැති වන්නට මේ අනුව පුළුවන්කම තිබෙනවා. එපමණක් නොව, මෙම පනත ක්‍රියාවේ යෙදීමෙන් පසු මේ රටේ මහ ජාතියට උතුරු නැගෙනහිර පළාත්වල එක බිම් අඟලකටවත් කිව්වු වන්නට බැරි විය හැකියි. මා ඊයේ කතා කරද්දී ගරු ඇමතිතුමා කිව්වා, "නැහැ, එහෙම දෙයක් සිදු වන්නේ නැහැ" යනුවෙන්. මෙම නීති ක්‍රියාවේ යොදවන්නේ එතුමා නොවෙයි. මෙම පනතේ හැටියට නිලධාරීන්ට ඉඩකඩ තිබෙනවා ප්‍රාදේශීය කොමිටි කියන අන්දමට එම ප්‍රතිපත්ති හදන්නට. යම් විධියකින් ඉඩම් දිය යුත්තේ ඉඩම් කච්චේරියක් පවත්වන්නේ නැතිවය කියා යාපනේ ප්‍රාදේශීය කොමිටිය කිව්වොත් ඒ කියමන දිසාපතිතුමා පිළිගනීවි. ඒ අනුව ඉඩම් බෙදීම සඳහා පුද්ගලයන් තෝරා ගනීවි. හැම දෙයක්ම ඇමතිතුමා අනුමත කළ යුතුයයි මෙහි සඳහන් වන්නේ නැහැ. අඩු වශයෙන් ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතියවත් ගන්නට වුව මනා වන්නේ නැහැ. එම නිසා ඒ ආකාරයට අනුමත කර ගෙන ඉඩම් බෙදා ගනීවි. එසේ කළ බව සමහරවිට අපි දන්නේත් නැහැ. ප්‍රාදේශීය කොමිටියත් දිසාපතිවරයාත් එකතු වී ඉඩම් කච්චේරියක් නොතබාම යම් ඉඩම් ප්‍රමාණයක් බෙදා දීම සඳහා මිනිසුන් තෝරා ගත්තායයි අපි සිතමු. එසේ තෝරා ගැනීම අවලංගු කරන්නට මෙම පනත යටතේ බලයක් තිබෙනවාද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

තිබෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මා පෙන්වා දෙන්නම් ඒ බලයේ සීමාව. අවුරුද්දක් ඇතුළත—

**මෛත්‍රීපාල සේනානායක මයා.** (මැදවච්චිය)
*(திரு. மைத்திரிபால சேனநாயக்க— மதவாச்சி)*
(Mr. Maithripala Senanayeke—Medawachchiya)

ඇයි අවුරුද්දකට සීමා කළේ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඉඩම් සංවර්ධන සංශොධන පනතේ 12 වන වගන්තියෙහි මෙසේ සඳහන් වෙනවා:

"ඉඩම් කච්චේරියකදී හෝ අන් ලෙසකින් දිසාපති විසින් කරන ලද තීරණයක් නිසා යම් තැනැත්තකු අවසර පත්‍ර දරන්නකු වශයෙන් ඉඩමක පදිංචිව සිටින අවස්ථාවක, ඒ තැනැත්තා ඒ ඉඩමේ පදිංචිව සිටි දිනයට පසුව වර්ෂයක් ඇතුළත, සාධාරණත්වය අනුව ඒ අවස්ථාවේදී එසේ කළ යුතුයයි ඉඩම් කොමසාරිස්ට හැඟේ නම් ප්‍රතිශෝධනය කිරීමෙන් දිසාපතිගේ තීරණය ඉඩම් කොමසාරිස් විසින් වෙනස් කළ හැකිය."

අවුරුද්දක් ඇතුළත වෙනස් කරන්නට පුළුවනි. එසේ නම් මා මෙම ප්‍රශ්නය අහන්නට කැමතියි: උතුරු පළාතේ ප්‍රාදේශීය කොමිටිය දිසාපතිතුමාත් සමඟ එකතු වෙලා යම්කිසි ඉඩම් බෙදීමක් කළ විට ඊට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

විරුද්ධව ඇමතිතුමාට පැමිණිලි කරන්නේ කවුද ? අවුරුද්දක් ඇතුළත නොවෙයි සම හරවිට කවදාවත් මේක එළිදරව් වන්නේ නැහැ. සමහරවිට අවුරුදු 4 ක් 5 ක් ගත වූවායින් පසු දැනගන්නට ලැබේවි. එත කොට අවලංගු කරන්නට බලයක් ඇත්තේ නැහැ. ඉඩම් කොමසාරිස්වරයාට මෙම පනත යටතේ අවුරුද්දකින් පසු අවලංගු කිරීමක් කරන්නට බැහැ. ඉඩම් කච්චේරි යක් නොපවත්වා යම්කිසි ඉඩම් ප්‍රමාණ යක් බෙදා දුන්නොත් ඒ ගැන ප්‍රසිද්ධයක් ඇති වන්නෙත් නැහැ. ඒ නිසා එම ඉඩම් බෙදා දුන් බව මහජනතාව දන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

මට අවස්ථාව දෙනවා නම් කාරණය පැහැදිලි කර දෙන්නට පුළුවනි. දිස්ත්‍රික් කොමිටියට බලයක් නැහැ, ඉඩම් දෙන හැටි නියම කරන්නට. 3, 4, 6 සහ 8 වන වගන්ති බලන්න. ඒජන්තවරයායි සැලැස්ම හදන්නේ. ඒ සැලැස්ම කෘෂිකර්ම කොමිටියට ඉදිරිපත් කරනවා. ඔවුන් ඒ ගැන රපෝර්තු කරන්නට ඕනෑ. ඊට පසු ඒජන්තගේ ප්ලෑනයි කෘෂිකර්ම කොමිටියේ රපෝර්තුවයි ඉඩම් කොමසාරිස්ට එවනවා. 6 වන වගන්තිය කියවා බලන්න. එත කොට කවුරුවත් කියන විධියට කටයුතු කරන්නට ඉඩම් කොමසාරිස්වරයාට වුව මනාවක් වන්නේ නැහැ. ඒජන්තවරයාගේ ප්ලෑනයි කෘෂිකර්ම කොමිටියේ රපෝර්තු වයි අරගෙන ඕනෑ දෙයක් කරන්නට ඉඩම් කොමසාරිස්වරයාට බලය තිබෙනවා. ඊට පසු ඒක මාරු කරන්නට බැහැ ඇමතිවරයාගේ අවසරයක් නැතුව.

කෘෂිකර්ම කොමිටියට බලයක් නැහැ ප්ලෑනක් හදන්නට. ඒජන්තවරයා හදන ප්ලෑන ගැන රපෝර්තු කරන්නට පුළුවනි ; අදහස් දක්වන්නට පුළුවනි. ඒජන්තවර යාගේ ප්ලෑන සහ කෘෂිකර්ම කොමිටියේ අදහස් අරගෙන කටයුතු කරන්නට ඉඩම් කොමසාරිස්ට සම්පූර්ණ බලය තිබෙනවා. ඊට පසු ගම් පුළුල් කිරීමට වෙන් කරන ලද ඉඩම් වෙන ක්‍රමයකට වෙනස් කරන්නට බැහැ. ගරු මන්ත්‍රීතුමා එළිදරව් කළ අදහස වැරදි බව මා ඊයේත් කිව්වා. දෙවන වරටත් එතුමා මේ ගැන සඳහන් කළ නිසයි තේරුම් කර දෙන්නට අදහස් කළේ. 4, 6, 7 සහ 8 වන වගන්ති බලන්න. ඒවායේ සම්පූර්ණ විස්තර තිබෙනවා. එම වගන්ති වලට අනුව කෙළින්ම, පැටලෙන්නේ නැතුව, කරුණු අවබෝධ කර ගන්නට පුළුවනි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**

මා කී දේ වන්නට ඉඩ නැති බව පෙන් වන්න උත්සාහ කරමින් ඇමතිතුමා පෙන්වා දුන්නේ එක පැත්තක් පමණයි. ප්‍රාදේශීය කෘෂිකාර්මික කමිටු දිසාපති තුමාට යම් යම් යෝජනා එවනවා යයි කීවා. මා එය පිළිගන්නවා. එහෙත් දිසාපති තුමාට එවන ඒ යෝජනා පිළිගෙන දිසාපති තුමා ඒවා ක්‍රියාත්මක කළොත්,, මේ පනත අනුව එය නවත්වන්නට පුළුවන්කමක් නැහැ. යම්කිසි අසාධාරණයක් වුණා නම් එය නැවැත්විය හැක්කේ යම්කිසි කාල සීමාවක් තුළදී පමණයි. එම කාල සීමාව අවුරුද්දකට පමණක් සීමා කර තිබෙනවා. එහෙත් එවැනි අසාධාරණයක් සිදු වී ඇති බව අවුරුද්දක් ඇතුළත හෙළි නො වුණොත් ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

කෘෂිකාර්මික කමිටුවල යෝජනා රපෝර්තු කරන්න දිසාපතිතුමාට පුළුවනි. ඒ යෝජනා භාර ගත යුතු යයි නීතියෙන් කියා නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**

ඇමතිතුමාගේ කීම මා භාර ගන්නේ නැහැ. ඉඩම් කච්චේරි පවත්වන්නේ දිසා පතිතුමායි. ඒ මිස ඉඩම් කොමසාරිස්තුමා එතැනට ගිහින් බලාගෙන ඉන්නේ නැහැ. ඉඩම් කොමසාරිස්තුමා කරන්නේ යෝජනා අනුමත කිරීම පමණයි. ඉඩම් බෙදා දිය යුත්තන්, ඉඩම් කච්චේරි පැවැත්වීමෙන් හෝ, ඇමතිතුමාගේ වචනවලින් කියනවා නම් "අත් ලෙසකින්" තෝරන්නේ දිසා පතිතුමායි. එහිදී යම්කිසි අසාධාරණයක් සිදු වුණොත් එය හෙළි වන්නේ කවදාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා කියන්නේ, එවැනි අසාධාරණයක් වී ඇති බව අවුරුදු 10 කට නැත්නම් 15 කට පසුව හෙළි වුණොත්, එදාට වුණත් ඒ අසාධාරණය නැති කිරීමට ක්‍රියා කිරීමේ බලය තිබෙන්නට ඕනෑ බවයි. එය අවුරුද්දකට පමණක් සීමා කළේ ඇයි? ඒ සීමාව බොහොම භයානකයි. එවැනි අසාධාරණයන් අවුරුද්දකින් හෙළි නොවන්න පුළුවනි. ඇමතිතුමා කරන ඒවාවත් අවුරුද්දකින් හෙළි වෙනවාද? ඉඩම් බෙදා දීමේදී ඇමතිතුමා කරන පෞද්ගලික සැලකිලිවලින් සමහරක් මේ ගරු සභාවේදී හෙළි වෙනවා. තවත් සමහර ඒවා කවරදාවත් හෙළි වන්නේ නැහැ. එතුමාගේ පෞද්ගලික දේවල් කියන්නට මා කැමති නැහැ. ඒ කොහොම වුණත්, යම්කිසි අසාධාරණයක් සිදු වී ඇත්නම් එය හෙළි වුණු දවසක ඒ ගැන ක්‍රියා කිරීමට ඉඩ තිබෙන්න ඕනෑ බවයි, මා කියන්නේ.

තමා ලංකා පුරවැසියකු බව හඟවා, බොරු පුරවැසි සහතිකයක් ඉදිරිපත් කොට ලංකා පුරවැසියකු නොවන්නෙක් ඉඩමක් ගත්තා යයි සිතමු. ඒ බව හෙළි වුණේ අවුරුද්දකට පසුව නම් ඒ ගැන ක්‍රියා කරන්නේ කොහොමද? මේ පනත අනුව එය අවලංගු කරන්න පුළුවන්කම තිබෙන්නේ, අවුරුද්දක් ඇතුළතදී හෙළි වුණොත් පමණයි. එම නිසා ඒ ගැන උසාවි යන්න සිදු වෙයි. මා නම් නීතිඥයෙක් නොවෙයි. එහෙත් අවුරුද්දකින් පසු එය අවලංගු කරන්නට බැරි බව නම් මා දන්නවා. එම නිසා සිදු වන්නේ, ලංකා පුරවැසියකු නොවන අර තැනැත්තාට ඒ ඉඩම පිළිබඳ හිමිකම එසේම තිබෙන්නට ඉඩ හැරීමයි. එම නිසයි මා කියන්නේ, මේ පනත ඉතාමත් සැලකිලිමත්ව සලකා බැලිය යුතුය කියා. මෙය නිකම් ඕනෑවට එපාවට ක්‍රියාත්මක කළ හැකි පනතක් නොවෙයි. මෙවැනි දුර්වලකම් රාශියක් මේ පනතේ තිබෙන නිසා, මේ පනතට විරුද්ධ වන්නට අපට සිදු වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මේ පනත ස්ථාවර කමිටුවකට ඉදිරිපත් කරනවා, වගන්තියක් වගන්තියක් පාසා සලකා බැලීම සඳහා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

සාකච්ඡා කළාට, සලකා බැලුවාට පමණක් මදි. යුක්තිසහගත, සාධාරණ සංශෝධන භාර ගන්නටත් ඕනෑ. එම නිසා, මුළු මන්ත්‍රී මණ්ඩලයම කාරක සභාවක් බවට පත් කොට, මේ පනතේ වගන්තියක් වගන්තියක් පාසා සලකා බලන්නට ඉඩ දෙන්න.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

මුළු මන්ත්‍රී මණ්ඩලයම කාරක සභාවක් බවට පත් කළොත් හුඟ දෙනෙක් කථා කරාවි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මේ මන්ත්‍රී මණ්ඩලයේදී කථා කරනවා හැරෙන්න වෙන මොනවාද කරන්නේ? මේ සංශෝධන ගෙන එන්නේ අවුරුදු 33 කට පසුවයි. එම නිසා මුළු මන්ත්‍රී මණ්ඩලයම කාරක සභාවක් බවට පත් කොට සලකා බලන්න බැරි ඇයි? කඩිමුඩියේ මෙය සම්මත කර ගන්නට තිබෙන හදිස්සිය මොකක්ද?

**ජෝර්ජ් රාජපක්ෂ මයා.** (මුල්කිරිගල)
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ—முல்கிரிகல)*
(Mr. George Rajapaksa—Mulkirigala)

හොර එළි වන නිසා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The hon. Member for Mulkirigala has been casting remarks about the Hon. Minister. It is very unfair. I think he is aware of the Standing Orders which say that if a Member wants to make a charge against another Member it should be on a substantive Motion.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

I shall bring a substantive Motion later, mentioning all that he has done.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Please do not interrupt the Chair.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

As it is I have done nothing. I am entitled to interrupt once in a while.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Please do not interrupt me when I am speaking. You are not entitled to interrupt me. You have been casting aspersions on the Hon. Minister—

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

I have not cast any aspersions on the Hon. Minister.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You have. Please listen to me. I would ask hon. Members kindly not to cast aspersions on any Member of this House.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එම නිසා, මුළු මන්ත්‍රී මණ්ඩලයම කාරක සභාවක් බවට පත් වී මේ පනතේ වගන්තියක් වගන්තියක් පාසා සලකා බැලීමට අවස්ථාව සලසා දෙන ලෙස මා ඉතා ඕනෑකමින් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එහෙම කරන්නට ඇමතිතුමා සතුටු නම්, ඒ කියන්නෙ පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවකට මේ පනත් කෙටුම්පත පැවරීමට සතුටු නම් අපේ කථා කෙටි කර කාරක සභා අවස්ථාවේදී කරුණු ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

That is, you want it to be considered by a Committee of the Whole House ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will you agree to it ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

A Committee of the Whole House now ?—[*Interruption*]. You cannot have two Second Reading Debates.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Not Second Reading ; they want to know whether the Bill can be considered by a Committee of the Whole House because if that is the case the speeches would not take long.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

If we finish the Second Reading by 12 o'clock.—[*Interruption*]. Otherwise, you stay, we stay, and we go on.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Carry on.

**ටි. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අවුරුදු 33 ක් තිස්සේ මේ රටේ ඉඩම් සංවර්ධන ආඥා පනත පුළුල් ලෙස සංශෝධනය කර නැහැ. දැන් මේ අවස්ථාවේදී එය සංශෝධනය කරනවා නම් රටටත් ජනතාවටත් ප්‍රයෝජනවත් වන පිළිවෙළට එම සංශෝධනය කිරීම අවශ්‍යයි. ඒ අනුව පළල් ලෙස සාකච්ඡා කර අපි මේක හරියට කරමු කියා අප කියන විට තමුන්නාන්සේලා 12 ට නවත්වනවා නම් අප ලැස්තිය කියනවා. මොකක්ද මේකෙ තේරුම? අප ඔය පැත්තේ සිටින කාලයේදී තමුන්නාන්සේලා යම් යම් කරුණු පිළිබඳව සති ගණන්, මාස ගණන්, කථා කළා මතකයි. එක් ගරු මන්ත්‍රීවරයෙක් වරක් පැය 11ක් තිස්සේ කථා කළා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
යෝජනාවට අදාළව.

**ටි. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අදාළව තමයි මා කථා කරන්නෙත්. අදාළකම තමුන්නාන්සේලාට ඕනෑ එකක් කර ගන්නට ඉඩ දී අප නිශ්ශබ්දව සිටීම ද? ඒකද අදාළකම? එම නිසා මේ තත්ත්වය ගැන අප තරයේම විරුද්ධ වෙනවා.

ගරු කථානායකතුමනි, මා නිදර්ශනයක් පෙන්වන්නම්. මගේ කොට්ඨාශයේ හාල්ග්‍රන්ඔය, රාගල, ස්ටැෆඩ් නම් වත්තක් රජයට ගත්තා. රජයට ගෙන ඉඩම් කච්චේරියක් පවත්වා ඒ ඉඩම් මහජනතාවට බෙදා දුන්නා. නමුත් එසේ බෙදා දුන්නාට පසුව පුරවැසියකම නැති, ඉඩම් ලැබීමට සුදුසු නැති පුද්ගලයකු ඇවිත් අර ඉඩමක හදිසියෙන්ම බලහත්කාරයෙන් ගෙයක් සෑදුවා. නමුත් ඒ පුද්ගලයා ඒ ඉඩමෙන් එළියට දමන්නට අද වන තෙක් ඉඩම් කොමසාරිස්වරයාට පුළුවන් වී නැහැ. දැන් මේ පනත් කෙටුම්පත සම්මත වුණාම මොකද වෙන්නෙ? මෙපමණ කල් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ එවැනි පුද්ගලයින්ට විරුද්ධව නඩු දමා ඒ ඉඩම්වලින් එළියට දමන්නට ඉඩම් කොමසාරිස්තුමාට බලය තිබුණා. නමුත් මේ පනත් කෙටුම්පත සම්මත වූවාට පසු ඉඩම් කොමසාරිස්තුමාට තිබෙන ඒ බලය නැතිවෙනවා. මක්නිසා ද, එවැනි අවස්ථාවලදී අවුරුද්දක් ඇතුළත ක්‍රියා කරන්නට ඕනෑ. නමුත් අර මිනිසා බලහත්කාරයෙන් ඒ ඉඩම අල්ලා ගෙන දැනට අවුරුදු තුන හතරක් ගත වී තිබෙනවා. ඒ අනුව ඇත්ත වශයෙන්ම මේ වගන්තියට අනුකූලව දැනට බලහත්කාරයෙන් ඉඩම්වල පදිංචිවී සිටින නොරටුන්ට ඒ ඉඩම් ලැබීම නීත්‍යනුකූල වෙනවා. ඇමතිතුමා මේ තත්ත්වය ගැන කල්පනා කළ යුතුයි.

සමහර විට ඇමතිතුමා අසුවල් දිනට පෙර බලහත්කාරයෙන් ඉඩම්වල පදිංචිවී සිටින උදවියට ඒ ඉඩම් දිය යුතුය කියා චක්‍ර ලේඛන යවනවා. පළමුවෙන්ම තමන්ගේ කොට්ඨාශවලින් මිනිසුන් ගෙන ගොස් ඔය හිඟුරක්ගොඩ, මැදිරිගිරිය, වලවේ ආදී ප්‍රදේශවල පදිංචි කරවනවා. ඉන්පසු යම්කිසි කාලසීමාවක් ගත වන තෙක් බලා ගෙන ඉන්නවා. බලා ගෙන සිට, අසුවල් දිනට පෙර බලහත්කාරයෙන් පදිංචි වී සිටින මිනිසුන්ට ඒ ඉඩම් දීම සුදුසුය, ඒ අනුව ඒ ඉඩම් දෙන්නය කියා චක්‍ර ලේඛනයක් යවනවා. නමුත් එවැනි චක්‍ර ලේඛන ක්‍රියාත්මක වන්නේ සමහර විට යම් යම් ප්‍රදේශවල පමණයි. අනික් ප්‍රදේශවල මිනිසුන් පිළිබඳව එවැනි චක්‍ර ලේඛන ක්‍රියාත්මක වන්නේ නැහැ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ 1960 සිටම බලහත්කාරයෙන් පදිංචිවී සිටින, ඉඩම් ලැබීමට සුදුසු, බෙදා දිය හැකි ඉඩම්වල පදිංචිවී සිටින කිසිවකුට අද වන තෙක් ඒ ඉඩම්වල පදිංචියට බලපත්‍ර ලැබී නැති බව මා වගකීමක් ඇතිව ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේට පුළුවන් නම් අසුවල් ඉඩම් අසුවල් උදවියට දී තිබෙනවාය කියා ලැයිස්තු ඉදිරිපත් කරන ලෙස මා අභියෝග කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා ඒ ගැන සොයන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. තමුන්නාන්සේ අද දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ දෙන්නට බැරි ඉඩම්වල බලහත්කාරයෙන් පදිංචිවී සිටින, ඉඩම් ලැබීමට නුසුදුසු එකම පුද්ගලයකුවත් ඒ ඉඩම්වලින් පිට කරන්නට ක්‍රියා කර නැහැ. ඒ කියන්නේ ආණ්ඩුවට අත්‍යවශ්‍ය ඉඩම්වල, සමහර විට වෙන් කළ ඉඩම්වල පුරවැසිකමවත් නැති උදවිය පදිංචිවී සිටිනවා. දැනට අවුරුදු දහයක් දොළහක් තිස්සේ ඔවුන් ඒ ඉඩම්වල පදිංචි වී සිටිනවා. ඔවුන් එක් කෙනෙකුවත් එළියට දමන්නට තමුන්නාන්සේ අද දක්වා ක්‍රියා කර නැහැ. නමුත් තමුන්නාන්සේ එක්තරා ප්‍රදේශයකින්—මම නම කියන්නෙ නැහැ—යම් පිරිසක් ගිහින් බලහත්කාරයෙන් පදිංචි වී සිටියා නම් කිසිම කථාවක් නැතිව ඒ පිරිසට ඒ ඉඩම් දෙනවා. ඇයි මේ දෙබිඩි ප්‍රතිපත්තිය? කොටසකට පමණක් මේ විධියේ කුඩම්මාගේ සැලකිල්ලක් දක්වන්නේ ඇයි? සමහර අය ඉඩම්වල පදිංචි වුණාම බලපත් ලැබෙනවා, සමහර අයට නැහැ. මගේ කොට්ඨාශයේ ඉඩම් දීම සඳහා ඉඩම් කච්චේරි මාර්ගයෙන් නීත්‍යනුකූලව තෝරා ගනු ලැබූ සමහර අයට අවුරුදු 5ක් 6ක් තිස්සේ ඒ ඉඩම් සඳහා අවසර පත් නොදී තිබෙනවා. ඉඩම් කච්චේරි මාර්ගයෙන් සුදුසු අය තෝරා ගත් නමුත් ඔවුන්ට ඉඩම්වල බලපත්‍ර දෙන්නේ නෑ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා ඒ ගැන සොයා බලනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

හෙච්චාට පමණක් මදි. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නත් ඕනෑ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා ඒවා හරිගස්සනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

හරිගස්සනවා නම් බොහෝම හොඳයි. එහෙත්, මෙවැනි තත්ත්වයක් තිබියදී, මෙම පණතෙහි සඳහන් "අවලංගු කිරීම අවුරුද්දකට සීමා කළ යුතුය" යනුවෙන් කියැවෙන වගන්තිවලට අප එකඟ වන්නේ කොහොමද? අප කියන්නේ, යම් අසාධාරණයක් සිදු වූ බව දැනගත් දවසේම ඒ සම්බන්ධව ක්‍රියා කිරීමේ බලය කොමසාරිස් තුමාට තිබිය යුතු බවයි.

ඊළඟට, ඉඩම් තක්සේරුව සම්බන්ධයෙන් කරුණු කීපයක් මා තමුන්නාන්සේට මතක් කළ යුතුයි. පතන් ඉඩම් සම්බන්ධයෙන් සිදු වී තිබෙන අසාධාරණය ගැන මා ගරු ඇමතිතුමාට කීපවරක්ම පැමිණිලි කර තිබෙනවා. මේ පතන් බිම්, කිසිවක් නොවැවෙන ගල් ගොඩවල්. එවැනි ඉඩම් සඳහා එක්කෙනකුගෙන් අවුරුද්දකට රු. 2 ක බද්දක් අය කරන අතර එතැනම, ඒ විධියේම, ඊට යාබද ඉඩම සඳහා තව කෙනකුගෙන් රු. 10 ක වාර්ෂික බද්දක් අය කරනවා. එවැනිම තවත් ඉඩමක් වෙනුවෙන් වෙනත් කෙනකුගෙන් රුපියල් 20 ක බද්දක් අය කරනවා. මේ විධියේ ප්‍රශ්න රාශියක් මා මෙම ගරු සභාවෙහිදීම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කළා. මෙය බලවත් අසාධාරණයක් බව මේ සම්බන්ධව ඇමතිතුමා සමග අප සාකච්ඡා කළ අවස්ථාවේදී පෙන්වා දුන්නා. මේ ආණ්ඩුව ඇති වුණාට පසුව පමණක් නොව, අපේ ආණ්ඩුව තිබෙන කාලයේදීත් ගරු ඇමතිතුමා මේ වැරදි හරිගස්සන බවට පොරොන්දුවක් අපට මෙම ගරු සභාවේදීම දුන්නා. ආඥාපණත සංශෝධනය නොකර ඒ වැරදි නිවැරදි කරන්නට බැරි නිසා ආඥාපනත සංශෝධනය කරන බවට ඇමතිතුමා පොරොන්දු වුණා. එහෙත්, කෝ ඒ පොරොන්දුව ඉෂ්ට කරන වගන්තිය? ඇමතිතුමාට පුළුවන් නම් එවැනි වගන්තියක් මේ පණතෙහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට පෙන්වන්න. එදා අපට දුන් පොරොන්දුව ඇමතිතුමා සම්පූර්ණයෙන්ම අමතක කළා.

මේ ඉඩම් තක්සේරු කරන්නේ කවුද? ඉඩම් ආණ්ඩුවට ගන්න විට නම් ඒවා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කෙරෙනවා. එහෙත්, කච්චිකරුවකුට ඉඩමක් දෙන විට එය තක්සේරු කරන්නේ ගම්මුලාදෑනියා හෝ ග්‍රාම සේවක. ඔහු එක් එක්කෙනාගේ මූහුණ බලා ඉඩම තක්සේරු කරනවා. එකම විධියේ ඉඩම් සඳහා එක්කෙනකු රු. 2 කුත්, තව කෙනකු රු. 10 කුත්, තවත් කෙනකු රු. 20 කුත් බදු ගෙවන්නේ ඒ නිසායි. වැඩිපුර බදු අය කෙරෙන්නේ සංවර්ධනය වුණු ඉඩම්වලින්යයි සමහර විට ඇමතිතුමා කියයි. එහෙත්, ඒවායෙහි කිසිම සංවර්ධනයක් නැහැ. සංවර්ධනය වී තිබෙන්නේ තණකොළ පමණයි. සමහර ඉඩම්වල තණකොළවත් වැවෙන්නේ නැහැ. මෙවැනි වැරදි වහාම නිවැරදි කළ යුතු බව අප තමුන්නාන්සේලා දෙගොල්ලම අවිවාදයෙන් පිළිගත යුතුයි.

මා මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. තව කරුණක් දෙකක් පමණක් පෙන්වා දී මගේ කථාව නතර කරනවා. සිදු වී තිබෙන මේ වැරදි හරිගැස්සීම සඳහා කාරක සභා අවස්ථාවේදීවත් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කොට, අසාධාරණයත් සිදු වී තිබෙන උදවියට සාධාරණය ඉෂ්ට කර දීමට මාර්ගයක් යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඉඩම් සංවර්ධනය සඳහා වෙන් වුණු මුදල් පාවිච්චි කිරීම සම්බන්ධවත් වචනයක් කිව යුතුව තිබෙනවා. ඒවා පාවිච්චි කෙරෙන්නේ පුදුම විධියට. සමහර කොට්ඨාශවල ඉස්කෝල ගොඩනැගිලි, මහා විද්‍යාල, පාරවල්, ජල සම්පාදන ක්‍රම දෙගුණ වී තිබෙන අතර සමහර කොට්ඨාශවලට ඉඩම් කෑල්ලක් දී තිබෙනවා පමණයි. ඒවායේ මිනිසුන්ට ගෙවල්වත් බොන්න වතුර ටිකවත් නැහැ. මගේ කොට්ඨාශයෙහි, පළල්පතන, අඹලියද්දැතැන්නවත්ත, මයිලගාවතැන්න යනුවෙන් ජල යෝජනා ක්‍රම 3ක් තිබුණා. ඒ සඳහා ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත් දී බාගෙට වැඩ කරගෙන ගිහින් තිබුණා. ජල නළ පවා බාගෙට සවි කර තිබුණා. එහෙත් මොකද වුණේ? 1965 දී ඉඩම් ඇමතිතුමා පිල් මාරු කොට එහා පැත්තට ගියායින් පසු ඒ වැඩ සම්පූර්ණයෙන්ම නතර වුණා. අවුරුදු 10ක් 12ක් තිස්සේ බොන්න පවා වතුර නැතිව බලා සිටි මේ ප්‍රදේශයේ මිනිසුන්ට ලැබුණු ජල යෝජනා ක්‍රම තුනේම වැඩ නතර වුණා. දැන් පයිප්ප හොරුන් ගෙන ගිහින්; කොන්ත්‍රාත්කාරයන් කොහේද කියා නැහැ. එක් අතකින් ආණ්ඩුවේ මුදල් නාස්ති වුණා. අනෙක් අතින් ඒ ප්‍රදේශයේ අහිංසක මිනිසුන් අමාරුවේ වැටුණා. මේ විධියටයි, තමුන්නාන්සේ වැඩ කරන්නෙ. එපමණක්ද? තමුන්නාන්සේ දන්නවා, බොලගංදුවල ව්‍යාපාරය ගැන. ඒ ව්‍යාපාරය ඉතා වැදගත් එකක් හැටියට තමුන්නාන්සේ සලකනවා. මඩුලුඔය ව්‍යාපාරයේ හතර වැනි පියවරයි, බොලගංදුවල ව්‍යාපාරය. බොලගංදුවල ව්‍යාපාරයට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් හැතැප්ම 7 ක පාරක් කපන්නට පටන්ගත්තා. හැතැප්ම 2 ක් පමණක් කපා දැන් ඒ පාරේ වැඩ නවත්වා තිබෙනවා. ඒ පාරේ වැඩ නැවැත්තුවේ විරුද්ධ පාර්ශ්වයට ඒ ආසනය ගිය නිසාද කියා මා අහනවා. එහෙම නොවෙයි නම් මොකක්ද හේතුව? මඩුලුඔය ව්‍යාපාරයේ වැඩ තමුන්නාන්සේ නවත්වා නැහැ. ඇත්ත කියන්නට අප ලෑස්තියි. ඉලුක් පැලැස්ස, කීනවල ඇළවල වැඩ කර ගෙන යනවා. එහෙත් බොලගංදාවල ව්‍යාපාරයට යාමට කපාගෙන ගිය පාරේ වැඩ අතරමග නවත්වා තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම ඒ ගැන හොයන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඒ විධියට පාරේ වැඩ නැවැත්වීම නිසා ඒ ව්‍යාපාරයට යාමට--ඒ ව්‍යාපාරයට වුවමනා බඩු ගෙන යාමට—හැතැප්ම 7ක් දුර පයින් යන්නට සිද්ධ වෙලා තියෙනවා. මේවා පලිගැනීම්. [බාධා කිරීමක්] හෙන ගහන අපරාධය කියා එක මන්ත්‍රීතුමෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

කියනවා. ඒකත් ඇත්තයි. මහජනයා ගෙන් මේ විධියට පලිගන්නට එපාය කියායි අප කියන්නේ.

තමුන්නාන්සේලා අතරම ඉන්න සම හර ඇමතිවරුන් අපෙන් සහයෝගය ලබා ගෙන වැඩ කරගෙන යනවා. කළ යුතු දේ කරන්නට ඒ ඇමතිවරුන් දන්නවා. ඒ ඇමතිවරුන්ට අපි අපේ සම්පූර්ණ සහ යෝගය දෙනවා. තමුන්නාන්සේ කරන් නෙම මේ විධියේ වැඩයි. ඒ පාර කැපීම නවත්වා තිබෙනවා. බොන්නට දීපු වතුර ටික දීම නවත්වා තිබෙනවා. අවුරුද්දේ 365 දවසේම වැස්ස තියෙන රාගල වැනි පළාත්වල, අපේ ආණ්ඩුව තියෙන කාල යේදී, ටකරම් බෙදුවා, ගෙවල් සෙවිලි කර ගන්නට. ඒකත් සම්පූර්ණයෙන් දුන්නෙ නැහැ. තුනෙන් දෙකයි වහගන්නට පුළු වන්. අනික් තුනෙන් එක තෙමෙනවා. මේ ආණ්ඩුව බලයට ආපු හැටියෙම ඒක නැවැත්තුවා. දැන් එක ටකරමක්වත් දෙන්නෙ නැහැ. මේකයි, තමුන්නාන්සේ ගේ ප්‍රතිපත්තිය. මේ දුෂ්කරතා සියල්ල ලම නැති කරනවාය, සින්නක්කර ඔප්පුව ගෙදරට එවනවාය කියා තමුන්නාන්සේලා කිව්වා. දැන් එවා තියෙනවා සින්නක්කර ඔප්පුව. කොහොමද ඒවා තියෙන්නේ? ලංකා දුම්කොළ සමාගමට අක්කර දාහක් නොමිළයේ දුන්නා. එදා වේල කන්නට නැති පුංචි බණ්ඩාට කියනවා, ඉඩමට සින් නක්කර ඔප්පුව දෙන්නට රුපියල් දාහක් දෙන්නය කියා. හරි සාධාරණ ප්‍රජාතන්ත්‍ර වාදී ප්‍රතිපත්තිය. ප්‍රජාතන්ත්‍රවාදී පමණක් නොවෙයිලු, දැන් සමාජවාදීත් වෙලාලු.

තමුන්නාන්සේ සමහර ජනපදවල බංගලා වගේ ගෙවල් හදනවා. සමහර ජනපදවලට මුකුත් නැහැ. නිකම්ම මිනි සුන් ගිහින් දමනවා. මිනිහෙක් කුකුළකු හදනවා නම් කුකුළටත් කූඩුවක් හදනවා. තමුන්නාන්සේ ඉඩම් දෙනවාය කියා පත නකට මිනිසුන් ගිහින් දමනවා. ඒ මිනි සුන්ට වතුර ටිකත් නැහැ, පාරත් නැහැ, ඉන්නට ගෙයත් නැහැ. පතන්වලට මිනි සුන් දමා, මම මේ තරම් ඉඩම් බෙදා තිබෙ නවා, මෙන්න වාර්තාව කියා පෙන්වනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ලංකාවෙ හැම තැනම එක සැලැස්මයි. කොහේවත් වෙනස් කර නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේ මේ ගරු සභාවේදී මට පොරොන්දුවක් දී තිබෙනවා. ඒක තිල වාර්තාවෙන් පෙන්වන්නම්. මඩුලු ඔය ව්‍යාපාරයේත්, පොළොන්නරුවේ, හිඟුරක් ගොඩ වගේ ගෙවල් හදා, කුඹුරු ඉඩම් සහ ගොඩ ඉඩම් දී මිනිසුන් පදිංචි කරනවාය කියා තමුන්නාන්සේ කිව්වා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඩී. එස්. සේනානායක අගමැතිතුමාගේ කාලයේදී පොලොන්නරුවේ ගෙවල් හැදුවා. දැන් හදන්නෙ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

දැන් මයියංගනේ හසලක හදන්නෙ නැද්ද? ගෙවල් හදා නොවෙයිද මිනිසුන් පදිංචි කරවන්නෙ? [බාධා කිරීමක්] එහෙමනම් තමුන්නාන්සේ කියයි, මේ පහසුකම් සියල්ලක්ම දෙන්නේ ඉස්සර ඉපදුණු මිනිසුන්ට පමණක්ය කියා. තමුන්නාන්සේ ඉපදුනේ සමහරවිට 1900 යේ වෙන්නට පුළුවන්. 1900 න් ඉස්සර ඉපදුණු මිනිසුන්ට පමණයි, මේ පහසුකම් දෙන්නේ, අනික් මිනිසුන්ට ඒවා දෙන්නේ නැහැ කියා තමුන්නාන් සේ කියන්නට පුළුවන්. ඒකද තමුන් නාන්සේගේ ප්‍රතිපත්තිය?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉඩම් කච්චේරිවලදී පොරොන්දු වුණු අයට පමණයි, දෙන්නේ. ඒක 1962 දි නැවැත්තුවා. ඊට පස්සෙ දෙන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

මා අහන්නෙ මේකයි. හැතැප්ම 7 ක්, 8 ක් පයින් යායුතු තැනක ඉඩම් අක්කරයක් දී, ගෙයක් හදා දෙන්නේ නැතිව එතැන මිනිසුන් පදිංචි කරවනවාට වඩා නරකද, ඒ මිනිහාට පතරොමක් පාවිච්චි කිරීම? මොකක්ද මෙහි තේරුම? දරුවන් හත් අට දෙනා සිටින සම හර පවුල් ගෙන ගොස් දමනවා. ඔවුන් කොහොමද ජීවත් වන්නෙ? සශ්‍රීක ඉඩම් ලබා දෙනවා නම්, පාර අයිනේ ඉඩම්, වතුර තිබෙන ඉඩම් ලබා දෙනවා නම් මිනිසුන්ට ඒවායේ ජීවත් වෙන්න පුළුවනි. අර බලපිටිය ප්‍රදේශයේ ඉඩම්වල නම් මිනිසුන් බලෙන්ම ගොස් පදිංචි වෙනවාලු. අවුරුද්දක් ගත වන විට ඒ අය ස්ථිර පදිංචිකරුවන් බවටත් පත් වෙනවාලු. නමුත් මේ නීත්‍යානුකූලව ගොස් පදිංචි වෙන පවුල් අතරමං වෙනවා.

ගරු කථානායකතුමනි, මගේ ප්‍රදේශයේ කඹුගේ කියා ස්ථානයක් තිබෙනවා. ඒ ස්ථානයේ දවසින් දවසම නාය යනවා; පස් කඩා ගෙන යනවා. ආහාර ඇමතිතුමාත් මේ ගැන දන්නා නිසා එතුමාත් මගේ අදහසට එකඟ වෙනවා ඇති. තිබ්බොටුගොඩ ප්‍රදේශයේ කඹුගේ කියන ස්ථානයේ දැන් කාලයක සිටම මෙය සිදු වෙනවා. ඇමතිතුමාට අපි හැමදාමත් කියනවා, මේ ස්ථානයේ සිටින මිනිසුන් මැරෙන්න කලින් කොයි ස්ථානයකට හෝ යවන්නය කියා. අපේ ආණ්ඩුව තිබෙන කාලයේ දීත් කිව්වා. මේ ආණ්ඩුව තිබෙන කාලයේ දීත් කියනවා. අපි දන්නවා හසලක ව්‍යාපාරයට පවුල් ගණනාවක් ගෙන යන්න යෙදුනා. නමුත් වලපනේ කොට්ඨාශයෙන් නම් කිසිම පවුලක් ඒ සඳහා තෝරා ගෙන නැහැ. වලපනේ උදවියගෙන් කිසිම කෙනෙක් ඒ ව්‍යාපාරයට ගෙනයන්න කැමති නැහැ. අනික් කොට්ඨාශවල සිටින උදවිය නම් ඒ සඳහා තෝරා ගත්තා. තමුන්නාන්සේලාගේ ආධාරකරුවන් කියනවාලු, වලපනේ මන්ත්‍රීතුමා විසින් එම ව්‍යාපාරය නවත්වා දමා තිබෙනවාය කියා. ගරු කථානායකතුමනි, ආණ්ඩුවේ ව්‍යාපාර නැවැත්වීමට මට පුළුවන්කමක් තිබෙනවාද? එහෙම නම් මමත් සෑහෙන මිනිහෙක් තමයි. තමුන්නාන්සේලා ගෙන යන ව්‍යාපාර නවත්වන්න මට පුළුවන්කමක් නැහැ. මා කියන්නේ හසලක ව්‍යාපාරයට හෝ මොන ව්‍යාපාරයට හෝ ගෙන ගොස් මේ මිනිසුන් මරණයෙන් බේරා ගන්නය කියායි. මේ මිනිසුන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. ගරු ඇමතිතුමාගේ ඉඩම් ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදවන්නේ ඔන්න ඔය ආකාරයටයි. මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ තමුන්නාන්සේගේ ඉඩම් ප්‍රතිපත්තිය මුළු රටටම සාධාරණව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පනතක් ඇති කිරීමට නම් මුළු සභාවේම කාරක සභාවකට මේ සංශෝධන පනත ඉදිරිපත් කර සංශෝධනය කිරීමට අවස්ථාවක් සලසා දෙන ලෙසයි. අපට මේ පනතට සම්පූර්ණ සහයෝගය දිය හැක්කේ එවිටයි. මේ ප්‍රශ්න නියම අන්දමට විසඳන්න නම් මුළු සභාවේම කාරක සභාවකට මෙය ඉදිරිපත් කර හැම දෙනෙකුගේම කැමැත්ත මේ පනතට ලබා ගත හැකිවනසේ මෙය සකස් කරන්න. එය පුද්ගලිකව නොව මුළු රටටම කරන සේවයක් වශයෙන් සලකා තමුන්නාන්සේ එය ඉටුකරනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. මා මීට වැඩියෙන් කතා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. කරුණාකර මෙය මුළු සභාවේම කාරක සභාවකට පවරා සාකච්ඡා කිරීමට අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

පූ. භා. 10.55

**රත්නායක මයා.**

*(திரு. ரத்நாயக்க)*

(Mr. Ratnayake)

ගරු කථානායකතුමනි, මේ රටට බලපාන ඉතාමත් වැදගත් ප්‍රශ්නයක් වන ඉඩම් ප්‍රශ්නයට අදාළ පනතක් සංශෝධනය කරන අවස්ථාවේදී වැදගත් කරුණු රාශියක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙහිදී වගන්තියක් වගන්තියක් පාසා කරුණු ඉදිරිපත් කිරීමට මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලාපොරොත්තු නොවන බව පළමුවෙන්ම කියන්න කැමතියි. ඊට හේතුව එසේ කරන්න ගියොත් කාල වේලාව වැඩියෙන් ගත වන නිසයි. මා මේ අවස්ථාවේදී ඉතා මත් කරුණාවෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. එනම් මේ සාකච්ඡා කරන්නේ ඉතාමත් වැදගත් පනතක් නිසා, ඉතා මත් වැදගත් සංශෝධන රාශියක් ඉදිරිපත් කර තිබෙන නිසා, කාලය ගැන බලන්නේ නැතිව මෙම විවාදයෙන් පසුව මෙම සංශෝධන පනත මුළු සභාවේම කාරක සභාවකට පවරන ලෙසයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

හොඳට පරීක්ෂා කරන්න නම් ස්ථාවර කොමිටියකට පවරන්න ඕනෑ.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)

කෙසේ වෙතත් ගරු කථානායකතුමනි, මෙම පනතට සංශෝධන රාශියක් ගෙන එන්නට සිදු වෙන බව මගේ හැඟීමයි. මුළු සභාවේම කාරක සභාවකට මෙය පවරන්නය කියා අපි ඉල්ලා සිටින්නේ ඒ නිසයි. ගරු කථානායකතුමනි, මේ සංශෝධන පනත ඉතාමත් අවශ්‍ය පනතක්. මෙය අවශ්‍යව තිබුණේ දැනට අවුරුදු ගණනාවකටත් කලිනුයි. දැන් තිබෙන ඉඩම් සංවර්ධන ආඥා පනතේ අඩුපාඩුකම් රාශියක් තිබෙනවා. එය මුලින් සකස් කරන අවස්ථාවේදී අද රටේ තිබෙන ප්‍රශ්න වැනි ප්‍රශ්නවල අපට මුහුණ දෙන්න සිදු වුණේ නැහැ. නමුත් ක්‍රම ක්‍රමයෙන් රට දියුණු වීමත් සමගම යම් යම් අළුත් ප්‍රශ්න පැනනැග තිබෙන නිසා සංශෝධන කිරීම ඉතාමත් අවශ්‍යයි. ගරු ඇමතිතුමාගේ ප්‍රකාශනයේදී කිව්වා වාගේම මේ සංශෝධනය කළ යුතුය යන අදහස ඇති වී ඇත්තේ 1956 දී බව මාත් පිළිගන්නවා. එය ක්‍රියාත්මක කිරීම සඳහා තමුන්නාන්සේ එදත් ඉඩම් ඇමතිවරයා වශයෙන් සිටිද්දී වැඩ පිළිවෙළක් පටන් ගත්තා. ඉඩම් සින්නක්කර දීමේ වැඩ පිළිවෙළ ගැන පරීක්ෂා කර බැලීමට fපාමර් නමැති මහත්මයකුගේ නායකත්වයෙන් කොමිෂන් සභාවක් පත් කළා. ඒ කොමිෂන් සභා වාර්තාවට මොනවා වුණාදැයි දන්නේ නැහැ. බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවේ ඉඩම් ඇමතිවරයා වශයෙන් සිටියේත් මේ ඉඩම් ඇමතිවරයාමයි. රජයේ බදු ඉඩම් සින්නක්කර දිය යුතුය කියන යෝජනාව ඒ අවස්ථාවේදීත් මතු වුණා. එහෙත් එය ක්‍රියාත්මක වුණේ නැති බව කනගාටුවෙන් කිව යුතුයි. ගරු මන්ත්‍රීවරුනුත් මහජනයාත් මේ ඇමතිවරයාට දොස් නගන්නේ ඒ නිසයි. 1958 ඇති කර ගත් අදහස මේ වනතුරුම ක්‍රියාත්මක කරන්නට බැරි වීම ගැනයි, අප කනගාටු වන්නේ. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය භාරව සිටි පසුගිය ආණ්ඩුවේ අගමැතිනිය, අනුරාධපුර නව නගරයේ ඉඩම් සින්නක්කර දීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා 1964 දී සාකච්ඡාවක් ඇති කළා. ඒ සාකච්ඡාවට ඉඩම් ඇමතිවරයාත්, එවකට නිවාස ඇමතිවරයා වශයෙන් සිටි වර්තමාන මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමාත් (එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.) ඉඩම් කොමසාරිස්තුමාත්, නීතිපතිතුමාත්, අනුරාධපුර කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් මාත් සහභාගි වුණා. අරලියගහ මන්දිරයේදී ඒ සාකච්ඡාව පැවැත්වුණු දිනය මට හරියට මතක නැහැ. 1968 ජූලි මාසයේ හෝ අගෝස්තු මාසයේ හෝ එය පැවැත්වුණු බව නම් කියන්නට පුළුවනි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

1962 සිටම මා මේ ගැන "කැබිනට් පේපර්" එකක් ඉදිරිපත් කර තිබුණා.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)

එහෙම කියනවා නම් පිළිගන්නම්. එහෙත් මේ බදු ඉඩම් සින්නක්කර කර දීමට වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යන බවක් අපට හෝ මහජනයාට හෝ දැන ගන්නට ලැබුණේ නැහැ. ඇත්තෙන්ම මේ සංශෝධන පනත වුවත් ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළ යුතුව තිබුණේ මේ ආණ්ඩුව බලයට පත් වුණු හැටියේ'මයි. බණ්ඩාරනායක යුගයේදී බදු ඉඩම්කාරයන්, බදු ඉඩම්කාර යන් වශයෙන් ම තබාගෙන සිටි බවත්, තමන් බලයට පත් වුණු විට ඒ බදු ඉඩම් සින්නක්කර කර දෙන බවත් 1965 මහා මැතිවරණ සමයේදී විශේෂයෙන්ම ඉඩම් බහුලව තිබෙන උතුරු මැද පළාතේදීත්, වයඹ පළාතේදීත් එක්සත් ජාතික පක්ෂ යේ උදවිය ප්‍රකාශ කළා. ඒ කාලයේ ඔය හවුල් ආණ්ඩුවක් ගැන කථා කෙළේ නැහැ. තමන් ඉඩම් ඇමති වශයෙන් පත් වන බවයි, වර්තමාන ගමනාගමන ඇමති වරයා එදා කීවේ. එහෙත් අද සිදු වී තිබෙන දේ අප කවුරුනුත් දන්නවා. මේ ඉඩම් සින්නක්කර කර දීමේ අදහස ගැන 1965 රාජාසන කථාවේ නම් සඳහන් කළා. එහෙත් එදා සිට අද දක්වා අවුරුදු හත රක් ගත වී ඇතත් තවමත් එය ක්‍රියාත් මක කර නැහැ. මේ ආණ්ඩුවේ පාලන කාල සීමාව තුළදී මෙය ක්‍රියාත්මක වෙතැයි හිතන්නට බැහැ. 1970 මහා මැතිවරණය පවත්වන තුරුම මෙය ක්‍රියාත්මක කරන් නට ලැබේදැයි හිතන්නට බැහැ. මේ ආණ් ඩුව 1965 දී දුන් පොරොන්දු ක්‍රියාත්මක කෙළේ නැහැ. තවත් මැතිවරණයකට අවු රුද්දක් තිබියදී මේක ක්‍රියාත්මක කරන වා යයි මහජනයාට පෙන්වීමටයි, උත්සාහ කරන්නේ. මේකේ රහස අපට තේරෙන වා.

ගරු ඇමතිතුමා උතුරු මැද පළාතේ සංචාරය කරන කොට නොයෙක් විධියේ ප්‍රකාශ කරනවා. දැනටමත් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මැතිවරණ කට යුතුවල යෙදී සිටින අය ප්‍රචාරය කරගෙන යන්නේ තමන් මේ බදු ඉඩම් සින්නක් කර කරන්නට යන බවයි. මේ ඉඩම් සින් නක්කර ගන්නට කැමතිද, නැද්දැයි අසා දැන් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය ලවා මේ බදු ඉඩම්කාරයන්ට ලියුම් යවා තිබෙනවා. ඉඩම් සින්නක්කර ගන්නට කැමති නම් ඊට කලින් හිඟ බදු මුදල් ගෙ වන්නැයි ද දන්වා තිබෙනවා. තමන් ඉඩම් සින්නක්කර දීම සඳහා වැඩ කර තිබෙන බව මහා මැතිවරණයට පෙර මහාජනයාට පෙන්වන්නටයි, මේ ලැස්ති වන්නේ. බණ්ඩාරනායක මැතිනියටත් ඒ විධියේ ලියමනක් එවා තිබෙනවා. මේ පනත කව දාවත් ක්‍රියාත්මක වෙයි කියා මා හිතන්

නෙ නැහැ. 1970 මැතිවරණයක් පවත්වන් නටම ඕනෑ නිසා මේ පනත ඉදිරිපත් කර නවා විනා මෙය අවංකවම බදු ඉඩම් සින් නක්කර කිරීමේ චේතනාවෙන් ඉදිරිපත් කරනවා නොවෙයි.

දැනට බලපවත්වන ඉඩම් සංවර්ධන ආඥපනතේ නොයෙකුත් අඩුපාඩුකම් තිබෙන බව මා මුලින් කිව්වා. ඉඩම් බෙදා දීමේදී නොයෙක් බාධා ඇති වෙන්නෙ ඒ නිසයි. වර්තමාන ඉඩම් සංවර්ධන ආඥ පනත අනුව කටයුතු කිරීමේදී මුහුණපාන් නට සිදු වන අඩුපාඩුකම් මග හරවන්නට රජය වග බලාගත යුතුයි. ඒ පනත යට තේ යම්කිසි කෙනෙකුට ඉඩමක් ලබා ගන් නට අවුරුදු ගණනාවක් ගත වෙනවා. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේත් අප වාගේම ආසනයක් නියෝජනය කරන කෙනකු නිසා තමුන්නාන්සේත් මේ තත්ත්වය ගැන හොඳින් දන්නවා ඇති. අපේ ආසනවල ගැමියෙකුට රජයේ ඉඩම කින් අක්කර 1/4 ක් හෝ 1/2 ක් ලබා ගන්නට වුවමනා වූ විට ඔහු ආදායම් පාලක නිලධාරිතුමාට පෙත්සමක් ඉදිරි පත් කරනවා. ඒ පෙත්සම යවා අවුරුදු ගණනාවක් ගත වුණයින් පසුවවත් ඔහුට ඉඩම් කැබැල්ලක් ලබා ගන්නට පුළුවන් වෙන්නෙ නැහැ. යම්කිසි ගැමියෙකු දිසා පතිගෙන් හෝ ආදායම් පාලක නිලධාරියා ගෙන් හෝ ඉඩමක් ඉල්ලා පෙත්සමක් ඉදිරිපත් කළ විට "ඊළඟ ඉඩම් කච්චේරිය පවත්වන තුරු ඉන්න" කියා ඔහුට ලියු මක් එවන සිරිතක් තිබෙනවා. මේ සඳහා සිංහලෙනුත්, ඉංග්‍රීසියෙනුත් ෆෝර්ම සකස් කර ගෙන තිබෙනවා. ඒ එකක් පුර වා අත්සන් කර යවනවා. ඉතින් අර අහිං සක ගැමියා ඉඩම් ලැබෙන තුරු බලා සිටි නවා. එහෙත් ඉඩම් කච්චේරිය පැවැත් වෙන්නෙත් නැහැ ; ඉඩම් කෑල්ල ලැබෙන් නෙත් නැහැ. ඉඩම් කෑල්ලක් ලබා ගැනීම සඳහා හතළිස් වාරයක් පණස් වාරයක් කච්චේරි ගානේ කකුල් ගෑ උදවිය මට පැමිණිලි ඉදිරිපත් කර තිබෙනවා. සමහර උදවිය පෙත්සම ඉදිරිපත් කර ඉඩම් වවන් නටත් පටන් ගන්නවා. ඉඩම වවාගෙන යන අතර ඉල්ලුම් පත්‍රය අළුත්වැඩියා කරන නමුත් අවසානයක් වෙන්නෙ නැහැ. උතුරු මැද පළාතේ අනවසරයෙන් පිහිටුවා ගත් කළ ඉඩම් කැබලි විසි දහසක් තිස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

දහසක් විතර තිබෙනවා. ඒ සමහර ඉඩම් වලින් පොල් පවා කැඩෙන නමුත් තවම ඒවාට බලපත්‍ර දී නැහැ. මේ ළඟදී සිට ඒවා නීත්‍යානුකූල කිරීමේ වැඩ පිළිවෙලක් අනු ගමනය කරගෙන යැම ගැන අපි ස්තුති වන්ත වෙනවා. ඒ ස්තුතිය හිමි විය යුත්තේ ඒ ප්‍රදේශයේ දිසාපතිවරයාටයි. එහෙත් ඒ වැඩ පිළිවෙලත් සතුටුදායක මදි. මේ නීත්‍යානුකූල කිරීමේ කටයුතු පටන් ගෙන දැන් අවුරුදු 2 ක් ගත වී තිබෙන නමුත් ඒ නීත්‍යානුකූල කිරීමේ කටයුතු අවසානයක් වී නැහැ. ඒ ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන්ට ඕනෑ.

ගරු ඇමතිතුමා දන්න කාරණයක් තමයි, රටේ හැම පුද්ගලයෙකුටම ඉඩම් කැබැල්ලක් වුවමනා කර තිබෙන බව. සැම තැනැත්තෙකුටම ඉඩමක් අවශ්‍ය බව අප පිළිගත යුතුයි. මේ මෑතක සිට ඉඩම් ඇමතිතුමා විශාල උනන්දුවක් දක්වනවා, ඉඩම් බෙදා දීමේ කටයුතු සම්බන්ධයෙන්. වාසනාවකට මෙන් 1970 දී මහා මැතිවරණයක් පැවැත්විය යුතු නිසා එතුමා යම් වැඩ පිළිවෙලක් ආරම්භ කර තිබෙනවා. ඊට සාධක වශයෙන් මා උතුරු මැද පළාතේ කටයුතු ගැන සඳහන් කරන්නට කැමතියි. අවුරුදු 4 ක් තිස්සේ එකම ඇමතිවරයෙකුටවත් වුවමනා කළේ නැහැ, උතුරු මැද පළාතට යන්න. එහෙත් දැන් මාස තුනක ඉඳල ඒ පළාතේත් ඉඩම් ප්‍රශ්න විසඳන්න වැඩ ආරම්භ කර තිබෙනවා. ප්‍රචාරය කරනවා සින්නක්කරයට දෙනවාය කියා. බදු වශයෙනුත්, සින්නක්කර වශයෙනුත් ඉඩම් බෙදා දෙනවා යයි ප්‍රචාරය කරනවා. වෙනෙකක් තබා එක්සත් ජාතික පක්ෂයේ මධ්‍යම කාර්යාලය කියා විශේෂ කාර්යාලයකුත් ගරු ඇමතිතුමා විවෘත කර තිබෙනවා, මේ ප්‍රශ්න විසඳන්න. එහි සිටගෙන තමයි ඉඩම් දෙන්නේ. That is unfair. මා එදත් කීවා ඉඩම් අවශ්‍ය එක්සත් ජාතික පක්ෂයේ අයට පමණක් නොවෙයි කියා. මේ රටේ පුරවැසියන් කාටත් ඉඩම් ඕනෑ කරනවා. අල්ලපු වැටේ කච්චේරිය තිබියදීත් එක්සත් ජාතික පක්ෂ කාර්යාලයට ගොස් ඉඩම් ප්‍රශ්නය විසඳන්නේ ඇයි?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඉඩම් ප්‍රශ්නය විසඳන්න එතැනට ගියා නොවෙයි. මා එහි ගිය අවස්ථාවේ ඔවුන් පැමිණ එහි දී මා හමු වුණා.

**රත්නායක මයා.**
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)

මට කියන්න එපා. මාත් එහි සිටින කෙනෙක්නේ. බොරු කියන වචනය මා මෙහි දී පාවිච්චි කරන්නේ නැහැ. එය කිවොත් ඉල්ලා අස් කර ගන්නය කියා ගරු කථානායකතුමා කියාවි. ඒ නිසා මා එම වචනය පාවිච්චි කරන්නේ නැහැ. ඒක අසත්‍යයක්. [බාධාකිරීමක්] ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින්ගේ ඒවායේ ගරු ඇමතිතුමා ජී. ඒ. ට ලියනවා. "For necessary action" කියා. [බාධාකිරීමක්] ඇමතිතුමාට කියන්න බැහැ ඉඩම් දෙන්නය කියා. ඒ නිසා "උඹට දෙන්නම්" කියා ඒ මිනිහාට කියා ජී. ඒ. ට ලියනවා "For necessary action" කියා. එසේ ලියා කියනවා "මේක දිසාපතිතුමාට ගෙනගොස් දීපන්, උඹට ඉඩම් ලැබෙයි" කියා. මා එහි ලියා තිබෙන එක ඔවුන්ට තේරුම් කර දුන් විට "මා ගියේ අවශ්‍ය දෙය කරන්න නොවෙයි, ඉඩම් ලබා ගන්නයි" කියා ඔවුන් ගරු ඇමතිතුමාට බැන බැන යනවා. ඉංග්‍රීසියෙන් ලියනවා "G. A., For necessary action" කියා. මිනිහාට කියන්නේ මෙය අරගෙන පලයන් දිසාපතිතුමා ඉඩම් දේවි කියලයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

තමුන්නාන්සේලාගේ ඉඩම් ඇමතිතුමා කළේ කොහොමද?

**රත්නායක මයා.**
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)

ඔය ඉන්නේ. අහන්නකෝ. [බාධා කිරීමක්] මා ගරු ඉඩම් ඇමතිතුමාට පෞද්ගලික චෝදනා ඉදිරිපත් කරන්නට ලැහැස්ති නැහැ. මා අනුකම්පා කරනවා මේ ගරු සභාවේදී හෝ පිටතදී හෝ ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නයක් ගැන සාකච්ඡා කරන විට සී. පී. ද සිල්වා ඇමතිතුමාට පතුරු යනතුරු බණිනවා. එයට හේතුත් තිබෙනවා. එහෙත් පෞද්ගලික දේවල් කියන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ.

මේ මාසයේ 20 වැනිදා මගේ කොට්ඨාශයේ රාජාංගන ව්‍යාපාරයට එනවා යයි ගරු ඉඩම් ඇමතිතුමා කීවා. එහෙත් යම් යම් හේතුන් නිසා එතුමාට එන්නට බැරි වුණා. එතුමා අසනීපයෙන්ය කියා අසත්‍යයක් කීවා. එහෙත් බලපිටියේ නාම යෝජනා ගැන රෑ දාවල් වැඩ කළාය කියා ආරංචියි. ඒ ගැන ඊර්ෂියාවක් නැහැ. පක්ෂය වෙනුවෙනුත් මැස්සිනා වෙනුවෙනුත් ඒවා කරන්නට ඕනෑ. එදා ගරු ඉඩම් ඇමතිතුමාට දෙන්නය කියා පෙත්සම් මිටියක්—පෙත්සම් 2000 ක් පමණ—ගරු ප්‍රවාහන ඇමතිතුමාට දුන්නා. ඒවා ලැබුණාද කියා මා දන්නේ නැහැ. ඉඩම් ඇමතිතුමා වෙනුවෙනුත් රජය වෙනුවෙනුත් කථා කළේ ගරු ප්‍රවාහණ ඇමතිතුමායි. රාජාංගනයේ මධ්‍යම දිස්පෙන්සරියක් විවෘත කළ අවස්ථාව නිසා ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් සිටියා. ඉඩම ඇමතිතුමා අසනීපයෙන්ය කියා ඒ අවස්ථාවේ මාත් කීවා. ඉක්මණින් සනීප වේවා කියා ප්‍රාර්ථනාවකුත් කළා. ගරු ඉඩම් ඇමතිතුමාට දෙන්නට ගෙනැවිත් තිබුණු පෙත්සම් සියල්ලම ගරු ප්‍රවාහන ඇමතිතුමාට දෙන්නය කියා මමත් කීවා. එතුමාත් ඒවා බාරගෙන ගරු ඉඩම් ඇමතිතුමාට දෙනවාය කියා පොරොන්දු වුණා. මෙතෙක් ඒවා ලැබී නැත්නම් ඒ ගැන මා කණගාටු වෙනවා. ලැබුණු වහාම ඒ ගැන කටයුතු කරනවා ඇත කියා මා හිතනවා.

මා කියාගෙන ආවේ ගරු ඇමතිවරයෙක්—විශේෂයෙන් ඉඩම් ඇමතිතුමා—යන විට පෙත්සම් දෙන්නේ ප්‍රශ්න තිබෙන නිසයි; ඉඩම් නැතිකම නිසයි. මන්ත්‍රීවරුන්, දිසාපතිතුමා, ආදායම් පාලක නිලධාරීන්, ඇමතිතුමා යනාදී අයට ඔවුන් පෙත්සම් දෙනවා. ඔවුන් පටන් ගන්නේ ගරු ඇමතිතුමාගෙන්. ඇමතිතුමාට දෙන පෙත්සමේ පිටපත් ඉඩම් කොමසාරිස්තුමා, දිසාපතිතුමා, ආදායම් පාලක නිලධාරීන්, මන්ත්‍රීවරුන් යන අයටත් යවනවා. එකකට සත 60 බැගින් වියදම් කර ඒවා ලියා පදිංචි කර යවන්නට කීයක් යනවාද? ඔවුන්ට ඉඩම් අවශ්‍යයි. ඒ නිසයි ඒ විධියට කරන්නේ. අද රටේ තිබෙන ඉඩම් ප්‍රතිපත්තියේ වරද කොතරම් ද කියා බලමු. ඉඩම් දිය යුත්තේ ඉඩම් කච්චේරියකින් මයි කියා නීතියේ නම් තිබෙනවා. එහෙත් අද රටේ ඉඩම් බෙදාදීමේ ඇති අක්‍රමිකතා කොතරම්ද කියතොත් මහජනයා තුළ හැඟීමක් තිබෙනවා ඉඩම් ඕනෑ නම් එය කලින් අල්ලා ගන්නට ඕනෑය කියා. ඒ සම්බන්ධව ගරු ඇමතිතුමාත් මා සමග එකඟ වේවි. රජයේ ඉඩමක් ලබා ගන්න ඕනෑ නම් රජයේ ඉඩමක් ලබා ගන්න ඕනෑ නම් පළමුවෙන් එය බලහත්කාරයෙන් අල්ලා ගත යුතු බවට අද මහජනතාව තුළ හැඟීමක් කාවැදී තිබෙනවා. එම නිසයි, ප්‍රයෝජනයට නොගන්න රජයේ ඉඩම්—රක්ෂිත ඉඩම් පවා—බලහත්කාරයෙන් අල්ලා ගන්නට මිනිසුන් පෙළඹී සිටින්නේ. සමහරුන් ජනපදවල ඉඩම් පවා අල්ලාගෙන තිබෙනවා. එහෙත් බලහත්කාරයෙන් රජයෙන් ඉඩම් අල්ලා ගන්න මිනිසුන් අතරෙන් දුප්පත් මිනිසුන්ට තැනක් ලැබෙන්නේ නැහැ. මිළ මුදල් ඇති මුදලාලිලා අපේ ප්‍රදේශයේ සමහර ජනපද ඉඩම්වලින්, ජනපදවාසීන්ට නීත්‍යානුකූලව හිමි විය යුතුව තිබුණු ඉඩම් කැබලි හතර පහ නොව දහය දොළහ පවා අල්ලාගෙන තිබෙනවා. ඉඩම් නීතියේ ඇති දුර්වලකම් හා දෙපාර්තමේන්තුවේ ප්‍රමාද දෝෂයන් නිසයි, ජනපදවාසීන්ට එවැනි තත්ත්වයකට මුහුණපාන්නට සිදුවී තිබෙන්නේ. අපේ ප්‍රදේශයේ සිදු වී ඇති එවැනි දේවල් ගැන මට අත්දැකීම් තිබෙන නිසයි, මා මේවා කියන්නේ. සාමාන්‍යයෙන් ඉඩම් ප්‍රශ්න, රාජකාරී කටයුතු කර අවසාන කරන්නට පුළුවන් ඒවා නොවෙයි. "පුංචි බණ්ඩාට අසුවල් ඉඩම පවරා දී ඉවරයි" කියා ලිපිගොනුවක රාජකාරී කටයුතු කිරීම අවසාන කරන්නට බැහැ. එම නිසා ඇමතිතුමාට දොස් පවරා සෑහීමකට පත් වන්නට මා සූදානම් නැහැ. ඒවායේ තිබෙන අමාරුකමුත් මා දන්නවා.

ඒ කෙසේ වෙතත්, ඉඩම් ආඥා පනත සංශෝධනය කරන මේ අවස්ථාවේදී මතක් කළ යුතු තවත් දෙයක් තිබෙනවා. පරණ අධිරාජ්‍යවාදී ක්‍රමයටම වැඩ කරනවා නම් කොයි තරම් සංශෝධන ගෙනාවත් මහ ජනතාවට එයින් යහපතක් සැලසෙන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

නැහැ. අනෙක් අමාත්‍යාංශ ගැන ටිකක් විමසා බැලුවොත් පෙනෙනවා, මෙරටට නිදහස ලැබුණාට පසුව ඒවායේ වෙනස්කම් බොහොමයක් සිදු වී තිබෙන බව. එහෙත් අවාසනාවකට වාගේ—ඉඩම් ඇමතිතුමාගේ අවාසනාවකටද, රටේ අවාසනාවකටද මා දන්නේ නැහැ—ඉඩම් අමාත්‍යාංශයේ හා ඒ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවල නම් තවමත් වැඩ කෙරෙන්නේ පරණ අධිරාජ්‍යවාදී ක්‍රමය අනුවමයි. ඉඩම් අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල, විශේෂයෙන් ඉඩම් කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවේ නම්, එදාට වඩා කිසිම වෙනසක් සිදු වී නැහැ. කොපමණ පෙත්සම් ඉදිරිපත් කළත් මිනිසුන්ට ඉඩම් ලැබෙන්නේ නැහැ. යම්කිසි ඉඩමක් බලහත්කාරයෙන් ඉල්ලා ගත්තවුන් දොට්ට දමන්නට කොහෙත්ම බැරි වූ විට පමණක් ඔවුන්ට ඒ ඉඩම් නීත්‍යානුකූලව පවරා දෙනවා. දැන් කෙරෙන්නේ එවැනි දෙයක්. එම නිසා මේ සංශෝධන පනත සම්මත වූවාට පසුවවත්, ඉක්මණින් ඒවා ක්‍රියාත්මක වීම සඳහා වැඩ පිළිවෙළක් යොදවන්නට ඕනෑ.

ඉඩම් අත්පත් කර ගැනීම ගැනත් ඇමතිතුමාට නිදර්ශන දෙක තුනක් පෙන්වන්නට කැමතියි. මා මුලින් කීවා වාගේ දුප්පත් මිනිහෙක් රජයේ ඉඩමක් අල්ලා ගෙන දිසාපතිතුමාට ඉල්ලීමක් කරනවා, ඒ ඉඩම දියුණු කිරීම සඳහා බලපත්‍රයක් දෙන්නය කියා. එහෙත් ඒ පිළිබඳව රාජ්‍ය කාරි කටයුතු කෙරෙන්නේ නැහැ. අවුරුදු ගණනාවකට පසුව, මිළ මුදල් තිබෙන බල පුළුවන්කාරයෙක් අර ඉඩමට රිංගා ගන්නවා. ඔහුට මිළ මුදල් තිබෙන නිසා, මොන විධියකින් හෝ ඔහුට අර ඉඩම පිළිබඳ අයිතිය පැවරෙන ඔප්පුව ලැබෙනවා. එවිට ඒ ඉඩම මුලින්ම අල්ලා ගත් අර අහිංසක දුප්පත් මනුෂ්‍යා දිසාපතිතුමා ළඟට ගිහින් තමාගේ දුක්ගැනවිල්ල ඉදිරිපත් කරනවා. එවිට දිසාපතිතුමා කියන්නේ, "මට දැන් කරන්න දෙයක් නැහැ, උසාවි ගිහින් බේරා ගන්න" කියායි. උසාවියේ නඩුකාරතුමා ඒ ප්‍රශ්නය විසඳන්නේත් ඇමතිතුමා කටයුතු කරන ආකාරයටමයි. කවද ඉඩම් කලින්ම අල්ලා ගත්තේ කියා නඩුකාරතුමා හොයන්නේ නැහැ. අර පෝසත් මුදලාලිට මුදල් මෙන්ම ඔප්පුවත් තිබෙනවා. This is really what is happening in the N. C. P. පුංචි බණ්ඩා ආවේ කලිනුයි, තෝමස් සිංඤෝ ආවේ ළඟදීයි, කියා නඩුකාරතුමා බලන්නේ නැහැ. එම නිසා එතුමා තීන්දුව දෙන්නේ කොහොමද? "Punchi Banda must vacate the land. This is a matter for the Government Agent."

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
Look up Section 12.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
මා කියන්නේ ඉස්සර සිදු වුණු දේවල්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එවැනි දුර්වලකම තිබුණු නිසා තමයි, මේ සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
ඕවා ක්‍රියාත්මක වෙන්න කල් ගත වෙනවා නොවැ? මේ රජය තිබෙන තුරු නම් ඔය සංශෝධන ක්‍රියාත්මක නොවන බවට මම ඕනෑ ඔට්ටුවක් අල්ලන්නම්. අපේ වාසනාවකට වාගේ 1970 මැතිවරණයක් තිබෙන නිසා, මෙහි මූලික කටයුතුවත් පටන්ගෙන තිබෙනවා. ඒ කෙසේ වෙතත්, මිළ මුදල් තිබෙනවා නම් ඉක්මනට ඔප්පු ගන්න පුළුවනි. මොන ක්‍රමවලින් හෝ ඉඩමේ අයිතිකාරයා වන්න පුළුවනි. [බාධා කිරීමක්] කච්චේරිවලින් තමයි ඔප්පු ලබාගන්නේ.

I am not blaming you. You are the Minister; but you are held responsible because you are the Minister in charge.

එම නිසා, මේ කාරණය සම්බන්ධයෙන් මට කියන්න තිබෙන්නේ, යම් අසාධාරණ දිසාපතිවරයාගෙන් අයුතු අන්දමට ඔප්පු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වක් ලබා ගෙන තිබෙනවා නම් ඒ ඔප්පු අවලංගු කිරීමට දිසාපතිවරයාට බලතල ලැබෙන අන්දමට නියෝග යවන්න ඕනෑ බවයි. නමුත් අද සිදු වී තිබෙන්නේ මොකක්ද ? දිසාපතිවරු අපට බොහෝ අවස්ථාවලදී කියා තිබෙනවා, ලොකු ලොකු තැන්වලින් එන නියෝග නිසා ඒ අන්දමට ඔප්පු දෙන්න සිදු වී තිබෙන බව. දිසාපතිතුමන්ලා කියනවා—" So-and-so instructed me " කියා. ඔන්න ඔය අන්දමට වහෙන් ඔරෝ ප්‍රතිපත්තියකුයි අනුගමනය කරන්නෙ. එම නිසා ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා මෙබඳු සිදුවීම් වළක්වන්න උත්සාහ දරන්න ඕනෑ. දුප්පත් මනුෂ්‍යයකුට අයත් අක්කර භාගය, අක්කරය හෝ අක්කර දෙක නියම අන්දමට අයත් කර ගැනීමට මෙම සංශෝධනයන් අනුමත කර ගත්තාට පසුවවත් හැකි වෙනවාය, මෙයින් ඒ දුප්පත් උදවියට සහනයක් සැලසෙනවාය කියා අපේ කිසිම විශ්වාසයක් නැහැ. මුදල් හදල් තිබෙන උදවියට පමණයි බොහෝ විට සහනයන් සැලසෙන්නේ.

ඔම ඊට හොඳම නිදසුනක් පෙන්වන් නම්. රුපියල් ලක්ෂ දෙකක් පමණ වියදම් කර රාජාංගන හන්දියෙ දැවැන්ත ගොඩනැගිල්ලක් තනා තිබෙනවා.

That encroacher is at the turn-off to the Irrigation office.

කලින් ඒ සම්බන්ධයෙන් නිකුත් කළ නියෝග ඇන් වෙනස් කරගෙන.

You have not been to Rajangana. There is a massive structure there.

එතැන විශාල සාප්පුවක් විවෘත කර තිබෙනවා. මුල් අවස්ථාවේදී තමුන්නාන්සේ ඉඩම් කොමසාරිස්වරයාට නියෝග කළා, යම්කිසි වන්දි මුදලක් ගෙවා වහාම එම ස්ථානයෙන් ඉවත් කරන්න කටයුතු කරන්නටය කියා. නමුත් අන්තිමේදී රුපියල් පන්සියයක හෝ දාහක දඩයක් ගෙවන්න නියම කොට එම ඉඩම ඒ පුද්ගලයාටම පවරා දුන්නා. එය සිදු වුණේ මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සෙයි.

ඊළඟට තවත් උදාහරණයක් වශයෙන් කලත්තෑවේ ඉඩම සොයිසා මහතාට පවරා දීම ගැන පෙන්නා දෙන්න කැමතියි. ගරු ඇමතිතුමා අපේ ආණ්ඩුවේ ඉඩම් ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී සොයිසා නමැති මේ පුද්ගලයාට ඉඩම පවරා දීමේ යෝජනාවට තරයේම විරුද්ධ වුණා. ඇත්ත වශයෙන්ම කලැත්තෑවේ මෙම ඉඩම හැරුණු විට එම ප්‍රදේශයේ ගැමියන්ට රජයේ වෙනත් ඉඩමක් නැහැ ලබා ගන්න. නමුත් ආණ්ඩුව වෙනස් වුණා පමණයි, කලින් අක්කර පණහයි ඉල්ලා තිබුණේ ; ඒ වෙනුවට අක්කර එකසිය පණහක් දුන්නා. මේ කාරණය මා විශේෂයෙන්ම රාජ්‍ය ඇමතිතුමාටයි කියන්නේ. කලින් ඉල්ලුවේ අක්කර 50 යි. ඒ අවසථාවේදී ඉඩම් ඇමතිතුමා නියෝගයක් කළා, ඉඩම දෙන්න බැහැ, ඉඩම දියුණු කළාට යම් කිසි මුදලක් ගෙවා ඉඩමෙන් ඉවත් කර දැමීමට කටයුතු කරන්නටය කියා.

" Pay him for the development and take action to eject him. " That was the last order. He reversed that order.

නමුත් අවසානයේදී අක්කර 150 ක්ම පවරා දී තිබෙනවා. ඔවැනි දේවල් සිදු වෙනවා නම් අපට නිහඬව සිටින්න බැරි බව මතක් කර දෙන්න කැමතියි. මුදල් හදල් තිබෙනවා නම් ආඥ පනතේ මොන අන්දමේ වගන්ති තිබුණත් පුද්ගලයන්ගේ අභිමතාර්ථයන් ඉටු කර ගැනීමට අපහසුවක් නැහැ.

ගරු කථානායකතුමනි, රාජකාරිය ගැන කථා කරන විට ලංකාවේ සෑම කච්චේරියකම ඉඩම් අංශයේ වැඩ කටයුතු ඉතාමත්ම ප්‍රමාදවයි කෙරෙන්නෙ, ඉතාමත්ම දුර්වල තත්ත්වයකයි තිබෙන්නෙ. මා මුලින් කීවාක් මෙන්, මෙම වැඩ කටයුතු දවසින් දෙකින් හමාර වන ඒවා නොවෙයි. ඉඩම් අංශයෙහි රාජකාරියෙහි යෙදී සිටින නිලධාරීන් නොයෙක් නොයෙක් අයගේ බලපෑම් උඩ ඉක්මනින් මාරු කර යැවීම හොඳ නැහැ. මන්ද ? ඉඩම් අංශයේ සේවය කරන නිලධාරීන් සෑහෙන කලක් එම අංශයේම වැඩ කරනවා නම් එයින් විශාල ප්‍රතිඵල ලබාගන්න පුළුවනි. මන්ද ? එම වැඩ කටයුතු ගැන එම නිලධාරීන්ට පළල් අවබෝධයක්, දැනීමක්, ලැබෙන නිසයි. ගරු කථානායකතුමනි, මගේ මතකයේ හැටියට මෙතුමා අපේ ආණ්ඩුවේ ඉඩම් ඇමතිවරයා වශයෙන් සිටිද්දි පළමු වරට දිස්ත්‍රික් ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

නිලධාරීන් වශයෙන් නිලධාරි කොටසක් කච්චේරිවලට පත් කර යැව්වා, ඉඩම් කොම සාරිස්වරයාගේ නිලධාරීන් වශයෙන්, දිසා පතිතුමන්ලාට සහාය වෙමින් ඉඩම් සම් බන්ධ ප්‍රශ්නවලදී කටයුතු කිරීමට. ඉඩම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් වශයෙන් නොයෙක් නොයෙක් කච්චේරි වලට සම්බන්ධව දිසාපතිවරුන් සමග ඒ අය කටයුතු කරගෙන ගියා. ඒ නිලධාරීන්ට ඒ ආකාරයෙන් දිගටම කටයුතු කර ගෙන යන්න ඉඩ සැලසුවා නම් මේ වාගේ අර්බුද ඇති වන්නේ නැහැ. ඒ නිලධාරීන් ඉඩම් සම්බන්ධයෙන්, රාජකාරී කටයුතු සම් බන්ධයෙන්, සෑහෙන අවබෝධයක්, දැනී මක්, ඇතුව කටයුතු කරගෙන ගිය බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. නමුත් පරිපාලන සේවය ආවායින් පසු ඒ තත්ත්වය වෙනස් වී තිබෙනවා. පරිපාලන සේවය ඇති කළ පමණින් ඉඩම් අංශවල වැඩ කටයුතු කරගෙන ආ පළපුරුදු නිල ධාරීන් මාරු කර යැවීම හොඳ නැහැ. ඉඩම් කොමසාරිස්තුමා පෙනෙන්න මෙම ස්ථාන යේ නොසිටීම ගැන මා කනගාටු වෙනවා. අද අනුරාධපුර කච්චේරියේ ඉඩම් නිල ධාරීන් වශයෙන් මෙම ආණ්ඩුව පත් කර එවා ඇත්තේ කවුද? සමුපකාර පරීක්ෂක වරු. මා උන්නැහේලාට නින්දාවක් කරනවා නොවෙයි මේ. [බාධා කිරීමක්] මම ඒ උදවියට දොස් කියනවා නොවෙයි. මේ කතාවට තමුන්නාන්සේලාත් එකඟ වෙනවා ඇති. අද දිස්ත්‍රික් ඉඩම් නිලධාරීන් වශයෙන් සමුපකාර පරීක්ෂකවරුන් කට යුතු කරනවා. සමුපකාර දෙපාර්තමේන්තු වට එපා වෙච්ච පරීක්ෂකවරුන් අනුරාධ පුර කච්චේරියේ ඉඩම් නිලධාරීන් හැටියට පත් කර සිටිනවා.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

Those are the weaknesses in the C.A.S. scheme.

රත්නායක මයා.
(திரு. ரத்னுயக்க)
(Mr. Ratnayake)

No. What I am saying is why are you transferring them too often.

කෘෂිකර්ම ඇමතිතුමා කියනවා මේක පරි පාලන සේවයේ දුර්වලකමක්ය කියා? නමුත් මා කියන්නේ, පරිපාලන සේවයේ ඇති වරදක් නිසා නොව එසේ වන්නේ ඊට නුසුදුස්සන් පත් කළ නිසා බවයි.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

They want to go on promotion.

රත්නායක මයා.
(திரு. ரத்னுயக்க)
(Mr. Ratnayake)

Why do you not create a system of promotions in the same department? Whether he goes to the Irrigation Department or to the Department of Agriculture, the C.A.S. man goes on the same salary scale. Whether he is a D.L.O. or anything else, he will be on that salary scale.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

When there are promotional posts elsewhere, they go there.

රත්නායක මයා.
(திரு. ரத்னுயக்க)
(Mr. Ratnayake)

කෘෂිකර්ම ඇමතිතුමා මොනවා කීවත් ඉඩම් ඇමතිතුමායි බැණුම් අසන්නේ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

මම බාරගන්නම්.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

පරිපාලන සේවයේ දුර්වලකමක්.

රත්නායක මයා.
(திரு. ரத்னுயக்க)
(Mr. Ratnayake)

පරිපාලන සේවයෙන් වේවා ඉඩම් නිල ධාරීන් බඳවා ගත්තායින් පසු එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරීන් ඒ දෙපාර්තමේන්තුවේම තබා ගෙන උසස්වීම් ඇති කිරීමට වැඩ පිළි වෙළක් නොයොදන්නේ මන් ද ?

They are all on the same salary scale.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

They have specialized in their work.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

When they are in the Ceylon Administrative Service, they get transferred.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

You have ruined the whole thing.

**රත්නායක මයා.**
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)

පරිපාලන සේවයේ යම් පිරිසක් තමුන්නාන්සේට දෙනවා. ඒ උදවිය පුළුවන්තරම් කලක් ඉඩම් අමාත්‍යාංශයේ තබා ගන්නට බැරි ඇයි ?

Do not transfer them. If you can transfer them haphazardly, why cannot you keep them. If you can get a co-operative inspector to be a D.L.O.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

They were sent. I did not want them. I want to tell you one thing. About two months ago I wrote to the Hon. Minister of Finance and I gave a list of people whom I wanted out.

**රත්නායක මයා.**
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)

Either they must go or you must go. If I were you either they will go or I will go. What is the use of being a Minister? Who gets the blackguardings ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

The people the government agents wanted out were sent out.

**රත්නායක මයා.**
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)

මට මතකයි ඔවැනි ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කලකට ඉහත ඇති වූ සිද්ධියක්. අපේ දිවංගත ඩී. එස්. සේනානායක අගමැතිතුමා සිටි කාලයේ වර්තමාන අගමැතිතුමා සිටියේ තරුණ වයසේයි. එතුමා එවකට ඉඩම් ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. එතුමා වරක් පොලොන්නරුවට ගොස් පරීක්ෂණයක් කළා. එම පරීක්ෂණයට අනුව ඒ අවස්ථාවේදී පොලොන්නරුවේ සිටි දිසාපතිතුමාගේ වැඩ කටයුතු ගැන කලකිරීමක් ඇති වීම හේතුකොටගෙන තම පියාට ඇවිත් කිව්වා, "එක්කෝ ඒ දිසාපති යන්නට ඕනෑ. නැතිනම් මා යන්නට ඕනෑ. මා ගියායින් පසුව මා ගිය කාරණය කුමක් දැයි ජනතාවට කියන්න" යනුවෙන්. එදා එසේ කීවේ වර්තමාන අගමැතිවරයායි. එතකොට තරුණ දිසාපති වරයෙක් සිටියා සී. පී. ද සිල්වා යන නමින්.

පරිපාලන සේවය තිබුණු පළියටම මෙම නිලධාරීන් වසරින් හමාරෙන් මාරු කරන්නට ගිය විට තමුන්නාන්සේගේ ඉඩම් ප්‍රතිපත්තිය කොතරම් හොඳ වුවත් එය නිසියාකාර ක්‍රියාත්මක කරන්නට බැහැ. තමුන්නාන්සේගේ දිස්ත්‍රික් ඉඩම් නිලධාරීන්ගෙන් එක් කෙනෙක්වත් අද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නැහැ. සියලු දෙනාම වෙනත් දෙපාර්තමේන්තුවලට ගිහින් තිබෙනවා. එම නිසා පරිපාලන සේවයට අයිතිය කියා ඒ පළියට——

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

පරිපාලන සේවයේ එක ලක්ෂණයක් ඒක. පළල් කර තිබෙනවා. ඕනෑම තැනකට යන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
ගියාට කමක් නැහැ. නමුත් මා කියන්නේ ඒ යෑමෙන් යම්කිසි හානියක් ඉවනවා නම්—

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ලොකු හායනික් වෙනවා.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
—ඒක වළක්වා ගැනීමටත් වැඩ පිළිවෙළක් යෙදිය යුතු බවයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
දෙපාතීමේන්තුවල විශේෂ දැනීමක් ඇති කරගෙන සිටින නිලධාරීන් වෙනත් සථානවලට ගියාම නැත්නම් පත් කළාම රාජකාායයී තත්ත්වය පහළ බසිනවා.

**එස්. බී. හේරත් මයා. (හිරියාල)**
*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*
(Mr. S. B. Herat—Hiriyala)
මොකක්ද ඒකට ගුරුකම ?

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
ගුරුකම මේකයි: යම් නිලධාරි කොටසක් ඉඩම් අමාත්‍යාංශයට ගත්තාම ඒ නිලධාරීන් ඒ අමාත්‍යාංශයේම තබා ගන්න. [බාධා කිරීමක්] පරිපාලන සේවයෙන් ලබා ගන්නා නිලධාරීන් දීර්ඝ කාලයක් තිස්සේ ඉඩම් සංවර්ධන දෙපාතීමේන්තුවේ වැඩ කරනවා නම් මීට වඩා හොඳට ඒ රාජකාායයී කටයුතු ඉෂ්ට වෙනවාට කිසිම සැකයක් නැහැ. නමුත් අද තත්ත්වය කුමක් ද? ඔය ඉඩම් ප්‍රශ්න විසඳීම ඕනෑම කෙනෙකුට කරන්නට පුළුවන් රාජ කාායයීයක් නොවෙයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒක ඇත්ත.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
මේ නිලධාරීන් පරිපාලන සේවයෙන් ගන්නවා නම් මා ගරු ඇමතිතුමාට යෝජනාවක් කරන්නට සතුටුයි. හොඳ ආදායම් පාලක නිලධාරිවරුන් ඉන්නවා. පරිපාලන සේවයට ඇතුළත් වූ පරණ ආදායම් පාලක නිලධාරිවරුන් ඉන්නවා. ඩී. එල්. ඕ. වරුන් හැටියට ඒ උදවිය පත් කරන්නට පුළුවනි. [බාධා කිරීමක්] නමුන්නාන්සේ කියන හැටියට ඩී. එල්. ඕ. වරුන් වෙන්නට කවුරුවත් කැමති නැහැ. මා එහෙම කල්පනා කරන්නේ නැහැ. අද සතුටින් ඒ වැඩ කරගෙන යන උදවියටවත් ඒ වැඩ කරගෙන යන්නට ඉඩ නොදෙන එක ගැනයි මා කථා කරන්නෙ. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය ගැන කථා කරන්නට යනවා නම් කරුණු රාශියක් ඉදිරිපත් කරන්නට පුළුවනි. ඔය ජනපද නිලධාරීන් වැනි උදවියට කරන අපරාධ ගැන මා කථා කරන්නට යන්නේ නැහැ. ඒවා මේකට අදාළ නැහැ. ඉඩම් සංවර්ධන වැඩ හැම කෙනෙකුටම කරන්නට පුළුවන් රාජ කාායයීයක් නොවෙයි. පරිපාලන සේවයේ යම් නිලධාරියකු උතුරු මැද පළාතට යැව්වාය කියමු. පළමුවෙන්, එහි තිබෙන ප්‍රශ්න ගැන ඔහු ඉගෙන ගන්නට ඕනෑ. ප්‍රදේශයේ තිබෙන ඉඩම් ප්‍රශ්න ගැන යම්කිසි අවබෝධයක් ඇති කර ගැනීමටවත් අඩු වශයෙන් මාස දහයක්, දොළහක්වත් ගත වෙනවා. අද මොකද වෙන්නෙ ? ප්‍රදේශයේ ඉඩම් ප්‍රශ්න ගැන, රට තොට ගැන යම් අවබෝධයක් ඇති කරගෙන ඔහු රාජකාරි කටයුතු පටන් ගන්නට යන විටම වෙනත් ස්ථානයකට හෝ දෙපාර්තමේන්තුවකට මාරු කරනවා. එක්කෝ ඔහුගේ ඉල්ලීමක් උඩ යනවා. නැත්නම් දෙපාර්තමේන්තුව විසින් මාරු කරනවා. ඊළඟට එතැනට අළුතෙන් නිලධාරියකු පත් කර යැව්වාම ඒ අළුත් නිලධාරියා මුල සිටම නැවතත් ඒ කටයුතු ආරම්භ කරන්නට ඕනෑ. ඒකයි අද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන තත්ත්වය. මේ තත්ත්වය ගැන ගරු ඇමතිතුමා විශේෂයෙන් සලකා බැලිය යුතුයි. දිස්ත්‍රික් නිලධාරීන් පමණක් නොවෙයි දෙපාර්තමේන්තුවේ වැඩ කරන සියලුම නිලධාරීන් පුළුවන් තරම් ඒ ඒ ප්‍රදේශවලම රඳවා ගැනීමට කටයුතු යෙදුවොත් මීට වඩා හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ඊළඟට මේ ඉඩම් දිය යුතු තැනැත්තන් තේරීම ගැන වචනයක් කියන්නට තිබෙනවා. ඒ වගන්තිය පිළිබඳව වලපනේ ගරු මන්ත්‍රීතුමාත් (ටී. බී. එම්. හේරත් මයා.) දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (ජය කොඩි මයා.) සැහෙන විවේචනයක් කළා. තමුන්නාන්සේට දොස් නැගුවා. අළුත් සංශෝධන පනත් කෙටුම්පතේ තිබෙන්නේ මෙහෙමයි:

"20. මේ ආඥා පනත යටතේ රජයේ ඉඩම් සතු කර දිය යුතු තැනැත්තන් තේරීම ඉඩම් කච්චේරියකදී කළ යුතුය:

එසේ වුවද නියම කරනු ලැබිය හැකි යම් අවස්ථාවලදී ඉඩම් කච්චේරියකදී නොව අන් ලෙසකින් ඒ තේරීම කළ හැකිය."

You must be having in mind to regularize under section 27 (c).

අන් ලෙසකින් තේරිය හැකිය කියනවා. වෙනත් කෙනෙකු ඇමතිවරයා වුණොත් අයුතු විධියට මෙයින් ප්‍රයෝජන ගන්නට පුළුවනි.

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

There will be a regulation coming under that.

රත්නායක මයා.
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)

මා එහෙම සිතුවා. තමුන්නාන්සේ මුලින්ම ඒ හැඟීම ඇති කළා නම්, එය තේරා දුන්නා නම් එපමණ විවේචනවලට ලක් වන්නේ නැහැ. එහෙම නම්, ඒ කරුණු සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ ප්‍රකාශය මා පිළිගන්නවා.

මෙම සංශෝධන පණත වගන්තියක් පාසා කියවන්නට මට නම් අවස්ථාව ලැබුණේ නැහැ. කියවා බැලු තරමින් මට වැටහී යන්නේ, මෙම පණත ක්‍රියාත්මක වුණාට පසු, කවුරුන් ඉඩම් ඇමතිවරයා වුවත් ඔහුට මෙයින් අයුතු ලෙස බලතල වැඩි වන බවයි. ඇමතිතුමාට ඕනෑ හැටියට වැඩ කටයුතු කරන්නට මෙයින් බලය ලැබෙන බවයි මගේ හැඟීම. පණතේ 4 වන වගන්තියේ දක්වෙන හැටියට, යම් සැලැස්මක් හදා එය දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටියට ඉදිරිපත් කරන්නට ඕනෑ. අප දන්නා හැටියට නම්, යම් වැඩක් ප්‍රමාද කරන්නට ඕනෑ නම් එය ඉදිරිපත් කළ යුතු තැන තමයි මේ දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටිය. තමුන්නාන්සේ එක් පණතකට Local Advisory Committee එකත් මේ පණතට District Agricultural Committee එකත් ඇතුළත් කර තිබෙනවා. මෙවැනි වැඩ මේ කොමිටිවලට බාර දීම ගැන මා නම් එකඟ වන්නේ නැහැ. එය මගේ පෞද්ගලික හැඟීමක්. තමුන්නාන්සේත් ඒ ගැන කල්පනා කර බලන්න. මෙම කොමිටියක නියෝජිතයන් 60 ක් 70 ක් පමණ සිටිනවා. පළාතේ මන්ත්‍රීවරුනුත් හත් අට දෙනකු, සමහර පළාත්වල දහ දොළොස් දෙනකු, මේ කොමිටිවලට ඇතුළත් වෙනවා. මේ උදවිය නොයෙක් දේශපාලන පක්ෂවලට අයත් වන නිසා යම් කරුණක් සම්බන්ධයෙන් සමථයකට පැමිණීම පහසු දෙයක් යයි මා නම් විශ්වාස කරන්නේ නැහැ. එම නිසා මේ කටයුතුවලට දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටි අවශ්‍ය නැහැ. මේ කටයුතු දිසාපති තුමාටත් එතුමාගේ නිළධාරීන්ටත් අවසාන වශයෙන් ඉඩම් කොමසාරිස්තුමාටත් සීමා කිරීම වරදක් නැහැ. ඒ අනුව වැඩ කරතොත්, පළාත් පාලන ඇමතිතුමාට මෙන්ම ඉඩම් ඇමතිතුමාටත් මීට වඩා වේගයෙන් ගමන් කරන්නට පුළුවන් වේයයි මා විශ්වාස කරනවා. මා කලින් කිව්වාක් මෙන්, මේ කටයුතු ප්‍රමාද කරන්නට, කල් දමන්නට ඕනෑනම් පමණක් ඒවා දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවට බාර දුන්නාට කමක් නැහැ. It will be mapping out at the Committee. ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මතක් කරනවා. මේ සංශෝධන පණතේ හැටියට, දිසාපතිතුමා හදන සැලැස්ම දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවට ගොස් එහිදී සාකච්ඡාවට භාජන වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

එතැනින් දිසාපතිතුමා ළඟට අවුත් ඊළඟට ඉඩම් කොමසාරිස්තුමා ළඟට ගොස් අන්තිමේදී ඉඩම් ඇමතිතුමා අතට එනවා. මේ අනුව සම්පූර්ණ බලය එන්නේ ඇමතිතුමා අතටයි. මෙතෙක් කල් දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටි මගින් නොයෙක් විධියේ යෝජනා ඉදිරිපත් වී ඇතත් ඒවායින් කියක් හරියාකාර ක්‍රියාත්මක වී තිබෙනවාදැයි ඕ මෙම ගරු සභාවේ මැතිඇමතිවරුන්ගෙන් අහන්ට කැමතියි. දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටිවල යෝජනා අනුව තැපැල් කන්තෝරු එක් එක් ආසනවලට ලබා දීමේ වැඩ පිළිවෙළ මෙහිදී උදාහරණයක් වශයෙන් ගන්නට පුළුවනි. යම් යම් ස්ථානවලට තැපැල් කන්තෝරු හා දුර කථන සේවා ලබා දීම සඳහා, මිනිසුන්ගෙන් පවා කරුණු විමසා, ඇතැම් විට මිනිසුන්ගෙන් බැණුම් පවා අසමින් ලැයිස්තු පිළියෙළ කරන නමුත් මුදල් වර්ෂය තුළ වැඩ කෙරෙන විට තැපැල් කන්තෝරු හා දුර කථන සේවා ලැබෙන්නේ ලැයිස්තුවෙහි සඳහන් තැන්වලට නොව වෙනත් තැන්වලටයි. මෙහිදීත් සිදු වන්නේ එයමයි. කෙරෙන්නේ සම්බන්ධතා කොමිටියෙන් අනුමත කෙරෙන දේ නොවෙයි, ඇමතිතුමාට ඕනෑ දේයි. කාරක සභා අවස්ථාවේදී අප මේවා සම්බන්ධව විස්තර වශයෙන් සංශෝධන ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

අනෙක් කරුණ, බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගැනීමයි. මිනිසුන් බලහත්කාරයෙන් ඉඩම් අත්පත් කර ගන්නේ ඔවුනට ඉඩම් නැති නිසයි. රාජාංගන ජනපදයේ නීතිගත කට්ටිකරුවන් 2,500 ක් පමණ සිටිනවා. එහෙත් 2,500 කට වඩා බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගත්ත අය ඉන්නවා. එක එක යායේ බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගත්ත අය 100, 200, 300 ඉන්නවා. ඒකට එක හේතුවක් ඉඩම් නැතිකමයි. තවත් හේතුවක් නම් අනවශ්‍ය ඉඩම් ප්‍රමාණයක් රක්ෂිත ඉඩම් හැටියට වෙන් කර තිබීමයි. ඒ ඉඩම්වලට වගකිව යුත්තෙක් නැහැ. ඉඩම් නැති අය, නීතියෙන් කාටවත් දී නැති රක්ෂිත ඉඩම් අල්ලා ගන්නවා. යම්කිසි රක්ෂිත ඉඩමක් තිබෙනවා නම්, රජය එය ප්‍රයෝජනයට ගන්න තෙක්, කිට්ටුවම පදිංචි වී සිටින කට්ටිකරුවාට ඒ ඉඩම භාර දෙන්නට ඕනෑය කියා මා ගරු ඇමතිතුමාට යෝජනා කළා. ජනපදවල තිබෙන පාරවලට අනවශ්‍ය ඉඩම් ප්‍රමාණයක්, රක්ෂිත ඉඩම් හැටියට වෙන් කර තිබෙනවා. එසේ වෙන් කර තිබෙන ඉඩම්, මිනිසුන් බලහත්කාරයෙන් අල්ලා ගන්නවා.

රාජාංගන ව්‍යාපාරයේ මිනිසුන් පදිංචි කරවන්නට පටන්ගත්තේ 1962 දීයි. ඒ ව්‍යාපාරයේ දකුණු ඉවුර ගැන පමණයි, මා විස්තර දන්නේ. එහි නීතියෙන් පදිංචි කළ කට්ටිකරුවන් 2,500 ක් සිටින අතර අනවසරයෙන් පදිංචි වූ අය ඒ වගේ දෙගුණයකට වඩා සිටිනවා. දැන්, අනවසරයෙන් පදිංචි වී සිටින අයට ඉඩම් දීම සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමට රජයට සිදු වී තිබෙනවා.

ගරු ඇමතිතුමා ළඟදී රාජාංගනයට එන බව ප්‍රවාහණ ඇමතිතුමා මතක් කළා. පෙත්සම් තවම ලැබුණේ නැත කිව්වා. ඒවා දෙන්නට ඕනෑ. ඇමතිතුමා පැමිණි විට, අනවසරයෙන් පදිංචි වී සිටින අයට ඉඩම් දෙන්නේ මොන විධියටද යන්න ගැන පැහැදිලි ප්‍රකාශයක් කරනවා ඇත කියා ඒ මහජනතාව බලාපොරොත්තු වෙන් සිටිනවා. ඉඩම් කච්චේරි පවත්වා ගම් මුන් අතරෙන් ඉඩම් ලැබීමට සුදුස්සන් දිසාපතිතුමා තෝරාගෙන තිබෙනවා. යම්කිසි දූප්පත් මනුෂ්‍යයෙක් බලහත්කාරයෙන් ඉඩම් අක්කරයක් අල්ලාගෙන, කැලෑව ශුද්ධ කර වරක් ගොවිතැන් කළාම සල්ලි තියෙන මුදලාලිලා ඒ මිනිහා එළවා දමා ඒ ඉඩම අල්ලා ගන්නවා. නීත්‍යානුකූලව තේරුණු සමහර කට්ටිකරුවන් ඒ ඉඩම්වල පදිංචි වී සිටින්නේ රජයෙන් දෙන දීමනා ලැබෙන තෙක් පමණයි. ඊට පසු ඒ අය ඉඩම අත්හැර යනවා. එසේ ගියාම තවත් කෙනෙක් ඒ ඉඩම බලහත්කාරයෙන් අල්ලා ගන්නවා. ඒවා පාලනය කරන නිලධාරීන්ගෙන් වැරදි තියෙනවා. ඒ අය යම්කිසි කෙනකු ඒ ඉඩම්වල පදිංචි වීම වළක්වන්නෙ නැහැ. සමහර අවස්ථාවලදී ජනපද නිලධාරියාම කියනවා, පුංචි බණ්ඩා, උඹ ඔය ඉඩමේ පදිංචි වෙයන් කියා. එසේ කියා ඒ මිනිහා පදිංචි වුණාට පසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිසාපතිතුමාට වාර්තා කරනවා, අසවල් අංකය දරණ ඉඩමේ අසවල් තැනැත්තා පදිංචි වී සිටිනවාය කියා. එයින් එයාගේ රාජකාරිය කරලා ඉවරයි. ඒ නිසා අනවශ්‍ය රක්ෂිත ඉඩම් ජනපදවල තිබෙනවා නම් ඒවා ළඟිලඟියේම ඒ ප්‍රදේශයේ පදිංචි ඉඩම් නැති, සුදුසුකම් තියෙන අයට දෙන්නට ඕනෑ. එසේ කරනවා නම් මේ ප්‍රශ්නය පහසුවෙන් විසඳන්නට පුළුවන් වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒ අන්දමට කරන්නය කියා ඉඩම් කොමසාරිස්තුමා නියමයක් කර තිබෙනවා.

**රත්නායක මයා.**
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)
ඉඩම් කච්චේරිය පවත්වා බී. ඕ. පී. එක පිළියෙල කර එය ක්‍රියාත්මක කරන්නට යන විට හදිසියේ යම් යම් වෙනස්කිරීම් කරන අවස්ථා තිබෙනවා.

You have altered the Rajangana B.O.P. more than four times.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
That is on advice.

**රත්නායක මයා.**
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)
Some persons have given you wrong advice.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
Expert advice.

**රත්නායක මයා.**
*(திரு. ரத்னாயக்க)*
(Mr. Ratnayake)
I do not consider that export advice.

ගරු කථානායකතුමනි, ලංකාවේ නොයෙක් නොයෙක් පළාත්වල එක එක විධියට ඔය ඉඩම් දෙනවා. සමහර තැන්වල අක්කර තුනක කුඹුරු ඉඩමකුත්, අක්කර 1 ක ගොඩ ඉඩමකුත් දෙනවා. තවත් සමහර තැනක අක්කර 5 ක කුඹුරු ඉඩමකුත්, අක්කර 1 ක ගොඩ ඉඩමකුත් දෙනවා. ඔන්න ඔය විධියට එක් එක් පළාතේ එක් එක් ක්‍රමයට දී ගෙන එනවා. අනුරාධපුර රාජාංගනයේ දකුණු ඉවුරේ යාය 17 නානා ප්‍රකාර අන්දමට දී තිබෙනවා. සමහර ස්ථානවල ගොඩ ඉඩම් අක්කර දෙක බැගින් දී තිබෙනවා. එසේ දී තිබෙන්නේත් දෙපොළකිනුයි. තවත් සමහර අයට අක්කර එක හමාර බැගිනුත්, සමහර කට්ටිකරුවන්ට අක්කර දෙක බැගිනුත් දී තිබෙනවා. සමහර තැන්වල කුඹුරු ඉඩම් අක්කර 3 බැගිනුත් දී තිබෙනවා. ඔන්න ඔය ආකාරයට නා නා ප්‍රකාර විධියට ඉඩම් බෙදා දී තිබෙනවා. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධ ස්ථිර වැඩපිළිවෙළක් ඇති කරන්නය කියා. ඔය බී. ඕ. පී. එක—සැලැස්ම—තිතෙන තිතෙන විධියට විටින් විට මාරු කරන්න ගියොත් විශාල කරදරයක් ඇති වෙනවා. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවටත් එය කරදරයක් වෙනවා. ඒ වාගේම පාරවල් නිරවුල් කිරීමටත් කරදරයක් වෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවටත් කරදරයක් වෙනවා. ඇළ වේලි සකස් කරන්න අමාරු වෙනවා. අන්න ඒ හේතූන් නිසා ඔය කරන්න පුළුවන් සෑම පරීක්ෂණයක්ම ජනපදවල මිනිසුන් පදිංචි කරවීමට කලින් කරන්න. හැම පරීක්ෂණයක්ම පවත්වා අවසාන සැලැස්ම සකස් කළාට පසුව ජනපදවාසීන් පදිංචි කරවන්නය කියායි මා ඉල්ලා සිටින්නෙ.

ගරු කථානායකතුමනි, මේ සැලැස්මවල් ගැන කථා කිරීමේදී තවත් කිව යුතු කරුණක් තිබෙනවා. මේ සංශෝධන පනත් කොයි තරම් ඇති කළත් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් ප්‍රශ්න සම්බන්ධයෙන් රාජකාරි කරන අයට අවශ්‍ය සැලැස්මවල් කච්චේරිවල ඇත්තේ නැහැ.

All the F.V.Ps are out of date. None of the F.V.Ps are up-to-date. They have never been brought up-to-date.

නොයෙක් ක්‍රමවලට ඉඩම් දී තිබෙනවා. නොයෙක් නොයෙක් අවස්ථාවලදී නොයෙක් ක්‍රමවලට ඉඩම් දී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

නමුත් අර අවසාන සැලැස්ම සකස් කළාට පසුව දෙන ඉඩම් ගැන කිසිම සඳහනක් කෙරෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, සමහර කච්චේරිවල තිබෙන සැලැස්මවල් පාවිච්චි කරන අයට ඒ ගැන කිසිම දැනීමක් නැති බවක් පෙනෙනවා. ඒ අය ඒ සැලැස්මවල් පාවිච්චි කරන ආකාරයෙන් එය පැහැදිලි වෙනවා. සැලැස්මේ යම් යම් ස්ථානවල පැන්සල් පාරවල්, තීන්ත පාරවල් දකින්නට තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්තුමා වග බලා ගත යුතුයි.

ගරු කථානායකතුමනි, යම් සැලැස්මක් සකස් කළ විට කච්චේරියට එයින් පිටපත් තුනක් ලැබෙනවා. එයින් එක් පිටපතක් කච්චේරියේම තබා ගන්නවා. තවත් පිටපතක් නිලධාරීන්ගේ පරීක්ෂණවලට පාවිච්චි කරනවා. අනික් පිටපත ආදායම් පාලක නිලධාරීතුමාගේ කාර්යාලයේ තබනවා. සමහර අවස්ථාවලදී අපට දකින්න ලැබී තිබෙනවා, කච්චේරියේ තිබෙන පිටපතට වඩා හොඳට ආදායම් පාලක නිලධාරි කාර්යාලයේ පිටපත තිබෙන බව. ඒ නිසා තමයි මා මුලින්ම කිව්වේ නිලධාරීන් මේ සැලැස්මවල අගය දන්නේ නැත කියා. අර පොඩි ළමයින් 'අ' 'ආ' ලියන්න පටන් ගන්නා වගේ ඉඩම් ගැන රාජකාරි කරන අයත් ඒ සම්බන්ධ 'අ' 'ආ' ලියන්න පටන් ගන්නේ මේ සැලැස්මෙනුයි. ඔන්න ඔය හේතූන් නිසා ඉඩම් ගැන නියම විධියේ වැඩපිළිවෙළක් ඇති කරන්නට නම් අවසාන සැලැස්ම නියම පිළිවෙළට තබන්න ඕනෑ. මා දන්නවා උතුරු මැද පළාතේ අවුරුදු 10 ක් 12 ක් පමණ පරණ වූ සමහර ඉඩම් ගැන කිසිම තීරණයක් ගත නොහැකි තත්ත්වයක් ඇති වී තිබෙන බව. ඒ නිසා කරුණාකර මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඒ වගේම, ගරු කථානායකතුමනි, මේ ඉඩම් ප්‍රශ්න බහුල වීමට තවත් හේතුවක් තිබෙනවා. ජනපද ඉඩම්වල වෙසෙන අය අතරේ බොහෝ විට කෝලාහල ඇති වෙන බවක් දකින්නට ලැබෙනවා. දැන් මේ පනතේ හැටියට තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා, ඉඩම් කට්ටි කරුවන්ට ඒ ඉඩම් "ග්‍රාන්ට්" එකක් වශයෙන් දීමට. තමුන්නාන්සේලා මෙය ක්‍රියාත්මක කරන්නේ කොහොමද? "ග්‍රාන්ට්" එකක් වශයෙන් දෙන්න කලින් ඒ ඉඩම් වෙන් වෙන් වශයෙන් බෙදා සැලැස්මවල් සකස් කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය තරම් මිනින්දෝරුවන් සිටිනවාද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දැන් අවුරුදු කිහිපයක සිටම ඒ ඉඩම් මැන ගෙන යනවා. 1930 ගණන්වල දුන් ඉඩම් දැන් මැන අවසාන වී ගෙන යනවා.

**රත්නායක මයා.**
*(திரு. ரத்னுயக்க)*
(Mr. Ratnayake)

මේ රජය ප්‍රතිපත්තියක් වශයෙන් මිනින්දෝරුවන් පුහුණු කිරීම නවත්වා තිබෙනවා.

You are not recruiting surveyors as such.—[*Interruption*]. They may have attended Technical College.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

There is a centre at Diyatalawa.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

We have a big one now.

**රත්නායක මයා.**
*(திரு. ரத்னுயக்க)*
(Mr. Ratnayake)

You believe in big things.

ආහාර අතින් මේ රට ස්වයංපෝෂිත කරන්නට ක්‍රියා කරගෙන යන මේ වේලාවේදී එය හරියාකාර සාර්ථක කර ගන්නට නම් ඉඩම් ප්‍රශ්නය විසඳන්නට ඕනෑ. අද රජයේ දෙපාර්තමේන්තුවල සිටින මිනින්දෝරුවන්ගේ ගණන 800 කටත් අඩුයි. මේ ගණන කිසි සේත්ම ප්‍රමාණවත් නැහැ. මිනින්දෝරුවන් නැතිව දිසාපතිවරුන්ට කවදාවත් මේ ඉඩම් ප්‍රශ්න විසඳන්නට බැහැ. ඉඩම් මනින්නට ඕනෑ. මනින්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැතිව ඉඩම් ප්‍රශ්න විසඳන්නට බැහැ. දැනට අවුරුදු දහයක් දොළහක් පරණ ජන පදවල ඇති ඉඩම්වල පවා තවම නියම මායිම් නැහැ. The boundaries have not been marked yet. ඒ නිසා මේක විශාල කරදරයක්. මේ පනත අනුව ග්‍රාන්ට් එකක් උඩ ඉඩම් කට්ටි මනින්නට දෙන්නට බලාපොරොත්තු වෙනවා නම් මිනින්දෝරුවන්ගේ සංඛ්‍යාව වැඩි කළ යුතුයි. මිනින්දෝරුවන් වැඩි කොට සෑම ඉඩමක්ම මනින්නට විධිවිධාන යෙදිය යුතුයි. දැනට සිටින මිනින්දෝරුවන්ගේ සංඛ්‍යාව 800 කටත් අඩු බව මා මතක් කළා. දැනට රජයේ දෙපාර්තමේන්තුවලට මිනින්දෝරුවන් බඳවා ගන්නේ නැහැ. සිටින අයත් අවුරුද්දෙන් අවුරුද්ද විශ්‍රාම යනවා. මේ ගරු ඇමතිතුමා 1956 දී ඉඩම් ඇමතිවරයා වශයෙන් පත් වන විට සිටියේ මිනින්දෝරුවන් 270 දෙනයි. එදා මේ ඇමතිවරයා යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම නිසා මිනින්දෝරුවන්ගේ සංඛ්‍යාව සෑහෙන තරමකින් වැඩි කර ගන්නට පුළුවන් වුණා. මිනින්දෝරුවන් වෙනත් දෙපාර්තමේන්තුවලට මුදා නොහැරීමේ ප්‍රතිපත්තියක් 1960 වර්ෂය තරමේදී පටන් ගත්තා. They were never seconded for duty to any other department.

දැන් එක පැත්තකින් මිනින්දෝරුවන්ගේ ගණන අඩුයි. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ සිටි සමහර මිනින්දෝරුවන් දැන් ආදායම් පාලක නිලධාරීන් වශයෙන් වැඩ බලනවා. මේක අපරාධයක් නොවැ. [බාධා කිරීමක්] That is news to you. මේ සම්බන්ධයෙන් ලිපිකරු සේවා සංගම් තමුන්නාන්සේට බලවත් සේ විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඒ උදවියට ඒ විධියේ පත් වීම් ලැබීම ගැන මගේ නම් කිසිම ඊර්ෂ්‍යාවක් නැහැ. ඒ වාගේම යම් කෙනකුට ඒ විධියේ පත් වීමක් දීම ගැන මා චෝදනා කරන්නේ නැහැ. මා චෝදනා කරන්නේ ප්‍රතිපත්තියක් වශයෙන් අනුගමනය කරගෙන ආ වැඩ පිළිවෙළ දැන් පැත්තකට දමා තිබීම ගැනයි. යම් යම් අය සතුටු කිරීමට ක්‍රියා කිරීමෙන් සංවර්ධන ව්‍යාපාර කඩාකප්පල් වෙනවා නේද? **ඒ නිසා මුල් පනත අනුව** හෝ වේවා මේ සංශෝධන පනත අනුව හෝ වේවා ඉඩම් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අවංකව ක්‍රියා කළ යුතුයි. මේ සංශෝධන පනත අවංක අන්දමින් ක්‍රියාත්මක කරන්නට වුවමනා නම් මිනින්දෝරුවන්ගේ සංඛ්‍යාව වැඩි කළ යුතුයි. එපමණක් නොව ඒ ඒ කච්චේරිවලට අවශ්‍ය මිනින්දෝරුවන් සපයා දිය යුතුයි. මිනින්දෝරුවන් නැති නිසා, ඉඩම් මැන නියම අන්දමට මායිම් ගල් නොදමන නිසා දැන් මහජනයාට මේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හිසරදයක් වී තිබෙනවා. 1956දී ඇති කරන ලද මහවිලච්චිය ගොවි ජනපදයට දැන් මේක මහා හිසේ රදයක්. නියම විධියට බදු අය කරන්නට පුළුවන්කමක් නැහැ. නියම විධියට දිය බද්ද අය කරන්නටත් බැහැ. තමන්ට රජයෙන් ලැබිය යුතු දේවල් ලැබෙනවා නම් බදු ගෙවන්න ලෑස්ති යයි ජනපදවාසීන් කියනවා. ඔවුන්ට නියම විධියට මඩින් අක්කර 3ක් ලැබී නැහැ. සමහරුන්ට ලැබී තිබෙන්නේ අක්කර 2 1/4 යි, නැත්නම් 2 1/2 යි. ඒ වාගේම, ගොඩින් ලැබිය යුතු අක්කර 2 වෙනුවට ලැබී තිබෙන්නේ අක්කරයයි, නැත්නම් 1 1/2 යි. එහෙත් මිළ මුදල් තිබෙන සමහරුන්ට නම් අක්කර 3 වෙනුවට 4 ක් 5 ක් ලැබී තිබෙනවා; වෙනත් විධියකට කියනවා නම් අල්ලාගෙන තිබෙනවා. 1956 දී ඇති කළ මහවිලච්චිය ජනපදය ගැන ඉඩම් ඇමතිතුමා දන්නවා. ඔවුන්ට වාරිමාර්ග පහසුකම් ලැබී නැති නිසා එය ලැබෙන තුරු අක්කර බද්දෙන් හා දිය බද්දෙන් නිදහස් කරන ලෙස ඒ ජනපදවාසීන් ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා. එක්තරා අවධියකදී ඉඩම් ඇමතිතුමා ඔවුන්ට යම්කිසි සහනයක් දුන්නා. එහෙත් දැන් නියෝග කර තිබෙනවා, 1966 සිටම හිඟ බදු මුදල් එකතු කර ගන්නය කියා. එය විශාල අපරාධයක්. ඔවුන්ට ඒ බදු මුදල් එකවර ගෙවන්න පුළුවන්කමක් නැහැ. දිය බද්ද හෝ වේවා අක්කර බද්ද හෝ වේවා ගෙවන්න ඔවුන් සූදානම්, රජයෙන් ඉටු විය යුතු යුතුකම් නිසියාකාරව ඉටු වෙනවා නම්. ඔවුන්ට නියම විධියට මායිම් සකස් කර දී නැහැ; වාරිමාර්ග පහසුකම් ලබා දී නැහැ. ඒවා නොකර කවරදාවත් නියම විධියට බදු මුදල් එකතු කර ගන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒවා සපයනවා නම් බදු එකතු කර දීමට අපිත් උදව් වෙන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

එදා—20 වැනිදා—රාජාංගන ව්‍යාපාරයේ වම් ඉවුරේ කට්ටිකරුවන් ඇවිත් හිටියා, ඇමතිතුමා හමු වන්න. එහෙත් එදා එතුමා ආවේ නැහැ. ඒ අයගේ පැමිණිල්ල මෙයයි: ඉඩම් ඇමතිතුමා විටින් විට දකුණු ඉවුරට එනවාලු. ඒ වාගේම වම් ඉවුරටත් ඇවිත් බලන්නලු. වම් ඉවුරේ අයට සුදුසු පාරවල් නැතිලු; ගෙවල් නැතිලු. "මුදල් ඇමතිතුමාගේ ඡන්දදායක කොට්ඨාශයේ සිටින තමුන්නාන්සේලාත් ඔය විධියට චෝදනා කරනවා නම්, මේ රජය යන ගමන ගැන තමුන්නාන්සේලා අවබෝධ යක් ලබා ගන්න ඕනෑ" යයි, මා ඔවුන්ට කාරණය තේරුම් කර දුන්නා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**

වැරදි විධියට තේරුම් කර දුන්නා ?

**රත්නායක මයා.**
*(திரு. ரத்ணயக்க)*
**(Mr. Ratnayake)**

මා කළේ, ඔවුන්ට තත්ත්වය පැහැදිලි කර දීමයි. රජයෙන් විය යුතු යුතුකම් කලට වේලාවට කර දිය යුතු බව මා විශේෂයෙන් මතක් කරන්නට කැමතියි.

අපේ රට කෘෂිකාර්මික රටක්. එම නිසා, ඉඩම් ප්‍රශ්නය ඉතාමත් බැරෑරුම් තත්ත්ව යක පවතින මෙවැනි අවස්ථාවක, අවුරුදු ගණනාවක් ගත වී වුවත් මෙවැනි සංශෝධන පනතක් ගෙන ඒම ගැන අප සන්තෝෂ වෙනවා. ඒ අතරම මේ සංශෝධන පනතේ වගන්තියක් වගන්තියක් පාසා අපේ දැනුමේ තරමින් කථානායකතුමා මඟින් රජයට අපේ අදහස් කියා පෑම අවශ්‍යයි. සමහර විට අපේ අදහස් ඉඩම් ඇමතිතුමා පිළිගන්නත් පුළුවනි; නො පිළිගන්නත් පුළුවනි. එය වෙනම ප්‍රශ්න යක්. එහෙත්, විශේෂයෙන් ගොවි ජනතාව වෙනුවෙන් ඔවුන්ට බලපාන වැදගත් ප්‍රශ්න ගැන අපේ අදහස් ප්‍රකාශ කරන්නට අපට අයිතියක් තිබෙනවා. එම නිසා ස්ථාවර කමිටුවක් ඉදිරියට මේ සංශෝධන පනත ඉදිරිපත් කරනවා වෙනුවට, මුළු මන්ත්‍රී මණ්ඩලයම කාරක සභාවක් බවට පරිවර්තනය වී මේ පනතේ වගන්ති යක් වගන්තියක් පාසා සලකා බැලීමේ අවස්ථාව ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**

With regard to that, I would draw the hon. Member's attention to Standing Order No. 57. I have not the power to do what the hon. Member wants done.

**රත්නායක මයා.**
*(திரு. ரத்ணயக்க)*
**(Mr. Ratnayake)**

ඒ ගැන ඇමතිතුමා වගබලා ගන්නවා ඇති.

ඊළඟට, මේ සංශෝධන පනතේ තිබෙනවා ණය ගැනීමේ ක්‍රමයකුත්. තම ඉඩම් උකසට තබා නොයෙකුත් බැංකුවලින් ණය ලබා ගන්න පුළුවන්ලු. එහෙත්, අර ගොවි ණය ලබා ගන්නට තමන්ගේ හාල් පොත් උකස් කර දුක් විඳින්නට අහිංසක ගොවීන්ට සිදු වුණා වාගේ තත්ත්වයක් මේ ණය ගැනීමෙනුත් ඇති වෙතැයි මා තුළ ලොකු බියක් තිබෙනවා. රජයේ වගා ව්‍යාපාරය යටතේ හාල් පොත් උකස් කොට ණය ගන්නට ගොවීන් පෙළඹවූවා. එහෙත් එසේ ණය ගත් ගොවීන් අතුරින් සමහරකුගේ කුඹුරු මැරී ගියා. එම නිසා නියමිත කාලය තුළදී ණය ආපසු ගෙවා ගන්නට වුණා. ඒ හේතුවෙන් දැන් ඔවුන්ට ඊළඟ කන්නය සඳහා ණය ලැබෙන්නේත් නැහැ, පිණට ලැබෙන හාල් සේරුව ගන්න හාල් පොතත් නැහැ. ඔවුන්ගේ හාල් පොත්වල කූපන් සියල්ලම කපා ගත්තත් කමක් නැහැ. මිරිස්, ළූණු, පරිප්පු, උම්බලකඩ ආදිය ගැනීම සඳහා හාල් පොතේ කැල්ලක් වෙන්ව තිබෙන නිසා ඒ කැල්ලවත් ඔවුන්ට ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ගොවි ණය ගැනීම සඳහා හාල් පොත් උකස් කිරීමේ හේතුවෙන් අන්තිමේදී මිරිස්, ළූණු, උම්බලකඩ, පරිප්පු ටික පවා ගන්න බැරි වුණා වාගේ, මේ ණය ගැනීමෙනුත් දුක් විඳින්නට සිදු වෙතැයි මා තුළ විශාල

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

හයක් තිබෙනවා. මේ සංශෝධන පනතේ තිබෙන අන්දමට තමන්ගේ ඉඩම් නොයෙක් ආයතනවලට උකස් කර ණය ගන්න අක්කරය බාගය ඉඩම් තිබෙන අයට නම් ලෙහෙසියෙන් පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒකත් කරනවා නම් කරන්ට පුළුවන්කම තිබෙන්නේ අක්කර සිය ගණන් ලබා ගත් මධ්‍යම පන්තියේ උදවියට පමණයි. විශේෂ බදු ක්‍රමය යටතේ ඉඩම් ලබාගත් උදවිය කරගෙන යන අක්‍රමිකතා ගැන දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ජයකොඩි මයා.) මතක් කළා. ඒ ගැන දැන් ගරු ඇමතිතුමා පරීක්ෂා කරගෙන යනවා ඇති. කිසිම පරීක්ෂණයක් නොකර ඉඩම් සංවර්ධන ආඥාපනතේ සියලුම නීති රීති උල්ලංඝණය කරල තමයි, විශේෂ බදු ක්‍රමය ආරම්භ කළේ. එයින් සිදු වුණේ දුප්පත් ජනතාව තවත් දුකට පත්වීමයි. මේ සම්බන්ධයෙන් පසුගිය විවාදයකදී ගරු ඇමතිතුමාට මතක් කළ කාරණයක් උදාහරණයක් වශයෙන් ඉදිරිපත් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මගේ කොට්ඨාශයේ අන්දරදිගිලිය කියා ගමක් තිබෙනවා ; අනුරාධපුරයේ අංක 2 තුලානේ බටහිර නුවරගම් පළාතේ පහළ අන්දරදිගිලිය. ඒ ගමේ සිටින්නේ පදිංචිකරුවන් අට දෙනයි. ඒ උදවියගෙ ඔළගමක් තිබුණා, ඉහළ අන්දරදිගිලිය කියා. ඉඩම් ඇමතිතුමා ඉහළ අන්දර දිගිලිය කොලොන්නාවේ පෙරේරා නමැති මහත්මයෙකුට විශේෂ බදු ක්‍රමය යටතේ පවරා දුන්නා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
කවුද, එල්. එස්. පෙරේරාද ?

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
මොන පෙරේරාද කියා මා දන්නෙ නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
එන්. එම්. පෙරේරාද ?

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)
එන්. එම්. පෙරේරා එහෙ ඉඩම් අල්ලා ගෙන නැහැ. එන්. එම්. පෙරේරාගෙන් නම් තමුන්නාන්සේ තිබෙන ටිකත් ගනීවි.

ගරු කථානායකතුමනි, දැන් අවුරුද්දකට විතර කලින් මම ගරු ඇමතිතුමාට මතක් කළා, මා කලින් සඳහන් කළ පවුල් අටට ඉඩම් වෙන් කරල ඉතුරු හරිය පෙරේරා මහත්මයාට දුන්නාට මගේ විරුද්ධත්වයක් නැහැ කියා. මේ කාරණය ගැන මම දිසාපතිතුමාටත් අනේක වාරයක් කරුණු කියල ඇති. මා පෙරේරා මහත්මයාව පෞද්ගලිකව හමුවෙලා එතුමා ගෙනුත් ඉල්ලා සිටියා, මේ ගම්මුන්ට අඩු ගණනේ තව අක්කර 40 ක්, 50 ක් වෙන් කරල ඉතුරු හරිය තමුන්නාන්සේ ගන්නය කියා. ඒ ඉඩම්වල කටයුතු සාර්ථක කර ගන්නට පුළුවන් වෙන්නෙ ගම්මුන් සමඟ සමඟියෙන් කටයුතු කළොත් පමණක් බවත් මා එතුමාට මතක් කළා. එහෙත් තවම ඒ ඉල්ලීම ඉටු වුනේ නැහැ. පෙරේරා මහත්මයා තවම ඒ ඉඩම්වල කිසිම ගොවිතැනක් කර නැහැ. ගස් ටික නම් කපාගෙන ඉවරයි. මේ වගේ කොයි තරම් නීති සංශෝධනය කළත්, ඇමතිතුමා තමන්ගේ විශේෂ බලතල පාවිච්චි කර ඒ අන්දමේ වැඩ කරනවා නම්, නිකම් කාලය මිඩංගු කරගෙන අපි මේ විධියේ පනත් ගැන සාකච්ඡා කර නීති සංශෝධනය කිරීමෙන් ප්‍රයෝජනයක් නැහැ.

ගරු කථානායකතුමනි, බදු ඉඩම්වල අයිතිය පැවරීම සම්බන්ධයෙන් මේ පනත මගින් විශේෂ වැඩ පිළිවෙලක් සකස් කර තිබීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ නීතිය මේ ආකාරයටම ක්‍රියාත්මක වෙනවා නම් ඉඩම්වල ඔප්පු අයිතිකරුවන්ටත්, ඔවුන්ගෙන් පැවතෙන්නන්ටත් විශාල සහනයක් සැලසෙන බවට කිසිම සැකයක් නැහැ. ඒ කරුණු ගැන විශේෂයෙන් සලකන්නට ඕනෑ. අද ඔප්පුවක් හිමි කෙනෙකු ඔහුගෙන් පැවතෙන්නන්ට ඒ ඔප්පුව පවරා දෙන්නට යැමේදී නොයෙක් විධියේ අක්‍රමිකතා සිදු වෙනවා. ඉඩම් සංවර්ධන ආඥාපනතේ උප ලේඛනයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

ඥාතීන් පිරිසක් ගැන සඳහන් කර තිබෙනවා. ඒ අනුව ඉඩම්වල අයිතිය පවරා දෙන්න ගියාම නොයෙක් විධියේ අවුල් සිදු වෙනවා. ඒ අවුල් ගැන කලින් කරුණු ඉදිරිපත් වුණා. සමහරවිට ඉඩමේ ඔප්පුව හිමිකරු මළාට පසුව ඔහුගේ භාර්‍යාවට පවා ඒ ඉඩම නැතිවී යන තත්ත්වයක් තමයි, අද තිබෙන්නේ. ඒ තත්ත්වය වැළැක්වීමට ගරු ඇමතිතුමා අළුත් පනතෙන් විධිවිධාන සකස් කර තිබීම ඉතා වැදගත් දෙයක්. ඒ නිසා එය ඒ විධියටම ක්‍රියාත්මක වෙනවා නම් විශාල සහනයක් සැලසෙන බව මා නැවතත් මතක් කරන්ට කැමතියි.

ගරු කථානායකතුමනි, මා මුලින් කිව්ව වගේ මේ සංශෝධන පනතත්, මුල් පනතත් සන්සන්දනය කර කියවා බලා අපට කාරකසභා අවස්ථාවේදී වැදගත් කරුණු ඉදිරිපත් කරන්නට ගරු ඇමතිතුමා අවස්ථාව සලසා දෙයි කියා මා විශ්වාස කරනවා. රාජ්‍ය ඇමතිතුමා මොනවා කිව්වත්, බැණුම් අහන්නට සිද්ධ වෙන්නෙ, ගරු ඉඩම් ඇමතිතුමාටයි. ඒ නිසා මේක පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරකසභාවකට ගන්න. මේක ඉක්මන් කරන්ට ඕනෑ කියා රාජ්‍ය ඇමතිතුමා තමුන්නාන්සේට දිරව්ව ලණු දෙයි. ඒවා භාර ගන්න එපා. [බාධා කිරීමක්] අපි දූන් පරණ උදවිය කියන ඒව ගණන් ගන්නෙ නැහැ. ඒ නිසා ආණ්ඩු පක්ෂයේත්, විරුද්ධ පාර්ශ්වයේත් සෑම ගරු මන්ත්‍රීවරයෙකුටම මේ වැදගත් පනත ගැන රට වෙනුවෙන් තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒ අදහස් මේ විවාදයේදී ඉදිරිපත් කරන්න පුළුවනි.

**රත්නායක මයා.**
*(திரு. ரத்நாயக்க)*
(Mr. Ratnayake)

හදිසිය මොකක්ද ? මේ විධියේ සංශෝධනයක් මේ ගෙනෙන්නෙ අවුරුදු 33 කට පසුයි. මේක රටට අදාළ මූලික ප්‍රශ්නයක්. ඒ නිසා මේ පනත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවකට පවරා සෑම මන්ත්‍රීවරයකුගේම අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

මෙයට අවුරුදු හතරකට පෙර මහජනතාවට දුන් පොරොන්දු අනුව, වාසනාවකට මෙන් 1970 දී මහා මැතිවරණයක් ඒවිය යන බලාපොරොත්තුව උඩ මෙබඳු පනතක් ඉදිරිපත් කිරීම ගැන ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙහි අඩංගු කාරණා ඉදිරි කාලය තුළදී ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියා අපට කියන්න බැහැ. කෙසේ හෝ වේවා මෙම පනතේ අඩංගු වැදගත් කාරණා නියම අන්දමට ක්‍රියාත්මක කරන්න හැකි වුණොත් එයින් ගම්බද මහජනතාවට සෙතක් සලසන්න පුළුවන් යයි ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)

ගරු කථානායකතුමනි, ඉඩම් සංවර්ධන ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ එතුමා විශාල සිත් නැවුලකින් පසුවන මේ අවස්ථාවේදී එම සිත් නැවුල තවත් වැඩිකිරීමට මා උත්සාහ කරන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නා පරිදි බණ්ඩාරනායක ආණ්ඩුව කාලයේදී අගමැතිතුමා හෝ අගමැතිනිය රටින් බැහැරව යන අවස්ථාවලදී රාජ්‍ය නායකයා හැටියට සභානායකතුමා පත් කිරීම සම්ප්‍රදායක් වී තිබුණා. [illegible]ගෙන් වර්තමාන ආණ්ඩුව යටතේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙවරක්ම ඒ සම්ප්‍රදාය කඩා ඒ වගකිවයුතු කටයුත්ත රාජ්‍ය ඇමතිතුමාට බාරදීම නිසා නැවතත් පිහිය මුවහත් තබාගෙන සිටින බව අපට සැලවී තිබෙනවා.

මීට සති දෙකකට පමණ උඩදිත් මේ ඉඩම් ඇමතිවරයා විසින්ම මේ වාගේම ගොවි ජනතාවට බලපාන වාරිමාර්ග (සංශෝධන) පනත කියා එකක් මේ ගරු සභාවට ඉදිරිපත් කළ බව තමුන්නාන්සේ දන්නවා. ඒ අවස්ථාවේදී කුඹුරු ගොවීන්ට යහපතක් යයි කියා ඉදිරිපත් කළ ඒ පනතට සංශෝධනයක් ඉදිරිපත් වූ අවස්ථාවේදී කුඹුරු පනතේ ආදි කර්තෘවරයා යයි කියන ගරු කර්මාන්ත ඇමතිතුමා ඡන්දය දීමෙන් වැළකී සිටි බවත් තමුන්නාන්සේ දන්නවා. ඒ සිද්ධිය වුණේ මෙයට සති දෙකකට පමණ උඩදී. ගොවි ජනතාවට යම්කිසි සහනයක් සලස්වා දෙන්නට එදා කටයුතු කළ ගරු කර්මාන්ත ඇමතිතුමා කෙරෙහි කොතරම් වෛරයකින් වර්තමාන ඉඩම් ඇමතිතුමා කටයුතු කරනවාද කියන එක එයින් පැහැදිලි වෙනවා. බණ්ඩාරනායක ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමති වශයෙන් සිටි වර්තමාන කර්මාන්ත ඇමතිතුමා එදා බණ්ඩාරනායක ආණ්ඩුවෙන් නෙරපීමට ඉඩම් ඇමතිතුමා කටයුතු කළාක් මෙන්ම සේනානායක ආණ්ඩුවෙනුත් එතුමා නෙරපීමට ගරු ඉඩම් ඇමතිතුමා දැන් සිටම පෙත්සම් අත්සන් කරනවාලු. ඒ කෙසේ වෙතත් මේ ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත ගැන කියන විට එක කරුණක් සක්සුදක් සේ පැහැදිලි වෙනවා. එම කරුණ නම් මේ ඉදිරිපත් කර තිබෙන අදහස්—මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන—ඉදිරිපත් කර තිබෙන්නේ පැහැදිලි දර්ශනයක් හෝ පැහැදිලි ප්‍රතිපත්තියක් නැතිව ඔළුවත් අවුල් වූ දිවත් පැටලෙන ඇමතිවරයෙක් විසින් වීමයි. එසේ කීමට හේතුව මෙයයි: මේ ඉඩම් ඇමතිතුමා දන්නේ නැහැ මේ පනතින් මේ රටේ ගොවි ජනතාවට යහපතක් සිදු වෙනවද නැද්ද කියා. එවැනි නිගමනයක් කිරීමට එතුමාට ආත්ම ශක්තියක් නැති බව මේ පනතින් ඔප්පු කළ හැකියි.

ගරු කථානායකතුමනි, සංශෝධන පනතක් ඉදිරිපත් කරනවාය කියන්නේ පනතක් මගින් මුල් පනතට සංශෝධන ඉදිරිපත් කිරීමයි. මෙම සංශෝධන පනතෙහි වගන්ති 90ක් පමණ තිබෙනවා. එම වගන්ති 90 න්ම අදහස් කරන්නේ මුල් පනතේ එසේ නැත්නම් ප්‍රධාන ප්‍රඥප්තියේ ඇති යම් යම් කොටස් අවලංගු කොට—යම් යම් වචන සහ වගන්ති අවලංගු කොට—ඒ වෙනුවට අලුත් වචන සහ වගන්ති ආදේශ කිරීමෙන් ඒ මුල් පනත සංශෝධනය කිරීමයි. ඒ නිසා මට තේරෙන හැටියට යම්කිසි පනතක් සංශෝධනය කර එය නීතිගත වුණාට පසුව එය නීතිගත වූ දින සිට ඉන් ඉදිරියට බලපවත්වන්නේ එම සංශෝධන පනතයි. එහෙත් මේ සංශෝධන පනත දෙකටම නැති පනතක්. මෙය නපුංසක පනතක්. මේ පනතත් මෙය ඉදිරිපත් කළ ඇමතිවරයා වගේම දෙකටම නැති දෙබිඩි ප්‍රතිපත්තියක් අන්තර්ගතවුණු පනතක් බව මෙහි ඇති වගන්තිවලින් පැහැදිලි කරන්නට පුළුවන්.

ගරු ඉඩම් ඇමතිවරයා මේ පනතින් අදහස් කරන්නේ කුමක්ද? ඇත්ත වශයෙන්ම ගරු ඉඩම් ඇමතිවරයා සඳහන් කළ ආකාරයට මේ පනතින් අදහස් කරන්නේ ඉඩම් කොමිසන් වාර්තාවේ තිබුණු ඇතැම් නිර්දේශ නීතිගත කිරීමට නම්, ඒවා නීතිගත කිරීමෙන් සහ ඒවා ක්‍රියාවට පරිවර්තනය කිරීමෙන් මේ රටේ ගොවි ජනතාවට සහනයක් ලැබෙනවාය කියා ඉඩම් ඇමතිතුමා කියන්නට ඕනෑ. එසේ නම් අපි මෙයට විරුද්ධ වන්නේ නැහැ. නමුත් එබඳු තීරණයකට, එබඳු නිගමනයකට බැසීමට ඉඩම් ඇමතිවරයාට ශක්තිය නැති බවයි අපේ පළමුවන පැමිණිල්ල. ගරු කථානායකතුමනි, මෙම පනත සම්මත වුණායින් පසුව ඇති වන තත්ත්වය කුමක්ද? මෙම සංශෝධන පනතේ 89 වන වගන්තිය කියවා බැලුවොත් මෙහි ඇති අවුල් තත්ත්වය වඩාත් පැහැදිලි වෙනවාට කිසිම අනුමානයක් නැහැ. පනත් කෙටුම්පතේ ඉංගිසි පිටපතයි මා ළඟ දැනට තිබෙන්නේ. එම නිසා මෙහි 89 වන වගන්තිය මා ඉංගිසියෙන් කියවා තේරුම් කර දෙන්නම්. මෙන්න වගන්තිය:

"89 (1) Every person who, on the day immediately preceding the date of commencement of this Act, is in occupation of any land alienated under the provisions of the principal enactment in the capacity of either permit-holder or owner, shall, on or before such date as may be



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

notified in the Gazette by the Government Agent of the administrative district in which such land is situated, elect whether such person will hold such land under the provisions of the principal enactment as amended by this Act or under the provisions of the principal enactment before such amendment, and shall notify such election to the Government Agent."

ඒ කියන්නේ, මෙම සංශෝධන පනත ක්‍රියාත්මක කිරීමට දිනකට පෙර, සතු කරනු ලැබූ යම් ඉඩමක, අවසර පත්‍ර දරන්නා වශයෙන් හෝ අයිතිකරු වශයෙන් පදිංචිව සිටින තැනැත්තා විසින්, දිසාපතිතුමා විසින් ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබූ දිනට පෙර, තමා ඒ ඉඩම ඇරීමට අදහස් කරන්නේ කලින් බලපැවැත් වූ නීති රීති යටතේද එසේ නැතිනම් සංශෝධන නීතිරීති යටතේද කියා දැනුම් දිය යුතුයයි සඳහන් කර තිබෙනවා. මේ අනුව කල්පනා කර බලන විට අවලංගු කරන ලද නීතිරීති යටතේ තෝරා ගන්නවාදැයි ප්‍රශ්න කිරීම තේරුමක් නැති වැඩක් බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ නීතිය බලපාන්නේ පැරණි නීතිරීති අනුව ඉඩම් ලබාගත් අයට පමණයි. අනාගතයේදී ඉඩම් ලබාගන්නා අයට ඒ නීති බලපාන්නේ නැහැ.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

ඒ කියන්නේ, දැනට ඉඩම් ලබා ගෙන ඇති අයට, අවලංගු කරන ලද නීතිය යටතේ එම ඉඩම්වල පරිපාලන කටයුතු ගෙන යනවාද නැතිනම් සංශෝධන පනතේ නීතිරීති යටතේ පරිපාලන කටයුතු ගෙන යනවාද කියා තෝරා ගැනීමට අවසර දී තිබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක අයුක්තියක්ද?

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

යම් නීතියක් හොඳයයි කියා ගරු ඇමතිතුමා සම්මත කර ගැනීමට බලාපොරොත්තු වෙනවා නම් සියළු දෙනාටම ඒකාකාරව ඒ නීතිය බලපාන අන්දමට සකස් කළ යුතුයි. එම නිසා පොදුවේ හැම දෙනාටම බලපාන අන්දමට සකස් කර ඉදිරිපත් නොකරන්නේ මන්දැයි ප්‍රශ්න කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම ඒ අන්දමට නීතිරීති සම්මත කර ගැනීම නිසා අනාගතයේදී ගැඹුරු ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වන වාට කිසිම අනුමානයක් නැති බවයි මගේ විශ්වාසය.

ගරු කථානායකතුමනි, මෙම සංශෝධන පනතේ තේරුම හරියාකාරව වටහා ගැනීමට නම් ඉඩම් සංවර්ධන ආඥා පනතට පෙර මේ රටේ තිබුණු තත්ත්වය ගැන මඳක් සිත් යොමු කිරීම වැදගත් යයි මා කල්පනා කරනවා. අධිරාජ්‍යවාදීන් මේ රට පාලනය කළ අවදියේදී නොයෙක් අන්දමේ නීතිරීති, රෙගුලාසි තිබුණා. ඒවායේ පරස්පර විරෝධතාවන් තිබුණා. ඒ නිසා අවුල් වියවුල් තත්ත්වයක් තිබුණා. එම නිසා පැහැදිලි ඉඩම් ප්‍රතිපත්තියක් මේ රටේ ඇති කරන්න වුවමනා වුණු නිසා ඒ කාලයේදී, 1927 දී පමණ ඉඩම් කොමිසමක් පත් කළා. එම කොමිෂන් සභාවෙන් කළ නිර්දේශයන් අනුව, ඒකාබද්ධ පරිපාලනයක් ඉඩම් සම්බන්ධයෙන් තිබිය යුතුය කියන මතය උඩ පළමුවන වරට ඉඩම් දෙපාර්තමේන්තුවක් පිහිටුවා ඉඩම් කොමසාරිස්වරයකු පත් කර ඉඩම් බෙදා දීමේ ක්‍රමයක් අලුතෙන් ආරම්භ කළා. එව කට මෙම කටයුතු භාරව සිටියේ අතිගරු ඩී. එස්. සේනානායක මැතිතුමායි. එසේ ඉඩම් කොමසාරිස්වරයකු හා දෙපාර්තමේන්තුවක් ඇති කර, රජයේ ඉඩම් බෙදා දීමේ අළුත් ක්‍රමයක් සකස් කර දැන් අවුරුදු තිස් ගණනක් පසු වී තිබෙනවා. 1955 වන තුරුම ඉඩම් කොමසාරිස්, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ හා ඒ ඒ දෙපාර්තමේන්තු ඉඩම් සංවර්ධන ආඥාපනතේ වගන්ති ක්‍රමයෙන් ක්‍රියාත්මක කරගෙන ආවා. එම කටයුතු කොයි තරම් දුරට සාර්ථකව කෙරී තිබෙනවාදැයි මැන බැලීම සඳහාත්, ඉඩම් සංවර්ධන ආඥාපනත සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊට අදාළ අනෙක් අණපනත් ගැන සොයා බැලීම සඳහාත්, සාර්ථකව ඒ කටයුතු කෙරී නැත්නම් ඊට හේතු කවරේද, ඒ සඳහා අවශ්‍ය සංශෝධන මොනවාද යන්න නිර්දේශ කිරීම සඳහාත් තමයි, 1955 දී නැවතත් කොමිෂන් සභාවක් පත් කළේ. ඒ කොමිසම අතුරු වාර්තාවක් ඉදිරිපත් කළා. එහෙත් ඔවුන්ගේ අවසාන වාර්තාව නිකුත් කළේ, 1958 දීයි.

1956 සිට අද දක්වා—මාස කීපයක් හැරෙන්නට—ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ සම්පූර්ණ පාලන බලයත්, ප්‍රතිපත්ති හැදීමේ සම්පූර්ණ වගකීමත් පැවරී තිබුණේ වර්තමාන ඉඩම් ඇමතිතුමාටයි. ඉඩම් ඇමතිතුමා තම කථාවේ පෙරවදනින් කියා සිටියා, ආණ්ඩු දෙකක් විසින් රාජාසන කථා තුනකදී දුන් පොරොන්දු ඉෂ්ට කිරීම සඳහා මේ සංශෝධන පනත ඉදිරිපත් කළාය කියා. මා ඒ කියමනට එකඟ වන්නේ නැහැ. ඒ කෙසේ වෙතත් මේ සංශෝධන පනත ඉදිරිපත් කිරීමෙන් ඉඩම් ඇමතිතුමා අදහස් කළේ, පසුගිය මහා මැතිවරණ කාලයේදී තමන් විසින් මහජනතාවට දුන් ප්‍රධාන පොරොන්දුවක් ඉෂ්ට කරන්නට උත්සාහ දරන බවක් ජනතාවට හුවා දැක්වීමට පමණයි. පසුගිය මහා මැතිවරණ කාලයේදී ඉඩම් ඇමතිතුමා ඇතුළු හත් හවුල් රජයේ නායකයන් ගොවි ජනතාවට ප්‍රධාන පොරොන්දු දෙකක් දුන්නා. මේ රටේ කුඹුරු ගොවීන්ට තමන් වැඩ කරන බිම් කොටස සින්නක්කරව දෙනවාය කියන පොරොන්දුව මේ රජයේ පළමු වැනි රාජාසන කථාවේ ගැබ් වුණා, මැතිවරණ කාලයේදීත් කීවා. ඒ පොරොන්දුව අද වන තුරු ඉෂ්ට කළේ නැහැ. ඒ වෙනුවට, වාරිමාර්ග සංශෝධන පනත මඟින් අද ගොවියා පිට තවත් බදු බර පටවා තිබෙනවා.

ඊළඟට, ගොඩ ගොවිතැන් කරන, උස් බිම් ජනපදවල සිටින, ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ ඉඩම් ලබාගෙන ජීවත් වන ගොවීන්ටත් පොරොන්දුවක් දුන්නා, වර්තමාන රජය බලයට පත් වුණොත් තමන් ලබා තිබෙන ඉඩම්, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ "outright grant" හෙවත් කොන්දේසි විරහිත ප්‍රදානයක් වශයෙන් පවරා දෙනවාය කියා. එහෙත් මේ සංශෝධන පනත හොඳට විග්‍රහ කර බැලීමේදී අපට පෙනී යනවා, මේ පනත ඉදිරිපත් කිරීමෙන් උත්සාහ කර තිබෙන්නේ, ගොවි ජනතාවගේ ඇස්වලට වැලි ගසා ඔවුන් මුළා කර, පොරොන්දු ප්‍රකාර ඔවුන්ට ඉඩම් දෙන බවට මායාවක් පෙන්නීමට පමණක් බව. පොරොන්දු වුණේ කොන්දේසි විරහිත ප්‍රදානයක් වශයෙන් ඉඩම් පවරා දෙන්නටයි. එහෙත් සංශෝධන පනතින් කෙරෙන්නේ, "outright grant" නොව "conditional sale" එකක් හෙවත් කොන්දේසි සහිත විකිණීමක්. ඒ බව පනතේ වගන්තිවලින්ම ඔප්පු කරන්නට අපට පුළුවනි. කොන්දේසි සහිත විකිණීමක් කරන බවට නම් ජනතාවට පොරොන්දුවක් දී තිබුණේ නැහැ. පොරොන්දු වුණේ, ඉස්සර තිබුණු නීතිය යටතේම කොන්දේසි විරහිත ප්‍රදානයක් හැටියට ඉඩම් පවරා දෙන බවටයි. මේ ඉඩම් සංවර්ධන ආඥා පනත ඇති කළේ මේ රටේ දුකින් තොර, පිනෙන් බර, වාසනාවන්ත, සෞභාග්‍යමත්, ඉඩම් හිමි ගොවි ජනතාවක් බිහි කිරීමටයි. ගොවීන් ආරක්ෂා කිරීමටත්, ගොවීන්ට දෙන ඉඩම් සංවර්ධනය කිරීමටත්, දියුණු කිරීමටත්, නිවසක් තනා ගැනීමටත් සෑම අයුරින්ම ආධාර දීමට විධිවිධාන යෙදිය යුතු යයි මේ ඉඩම් කොමිෂන් සභා වාර්තාවෙන් නිර්දේශ කර තිබෙනවා. මුල් පනතේ ප්‍රධාන ප්‍රඥප්තියට අනුව රජයේ ඉඩම් දිය හැක්කේ ඉඩම් කච්චේරියක මාර්ගයෙන් පමණයි. මුල් පනතේ 20 වන වගන්තිය දෙස බලන විට එය හොඳට පැහැදිලි වෙනවා. මුල් පනතේ 20 වන වගන්තියේ තිබෙන්නේ මෙහෙමයි :

"All land shall be disposed of at a land kachcheri."

එපමණයි. නමුත් මේ සංශෝධන පනතින් එය ටිකක් වෙනස් කර තිබෙනවා. මුල් පනතේ හැටියට අවස්ථා දෙකක් පමණයි තිබෙන්නෙ. පළමුවන අවස්ථාව නම් අවසර පත්‍රයක් පිට ගොවියකුට ඉඩමක් දීමයි. ඒ ඉඩම දියුණු කර, හරියාකාරව වගා කළාට පසු ඉල්ලීමක් කළාම අවසර පත්‍රය වෙනුවට ඉඩම් කොමසාරිස්වරයා විසින් "ග්‍රාන්ට්" එකක් නැත්නම් ප්‍රදානයක් දෙනවා. ඒ දෙවන අවස්ථාවයි. ඒ ප්‍රදානය දෙන විට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

වාර්ෂික බද්ද වැඩි වෙන්නෙවත්, සින්නක්කරයට ගන්න අමුතුවෙන් මුදලක් ගෙවන්නවත් වුවමනාවක් නැහැ. අවසර පත්‍රයක් යටතේ තමන්ට ලැබුණු ඉඩම් කැබැල්ල සංවර්ධනය වූවායින් පසුව "ග්‍රාන්ට්" එකක් ඉල්ලනවා. ඒ "ග්‍රාන්ට්' එක ලැබුණොත් වර්ෂයකට පාසා ඉතාම සුළු මුදලක් ආණ්ඩුවට ගෙවන සිරිතයි මෙතෙක් තිබුණේ. එතකොට අවස්ථා දෙකයි. අවසර පත්‍රය ලැබුණු අවස්ථාව, අවසර පත්‍රය යටතේ ඉඩම සංවර්ධනය කළාට පසුව ආණ්ඩුවෙන් "ග්‍රාන්ට්" එකක් නැත්නම් ප්‍රදානයක් ඉල්ලීමේ අවස්ථාව යනුවෙන් අවස්ථා දෙකයි. නමුත් මේ සංශෝධන පනතින් ඒ අවසථා දෙක අවස්ථා තුනක් කර තිබෙනවා මේ දෙකටම නැති ඇමතිතුමා. කොහොමද එය කර තිබෙන්නෙ? මේ පනත යටතේ පළමුවෙන් ඉඩම් කච්චේරියකදී ඉඩමක් ලබා ගෙන අවසර පත්‍රයක් ගන්නවා. ඒ අවසර පත්‍රයේ ප්‍රකාර රජයේ පරිපාලනය යටතේ තමන් ඒ ඉඩම භුක්ති විඳිමින් වගා කළාට පසුව, යම්කිසි කාල පරිච්ඡේදයක් ගත වූවාට පසුව ආණ්ඩුවේ දිසාපති වරයා විසින් ඒ ඉඩමට යම්කිසි මුදලක් නියම කර යම්කිසි කාල සීමාවක් තුළදී ඒ මුදල ගෙවාපන්ය කියා ගොවියාට කියනවා. රජයේ වාරිමාර්ග ඒ ඉඩම සම්පයෙන් යනවා නම් ඒ ඉඩම සංවර්ධනය කිරීමට ආණ්ඩුවෙන් වැය වූ මුදලත්, ආණ්ඩුවෙන් යම් යම් ආධාර දුන්නා නම් ඒ සියලුම මුදලුත් එකතු කර, ඉඩමේ වටිනාකමත් මැන, සමහර විට පොළියත් එකතු කර තක්සේරුවක් කරනවා. වර්ෂ කිපයක් ඇතුළත ඒ මුදල ගෙවන්නය කියා දිසාපති වරයා නියම කරනවා. දැන් මේ ගෙවීම වාර්ෂික බද්දක් නොවෙයි. ඒ ගෙවීම අවසාන වූ විට තමයි අර ප්‍රදානය ලැබෙන්නෙ.

මුල් පනතේ ඔය ක්‍රමය නැහැ. විශේෂයෙන්ම මෙන්න මේ කොටසට තමයි අපේ විරුද්ධත්වය පළ කරන්නෙ. මේ රටේ දුප්පත් ජනතාව විසින් සංවර්ධනය කරන ලද ඉඩම් කැබැල්ල ප්‍රදානය කිරීමට ඇයි ඔවුන්ගෙන් මුදලක් අය කරන්නෙ? ඇයි ඔවුන්ට මේ ඉඩම් කැබැල්ල විකුණන්නෙ? ඇයි ඔවුනට මේ ඉඩම් කැබැල්ල නිකම් දෙන්නට බැරි? අප මේ අවස්ථාවේදී මතු කරන ප්‍රධාන ප්‍රශ්නය ඒකයි. මෙපමණ කලක් තුළ තමන් සංවර්ධනය කළාට පසු ඉඩම නිකම් දුන්නා නම්, නිකම් ප්‍රදානය කළා නම් ඇයි මේ සංශෝධන පනතින් ඒක වෙනස් කරන්නෙ? ඇයි මේ පනතින් ආණ්ඩුවේ ඉඩම් ගොවීන්ට විකුණන්නට ක්‍රමයක් සලස්වා තිබෙන්නෙ? අන්න ඒකයි මේ අවසථාවේදී අප මතු කරන ප්‍රධාන ප්‍රශ්නය. තමුන්නාන්සේලාගේ මැතිවරණ පොරොන්දුව ඒක නොවෙයි. ගොවියකුට අවසර පත්‍රයක් පිට භුක්ති විඳින ඉඩමක් තිබෙනවා නම් ඒ ඉඩම ගොවියාට විකුණනවාය කියා තමුන්නාන්සේලා මැතිවරණ කාලයේදී පොරොන්දු වුණේ නැහැ. එම ගොවීන්ගෙන් මුදල් ගන්නවාය කියා නොවෙයි මැතිවරණ කාලවලදී කිව්වේ. පත්‍රවල ලොකුවට පළ කරනවා. වේදිකාවල ඉඳගෙන හයියෙන් කෑ ගහනවා. අපි මේ රටේ ගොවි ජනතාවට ඉඩම් ප්‍රදානය කරනවායයි ප්‍රකාශ කරනවා. "outright grant" යනුවෙනුයි කියන්නේ. එහෙත් ඒක නොවෙයි කෙරෙන්නේ. ඉඩම්වලට සල්ලි ගෙවන්නට සිදු වී තිබෙනවා. ආණ්ඩුවෙන් සල්ලිවලට ඉඩම් ගන්නටයි ගොවීන්ට සිදු වී තිබෙන්නේ. ඒකයි ඇත්ත තත්ත්වය. ගොවියා විසින් වැඩ කරන ලද ඉඩමකට රජය විසින් යම් කිසි මුදලක් වැය කළා නම් ඒ මුදල නැවත ආපසු ලබා ගැනීම සඳහායි—සමහරවිට පොළියත් එක්කම ලබා ගන්නට විය හැකියි—ඉඩම් සංවර්ධන පනත මේ ආකාරයට සංශෝධනය කර තිබෙන්නේ. එම නිසයි අපි මෙම වගන්තියට තදින්ම විරුද්ධත්වය පළ කරන්නේ.

වාරිමාර්ග සංශොධන පනතින් කුඹුරු පනත මරා දැම්මා. අනික් පැත්තෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත මගින් ගොවි ජනතාවට ලබාදී තිබුණු සහනය—මුදල් නොගෙවා ප්‍රදානයක් වශයෙන් ඉඩම් ලබා ගැනීමට තිබුණු වරප්‍රසාදය—මෙම පනතින් අහෝසි කර දමා තිබෙනවා. දැන් ගොවීන්ට ඉඩම් විකිණීමටයි සූදානම් වී සිටින්නේ. ඩී. එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ පටන් 1968 නොවැම්බර් 24 වෙනි දින දක්වා තිබුණු ප්‍රතිපත්තිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනස් කරන්නට දැන් හදනවා. ඒක පුදුමයක් නොවෙයි. අපේ ආණ්ඩුව පැත්තේ සිටියදී ඩී. එස්. සේනානායක මැතිතුමාගේ ප්‍රතිපත්තියට තදින් විරුද්ධ වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා ඉඩම් ඇමතිතුමා දැන් එම තත්ත්වය වෙනස් කරන්නට හදනවා. මේ ඉඩම් සංවර්ධන ආඥා පනත හරියාකාර ක්‍රියාත්මක කරන්නට නොහැකි හේතුන් මොනවාදැයි සොයන්නට විශාල පරීක්ෂණයක් පැවැත්තුවා. 1955 සිට 1958 දක්වා පැවැත්වූ ඉඩම් කොමිසමක් මගිනුයි එය කළේ. එහි අවසාන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා. එම වාර්තාවේ පැහැදිලිව ලියා තිබෙනවා, මෙම ඉඩම් සංවර්ධන ආඥා පනත ඩී. එස්. සේනානායක මහතා අදහස් කළ ආකාරයට ක්‍රියාත්මක කරන්නට නොහැකි වුණු හේතුන් මොනවාද යන්න. එම වාර්තාවේ ඇතැම් නිර්දේශයන් නොපිටට පෙරළා මෙම ඉඩම් සංවර්ධන පනතට ඇතුළත් කර තිබෙනවා. එම වාර්තාවේ නොයෙකුත් හේතුන් දක්වා තිබෙනවා. ඉඩම් සංවර්ධන ආඥා පනතේ මුල් කර්තෘවරුන් අදහස් කරන ලද පරිදි එය මේ රටේ ක්‍රියාත්මක කරන්නට බැරි වුණේ මන්ද යන්න එම වාර්තාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

1958 පිට වූ එම වාර්තාවේ පළමුවෙන්ම සඳහන් කර තිබෙනවා, අවශ්‍ය පරිපාලන ක්‍රමයක් ඇති කර නොතිබීම නිසා ඉඩම් සංවර්ධන ආඥා පනත නියම ආකාරයට ක්‍රියාත්මක කරවීමට බැරි වුණු බව. 1958 වර්ෂයේ ඔවුන් කර තිබෙන නිර්දේශය එයයි. 1958 සිට 1968 දක්වා මේ ඇමතිවරයා කුම්බකරණයෙක් වාගේ නිදාගෙන සිටියා. එතුමා ඉඩම් සංවර්ධනය සඳහා කළේ කුමක්දැයි අපි මෙම අවස්ථාවේදී ප්‍රසිද්ධයේ පැහැදිලි ලෙස අහනවා. එදා එම ඉඩම් කොමිෂන් වාර්තාවේ කියා තිබුණා මෙම පනත ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය නිලධාරීන් පිරිසක් ඇති කර නැති වග. ඒ සඳහා අවශ්‍ය මානක නිලධාරීන්-මිනින්දෝරුවන්-පුහුණු කර නැති බව කියා තිබෙනවා. අවශ්‍ය මිනින්දෝරුවන් නැති නිසා එය ක්‍රියාත්මක කරන්නට බැරිලු. අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) අද උදේ මෙම සභාවට පැහැදිලි කර දුන්නා, ඉඩම් සංවර්ධන පනත හරියාකාර ක්‍රියාත්මක කරන්නට නම් ප්‍රධාන වශයෙන්ම අත්‍යවශ්‍ය වන්නේ මිනින්දෝරුවන් බව. එහෙත්, ඉඩම් ඇමතිතුමා අවුරුදු 10 ක් තිස්සේ මේ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා මිනින්දෝරුවන් පුහුණු කිරීමට හෝ හැකිතාක් ඉක්මනින් බලපත් හිමියන්ට ප්‍රදානය දීමට හෝ යොදා තිබෙන මාර්ග මොනවාද? 1958 සිට 1968 දක්වා කාලය තුළ මේ රටේ මිනින්දෝරුවන්ගේ ගණන කීයකින් වැඩි වී තිබෙනවාද? ඔවුන් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන කීයක් පිහිටුවා තිබෙනවාද? තිබෙන මධ්‍යස්ථානයත් දැන් වසා දමලා නේද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
නෑ.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

මිනින්දෝරුවන්ගේ හිඟය පිළිබඳව උදාහරණයක් වශයෙන් මට එක් කරුණක් කියන්නට පුළුවනි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දුප්පත් ගොවියකුගේ කිසියම් ඉඩම් ආරාවුලක් ඇති වුණොත් එහි අවශ්‍ය කටයුතු සඳහා යැවීමට හම්බන්තොට කච්චේරියේ මිනින්දෝරුවකු නැහැ. මුළු දිස්ත්‍රික්කයටම සිටින්නේ එක කච්චේරි "සර්වේයර්" කෙනකු පමණයි. හම්බන්තොට දිස්ත්‍රික්කය වර්ග හැතැප්ම 1,100 ක් විශාල ප්‍රදේශයක්. එහෙත්, ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ බෙදා දෙනු ලබන සියලුම ඉඩම්වල කටයුතු කිරීම සඳහා ඒ ප්‍රදේශයට සිටින්නේ එක මිනින්දෝරුවයි. අවශ්‍ය නිළධාරීන් නැතිලු. එහෙම නම්, අවශ්‍ය නිළධාරීන් පුහුණු කරවා ගැනීමට අවුරුදු 12 ක් තිස්සේ ක්‍රියා නොකෙළේ ඇයි? 1958 අවුරුද්ද වන විට මේ රටේ ඉඩම් සංවර්ධන ආඥා පණත යටතේ බලපත් 2,48,000ක් දී තිබුණු නමුත් "ග්‍රාන්ට්" එක හෙවත් ප්‍රදානය ලැබී තිබුණේ එම බලපත් හිමියන්ගෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

5,000 කට පමණක් බව ඉඩම් කොමිසමේ වාර්තාවෙහි ගණන් හිලවු සහිතව දක්වා තිබෙනවා. මේවා ඉතා වැදගත් සංඛ්‍යා ලේඛන. මේ හේතු කොට ගෙන ඉඩම් සංවර්ධන ආඥා පණත කෙරෙහිවත් එය ක්‍රියාත්මක කරවන්නන් කෙරෙහිවත් ගොවි ජනතාව තුළ කිසිම විශ්වාසයක් නැති බවත්, එම වැඩ පිළිවෙළද ඉතාම දුර්වල තත්ත්වයකට පත් වුණු බවත් එම වාර්තාවෙහි පැහැදිලිව කියා තිබෙනවා.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல— கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

වාර්තාව නිකුත් වී තිබෙන්නේ මොන අවුරුද්දේද ?

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**

*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*

(Mr. George Rajapaksa)

1958 දී.

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ඒක තමයි. මාත් හිතුවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**

*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*

(Mr. George Rajapaksa)

අපේ කාලයේදීත් අප හුඟක් මෝඩකම් කළා. මේ වාගේ කෙනකු ඉඩම් ඇමතිතනතුරට පත් කරගෙන අවුරුදු 12 ක්ම ඔහු ඒ තනතුරේම තබා ගැනීම තමයි අප කළ ලොකුම වරද. ඇයි මෙවැනි අය තබා ගත්තේ ? අප විරුද්ධ පාර්ශ්වයේ නායිකාවට දොස් කියන්නේ ඒ නිසා තමයි. ඉඩම් සංවර්ධන ආඥාපනත හරියාකාර ක්‍රියාත්මක කිරීමට ගම්බද කච්චේරිවලට අවශ්‍ය නිලධාරීන් පත් කරන්නට මේ ඇමතිතුමාට පුළුවන් වී නැහැ.

කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් කට්ටි පරිපාලන නිලධාරීන් 10 දෙනකු සිටිනවා. ඕවර්සියර්වරුන් 32 ක් සිටිනවා. එහෙත් කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශයේ තිබෙන ඉඩම් ප්‍රමාණය කොපමණද ? ගම් පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය යටතේ ගන්නා ලද ඉඩම් අක්කර 3,925 යි. රජයට ඉඩම් ලබා ගැනීමේ ආඥාපනත අනුව අත්කර ගත් ඉඩම් අක්කර 4,520 යි. ඒ අනුව, පාලනය කිරීමට තිබෙන මුළු අක්කර ගණන 8,445 යි. ඉඩම් කට්ටි තිබෙන්නේ 15,000 යි. මේ සුළු ප්‍රමාණය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ඉතා විශාල නිලධාරීන් සංඛ්‍යාවක් සිටින නමුත් එමෙන් දස ගුණයක් විශාල හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා සිටින්නේ නිලධාරීන් කීදෙනාද ? ඕවර්සියර්වරුන් 4 දෙනයි. අනික් අය 10 දෙනයි. මිනින්දෝරුවන් සිටින්නේ ඉතාම ස්වල්ප දෙනයි. ඒ අන්දමට නිසි පාලනයක් නැති නිසා තමයි මේවා ක්‍රමක් ක්‍රමයෙන් අහෝසි වී තියෙන්නේ. 1958 තිබුණු තත්ත්වය ගැන සංඛ්‍යා ලේඛන මා දැන් තමුන්නාන්සේට ඉදිරිපත් කළා. 1958 සිට මේ රාජකාරිය භාර වී සිටි ඇමතිතුමා විසින් කළ යුතු මූලික වැඩ නොකළ නිසා තමයි, තත්ත්වය මේ තරම් උග්‍ර වී තිබෙන්නේ.

ඉඩම් කොමසාරිස්තුමාගේ 1965-66 පාලන වාර්තාවේ තිබෙන අන්දමට අද තත්ත්වය මොකක්ද ? කොයි තරම් දුරට තත්ත්වය නරක් වී තිබෙනවාද කියා බලන්න. ඉඩම් කොමසාරිස්තුමාගේ 1965-66 පාලන වාර්තාවේ "ඒ" උප ලේඛනයේ මෙසේ සඳහන් වී තිබෙනවා :

> "1965-66 වර්ෂයේ ගම් පළල් කිරීම සඳහා ගැමියන්ට පවරා දුන් ඉඩම් :
>
> 1965-66 අවසානයේ ඇති මුළු කච්චිකරුවන් ගණන : අවසර පත්‍ර පිට 4,57,741යි. 1965-66 අවසාන වන විට ප්‍රදාන ලැබී තිබුණු කච්චිකරුවන් 4,707යි."

ඒ ඉලක්කම් දෙකෙන්ම පෙනෙනවා නේද, අද තත්ත්වය කුමක්ද කියන එක. ඉඩම් සංවර්ධන ආඥාපනත නියම අන්දමට ක්‍රියාත්මක කිරීමට නම් පළමුවෙන්ම කළ යුතුව තිබෙන්නේ අවශ්‍ය නිලධාරීන් සැපයීමයි. ඒ නිසා තමයි, මා මේ කරුණු පෙන්වා දුන්නේ. ගරු ඇමතිතුමා කොයි තරම් වුවමනාවෙන් මේ පනත් සංශෝධනය කළත්, මේ පනතෙන් අවසානයේදී කච්චිකරුවන්ට යම්කිසි වාසියක් ලැබෙනවා නම් එය ලැබෙන්නේ ග්‍රාන්ට් එක

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

හෙවත් ප්‍රදානය ලැබුණු පසු බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ප්‍රදානය ලැබෙන තුරු ඒ ප්‍රදානයට යටත් ඉඩම විකුණන්ටවත්, උගස් තියන්නටවත් බැහැ. නීත්‍යනුකූල තත්ත්වය එය බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. තත්ත්වය එසේ නම් ග්‍රාන්ට් එක ලැබෙන්නට කොපමණ කාලයක් සිටිය යුතුද යන ප්‍රශ්නය ඊ ළඟට මතු වෙනවා. ග්‍රාන්ට් එක ලබා දෙන්නට සියලුම ඉඩම් මනින්නට ඕනෑ; සැලැස්ම හදන්නට ඕනෑ; මායිම් බේරන්නට ඕනෑ. ඒ සියල්ලක්ම කරන්නට තමුන්නාන්සේට නිලධාරීන් නැහැ; මානක නිලධාරීන් නැහැ. ඒ නිසා මේ සංශෝධන පනත පොතට පමණක් සීමා වෙනවා ඇති. මේ පනත ක්‍රියාත්මක කරන්නට බැරි තත්ත්වයකුයි, අද පවතින්නේ. තමුන්නාන්සේ ඇමති ධුරය දරණ තුරු මේ රටේ එකම පනතක්වත් හරියාකාර ක්‍රියාත්මක කරන්නට පුළුවන් වේද යන්න මට නම් සැක සහිතයි.

මේ තත්ත්වය නිසා අද ගොවි ජනතාවට විඳින්නට සිදු වී තිබෙන දුක් කම්කටොළු රාශිය ගැන ටිකක් කල්පනා කර බලන්න. අද ඈත පිටිසර පළාත්වල ගොවියාගේ තත්ත්වය කුමක්ද? ඔහුට අවසර පත්‍රය දෙනවා. ඒ අවසර පත්‍රය දෙන විට කියනවා, අක්කරයකට අවුරුද්ද අන්තිමේදී ශත 50ක් දෙන්නය කියා. එහෙත් ඒ ඉඩම මැන වෙන් කර දෙන්නෙ නැහැ. මායිම් මේකය කියා, මිනින්දෝරු මහත්මයාගේ ගෝලයෙක් ඇවිත් අත දික් කර පෙන්වා දෙනවා. ඊ ළඟට නවත් කංකාණි කෙනෙක් එනවා. ඒ අය මනින්නේ කොහොමද? ගම්බද ප්‍රදේශවල සල්ලිවලට අක්කරය රූඩ් එකට මනින අයත් ඉන්නවා. අල්ලපු වත්තේ මිනිහාට මේක පෙනුනම ඉඩම් අරගලයක් ඇති වෙනවා. දෙගොල්ලම තමන්ගේ අවසර පත්‍රත් අරගෙන ඉඩම නිරවුල් කර ගැනීමට දිසාපතිතුමා ළඟට යනවා. දිසාපතිතුමා කියන්නේ මොකක්ද? තමුසෙලාට අවසර පත්‍ර දී තිබෙනවා. මට මේවා මැන වෙන්කර දෙන්නට නිලධාරීන් නැත, ඒ නිසා උසාවියට ගිහින් බේරා ගන්නය කියනවා. දුප්පත් අසරණ අහිංසක මිනිසුන් තමන්ගේ අවසර පත්‍රත් අරගෙන උසාවියට ගිහින් නීතිඥ ගාස්තුත් ගෙවා අන්තිමේදී හිඟමනට පත් වෙනවා. මේ තමයි ගම්බද තිබෙන ඇත්ත තත්ත්වය. ඒ නිසා අඩු වශයෙන් අවශ්‍ය නිලධාරි පිරිසවත් පත් කරන්න. මෙවැනි ආරවුල් බේරුම් කිරීම සඳහා පළාත්බද කච්චේරිවලට අවශ්‍ය නිලධාරි පිරිස පත් කරන්න. ඉඩම් ආරවුල් නිසාම අද මිනීමැරුම් පවා ඇති වෙනවා. නොයෙකුත් අන්දමේ අපරාධ සිදු වෙනවා. මූලික හේතුවක් තමයි මේ ඉඩම් ආරවුල්. තම තමන්ගේ ඉඩම්වල මායිම් බේරා ගැනීමට බැරි තත්ත්වයක් අද ගම්බද ජනතාවට ඇති වී තිබෙනවා. මේ තත්ත්වයෙන් ඔවුන් බේරා ගැනීමට ඇමතිවරයා ක්‍රියා කරන්න ඕනෑ. අපි අවුරුදු 12ක් පමණ තිස්සේ මේ සම්බන්ධව—මේ ප්‍රශ්න සම්බන්ධව—නෙත් සිත් යොමු කෙරෙව්වත් තමුන්නාන්සේ පොළොන්නරුව පළාතේ සිටින මී හරකෙක් වගේ උඩ බලාගෙන සිටිනවා මිස ඒ කිසිම දෙයක් ගැන ඇහුම්කන් දීමක් වත් කළේ නැහැ. අපට තිබෙන කනගාටුව එයයි.

ගරු කථානායකතුමනි, ගරු ඩී. ඇස්. සේනානායක අගමැතිතුමා ඇතුළු එවකට සිටි පාලකයන් විසින් මේ ඉඩම් සංවර්ධන ආඥා පනත ගෙන එන ලද්දේ යම්කිසි අදහසක් ඇතුවයි. සමෘද්ධිමත්, සෞභාග්‍යමත් ඉඩම් හිමි ගොවි ජනතාවක් මේ රටේ ඇති කිරීමයි ඒ අයට වුවමනා කළේ. ඒ අදහස ඇතිව ගොවි ජනතාවට හැකි තරම් ආධාර ලබා දුන්නා. ගරු කථානායකතුමනි, අද සමාජ තත්ත්වය උඩ ඉඩම් කැබැල්ලක් දීමෙන් පමණක් කෙනෙකුගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට නොහැකි වන බව තමුන්නාන්සේ පවා පිළිගන්නවා ඇති. ඉඩම් කැබැල්ලක් දීමෙන් පමණක් එය සිදු වන්නේ නැහැ. ඒ නිසාම අද පිළිගෙන තිබෙනවා, ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ හෝ උස් බිම් ජනපද ක්‍රමය යටතේ හෝ මොන යම් ක්‍රමයක් යටතේ හෝ ඒ සියලු දෙනාටම ආධාර දිය යුතුය කියා. අපි දන්නවා පසුගිය කාලයේ වැවිලි ද්‍රව්‍ය දීමේ ක්‍රමයක් තිබුණා. දැන් ඒ ක්‍රමය පවත්නා බවක් පෙනෙන්න නැහැ. ගෙවල් සෑදීමට ආධාර දීමේ ක්‍රමයක් තිබුණා. එයත් හරියාකාර ක්‍රියාත්මක වෙන බවක් පෙනෙන්න නැහැ. ඒ ක්‍රමය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවුරුද්දකට ගෙවල් 150කට වඩා සෑදීමට ආධාර දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. එසේ දෙන ආධාර මුදල ජීවන වියදම වැඩි වෙන ප්‍රමාණයේ හැටියට වැඩි කරන්නේත් නැහැ. අද ජීවන වියදම විශාල වශයෙන් වැඩි වී තිබෙනවා. ගේ දොර සෑදීමට අවශ්‍ය උපකරණවල මිල වැඩි වී තිබෙනවා. නමුත් තමුන්නාන්සේලා ගෙවල් සෑදීම සඳහා කට්ටිකරුවන්ට දෙන ආධාර මුදලේ කිසිම වැඩිවීමක් සිදු වී නැහැ. එය පටන් ගත් තැනමයි. ඒ නිසා ඒ අයට බොහොම අමාරු තත්ත්වයක් ඇති වී තිබෙනවා. අත්දැකීමෙන්ම ඒ බව තමුන්නාන්සේලාටත් අවබෝධ වී ඇති. කලින් නම් ගෙයක් අවුරුදු දෙකක් ඇතුළත සාදා නිම කළ යුතුයි. නමුත් දැන් ඒ කාලය අවුරුදු 3 දක්වා දීර්ඝ කර තිබෙනවා. ඒ අවුරුදු තුන ඇතුළතදීවත් තමුන්නාන්සේලා දෙන රුපියල් 1,000 ආධාර මුදලින් ජීවත් වීමට සෑහෙන තත්ත්වයේ ගෙයක් සාදා ගැනීමට පුළුවන්කමක් නැහැ. ඒ බව තමුන්නාන්සේලා අත්දැකීමෙන්ම පිළිගන්නවා ඇති.

ගරු කථානායකතුමනි, මේ පනතේ "diagram scheme" කියා සඳහන් වෙනවා. එය මුල් පනතේ පමණක් නොව සංශෝධිත පනතෙන් ඇතුළත් වෙනවා. දිසාපතිතුමාට යම්කිසි ඉඩමක් කට්ටිකරුවන් අතරේ බෙදා හැරීමට වුවමනා වූ විටක මුලින්ම කරන්නේ සිතියමක් හෝ යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් ඒ ඉඩම් කට්ටි වෙන් කර දීමයි. එසේ එම ඉඩම් කට්ටි බෙදා දෙන විට ඒවාට යන්න පාරවල් තිබිය යුතුයි. අද ගම්බද ප්‍රදේශවල රජය විසින් වෙන් කර දී තිබෙන ඉඩම් කට්ටිවලට යාමට දී තිබුණ පාරවල් සියල්ලක්ම වාගේ අවහිර කර තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. මේ සම්බන්ධයෙන් ඇති වන ආරවුල් නිසා දිනපතා දහස් ගණනින් කච්චේරියට පෙත්සම් එනවා. "අනේ අපේ ඉඩමට යන්න පාරක් නැහැ, තිබුණ පාර අවහිර කර තිබෙනවා, තමන්ගේ ඉඩමට අයත්ය කියා වෙනත් කෙනෙකු විසින් එය අයත් කර ගෙනය," ඔන්න ඔය විධියේ චෝදනා සහිතව පෙත්සම් දහස් ගණනක් ඇවිත් තිබෙනවා. මේ ප්‍රශ්න නිරවුල් කිරීමට අවශ්‍ය වන්නේ මානක නිලධාරීනයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන මෙවැනි ප්‍රශ්න ගැන මාස ගණනක් තිස්සේ අවුරුදු ගණනක් තිස්සේ අපි දිසාපතිවරයාට කියා සිටි නමුත් කිසිම පිළිසරණයක් ලැබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම මෙය දිසාපතිතුමාට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අවශ්‍ය නිලධාරීන් පත් කිරීමයි කළ යුත්තෙ. මේවා ගැන වග විභාග කිරීම සඳහා අවශ්‍ය නිලධාරීන් පත් කරන්න ඕනෑ. මේ ඉඩම් කට්ටිවලට පාරවල් මුලින් ලබා දී තිබෙනවා. නමුත් ඒවා පසුව අවහිර කර තිබෙනවා. ඒ නිසා ඉඩම් ඇමතිතුමා මේ සංශෝධිත පනතේ මාර්ගයෙන්වත් මේ ප්‍රශ්න ඉක්මණින්ම නිරවුල් කර දෙන්න උත්සාහ කරන්න. යම්කිසි ඉඩමකට යන පාර අවහිර කර තිබෙනවා නම් ක්ෂණයකින්ම ඒ පාර ලබා දීමට කටයුතු කරන්න. අවුරුදු ගණන් මිනිසුන්ට මේ විධියට රස්තියාදු වෙන්න බැහැ. මෙය ගම්බද ප්‍රදේශවල තිබෙන විශාල ප්‍රශ්නයක් වශයෙන් හඳුන්වන්න පුළුවනි. අප මේක සුළුවෙන් කල්පනා කරනවා. එහෙත් ගම්බදව මිනීමැරුම්, අපරාධ, කෝලාහල වැඩි වැඩියෙන් ඇති වන්නේ මේ සුළු හේතුව නිසා බව පෙනී යන්නට ඕනෑ. ඒ දුප්පත් මිනිසුන්ට තිබෙන ලොකුම වස්තුව තමන්ගේ ඉඩමයි. ඒ ඉඩමට යන පාර අවහිර කළ විට ඒ මිනිසුන්ට ඇති වන සිත් තැවුල කොපමණද ? පාර අවහිර කළ විට වතුර ටික ගෙන ඒම සඳහා ළිඳට යන්නට විධියක් නැහැ. ළමයින්ට පාඨශාලාවට යන්නට විධියක් නැහැ. ගැහැණු උදවියට කඩයට යන්නට විධියක් නැහැ. මේ සුළු ප්‍රශ්න හරියාකාර ලෙස විසඳා දීමට නිලධාරීන් නැත්නම්, ඒ සඳහා නිලධාරීන් යොදවන්නට පුළුවන්කමක් නැත්නම් මේ ඉඩම් සංවර්ධන ආඥපනත සම්පූර්ණයෙන්ම අසාර්ථක බව කියන්නට සිදු වෙනවා. ඉඩම් සංවර්ධන ආඥපනත මහජනයාට ප්‍රයෝජනවත් වන අන්දමට ක්‍රියාත්මක කරන්නට වුවමනා නම් අර කියන ලද සුළු ප්‍රශ්න ගැනත් අඩි සැළකිල්ලක් දක්වා ක්‍රියා කරන්නට ඕනෑ. මේවා සුළු ප්‍රශ්න හැටියට තමන්නාන්සේලාට පෙනෙන්නට පුළුවනි. එහෙත් ගම්බද උදවියට මේවා ලොකු ප්‍රශ්නයි. අප මේ ගැන නොයෙක් වර කරුණු ඉදිරිපත් කර තිබෙනවා. පිටතදී මේවා ගැන නොයෙක් විට කියා ඇතත් ප්‍රයෝජනයක් සිදු නොවූ නිසයි, මේ අවසාන සභාවේදීත් මේවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන කියනන්ට සිදු වී තිබෙන්නේ. මේවා ලොකු වැඩ නොවෙයි. මහවැලි ගඟ උතුරට හැරවීම වැනි ලොකු වැඩ කරන එක හොඳයි. ඒ ලොකු වැඩ කරන අතරම ගම්බද දුප්පතාගේ මේ පුංචි ප්‍රශ්න ගැනත්— ඔවුන්ට ඒවා ලොකු ප්‍රශ්නයි—සැලකිල්ලක් දක්වා ක්‍රියා කළ යුතුයි. ගම්බද දුප්පතාගේ ප්‍රශ්න ගැන ඇස් පියාගෙන ඉන්නේ නැතිව ඒවා ගැන සැලකිල්ල යොමු කරන්න.

ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ අවසර පත්‍ර පිට දෙන ලද ඉඩම් සින්නක්කර දිය යුතු බවට මහජනයා අතර ඉල්ලීමක් ඇති වුණු බව ගරු ඇමතිතුමා ඊයේ තම කථාවේ මුල් කොටසේදී ප්‍රකාශ කළා. "අපට තබා ගැනීමට, ණය ගැනීමට, විකුණා ගැනීමට මේ ඉඩම් සින්නක්කර ඕනෑ" යනාදී වශයෙන් මහජනයා ඉල්ලා සිටින්නට වීම නිසා ඒ ගැන කල්පනා කර බලා මෙම පනත සකස් කළ බව එතුමා කීවා. එතුමා ඒ ගැන කල්පනා කළා විය හැකියි. හොඳයි, ජනතාව ඒ විධියට කල්පනා කිරීමට හේතුව කුමක්ද? අන්න ඒ කාරණය ගැන ගරු ඇමතිතුමාත් මෙම ගරු සභාවත් හොඳින් සිතා බැලිය යුතුයි. ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ හෝ වේවා, කොළනි ක්‍රමය යටතේ හෝ වේවා කට්ටි කරුවන්ට ලැබී තිබෙන ඉඩම්වලින් වැඩි කොටසක කරන්නට පුළුවන් වන්නේ ගොවිතැනයි. ජනපදවල හැරෙන්නට අනෙක් තැන්වල සිටින්නන් ගොඩ ගොවිතැන් කරනවා. ඒ ගොවියන්ට සුළු වශයෙන් හෝ ජීවන තත්ත්වයක් ලබා ගැනීමට නම් ඔවුන්ගේ කෘෂිකාර්මික ද්‍රව්‍ය වෙළහෙළඳාම් කිරීමට පහසුකම් තිබෙන්නට ඕනෑ. අවසර පත්‍ර ක්‍රමය යටතේ ඉඩම් ලබාගෙන සිටින ගොවියකුට හදිසි ණයක් ලබා ගන්නට ක්‍රමයක් ගම්බදව පැවතුණේ නැහැ. ඒ අයට ණය ලබා ගැනීමට පහසුකම් සලස්වා ගැනීමටයි, ඒ ඉඩම් සින්නක්කර ඉල්ලන්නේ. තමන්ට සින්නක්කර වශයෙන් ඉඩම් කැබෙල්ල ලැබුණාම එය උකස් කර හෝ මුදල් ටිකක් ලබා ගන්නට පුළුවනි. හැබැයි ඒ ගොවිජනතාවගේ ප්‍රයෝජනය සඳහා අද ග්‍රාමීය ණය ක්‍රමයක් නැහැ. බලපත්‍රයක් යටතේ හෝ ප්‍රදානයක් යටතේ හෝ ඉඩමක් ලබාගෙන තිබෙන කෙනකුට ඒ ඉඩම මැන වෙන් කිරීමෙන් පසුව එය උකස් කර මුදල් ලබා ගන්නට පුළුවන් බව ඇමතිතුමා කියනවා. ඒ කියන්නේ, බලපත්‍රයක් පිට හෝ ප්‍රදානයක් පිට හෝ ලැබූ ඉඩමක් උකස් කළ හැක්කේ එක්කෝ කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන සංස්ථාවටයි; එහෙම නැත්නම් උකස් බැංකුවටයි; එහෙමත් නැත්නම් සමුපකාරයටයි. මහජන බැංකුවටත් උකස් තියන්න පුළුවනි. එහෙත් ඒ කොටස පනතට ඇතුළත් කිරීමෙන් ගොවියන්ගේ ණය ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. අක්කර දෙකක් හිමි, තිස්සමහාරාමයේ හෝ මුල්කිරිගල හෝ සිටින ගොවියකුට ඒ ඉඩම් අක්කර දෙක සඳහා ඇති ඔප්පුවක් අරගෙන කොළඹ අවුත් ඒ.අයි. සී. සී. එකෙන් ණයක් ගන්නට පුළුවන්ද? ඒක නොකෙරෙන වැඩක්. ඒ ස්ථානයෙන් ප්‍රයෝජන ලබා ගන්නේ දුප්පත් සාමාන්‍ය ගොවියා නොවෙයි. එයින් ප්‍රයෝජන ලැබෙන්නේ මධ්‍යම පන්තියේ ගොවීන්ටත්, මධ්‍යම පන්තියේ ඉඩම් හිමියන්ට හා විශේෂ බදු ක්‍රමය යටතේ විශාල ඉඩම් ලබාගත් උදවියටත් පමණකි.

ගරු කථානායකතුමනි, මහජන බැංකුව ළඟදී වැදගත් වැඩක් ආරම්භ කළා. එහෙත් ඒ වැඩ පිළිවෙළ පළල් වේගන යන බවක් පෙනෙන්නට නැහැ. එනම්, ග්‍රාමීය බැංකු පිහිටුවීමයි. මහජන බැංකුව මෑතක් වන තුරු එහි ශාඛා පිහිටුවාගෙන ගියේ ප්‍රධාන නගරවල පමණයි. ගොවීන්ට ක්ෂණික වුවමනාවක් සඳහා ණයක් ලබා ගැනීමේ පහසුව සැලසීමට නම් ගම් නියම්ගම්වල ග්‍රාමීය බැංකු පිහිටුවිය යුතුයි. මහජන බැංකුවේ අධ්‍යක්ෂතුමා විසින් ඒ ක්‍රියා මාර්ගය ආරම්භ කර තිබෙන නමුත් එය අතර මග නතර වී තිබෙන බවයි, අද මට වැටහී යන්නේ. ඒ නිසා ග්‍රාමීය බැංකු ක්‍රමය තවත් පළල් කර ගොවියාට හදිසියකදී පහසුවෙන් ණයක් ලබා ගැනීමේ අවස්ථාව සැලසෙන අන්දමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගොවි ජනතාවට ඊළඟට මුහුණ පාන්නට සිදු වන ප්‍රශ්නය මොකක්ද? තමන් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය අලෙවි කර ගැනීමේ ප්‍රශ්නයයි. මේ රටේ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව ආරම්භ කළේ අතිගරු ඩී. එස්.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

සේනානායක අගමැතිතුමායි. එය පිහිටුවන්නට යෙදුණේ මොන හේතුවක් නිසාද? තමන්ගේ කඩපොළට එන වෙළෙන්දන් නියම කරන මිළ ගණන්වලට තුට්ටුවට දෙකට, තමන්ගේ ද්‍රව්‍ය විකුණා ගන්නට එදා ගොවීන්ට සිදු වී තිබුණා. තමන්ගේ ශ්‍රමයේ ප්‍රතිඵල තමන්ට ලබා ගන්නට එදා ගොවියාට පුළුවන්කමක් තිබුණේ නැහැ. අහක සිටින වෙළෙන්දකු නැත්නම් ලොරි කාරයෙකු තමයි, ගොවියාගේ ශ්‍රමයේ ප්‍රතිඵල ලබා ගත්තේ. ඒ ගැන කල්පනා කර නැසීගිය ඩී. එස්. සේනානායක අගමැතිතුමා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවක් ආරම්භ කළා. එහෙත් ඒ දෙපාර්තමේන්තුවෙන් ඒ කටයුත්ත හරියාකාර නොකෙරෙන බව ගරු ඇමතිතුමාම පිළිගන්නවා ඇති. මේ විධියේ සංශෝධන පනත් යටතේ නිකම් ගොවීන්ට ඉඩම් බෙදා දුන් නාම ගොවීන්ගේ ප්‍රශ්න විසඳෙනවා යයි ගරු ඇමතිතුමෙකු හිතෙකින්වත්, මොහොතකටවත්, කල්පනා කරන්නට එපා. ගොවි ප්‍රශ්න හරියාකාර විසඳෙන්නට නම් ඔවුන්ගේ මංමාවත් හොඳ හැටි සකස් කර දෙන්නට ඕනෑ. ඔවුන්ට හරි හැටි ජලය සපයා දෙන්නට ඕනෑ. ඔවුන් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය විකුණා ගැනීමට පහසුකම් සලසා දෙන්නට ඕනෑ. විශේෂයෙන්ම ගම්බද ගොවීන්ට ක්ෂණික ණය ලබා ගැනීමේ පහසුකම් සලසා දෙන්නට ඕනෑ. මේ කරුණු සම්පූර්ණ කර දුන්නොත් පමණයි, මේ රටේ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්නට පුළුවන් වෙන්නෙ. මා මේ අදහස් කිහිපය ඉදිරිපත් කරන්නේ ඒවා ඉතා වැදගත් නිසයි.

ගරු කථානායකතුමනි, අද බඩු මිළ ඉහළ ගොස් තිබෙන අන්දම ගැන තත්වාකාරයෙන් සලකා බලන විට, ඇනට ලබා දී තිබෙන ආධාර කිසිසේත් ප්‍රමාණවත් නොවන බවයි අපට වැටහී යන්නේ. මගේ කොට්ඨාශයේ මුරුතවෙල ජලාශය නමින් බැම්මක් බඳිනවා. ඒ බැම්මට යට වන ප්‍රදේශයේ පදිංචිව සිටි ගොවි පවුල් 16 ක් ඉවත් කරන්නට සිදු වුණා. ඔවුන්ට යන්නට වෙන තැනක් තිබුණේ නැහැ. ඔවුන්ගේ ඉඩකඩම්, ගෙවල් දොරවල්, සම්පූර්ණයෙන්ම විනාශ වුණා. නොයෙක් විධියට කරදර කිරීමෙන් පසු දැන් ඔවුන්ට දී තිබෙනවා, තාවකාලික වශයෙන් අක්කර 1/2ක් හා ගෙයක් තනා ගැනීම සඳහා රු. 80 ක මුදලක්. ගරු කථානායකතුමනි, මහජන පොදු කටයුත්තක් සඳහා තමන්ගේ ඉඩකඩම ගේදොර රජයට විනාශ කර දමන්නට ඉඩ දුන් ජාතික හැඟීමකින් යුත් ඒ ගොවි පවුල් 16 ට මේ ආකාරයට සැලකීම යුක්තිසහගතද කියා මා ගරු ඇමතිතුමාගෙන් අහනවා. මේ කාලයේ රු. 80 කින් ගොවි පවුලකට ජීවත් වන්නට ගෙයක් තබා බල්ලෙකුට කුඩුවක් හදන්නට පුළුවන්දැයි මා අහනවා. අද පවතින තත්ත්වය ඕකයි. කරුණා කර මෙවැනි ප්‍රශ්න ගැන තමුන්නාන්සේලාගේ සැලකිල්ල යොමු කරන්න. [බාධා කිරීමක්] හිනා වෙන්න එපා, ගරු ඇමතිතුමනි, මේක ඉතා බරපතළ ප්‍රශ්නයක්. අපි මේව තුට්ටු දෙකටයි ගණන් ගන්නෙ. එහෙත් රු. 80 කුකුල් කුඩුවෙ ජීවත් වෙන්න සිද්ධ වෙන්නෙ ඒ උදවියටයි. ඒ ප්‍රශ්නය ගැනත් ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට කැමතියි. මුල් පනත හොඳ පනතක්. හරියාකාර ක්‍රියාත්මක කරනවා නම් ප්‍රධාන ප්‍රඥප්තිය ඉතා හොඳයි. එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමේ වගකීම ගරු ඉඩම් ඇමතිවරයා බාර ගත යුතුයි. අවුරුදු 12 ක් තිස්සේ කුම්භකර්ණ නින්දෙන් සිටි ගරු ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමතිතුමා මේ තනතුරේ සිටින තුරුම මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැති බවයි මගේ වැටහීම. අද මේ ඇමතිතුමා යටතේ පැහැදිලි ඉඩම් ප්‍රතිපත්තියක් නැහැ. මේ ඇමතිතුමාගේ ඉඩම් ප්‍රතිපත්තිය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වෙනවා; කාලයෙන් කාලයට වෙනස් වෙනවා; ජනපදයෙන් ජනපදයට වෙනස් වෙනවා; කුලයෙන් කුලයට වෙනස් වෙනවා. උදාහරණ ඕනෑ නම් ඒවාත් කියන්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, ඉඩම්වල මිල ඉතාමත්ම වැඩි කොළඹ නගරයේ බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. කුරුඳුවත්තේ පර්චස් එකක් රුපියල් දහ දහසකට පමණ මිල කරන්නට පුළුවන්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
4,000 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

රාජ්‍ය ඇමතිතුමාගේ හිල්ටන් හෝටලය වත් අරගොල්ලෝ විකුණන්නට හැදුවේ ඊට වැඩියෙන්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒ කොල්ලුපිටියේ.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

ළඟදී කුරුඳුවත්තේ ඉඩම් රුපියල් 8,000 බැගින් විකුණා තිබෙනවා—ගරු නුවරඑළියේ මන්ත්‍රීතුමාගේ (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) ඒවා එහෙම.

ඒ කෙසේ වෙතත් මා කියන්නේ මෙයයි: කලින් කලට බදුදීම් ගැන හා අය කරන බදු පිළිබඳව පරීක්ෂණයක් කර දියුණුවන සමාජයේ ඉඩම්වල වටිනාකම වැඩිවන ආකාරයට බද්ද වැඩි කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ඉඩම් නැතිකම නිසා වටිනාකම වැඩිවන නාගරබද ප්‍රදේශවල එසේ කරන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, මා විවේචනයක් හැටියට කරනවා නොවෙයි, තමුන්නාන්සේ පුදුම වේවි අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ මාලිගාව පිහිටා තිබෙන්නේ අක්කර දෙකක රජයේ ඉඩමකයි. තමුන්නාන්සේ පුදුම වේවි කොළඹ ඇති ඒ අක්කර දෙකට වාර්ෂික බද්ද රු. 2 යි. මා ඇමතිවරයාට දොස් කියන්නේ නැහැ. මෙය අධිරාජ්‍යවාදී කාලයේ සිට පවතින දෙයක්. මේවා වෙනස් කරන්නට ඕනෑ. තත්ත්වය අනුව වෙනස් කරන්නට ඕනෑ. තමුන්නාන්සේ පුදුම වේවි ඊබ්‍රාහිම් කියන ටී. ආර්. පී. කාරයෙක් කොළඹ බෞද්ධාලෝක මාවතේ—බුලර්ස් පාරේ—අක්කර 20 ක් බලහත්කාරයෙන් අල්ලාගෙන එහි මුඩුක්කු ගෙවල් හදා ඒවා කුලියට දෙනවා. අවුරුදු 20 ක් තිස්සේ මේ මිනිහා මේ කටයුත්ත කර ගෙන යනවා. ඒ මුඩුක්කු ගෙවල් නැතිකර ඒ ඉඩම් පුරවා ඒ රජයේ ඉඩම් නැවතත් රජය සතු කරගෙන මුඩුක්කු සංහාරය සඳහා කටයුතු නොකරන්නේ ඇයි? කොළඹ තිබෙන රජයේ ඉඩම් අල්ලාගෙන ඇති ධනපති කොම්පැනිකාරයන් පිට කර ඒවා නැවතත් රජයේ පාලනයට අරගෙන ඒවා රජයේ ප්‍රයෝජනවත් කටයුත්තකට පාවිච්චි කරන හැටියට මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. තමුන්නාන්සේ පුදුම වේවි "ලේක් හවුස්" එකේ කොටසකුත් හදා තිබෙන්නේ ආණ්ඩුවේ ඉඩමක. ඊට මෙහා සර් සිරිල් සොයිසාගේ "රීජන්ට් ප්ලේස්වල" කොටසකුත් හද තිබෙන්නේ ආණ්ඩුවේ ඉඩමක. මේවාට වාර්ෂික බද්ද වශයෙන් ගෙවන්නේ ඉතාම සුළු මුදලක්.

අනික ඒ කාලයේ බෞද්ධාගම්කාරයින්ට කළ වෙනස්කමුත් වෙනස් කරන්නට ඕනෑ. කොළඹ තරුණ බෞද්ධ සමිතිය තම ගොඩනැගිලි ඉදිකර තිබෙන්නේ රජයේ ඉඩමකයි. ඒ සඳහා වාර්ෂික බද්ද වශයෙන් රුපියල් 43,000 ක් රජයට ගෙවනවා. ඊට මෙහා ඒ ආසන්නවම ඇති තරුණ ක්‍රිස්තියානි සංගමයේ ගොඩනැගිලි සඳහා ගෙවන්නේ රු. 4,000 යි. ඇයි මේ වෙනස? ඔය වගේ පරස්පර විරෝධි අවස්ථා එමට තිබෙනවා. දැනට තිබෙන නීති අනුව ඒ සඳහා කටයුතු කිරීමට ඇමතිවරයාට බලය නැත්නම් එතුමා බල තල ගන්නට ඕනෑ. විශේෂයෙන්ම පළාත් පාලන ඇමතිතුමාට මෙය අවශ්‍යයි. ඒ නිසා ඉඩම් අල්ලාගෙන ඇති ඊබ්‍රාහිම් වැනි ටී. ආර්. පී. කාරයින්ගෙන් බෞද්ධාලෝක මාවතේ එහා තිබෙන අක්කර 20 ලබාගන්නය කියා මා විශේෂයෙන්ම පළාත් පාලන ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ඔවුන්ට මේ විධියට රජයේ ඉඩම් අත්පත් කර ගෙන සිටින්න ඉඩ දෙන්න එපා. එපමණක් නොවෙයි, පාසන්ස් පාරේ ජෙෆ්රි මෝටර් වර්ක්ස් සමාගම තිබෙන ස්ථානයේ රජයේ ඉඩමක් අල්ලා ගත් නැනැත්තෙක් සිටිනවා. රජයේ ඉඩම වෙනුවෙන් නොගෙවූ බදු මුදල දැන් රු. 75,000 දක්වා එකතු වී ඇති බව දැන ගන්න ලැබී තිබෙනවා. අද වනතුරු මේ මුදල ගෙවා ඇම්මට කිසිම උත්සාහයක් ඒ නැනැත්තා දරා නැහැ. මෙම ඉඩම් ආපසු ලබාගැනීමට කිසිම පියවරක් ඇමතිතුමා ගෙන නැහැ. එසේ නොකරන්නේ ඒ පුද්ගලයන් ආරක්ෂා කිරීමට උසස් නැන්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

වල සිටින පුද්ගලයන් ක්‍රියා කරන නිසයි. හිඟ බදු මුදල් ගෙවන්නෙත් නැහැ, එම ස්ථානවලින් ඉවත් වන්නෙත් නැහැ. එසේ වුණත් දුප්පත් මනුෂ්‍යයකුට තමන්ගේ වාර්ෂික බද්ද ගෙවන්නට බැරි වුණොත් ඒ තැනැත්තාගේ බද්ද අවලංගු කර දමනවා. නමුත් රීගල් සිනමා ශාලා වට යාබදව පිහිටා ඇති මෙම ඉඩම සඳහා රජයට අයවිය යුතු රු. 75,000 ක බද්ද අය කර ගැනීමට මේ වනතෙක් ක්‍රියා කර නැහැ. මෙබඳු පුද්ගලයන් ආරක්ෂා කිරීමට ඇමතිතුමා උත්සාහ දරන්නේ මන්ද කියා ප්‍රශ්න කරන්න කැමතියි. අන්න ඒකයි අප නගන ප්‍රශ්නය.

ගරු කථානායකතුමනි, බදු දෙන්නේ කුමන ආකාරයටද කියා ඊළඟට අප කල්පනා කර බලමු. Aitken Spence සමාගම තිබෙන්නේ රජයේ ඉඩමකයි. ඒ සමාගමට එම ඉඩම දී තිබුණේ කෙටි කාලීන බද්දකටයි. ගිය අවුරුද්ද වනතුරු දී තිබුණු බද්ද මේ රජය මඟින් දැනට දීර්ඝ කර තිබෙනවා. එසේ දීර්ඝ කරනු ලැබුවේ ගරු ඇමතිතුමාගේ ඥතිවරයකුට එම සමාගමේ රක්ෂාවක් දුන්නට පසුව බව අපට දැනගන්න ලැබී තිබෙනවා. එම නිසා මෙබඳු සිදු වීම්වලට ගරු ඇමතිතුමා සම්පූර්ණයෙන් වගකිව යුතු බව පෙන්නා දෙන්න කැමතියි. මෙබඳු කාරණා ගැන ගරු ඇමතිතුමා පරීක්ෂා කර බලන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් අප ලියුම් එව්වාම අඩු වශයෙන් ඒවා ලැබුණු බවවත් අපට දන්වා එවන්නේ නැහැ. අප එවන ලියුම් එතැන සිටින ඇමතිතුමාගේ එකම කාන්තාව—ශ්‍රී කාන්තාව—ගිල දමනවා ඇති. එම නිසා මෙබඳු සිදු වීම් සුළු වශයෙන් ගණන් නොගෙන ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිනවා. ගරු කථානායක තුමනි, අප දන්නා අන්දමට කොළඹ නගරය තුළ ඇති රජයේ ඉඩම්වලින් තුනෙන් පංගුවක් පමණ බලවත් උදවිය අල්ලා ගෙන තිබෙනවා. එම ඉඩම් සඳහා ගෙවිය යුතු බදු මුදල ඉතා මත්ම සුළු වුණත් ඒ මුදලවත් ගෙවන්නේ නැහැ. සමහර ඉඩම්වලට අය කරන්නේ අක්කරයකට රුපියලයි දෙකයි. එම නිසා ඉඩම් බදු දීමේදී පැහැදිලි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න ඕනෑ. ඇත්, බෞද්ධාලෝක මාවතේ එක් කොළ වරක දෑවමොට්ටාවේ අමරවංශ ස්වාමීන් වහන්සේට ඉඩමක් දී තිබෙනවා. අනික් කෙළවරේ මීටියාගොඩ ගුණරතන ස්වාමීන් වහන්සේට ඉඩමක් දී තිබෙනවා. නමුත් මේ ඉඩම් කොයි විධියෙන්ද පවරා දුන්නෙ? කුමන කොන්දේසි උඩද පවරා දුන්නෙ? මේ කාරණා පිළිබඳව රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය පැහැදිලි කර දෙනවා නම් හොඳ බව මතක් කරනවා. ඒකයි මේ අවස්ථාවේදී අප කරන බලවත් ඉල්ලීම.

ගරු කථානායකතුමනි, යම් යම් පදවි වලට නිලධාරීන් පත් කිරීමේදී සුදුසුකම් ඇති පුද්ගලයන්ම පමණක් පත් කිරීමට උනන්දුවක් ගන්න ඕනෑ. මා එසේ කියන්නේ හේතු ඇතුවයි. ඉඩම් කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුවේ සිටිනවා, ශ්‍රී කාන්තගේ චක්ගෝලයෙක්. තුන්වන ශ්‍රේණියේ ලිපිකරුවකු වන ඔහුගේ නම කනකසුංදරම්. ඔහුගේ රක්ෂාව මොකක්ද? විරාන්ස්පෝට් ඔපිසර් වශයෙන් පත් වීමක් දී ඇතත් ඒ සම්බන්ධයෙන් ඔහු ලබා ඇති සුදුසුකම මොකක්ද? ඔහු ඒ ගැන දන්නේ මොනවාද? ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රනාන්දු නමින් හැඳින්වෙන පුද්ගලයෙක් සිටිනවා. එයා තමයි, පාරවල් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පත් කර ඇති ඉංජිනේරුවා. නමුත් ඒ තනතුරු දැරීමට ඔහු සුදුසුකම් ලබා නැහැ. ඒ පුද්ගලයා පරණ ඕවර්සියර් කෙනෙක්. ඔන්න ඔය ආකාරයට පත් වීම් දී තිබෙනවා. ඔවුන් රජයේ මුදල් පිල්ලි ගහනවා. ගරු කථානායකතුමනි, ඔන්න ඔවැනි කාරණා ගැනත්, කොළඹ නගරයේ ඉඩම් අල්ලා ගැනීම සම්බන්ධයෙනුත් සම්පූර්ණ පරීක්ෂණයක් කරන මෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මෙබඳු කාරණා ගැන සොයා බැලීම පිණිස කමිටුවක් පත් කරන ලෙස ඉල්ලා සිටිනවා. එවිට ඇතැම් උදවියට අක්කරය රුපියලට දෙකට ඉඩම් බදු දී ඇති බව පෙනී යාවි. මා දන්නා අන්දමට කොළඹ අග්‍රරාජගුරු ප්‍රසාදීන් වහන්සේට, රජයේ ඉඩම් අක්කරය රුපියල් දෙක ගණනේයි බදු දී තිබෙන්නේ. ඉඩම් ලැයිස්තුවක් සකස් කර ඒ ඒ අයට බදු දුන් ඉඩම් හා බදු වශයෙන් ගෙවන ප්‍රමාණයන් ගැන සොයා බැලුවොත් මේ කාරණා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේට පැහැදිලි වෙයි. කොළඹ කච්චේරියේ සිටි එක්තරා ඉඩම් නිලධාරියෙක් මේ ප්‍රශ්නය මතු කළා. නමුත් ඒ නිලධාරියා හිටි ගමන්ම අතුරුදහන් වී තිබෙනවා. මොන කාරණයක් නිසා දැයි අප දන්නේ නැහැ. එම නිසා, මේ කාරණා ගැන වහාම පරීක්ෂණයක් පැවැත් වීමට ඇමතිතුමා පියවර ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට මට බලපාන ප්‍රශ්නයක් ගැන කියන්න කැමතියි. මේ ඇමතිතුමාගේ ඉඩම් ප්‍රතිපත්තියෙහි කිසිම නිරවුල් භාවයක් නැහැ. එතුමාට පැහැදිලි ප්‍රතිපත්තියක් නැහැ. ප්‍රදේශයෙන් ප්‍රදේශයට, ජාතියෙන් ජාතියට, කුලයෙන් කුලයට වෙනස් වන ප්‍රතිපත්තියකුයි ඉඩම් සම්බන්ධයෙන් එතුමා අනුගමනය කරන්නේ. මෙහිදී මුරුතවෙල ජලාශ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් සඳහන් කළ යුතු කරුණක් තිබෙනවා. මුරුතවෙල ජලාශයේ සැළැස්ම සාදන විට ඉඩම් ඇමතිතුමාවත් දැන සිටියේ නැහැ, කොපමණ බිම් ප්‍රදේශයක් ඊට යට වෙනවාද කියා. වැසියන් පදිංචි කර වීමට කොතෙක් ඉඩම් කට්ටි තිබේද කියාවත් එතුමා දැන සිටියේ නැහැ. මූලික කරුණුවත් සොයා බලා නොගෙන මහා වාරිමාර්ග ක්‍රමයක් ආරම්භ කළා. එයින් විපාක විඳින්නේත්, දුකට පත් වන්නේත් එම වාරිමාර්ග ක්‍රමය යටතේ ජීවත් වන අහිංසක ගොවි ජනතාවයි. මුරුතවෙල ජලාශය තැනීම සඳහා ඇති කරන ලද වැඩ පිළිවෙලට අනුව ගොවි පවුල් 500 ක් පමණ තදබදයට පත් වෙනවා. ඒ උදවිය පදිංචි කර වන්නට තරම් ඉඩම් ප්‍රමාණයක් මුරුතවෙල ජලාශය යටතේ අස්වැද්දෙන්නේ නැහැ. එසේ වූ විට එම උදවියට යන කල දසාව කුමක්ද? උඩවලවේ නම් ඉඩම් අක්කර පහ බැගින් දෙන්නට වුවමනා බව කියනවා. මුරුතවෙලින් දෙන්නේ අක්කර දෙක හමාරයි.

විශේෂයෙන් මෙම කාරණයෙහිදී ඇමතිතුමා මගෙන් නිච නින්දිත නිහීන අන්දමට පළි ගෙන තිබෙනවා. එතුමා එසේ කර තිබෙන්නේ මන්ද? උඩවලවේ ඉඩම් දෙනවාය කියා මුල්කිරිගල කොට්ඨාශයේ වැසියන්ගෙන් එතුමා ඉල්ලුම් පත්‍ර කැඳෙව්වා. එසේ හෙයින් මුල්කිරිගල කොට්ඨාශයෙන් 12,000 ක් පමණ දෙනා දිසාපතිවරයාට ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළා. එම ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් යැවීම සඳහා අඩු වශයෙන් ඔවුන් ශත 60 බැගින් හෝ වැය කර තිබෙනවා. ඒ අතර මෙම අවුරුද්දේ අගෝස්තු මස 10 වන දින මා මෙම සභාවේ දී මේ ඇමතිතුමා විවේචනය කළාය කියා එතැන් සිට සතියක් ගත වන්නට මත්තෙන් එම කටයුත්ත සඳහා ඉඩම් කච්චේරිවලින් තෝරා ගත් කට්ටිකරුවන්ගේ නාම ලේඛනයෙන් ඔවුන්ගේ නම් සම්පූර්ණයෙන්ම අහෝසි කර දමා තිබෙනවා. උඩවලවේ ව්‍යාපාරය යටතේ මුල්කිරිගල ආසනයට එකම එක ඉඩම් කට්ටියක් නොලැබෙන ආකාරයට නියෝග කර තිබෙනවා. දැන් නිදහසට කියනවා, "මුරුතවෙලින් ලැබෙනවා" යනුවෙන්. මුරුතවෙලින් ලැබෙනවා නම් ඇයි අර අවසථාවේදී ඒ අන්දමට ඉල්ලුම් පත්‍ර කැඳෙව්වේ? මේ ඇමතිතුමා ආත්ම ගෞරවයක් ඇති මිනිහෙක් නම් අඩු වශයෙන් මෙම යුතුකමවත් කරන්නට ඕනෑ. මගෙන් පළි ගත්තාට කමක් නැහැ. අර අන්දමට දුප්පත් ජනතාවගෙන් සූරාගත් ශත 60 මුදල වත් ඒ උදවියට ආපසු දිය යුතුයි. තමුන්නාන්සේ වෙන කිසිවක් නැතත් ඒ මුදලවත් ආපසු දෙන්නට පොරොන්දු වෙනවාද? මේ කර තිබෙන්නේ වංචාවක්. ඉඩම් දෙනවා යැයි ඉල්ලුම් පත්‍ර කැඳෙව්වා. ඔවුන් රස්නියාදු කෙරෙව්වා. ඉඩම් කච්චේරිවලට කැඳෙව්වා. මා එතුමා විවේචනය කළායින් පසු ඒවා අහෝසි කළා. "මුරුතවලින් දෙන නිසා උඹලාට මේවා දෙන්නේ නැහැ" කියනවා. එහෙනම් වලාමේ මේක මීට පෙර දැන සිටියේ නැද්ද? මුරුතවෙල හදිසියේ සාදන ලද ව්‍යාපාරයක් නොවෙයි. කාලාන්තරයක් තිස්සේ පරීක්ෂණ පවත්වා පටන් ගන්නා ලද ව්‍යාපාරයක්. හදිසියේම මුරුතවෙල මතක් වුණේ මන්ද? මෙයින් කර තිබෙන්නේ නින්දිත අන්දමේ පළිගැනීමක්. ඔය ඉඩම් කට්ටි පණහ නැති වුණාට මට ඇති රුදාවක් නැහැ. තමුන්නාන්සේගේ තර්කය මුරුතවෙලින් ලැබෙන නිසා මේවා දෙන්නේ නැත කියනු එක නම් අඩු වශයෙන් උඩවලවේ ජනපද වාසීන්ට දෙන ඉඩම් ප්‍රමාණයවත් මුරුතවෙල උදවියට දිය යුතුයි. උඩවලවේ [illegible]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

අක්කර 5 බැගින් දෙනවා වාගේ මුරුත වෙල අයටත් අක්කර 5 බැගින් දෙනවාද? ඒක සාධාරණ ඉල්ලීමක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

ඒවත් දූන් කාටද පොරොන්දු වෙලාලු.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**

*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*

(Mr. George Rajapaksa)

නගරබදව සිටින තමුන්නාන්සේලා ගොවි දුක දන්නේ නැහැ. දන්නවා නම් ඔහොම කිනා වෙන්නේ නැහැ. ඉඩම් ඇමතිතුමා දන් කල්පනා කරනවා. එතුමාට බැපිද ඔවුන්ටත් අක්කර 5 බැගින් දෙනවායැයි කියන්න. එතුමා එසේ කිව්වත් කියන එක නොවෙයි, වෙන දෙයක්මයි කරන්නේ. එදා කිව්වා පාරක් සාදා දෙනවාය කියා. දූන් කියනවා ඒක කරන්නට බැරිය කියා. මතකද? රක්ෂා දෙන්නෙත් තමන්ගේ අයට පමණයි. නෑදැයින්ට පමණයි. මුරුතවෙල පවුල් 500 කගේ ඉඩකඩම් ජල යට යට වෙනවා. රක්ෂාවල් තිබෙනවා නම් ඒ අයට පළමුවෙන් රක්ෂා දිය යුතුය කියා කිව්වා. ඒ අයට පළමුවෙන් රක්ෂා දෙනවාය කියා ගරු ඇමතිතුමාත් ප්‍රසිද්ධියේම කිව්වා. නමුත් ගිහින් බැලුවාම එතැන රක්ෂා දී තිබෙන්නේ රත්ගම අයටයි.

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)

*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*

(Mr. D. E. Tillekeratne—Ratgama)

නැහැ.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**

*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*

(Mr. George Rajapaksa)

මා ඒක ඔප්පු කරන්නම්.

**ඩී. ඊ. තිලකරත්න මයා.**

*(திரு. டி. ஈ. திலகரத்ன)*

(Mr. D. E. Tillekeratne)

ඔයේ එක් කෙනෙකුටවත් දීලා නැහැ.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**

*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*

(Mr. George Rajapaksa)

රත්ගම සිටින සියලු දෙනාම තමුන්නාන්සේගේ නොවෙයි.

**ඩී. ඊ. තිලකරත්න මයා.**

*(திரு. டி. ஈ. திலகரத்ன)*

(Mr. D. E. Tillekaratne)

රත්ගම සිටින අය මට අයිතියි, තමුන්නාන්සේට වඩා. රත්ගම ගැන කථා කරන්නට මට අයිතියක් තිබෙනවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**

*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*

(Mr. George Rajapaksa)

රක්ෂාවල් තිබෙනවා නම් ඒවා පළමුවෙන්ම දිය යුතුව තිබුණේ ඒ යෝජනා ක්‍රම යට යටත් වන අයටයි. මක්නිසාද? ඔවුන්ගේ ඉඩම් යට වෙනවා. ඔවුන්ගේ ගෙවල් දොරවල් යට වෙනවා. ඔවුන්ගේ වැව්ලි යට වෙනවා. ඔවුන්ට කර කියා ගන්නට දෙයක් නැහැ. එම නිසා ඔවුන්ට පළමුවෙන් රක්ෂා දෙන්නෙ නැත්නම් පළමුවෙන් දෙන්නෙ කාටද? නමුත් ඒ යුතුකමවත් ඉෂ්ට කරන්නෙ නැහැ. රහස් ගිවිසුම යටතේ ඌරුබොක්කේ සහ නැගෙනහිර ඉඩම් සම්පූර්ණයෙන්ම පෙඩරල් පක්ෂයට දෙන්නට පොරොන්දු වූ මිනිසුන් තමයි මේ. එහෙම නම් තමුන්නාන්සේලාට ඇයි මුරුතවෙලට දෙන්නට බැරි? උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ඉඩම් සම්පූර්ණයෙන්ම පෙඩරල් පක්ෂයට දෙන්නට පුළුවන් නම් ඇයි මුරුතවෙල ජනතාවට, මුල්කිරිගල ජනතාවට ඒ ඉඩම් දෙන්නට බැරි? අන්න ඒ ප්‍රශ්නයයි මා මතු කරන්නෙ.

එපමණක් නොවෙයි. මේ ඇමතිවරයාගේ අදක්ෂ පාලනය නිසා ගොවීන්ට ඇති වී තිබෙන හිරිහැර කියා නිම කරන්නට බැහැ. මා මේ අවස්ථාවේදී ඊට එක උදාහරණයක් පමණක් පෙන්වන්නම්. තමුන්නාන්සේ මුල්කිරිගල ජනතාවගෙන් එළවළු පළිගන්නවා. නිකම් නොවෙයි, සොයා සොයා පළිගන්නවා. 1964 වර්ෂයේදී ඉඩම් කච්චේරියක් පවත්වා චන්ද්‍රිකාවැව යෝජනා ක්‍රමය යටතේ පදිංචි කරවීම සඳහා මුල්කිරිගල ආසනයෙන් ඉඩම් කට්ටිකරුවන් හැටදෙනෙකු තෝරුවා. ඒ උදවිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුවේ රථ වාහනවලින් කැඳවාගෙන ගොස් ඉඩම් එහෙම පෙන්වා පදිංචි කෙරෙව්වා. 1964 වර්ෂයේදී ආණ්ඩුවෙන් ඒ විධියට ක්‍රියා කළා. ඊටපසු මේ අවුරුද්දේ මුල් භාගයේදී ඉඩම් ඇමතිතුමා යටතේම තිබෙන තවත් දෙපාර්තමේන්තුවකින් ගිහින "ලෑන්ඩ් සෙට්ල්මන්ට්" කියා එකක් කර තිබෙනවා. අර ඉඩම් කච්චේරියක් පවත්වා තෝරා ගත් මිනිසුන්ගේ ඉඩම් ටික "ලෑන්ඩ් සෙට්ල්මන්ට්" එකෙන් ඒ ප්‍රදේශයේ සිටින අලහප්පෙරුම නම් තැනැත්තෙකුට දී තිබෙනවා. එමනිසා දැන් අර දුප්පත් මිනිසුන්ට යන එන මගක් නැහැ. ඒ අයට ගමත් නැහැ; වෙන යන්නට තැනකුත් නැහැ. අලහප්පෙරුම කියන තැනැත්තා "සෙට්ල්මන්ට්" එකත් අරන් ඒ ගොවි පවුල් අට ඒ ඉඩමෙන් නෙරපීම සඳහා දැන් උසාවි ගිහින් තිබෙනවා. එතකොට දැන් මේ දුප්පත් මිනිසුන්ට නීතිඥ මහත්වරුන් සොයා ගෙන රත්නපුරේ දිස්ත්‍රික් උසාවියට යන්නට සිද්ධ වී තිබෙනවා. නමුත් ඔවුන්ට රත්නපුරයට යන්නට බස් ගාස්තුවවත් නැහැ. මා මේ සිද්ධිය ගැන රත්නපුරේ දිසාපතිතුමාට ලියා යැව්වා. ඒවාගේම ශ්‍රී කාන්තා මහත්මයාටත් ලියා එව්වා. නමුත් තවමත් උත්තරයක් නැහැ. උත්තැහෙ හිලින්නට ඇති ඒ ලියුම. ඒ මිනිසුන් මා ළඟට ආවා. වෙන යන්නට තැනක් නැති නිසා මැරී දමන තෙක් එහිම ඉන්නය කියා මා ඔවුන්ට කිව්වා. ආණ්ඩුවෙන්ම ඔවුන් ගෙනැවිත් පංදිංචි කෙරෙව්වා නම්, දැන් ආණ්ඩුව ඔවුන්ට පිහිට වන්නේ නැත්නම් මරා ගෙන මැරෙනවා මිසක් වෙන තැනකට යන්නට එපාය කියා මා ඔවුන්ට කිව්වා. ඒ අය යැවූ පෙත්සමක පිටපතක් මා ළඟ තිබෙනවා. ශ්‍රී කාන්තා මහත්මයාටත් මේ පෙත්සමේ පිටපතක් යවා තිබෙනවා. තමුන්නාන්සේගේ දැනගැනීම සඳහාත් විහාම ක්‍රියා කිරීම සඳහාත් මේ පෙත්සම මා ඉදිරිපත් කරන්නම්. වුවමනා නම් මා කියවන්නම්.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
You might send it to him.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
මේකත් ගිලියිද දන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම මේ ගැන ක්‍රියාකරනවාද කියා අප දැනගන්නට ඕනෑ. මේ කාරණය පිළිබඳව නීත්‍යානුකූලව දැන් ගතයුතුව තිබෙන්නේ එකම පියවරයි. මේ ඉඩම අත්පත් කර ගන්නට ඕනෑ. වෙන කරන්නට දෙයක් නැහැ. ඇමතිතුමා තමාගේ විශේෂ බලතල පාවිච්චි කර රජයට ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥපනත යටතේ වහාම මේ ඉඩම අත්පත් කර ගන්නට ඕනෑ. නැත්නම් හෙට අනිද්දා වන විට මේ මිනිසුන් එළවා දමනවා ඇති.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය පිළිබඳව පරීක්ෂා කර ඒක හරි නම් ඒ වරද හරිගැස්වීමට ක්‍රියා කරන්නම්.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)
වහාම ඒක කරන්නට ඕනෑ. මා තමුන්නාන්සේට ස්තුති කරනවා ඒ ගැන. දැන් ඔය උත්තරයවත් ලබා ගැනීමට ගිරිය පුප්පා ගෙන කෑගසන්නට සිද්ධ වුණා නේද? පළාත් පාලන ඇමතිතුමා නම් ඔය විධියට නොවෙයි ක්‍රියා කරන්නෙ. වැඩ කිරීම පිළිබඳව ඒ ඇමතිතුමාගෙන්වත් පාඩමක් ඉගෙන ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ග්‍රාන්ට් එකක්වත් ගන්න තියෙනවාද දන්නේ නැහැ.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)
එතුමා කාටත් සාධාරණ විධියට ග්‍රාන්ට් දෙනවා. අපටත් දෙනවා, තමුන්නාන්සේලාටත් දෙනවා. එහි කිසිම වරදක් නැහැ. දේශපාලන වශයෙන් අප තමුන්නාන්සේලා සමග විරුද්ධ වුවත්, පොදු කටයුතුවලදී විරුද්ධ වීමට කිසිම වුවමනාවක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

අප ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මෙම පණත හරියාකාර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මානක නිලධාරීන් ආදීවූ නිලධාරි පිරිසක් ඇති කොට ඔවුන් ගම්බද කච්චේරි වලට පත් කර පණත නියම විධියට ක්‍රියාවේ යොදන ලෙසයි.

ඊළඟට අප මෙම පණතේ වගන්ති කෙරෙහි මඳක් අපගේ කල්පනාව යොමු කරන්නට ඕනෑ. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, මෙම සංශෝධන පණතේ 3 වන වගන්තියෙන් මෙසේ සංශෝධනය කර තිබෙනවා :

"Section 8 of the Principal Enactment is hereby amended as follows—

(*a*) in paragraph (*n*) of that section, by the substitution, for the words 'middle-class Ceylonese,' of the words 'certain classes of persons,'

මෙහි "certain classes of persons" යන්නෙහි අර්ථ විග්‍රහයක් කර නැහැ. මේ උදවිය කවුරුන්දැයි අප දන්නේ නැහැ. මෙයින් ගරු ඇමතිතුමා අදහස් කරන්නේ, එතුමාගේ නෑදෑයන්ද, හිතමිතුරන්ද, පන්දම්කාරයන්ද, කොන්ත්‍රාත් කාරයන්ද, බල පිටියේ අයද, පොලොන්නරුවේ අයද, උස් මිනිසුන්ද, මිටි මිනිසුන්ද, මහත මිනිසුන්ද, ධනපති කොම්පැනි කාරයන්ද, නුවර එළියේ ගරු මන්ත්‍රීතුමා මෙන් තේ අක්කර 20,000 ක් තිබෙන අයද යන වග අප දැනගන්නට ඕනෑ. "ඇතැම් පුද්ගල පන්ති" යන වචන ආදේශ කිරීමෙන් මෙය සංශෝධනය කළ යුතු බව මෙම සංශෝධන පණතේ 3 වන වගන්තියෙහි දැක්වෙනවා. මේ ඇතැම් පුද්ගල පන්ති වලට අයත් වන පුද්ගලයන් කවුරුන්දැයි අප දැන ගත යුතුයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මම කියන්නම්. එම කොටසට ඇතුළත් වන අය, "Educated youth, lower middle class, middle class." යනුවෙන් සඳහන් වී තිබෙනවා. රෙගුලාසි මඟින් මීට ඇතුළත් කළ හැකි වෙනත් අයත් මීට අයිති වෙනවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

ඔය ටික බොහොම ලෙහෙසියෙන් මේ පණතටම ඇතුළත් කරන්නට පුළුවන්කම තිබුණානේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒවා රෙගුලාසි මඟින් ඉදිරිපත් කරන්නට ඕනෑ.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

එහෙම නම්, ඒ බව පණතෙහි සඳහන් කරන්න එපායැ. පණතෙහි සඳහන් වී තිබෙන්නේ, "'මධ්‍යම පන්තියේ ලාංකික යන්' යන වචන වෙනුවට, 'ඇතැම් පුද්ගල පන්ති' යන වචන ආදේශ කිරීමෙන්" යන්න පමණයි. නීතියේ අඩු ලුහුඬුකම්වලින් රිංගා ගොස් විශේෂ පුද්ගල පන්තිවලට රටේ ඉඩම් ටික දීමේ වැඩ පිළිවෙළකට ඉඩ දෙන්නට අපට පුළුවන් කමක් නැහැ. මේ ආණ්ඩුව විසින් විශේෂ බදු මණ්ඩල යටතේ ධනපතියන්ට ඉඩම් බෙදා දුන්නාක් මෙන්, අර්ථය පැහැදිලි නොවන අන්දමේ සංශෝධන ඉදිරිපත් කොට ඒ මඟින් මේ රටේ ඉඩම් තව තවත් ධනපතියන්ටම බෙදා දේදෝ යන සාධාරණ බියක් අප තුළ තිබෙනවා. එම නිසා මෙවැනි නීති සම්පාදනය කිරීමේදී එය පැහැදිලිව කළ යුතු බව මා කියන්නට කැමතියි.

ඊළඟට, මෙම ආණ්ඩුව පසුගිය මැතිවරණ කාලයේදී ඉඩම් සම්බන්ධයෙන් ජනතාවට දුන් පොරොන්දු කඩ කර තිබෙන හැටි මා කියන්නට අදහස් කරනවා. සින්නක්කර ඉඩම් නොමිළයේ දෙන බව තමුන්නාන්සේලා පසුගිය මැතිවරණ කාලයේදී ජනතාවට කිව්වා. එහෙත් ඇත්ත වශයෙන්ම මේ පනත සම්මත වූ පසු ඒ ඉඩම් කට්ටිවලට වන්දි වශයෙන් අවුරුදු ගණනාවක් තිස්සේ මුදල් ගෙවන්නට වෙනවා ; දිසාපතිතුමා තක්සේරු කරන ආකාරයට, නියම කරන ආකාරයට, වාරිමාර්ග ක්‍රමවලට යන වියදමත් සමග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙවන්නට සිදු වෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා කර තිබෙන්නේ විශාල වංචාවක්. ඒ වගන්තිවලට මගේ සම්පූර්ණ විරුද්ධත්වය මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මේ පනතේ ඉතාමත්ම භයානක වගන්තිය තමයි 9 වැනි වගන්තිය. 9 වැනි වගන්තිය යටතේ ප්‍රධාන ප්‍රඥප්ති වගන්තියෙහි 20 වැනි වගන්තිය අවලංගු කර ඒ වෙනුවට අළුත් වගන්තියක් ඇතුළු කර තිබෙනවා. මුල් පනතේ 20 වැනි වගන්තියේ තිබෙන්නේ මේ විධියටයි :

"No land shall be alienated except at a Land Kachcheri."

ඉඩම් කච්චේරියකින් මිස වෙන යම් ක්‍රමයකින් ඉඩම් දෙන්නට බැරි බවයි, එහි ඇහැදිලිව ප්‍රකාශ කර තිබෙන්නේ. දැන් සංශෝධන පනතේ තිබෙන්නේ මේ විධියටයි :

" මේ ආඥා පනත යටතේ රජයේ ඉඩම් සතු කර දිය යුතු තැනැත්තන් තේරීම ඉඩම් කච්චේරියකදී කළ යුතුය :

එසේ වුවද නියම කරනු ලැබිය හැකි යම් අවස්ථාවලදී ඉඩම් කච්චේරියකදී නොව අන් ලෙසකින් ඒ තේරීම කළ හැකිය."

එසේ නම් තමුන්නාන්සේ ඉඩම් කච්චේරි ක්‍රමය නැතුවාට ඉඩම් බෙදා දීම සඳහා වෙන ක්‍රමයක් මේ පනත යටතේ ඇති කර තිබෙනවා. මේ මුළු ඉඩම් සංවර්ධන පනතම නොපිටට පෙරළන්නට පුළුවන් භයානක වගන්තිය තමයි ඒ වගන්තිය. ඉස්සර ඉඩම් දෙන්නට පුළුවන් ඉඩම් කච්චේරියකින් පමණයි. අද අන් ලෙසකිනුත් ඉඩම් දෙන්නට පුළුවන් අන්දමට බලතල මේ සංශෝධන පනතින් ඇමතිවරයා තමා වෙත පවරාගෙන තිබෙනවා. ඒ නිසා මේ භයානක වගන්තියට අප තරයේම විරුඬ වෙනවා. දුවමොට්ටාවේ අමරවංශ ස්වාමීන් වහන්සේට බෞද්ධලෝක මාවතේ රජයේ ඉඩම් දුන්නේ මේ " අන් ලෙසකින්... " කියන වගන්තිය මේ පනතට ඇතුළත් කිරීමේ බලාපොරොත්තු වෙන් බවයි මගේ විශ්වාසය. ඉඩම් කච්චේරියකින් නොවෙයි, ඒ බද්ද දී තිබෙන්නේ. මොකක් හෝ පනතක් යටතේ අනියම් ක්‍රමවලින් ඉඩම් දී තිබෙනවා. රජයේ ඉඩම් ආරක්ෂා කර ගැනීම අපේ පරමාර්ථයයි. අන් ලෙසකින් ඒ තේරීම කළ හැකිය

යන කොටස ආදේශ කිරීමෙන් තමුන්නාන්සේ පවරාගෙන තිබෙනවා, මීට කලින් කවදාවත් මේ රටේ ඉඩම් ඇමතිවරයකුට නොතිබුණු බලයක්. [බාධා කිරීමක්] නැහැ, නැහැ. 20 වැනි වගන්තිය ගැනයි, මා කථා කරන්නේ. 20 වැනි වගන්තියේ තිබෙන්නේ මෙසේයි :

"No land shall be alienated by grant a Land Kachcheri."

ඒක එසේම තිබෙන්නට හරින්නෙ නැත්තෙ ඇයි ? ඒක සංශෝධනය කරන්නෙ ඇයි ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

No ; " grant ".

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)

නැහැ, නැහැ. මා තර්ක කරන්නට අදහස් කරන්නෙ නැහැ. එහෙත් ඇමතිතුමා කියනවා නම් ග්‍රාන්ට් එකය කියා එතැන තියෙන වචනය ග්‍රාන්ට් නොවන බව මා පෙන්වා දෙන්නට කැමතියි. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 20 වැනි වගන්තියේ සඳහන් කර තිබෙන්නේ මේ විධියටයි :

"No land shall be alienated by grant except at a Land Kachcheri."

[බාධාකිරීමක්] ඔහොම ඉන්න, ඔහොම ඉන්න. මා කියන තෙක් ඉන්න. තමුන්නාන්සේ සංශෝධනය කරන්නට යන්නේ 20 වැනි වගන්තියයි. සංශෝධනය මා දැන් කියවා දුන්නා. 20 වැනි වගන්තිය මොකක්ද ?

"No land shall be alienated by grant except at a Land Kachcheri."

ඒක හරි. [බාධාකිරීමක්] කොහොම වුණත් ග්‍රාන්ට් එකකින් ලෑන්ඩ් කච්චේරියක ඉඩම් දෙන්නට බැහැ. දැන් තමුන්නාන්සේට ඉඩම් කච්චේරියක් තබන්නෙත් නැතිව තුණ්ඩු කෑල්ලකින් ඉඩම් දෙන්නට පුළුවන් නේද ? මේ සංශෝධනය මගින් සිදු වන්නේ ඒක නේද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

කොයි කොටස්වලටද මේක දෙන්නට අදහස් කරන්නේ ? ඒකට උත්තරයයි, අප සොයන්නට අදහස් කරන්නේ.

ගරු ඇමතිතුමා ඊයේ තවත් එකක් කිව්වා. කවද නෝනා කෙනෙක් ඇවිත් එතුමාගේ කණට කොඳුරා අදෝනාවක් කළාලු. බලපත්‍ර හිමියාගේ ඇවෑමෙන් පසු ඉඩම් පැවරීමේ ආකාරය පිළිබඳව මොකක්ද කිව්වාලු. තමුන්නාන්සේට එය වෙනස් කරන්න හිතුනේ කවුද කෙනෙකු ඇවිත් කළ අදෝනාවක් නිසාය කිව්වා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මා ඒ කිව්වේ නඩුවක් සම්බන්ධවයි.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)
ඔය අදෝනාවම තමුන්නාන්සේ ඉදිරියේ කරන්න කලින් පාමර්, අර්ල් විජේවර්ධන ආදී ඉඩම් කොමසාරිස්වරුන් ඉදිරියෙන් කර තිබෙනවා. මා දන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වන්නේ ඒ සම්බන්ධ වෙනත් ප්‍රශ්නයක් කෙරෙහියි. තමුන්නාන්සේට බලය පවරා ගත යුතු ස්ථාන තිබෙනවා. අපි දන්නවා යම් යම් මානුෂික ප්‍රශ්න ඇති වෙන අවස්ථා තිබෙනවා. කච්චිකරුවන්ගේ ඇවෑමෙන් ඉඩම් පැවරීමේදී යම් යම් ප්‍රශ්න ඇති වී තිබෙනවා. මේ සම්බන්ධ පැමිණිල්ලක් මට ලැබී තිබෙනවා. ඒ පැමිණිල්ල කර තිබෙන්නේ කච්චිකරුවෙකුගේ දරුවෙක් විසිනුයි. ඒ පුද්ගලයාගේ පියාට ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ ඉඩමක් භුක්ති විඳීමට බලපත්‍රයක් දී තිබුණා. ඒ තැනැත්තා විවාහකයෙක්. පළමු විවාහයෙන් එක් දරුවෙක් සිටියා. ඔහු විවාහ වී අවුරුද්දකින් —එක දරුවෙක් ලැබුණාට පසු—ඔහුගේ භාර්යාව ඔහුගෙන් වෙන් වී ඇඹිලිපිටිය පළාතට ගොස් ජීවත් වුණා. ඊටපසු මේ පුද්ගලයා අනියම් බිරියක් තබා ගත්තා. ඒ අනියම් භාර්යාවට දරුවන් පස් දෙනෙක් සිටියා. මෙම ඉඩමේ පසු පැවරීම ලියා තිබුණේ දෙවන බිරියගේ වැඩිමහල් දරුවාටයි. නමුත් ඊටපසුව එය වෙනස් කර තමන්ගේ කසාද බිරියගේ දරුවාට එය පවරා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ ඉඩමේ 13 වසරක් පමණ ජීවත්ව සිටියේ අර අනියම් බිරිය ඇතුළු දරු පිරිසයි. එම ඉඩම සංවර්ධනය කළේත් ඒ අය විසින්මයි. නමුත් ඒ අනියම් බිරියට නීතියෙන් විවාහ වෙන්න ක්‍රමයක් තිබුණේ නැහැ. එයට හේතුව අර පුද්ගලයා නීතියෙන් දික්කසාද වී නොතිබුණ නිසයි. ගරු කථානායකතුමනි, මෙම නීතිය යටතේ මෙහිදී ඇති වෙන්නේ කිනම් තත්ත්වයක්ද ? කවදා හෝ අර මිනිහා මැරුණ දවසක එම ඉඩම අයිති වන්නේ අර කසාද ස්ත්‍රියගේ පුත්‍රයාටයි. ඒ ඉඩමේ පදිංචි නොවුණ, එම ඉඩම වගා නොකළ කෙනෙකුටයි එය අයත් වෙන්නෙ. ඔන්න ඔය විධියේ ප්‍රශ්න අනන්ත ඇති වී තිබෙනවා. මෙම නීතියෙන් මෙවැනි ප්‍රශ්න විසඳන්න බැහැ. ඒ නිසා මා තමුන්නාන්සේට කියන්නේ මෙම සංශෝධිත පනතට කිනම් සංශෝධනයක් හෝ ඇති කර කොතැනකින් හෝ වගන්තියක් දමා මානුෂික ප්‍රශ්න ඇති වුණ අවස්ථාවලදී යුක්ති සහගතව ඒවා බේරුම් කර ගත හැකි වනසේ යම්කිසි බලයක් ඉඩම් කොමසාරිස්තුමාට ලබා දෙන ලෙසයි. එවැනි අවස්ථාවකදී යුක්ති සහගතව ක්‍රියා කිරීමට හැකි වනසේ යම්කිසි බලයක් ලබා දෙන්න. එවැනි හොඳ දේවල් සම්බන්ධයෙන් බලය පවරා ගත්තාට කිසිම වරදක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එයට මා එකඟ වෙනවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஷ)*
(Mr. George Rajapaksa)
එහෙම නම් එයට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. ඒ වගේ දුර්වල තැන් කොතෙකුත් ඇති වෙනවා. නීතියෙන් හැම ප්‍රශ්නයක්ම විසඳන්න පුළුවන් වන්නේ නැහැ. එවැනි කටයුතු සඳහා පළල් වශයෙන් ඉඩම් කොමසාරිස්තුමාට බලය පවරා ගත යුතුයි. එවැනි අවස්ථාවලදී යුක්ති සහගත අන්දමට ක්‍රියා කිරීම සඳහා බලය පවරා ගත්තාට කිසිම වරදක් නැහැ. මා මේ ඉදිරිපත් කළේ එක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උදාහරණයක් පමණයි. තවත් මෙවැනි උදාහරණ 50 ක් 60 ක් පමණ වුණත් ඉදිරිපත් කරන්න පුළුවනි.

ඒ නිසා අපි මේ ඉදිරිපත් කළ විවේචනයන් ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කොට ඉඩම් සංවර්ධන ආඥා පනත රටට වැඩදායක වන අන්දමට සංශෝධනය කරන හැටියට ඉල්ලා සිටිනවා. ඒ සමගම තමුන්නාන්සේ වෙත පවරා තිබෙන වැඩි බලතල අහෝසි කර දමා මේ රටේ සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේ ඉඩම් හරියාකාර පාලනය කර ගැනීමට අවස්ථාවක් සලසා දෙන ලෙස ඉල්ලමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

අ. භා· 3.26

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)

*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ඉඩම් ඇමතිතුමාගේ ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳව තදබල විවේචනයක් කෙරුණා. සමහර විට සමහර අය සිතනවා ඇති එම විවේචනය අසාධාරණය කියා. නමුත් ඇත්ත වශයෙන්ම මගේ ප්‍රදේශයේ ඉඩම් පිළිබඳව අද තිබෙන ආරවුල් තත්ත්වය දෙස බලන විටත්, ඉඩම් ඇමතිවරයා ඒ ගැන ක්‍රියා කර තිබෙන ආකාරය දෙස බලන විටත් මුල්කිරිගල මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) විසින් ප්‍රකාශ කරන ලද සමහර වේදනාත්මක විවේචන අසාධාරණ විවේචන හැටියට කිසිම කෙනෙකුට සලකන්න පුළුවන්කමක් නැහැ.

අ. භා. 3.27

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *took the Chair.*

**කාරියවසම් මයා.**

*(திரு. காரியவசம்)*

(Mr. Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. පසුගිය අවුරුදු දොළහ තිස්සේ ඉඩම් ඇමතිවරයා වශයෙන් තමන් කෙළේ කුමක් දැයි ඇසූ විට, 1964 වන තුරු අවුරුදු නවයක කාලයක් තිස්සේ තමන්ට වැඩ කරන්නට ඉඩ නොදුන් බව මේ ඇමතිවරයා කියන බව දැන ගන්නට ලැබී තිබෙනවා. අද මේ ඇමතිවරයා මේ ආණ්ඩුවේ ඇමතිවරයකු වශයෙන් සිටියත් යම්කිසි විධියකින් අනාගතයේදී බලයට පත් වන වෙනත් ආණ්ඩුවකත් ඉඩම් ඇමතිවරයා වශයෙන් මෙතුමාම පත් වුවහොත් එදාට කියනවා ඇත්තේ කුමක් ද? හත් හවුල් ආණ්ඩුවේ ඉඩම් ඇමතිවරයා වශයෙන් තමන්ට වැඩ කරන්නට දුන්නේ නැතැයි එතුමා කියනවා ඇති. ජාතිය නගා සිටු වීම සඳහා අතිමහත් වැඩ කොටසක් කළ හැකි ඉඩම් අමාත්‍යාංශය සම්බන්ධයෙන් අප දැඩි සැලකිල්ලක් දක්වා කරුණු සොයා බලන්නටත්, විවේචනය කරන්නටත් අවශ්‍යයි. ඇත්තෙන්ම ඉඩම් ඇමතිවරයා ජාතියේ අනාගත යහපත තකා මධ්‍යස්ථභාවයකින් යුක්තව උද්‍යොගයෙන් ක්‍රියා කරන්නකු විය යුතුයි. නෑදෑකම අනුව හෝ මිත්‍රකම අනුව හෝ තමන්ගේ ප්‍රදේශයේ කෙනකු වීම අනුව හෝ ඉඩම් ප්‍රශ්න විසඳන්නට කල්පනා කරනවා නම් එය අනාගත පරම්පරාවට කරන බලවත් වරදක් බව කිව යුතුයි. ඉඩම් අමාත්‍යාංශය මෙතෙක් කල් ගෙන ගිය අදූරදර්ශී ක්‍රියා මාර්ගය වහාම නවත්වා නියම නිලධාරී මණ්ඩලයක් පත් කොට ක්‍රමවත් වැඩ පිළිවෙළක් ගෙන යා යුතුව තිබෙනවා. අප කොතරම් හොඳ නීති පැනෙව්වත් ඒවා හරි හැටි ක්‍රියාත්මක නොකරනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් ඒවායින් ප්‍රයෝජනයක් සැලසෙන්නේ නැහැ. කොච්චර හොඳ නීති පැනෙව්වත් ඒ නීති ක්‍රියාත්මක කරන්නට සිටින ඇමතිවරයාත්, ඔහු යටතේ සිටින ස්ථිර ලේකම්වරයාත්, ඒ ස්ථිර ලේකම්වරයා යටතේ සිටින අනෙක් රාජ්‍ය සේවකයනුත් ඒවා හරි හැටි ක්‍රියාත්මක නොකරනවා නම් ඉන් සිදු වන ප්‍රයෝජනයක් නැහැ. ඉඩම් ඇමතිවරයා ස්ථිර ප්‍රතිපත්තියක් අනුගමනය නොකරනවා නම්, අන්‍යයන්ගේ හිනාවට ලක් වන වැඩ ඔහු අතින් සිදු වෙනවා නම් ඔහු යටතේ තිබෙන දෙපාර්තමේන්තු හරි හැටි වැඩ කරතැයි කොහොම නම් හිතන්නට ද? නීති පැනවිය යුත්තේ අලුත් අවුල් ඇති කිරීමට නොව තිබෙන අවුල් නිරවුල් කිරීම සඳහායි. අලුතෙන් පනවන නීති වලින් අවුල් වියවුල් ඇති වෙනවා නම් ඒවා අහෝසි කර දමන්නට ඕනෑ. මේ රටේ ඉඩම් සම්බන්ධයෙන් අද තිබෙන අවුල් සහගත නීති මාලාව ඉවත් කොට, ජන ජීවිතය සාර්ථක කර ගන්නට අදාළ වන මහජනයාගේ සිතුම් පැතුම් වලට සරිලන නව නීති මාලාවක් සකස් කළ යුතුයි. පරණ නීති නොයෙකුත් අයුරින් විවේචනයට භාජන වී තිබෙනවා. ඒ නීති ක්‍රියාත්මක කිරීමෙන් දුප්පත් ගොවි ජනතාවට සහනයක් සැලසෙනවා වෙනුවට නිලධාරීන්ගේ මල්ල පිරෙනවා. නීති එක එක විධියට විග්‍රහ කිරීමට නීතිඥයන්ට ඉඩ දීමෙන් ඒ නීතිඥයන්ගේ මඩි තර වෙනවා මිස ඉඩම් අයිතිකාරයන්ට ප්‍රයෝජනයක් සැලසෙන්නේ නැහැ. උසාවියට ගොස් නීති පොත් පෙරළ පෙරළා තර්ක කර කර ඉන්නට ඉඩකඩ නොසැලසෙන අන්දමින් සාධාරණ අලුත් නීති පද්ධතියක් ඉඩම් සම්බන්ධයෙන් ඇති කරන්නට ඕනෑ. එසේ කළහොත් මේ රටේ අනාගතය සඳහා යහපත් ස්ථිර ක්‍රියාමාර්ගයක් ඇති වේවි.

ගරු **නියෝජ්‍ය කථානායකතුමනි.** මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධනය බොහෝ දුරට ඉඩම් ආරාවුල් බේරීමට උපකාරී වෙයි කියා මා හිතනවා. එහෙත් මේ විධියේ නීති කොයිතරම් දුරට සකස් කළත් මේවා ක්‍රියාත්මක කරන නිලධාරීන් හරිහැටි මේවා ක්‍රියාත්මක නොකළහොත් ඇමතිතුමාටත් කරන්නට දෙයක් නැතිව යනවා. මා ඊට උදාහරණ කීපයක් දෙන්නම්. සමහර ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බල තල දිස පතිවරුන්ට පවරා තිබෙනවා. ඔවුන් හරිහැටි ඒ බලතල ක්‍රියාත්මක නොකරනවා නම් ඇමතිතුමාට කරන්නට දෙයක් නැහැ. පසුගිය කාලය තුළ ඒ විධියේ බොහෝ අසාධාරණකම් ගාළු දිස්ත්‍රික්කයේ සිදු වී තිබෙනවා. ස්පෙල්ඩ්වින්ඩ් නමැති දිසාපතිවරයකු පසුගිය කාලයේ ගාල්ලේ දිසාපති වශයෙන් පත් වී ආව. ඒ දිසාපතිවරයා රාජකාරි කළේ වතුකාරයන්ට වුවමනා හැටියටයි. ඉඩකඩම් පවා ඔවුන් කියන හැටියට බෙදා දුන්නා. වතුකාරයෙකුට පක්ෂපාත මිනිසෙකුත්, වෙනත් දුප්පත් මිනිසෙකුත් ඉඩමක් ලබා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා නම්, කෙලින්ම ඒක වතුකාරයාට පක්ෂපාත නැනැත්තාට දෙන්නට බැරි නම් අඩු වශයෙන් ඒක දෙකට කඩල කොටසක්වත් ඔහුට ලබා දෙන්නට ඒ දිසාපතිවරයා ක්‍රියා කළා. එවැනි තත්ත්වයක් ඒ කාලයේ පැවතුණු බවට මට කෙළින්ම චෝදනා කරන්නට පුළුවනි. කලින් සිටි දිසාපතිවරයා මෙන්න මේ අන්දමට අසාධාරණ ලෙස ක්‍රියා කර තිබෙනවාය, ඔහු ක්‍රියා කර තිබෙන්නේ කෙළින්ම වතුකාරයන්ගේ ඕනෑ එපාකම් පිරිමැසීමටය, කියා මා වර්තමාන දිසාපතිතුමාටත් කරුණු කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. අද ඒ දිසාපතිවරයා සිටින්නේ වතුකාර සංගමයේ ඉහළ ස්ථානයේයි. ඒ ස්ථානය ලබා ගැනීමට ඒ කාලයේ වතුකාරයන්ට ඕනෑ හැටියට ක්‍රියා කළා. ඉතින් මේ රටේ සාමාන්‍ය ජනතාවට යුක්තියක් ඉෂ්ට වෙයි ද? කොතෙක් නීති පැනෙව්වත් ඒවා ක්‍රියාත්මක කරන පුද්ගලයන් හරිහැටි ක්‍රියා නොකළොත් ඇති වන තත්ත්වය පැහැදිලි කිරීමටයි, මා ඒ කරුණ ගැන සඳහන් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට තවත් උදාහරණයක් පෙන්වා දෙන්නට කැමතියි. ඕනෑම ඉඩමක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ඉඩම් කොමසාරිස්තුමාට සම්පූර්ණයෙන් බලතල තිබෙනවා. මගේ කොට්ඨාශයේ ගොඩඅමුණ කියන ගමේ කේ. ජී. කරෝලිස් නමැති මුදලාලි මහත්මයෙකුට අයිති ඉඩමකට යාව ගුණදාස නමැති දුප්පත් ගැමියෙකුගේ ඉඩමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. ඒ ඉඩමේ අයිතිය ඔහුට ලැබුණේ ඔහුගේ භාර්යාවගේ පියාවන ඔහුගේ මාමාගෙනුයි. මේ ගුණදාස නමැත්තාගේ මාමා අවුරුදු 10 ක්, 15 ක් පමණ මේ ඉඩම භුක්ති විඳගෙන ඇවිත් ගුණදාසට පවරා තුන්නා. අවුරුදු 15ක්, 20 ක් තරම් වයස කොස්ගස් හා පොල්ගස් ආදිය ඒ ඉඩමේ තිබෙනවා. මේ ඉඩම නිසා මා කලින් නම සඳහන් කළ මුදලාලිගේ ඉඩමට පොඩි අවහිරයක් තිබෙනවා. ඒ නිසා මේ ඉඩමෙන් පර්චස් තිහ හතළිහක් ලබා ගන්න මුදලාලිට ඕනෑ වුණා. මුදලාලි කළේ මොකක්ද ? ගුණදාස දැනට භුක්ති විඳින්නේ කලින් තමාට අයිතිව තිබුණු ඉඩමක් යයි ඔහු ඉඩම් කොමසාරිස්තුමාට දැනුම් දුන්නා. මෑතකදී ඉඩම් කොමසාරිස් තුමා නියෝගයක් යවා තිබෙණවා ගුණදාස නැමැත්තා භුක්ති විඳගෙන එන ඉඩම බෙදා වෙන් කර එයින් පර්චස් 50 ක් මුදලාලිට දෙන්න කියා. මේ කටයුත්තට දිසාපතිතුමාට අතගහන්න ඉඩ දුන්නෙ නැහැ. දුප්පත් ගොවියෙකු අවුරුදු ගණනක් භුක්ති විඳගෙන ඇවිත් තමාගේ දුව කසාද බඳින අවස්ථාවේදී තම බෑණාට පවරා දුන්න මේ ඉඩමෙන් පර්චස් 50 ක් ඒ මුදලාලිට දෙන්නට නියම කිරීම සාධාරණ වැඩක්ද ? මේ ඉඩම මණින්නට ගියාම මිනියක් දෙකක් නොමැරෙයි කියා තමුන්නාන්සේ හිතනවාද ? තමන් අවුරුදු විස්සක් තිහක් භුක්ති විඳගෙන ආව ඉඩමක් මෑනල බලහත්කාරයෙන් වෙන කෙනෙකුට වෙන් කරල දෙන කොට තමන්ගෙ හෘදය වස්තුව කඩල දෙන්න වගේ නේද ගැමියෙකුට හිතෙන්නෙ ? මේ ඇමතිතුමා අවුරුදු 12ක් තිස්සේ අනුගමනය කළ මේ ඉඩම් ප්‍රතිපත්තිය නිසා මේ රටේ සිදු වූ මිනී මැරුම් සංඛ්‍යාව ගණින් බලනවා නම්, ඇමතිතුමාගේ වයසේ දින ගණනට වඩා වැඩි බව කියන්නට ඕනෑ. ඒ නිසා හෙටවත් නියෝගයක් යවා අර විධියේ අයුතු ක්‍රියාවන් නතර කරන හැටියට ඉඩම් කොමසාරිස් තුමාට දන්වන මෙන් මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

දිසාපතිතුමා තවත් එකක් කර තිබෙනවා. මේ කරුණ සඳහන් කරන්නේ ඉඩම් ප්‍රතිපත්තිය වෙනස් කිරීමට කොතරම් නීති ඇති කළත් ඒවායින් ඵලය යන තැන් පෙන්වීමටයි. මගේ ප්‍රදේශයේ කඳු සහිත ඉඩමක් තිබෙනවා. එහි එක්තරා ගොවියෙක් අවුරුදු 10 ක පමණ කාලයක සිට පදිංචි වී සිටිනවා. ඊට අවුරුදු හය හත කට පමණ පසුව තවත් ගොවියෙක් එහි පදිංචි වී සිටිනවා. ඒ ප්‍රදේශයේ ගම්සභා පතිතුමාට ක්‍රීඩා පිට්ටනියක් සඳහා එම ඉඩම ගන්නට ඕනෑ කළා. ඒ ඉඩම ගත්තත් අඩි 25 කට වඩා විශාල ක්‍රීඩා පිටියක් හදන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා සමහරවිට එය ගන්නට හැදුවේ පෞද්ගලික ඕනෑකමකට වන්නට ඇති. ඊට පසුව එහි පදිංචිව සිටි ගොවියකුට විරුද්ධව ආණ්ඩුවෙන් නඩුවක් දැම්මා. ඒ නඩුවෙන් දිසාපතිවරයා පරාජය වුණා. ඊට පසුව ඔහු එතැනින් නතර නොවී ඒ ඉඩමට අල්ලපු ඉඩමේ තවත් පර්චස් කීපයක පදිංචි වී සිටින තවත් ගොවියකුට විරුද්ධව දැන් නඩුවක් පවරා තිබෙනවා. සමහරවිට ඒ නඩුවෙනුත් දිසාපතිතුමා පරදින්නට පුළුවන්. එසේ නුණොත් ඔහු දිනාවි. එම ඉඩම ක්‍රීඩා භූමියකට සුදුසු නැත කියා ඉඩම් නිලධාරියා පවා රපෝර්තු කර තිබියදීත් ඒ කාලයේ සිටි දිසාපතිතුමාගේ ඕනෑකම වූයේ ඉඩම් නිලධාරියා කියන එක පිළිගැනීම නොවෙයි. ඒ ප්‍රදේශයේ චතුකාර යින් කියන පිළිවෙළට ක්‍රියා කිරීමටයි. ඒ නිසා අර දුප්පත් ගොවීන්ට නඩු සඳහා රුපියල් දහස් ගණනක් වියදම් කරන්නට සිදු වුණා. ඒ විධියේ දේවල් සිදු වෙනවා. අපේ ඉඩම් කොමසාරිස්තුමා හමුවීමට මා කීපවරක්ම මහන්සි ගත්තා. එහෙත් එතුමා අසනීපයෙන් නිවාඩු පිට සිටි නිසා මට හමුවන්නට බැරි වුනා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රදේශයේ මැටිවිලිය කියා ගමක් තිබෙනවා. එහි ගෙවල් එකකට එකක් හේත්තුවී තිබෙන්නේ ; නගරයක වගෙයි. ඉඩම් ප්‍රතිපත්තිය කොතරම් වෙනස් කළත් තත්ත්වය ඒකයි. සමහරවිට හිනිදුම ගරු මන්ත්‍රීතුමාත් (එම්. එස්. අමරසිරි මයා.) ඒ ගම ගැන දන්නවා ඇති. ගෙවල් එකකට එකක් හේත්තු වී තිබෙන්නේ. ඒ තරමටම ඉඩම් හිඟයි. එහි මිනියක් වළලන්නට ඉඩමක් නැහැ. 1934 සිට මිනී වැළලීම සඳහා අක්කරයක රජයේ ඉඩමක් ඉල්ලුවා. ඒ කාලසීමාව තුළ ගම්සභාපතිවරුන් 5 දෙනෙක් පමණ එහි සිටියා. ඒ 5 දෙනාමත් එම ඉඩම මිනී වැළලීම සඳහා ගැනීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

මහන්සි ගත්තා. දැනට සිටින පිටිගල-වැයිහේන් ගම්සභාපතිවරයාත් එය ලබාගැනීමට මහන්සි ගන්නවා. එහෙත් ඉඩම් ඇමතිතුමාගේ එක පෑන් පහරින් ඒ අයට සොහොන් පිටිය නැති වුණා. අද ඒ අය ඉන්නේ හිත් වේදනාවකින්. පසුගිය රජය තිබියදී අවුරුදු හතර හමාරක් තිස්සේම ඒ ඉඩම ගන්නට ඉඩම් ඇමතිතුමාට මාසාන්නලව් කළා. මේ ඉඩම් ඇමතිවරයා සිටින තුරු එය ගන්නට මට පුළුවන් වුණේ නැහැ. 1964 දෙසැම්බර් 4 වැනි දා මොහු අස් වී යන තුරුම බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ එක බිම් අගලක්වත් ආරෝග්‍යශාලාවකට හෝ මාතෘ නිවාසයකට හෝ වෙන යම් කටයුත්තකට හෝ ලබා ගන්නට පුළුවන් වුණේ නැහැ. 1964 දෙසැම්බර් 4 දා මේ ඉඩම් ඇමතිතුමා ගියාට පසුව ආරෝග්‍ය ශාලාවලට හා මාතෘ නිවාසවලට අපි ඉඩම් අත් කර ගත්තා. එහෙත් සිදුවූයේ කුමක්ද? නැවතත් මේ ඉඩම් ඇමතිවරයා බලයට ආවා. බලයට පැමිණි හැටියේම එතුමා කළේ කුමක්ද? අපි අක්කර අටසිය ගණනක් තිබෙන වත්තකින් ආරෝග්‍යශාලාවකට අක්කර 4 ක් ලබාගත්තා. මේ ඉඩම් ඇමතිතුමා නැවත බලයට පැමිණි හැටියේම එය අහෝසි කළා. තවත් තැනකින් මාතෘ නිවාසයකට අක්කර 2 ක් ගත්තා. සමහරවිට ඇමතිතුමාගේ නෑදෑයකුගේ නිසා වන්නට ඇති ඒ අක්කර දෙක පවරා ගැනීමත් අවලංගු කළා. ඒවා 38ඒ වගන්තිය යටතේ ගත් ඉඩම්. ප්‍රදේශ අනුව, ජාතීන් අනුව, කුල අනුව වෙනස් වෙනස් අන්දමට සලකනවා නම් ප්‍රජාතන්ත්‍රවාදීය කියා ගන්නා මෙබඳු ආයතන තිබීමෙන් ඇති ඵලය කුමක්ද කියා ප්‍රශ්න කරන්න කැමතියි. ජාතිය, ප්‍රදේශය, කුලය වැනි කාරණා ගැන සලකා ක්‍රියා කරන්න නම්—ඇමතිවරයකු පත් කර සිටින්නේ පක්ෂය හෝ පාට ගැන සලකා ක්‍රියා කරන්න නම්—එබඳු ඇමතිවරයකු සිටින ආණ්ඩුව බලු වටින්නේ නැති බව කෙලින්ම මට ප්‍රකාශ කරන්න සිදු වී තිබෙනවා. නොයෙකුත් අණපනත්, නීතිරීති, සංශෝධනයන් කොයි අන්දමින් සම්මත කර ගත්තත් ඒවා අපක්ෂපාතව ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්නේ ආණ්ඩුවේ ඇමතිවරුන් සාධාරණව ක්‍රියා කළහොත් පමණක් බව පෙන්නා දෙන්න කැමතියි. මේ අන්දමට අසාධාරණකම් කරනවා නම් රටේ දියුණුවක් බලාපොරොත්තු වන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගම් ප්‍රදේශවල ජීවත්වන උදවිය ඉතාමත්ම දුප්පත්. බොහෝ විට ගොවියන්ට අඳින්න ඇත්තේ එක සරමයි. ගොවි රජවරුන් තෝරා ගත්තත්, කෘෂිකාර්මික මණ්ඩලවල හෝ කමිටුවල වැඩ කටයුතු ගැන ඒ උදවියට කිසිම අන්දමක බලපෑමක් කරන්න බැහැ. එම මණ්ඩලවල කිසිම පදවියකට පත් කර නැහැ. නමුත් ඉඩකඩම් දෙන්න නම් කථා කරනවා. එපමණක් නොවෙයි, මෙම දුප්පත් ගොවීන්ට රජය කොයි ආකාරයෙන්ද සලකන්නේ? ගොවියකු රජයේ ඉඩමකින් අක්කරයක් අල්ලා ගෙන වගා කළොත් ඔහුට ඒ අක්කරය වෙනුවෙන් රුපියල් පණහක හෝ සියයක දඩයක් ගහනවා. ඊට පසුව ඒ ඉඩමෙහි වගා කරන්න ඉඩ දුන්නොත් බදු වශයෙන් අක්කරයකට රුපියල් තිහක් හතලිහක් අය කරනවා. නමුත් කොළඹ නගරයේ ඇති රජයේ ඉඩම්වලින් අය කරන්නේ රුපියලක්-දෙකක් වැනි සුළු බදු මුදලක්. කොළඹ අග්‍රරාජගුරුප්‍රසාදීන් වහන්සේට කොළඹ නගරයෙන්ම පවරා දී ඇති රජයේ ඉඩම්වලින් අය කරන්නේ රුපියලක තරම් සුළු බදු මුදලක් බව අපට දැන් දැනගන්න ලැබුණා. කෙසේ හෝ වේවා වගා කිරීම සඳහා රජයෙන් මෑතකදී දී ඇති ඉඩම් වෙනුවෙන් අක්කරයකට බදු වශයෙන් රුපියල් හත-අටක් හෝ දහයක් දොළහක් අය කරනවා. මේ කාරණා ගැන අප නොයෙකුත් අවස්ථාවලදී දිසාපතිතුමා සමග සාකච්ඡා කර තිබෙනවා; ප්‍රදේශයේ ගොවි ජනතාවට මුහුණ පාන්න වී ඇති දුෂ්කරතාවන් පිළිබඳ කරුණු හෙළි කර තිබෙනවා; ඉඩම් කොමසාරිස්වරයාට ලියා දන්වා තිබෙනවා. නමුත් ඒ පිළිබඳව කිසිදු තීරණයක් අපට තවම දැනගන්න ලැබී නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් ලබා ගන්නා ගොවීන්ට නිවාස සාදා ගැනීම සඳහා ආධාර මුදලක් රජයෙන් දෙනවා. මෙය ඉතාමත්ම සුළු ගණනක් වුණත් සමහර දිසාපතිවරු ඒ මුදලවත් බෙදා දෙන්නේ නැතුව ආපසු එවනවා. අපේ ප්‍රදේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කලින් සිටි දිසාපතිතුමා ලක්ෂ ගණනක මුදලක් ආපසු එවා තිබෙනවා. ඒ හැරෙන්න, නිවාස තැනීම සඳහා දෙන මුදල කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. ලැබෙන මුදල පවා ලබාගන්නේ ඉතාමත්ම අමාරුවෙන්. විශේෂයෙන්ම නිවාසයක් තැනීම සඳහා ආධාර ලබා ගන්න ඉඩම් ඕවර්සියර් අනුමත කරන්න ඕනෑ. එසේ අනුමත කරන්න නම් ආධාර මුදල වශයෙන් ලැබෙන රුපියල් දාහෙන් පන් සියක්වත් ඉඩම් ඕවර්සියර්ට දෙන්න ඕනෑ. මෙය රහසක් නොවෙයි. එම නිසා, දුප්පත් ගොවීන්ට තම නිවාස සාදා ගැනීම සඳහා දෙන මුදල කෙලින්ම ඒ උදවියටම ලබා ගැනීමට පහසුකම් සලසා දෙන්න ඕනෑ. ඉඩම් ඕවර්සියර් ලවා අනුමත කරවා ගැනීම වැනි කටයුතුවලට ඉඩ සලසන්න එපා.

මා නියෝජනය කරන කොට්ඨාශය, සීඝ්‍රයෙන් ජනගහනය වැඩි වෙමින් පවතින ප්‍රදේශයක්. පසුගිය අතුරු මැතිවරණයේදී ඡන්ද දායකයන් පණස් හත් දාහකට ආසන්න සංඛ්‍යාවක් ලියාපදිංචි වී සිටියා. මේ අනුව ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක් ඒ ප්‍රදේශයේ ජීවත්වෙනවා. මෙතරම් විශාල ජනගහණයක් ඇති ප්‍රදේශයක් වුණත්, ප්‍රදේශයේ ඉතාමත්ම තදින් බලපාන ඉඩම් ප්‍රශ්නය නිරවුල් කිරීමට ඇමතිතුමා පසුගිය අවුරුදු 12 ක කාල පරිච්ඡේදය තුළ කිසිවක් කර නැති බව සඳහන් කරන්න මට සිදු වී තිබෙනවා. ඇමතිතුමාගේ ඉඩම් ප්‍රතිපත්තිය කොයි තරම් අසාර්ථකද කියනවා නම්, පසුගිය කාල පරිච්ඡේදය තුළදී මගේ කොට්ඨාශයේ ඇති ඌරගහ දිවිතුරවැලිවිටය කියන කොටස් මැන වෙන් කර, නිරවුල් කර දෙන ලෙස කරන ලද ඉල්ලීම අද වන තුරු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙනවා. ඉතින් දහස් ගණන් උදවිය කා කොටාගෙන මැරෙනවාය කියන එක පුදුම යක්ද? මෙවැනි තත්ත්වයක් තමයි උදා වී තිබෙන්නේ. මේ ඇමතිතුමාට ඒ උදවියට ඉඩම් නිරවුල් කර දෙන්නට වුවමනාවක් නැහැ. අත හයිය එකාට වුවමනා නම් ඕනෑ වේලාවක ගොස් ඒවා උදුරා ගන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ; බැරි වේලාවත් අසරණ අහිංසක මිනිහෙක් යම් ඉඩමක පදිංචිව සිටියොත් ඔහු එතැනින් පැන්නකට තල්ලුකර දමා එම ඉඩම කොල්ල කා ගන්නට පුළුවන්කම තිබෙන්නට ඕනෑ, මේ ඇමතිතුමාගේ ප්‍රතිපත්තියට අනුව. මට ඒ බව ඔප්පු කිරීම සඳහා සිය ගණනක් උදාහරණ පෙන්වා දෙන්නට පුළුවනි. මගේ කොට්ඨාශයේ වූ සිද්ධිවලින්ම මට අත්දැකීම් ලැබී තිබෙනවා.

පසුගිය කාලයේ ඒ පළාතේ එක්තරා ඉඩම් නිලධාරියෙක් සිටියා. ඔහු කළ දෙයක් මට දැන් මතක් වෙනවා. එක්තරා කාන්තාවකට ඉඩමක් දී තිබුණා. අවුරුදු 20 ක්ම ඒ කාන්තාව ඒකට බදු ගෙව්වා. එහි ලොකු පොල් ගස් කොස් ගස් යනාදී යත් වවා තිබුණා. ඇගේ නමට ඒ ඉඩම දී ඇති බවට ඔප්පුවක් තිබියදීත් වෙන කෙනෙකුට තව ඔප්පුවක් දෙන්නට එම නිලධාරියා ක්‍රියා කළා. ඉන් පසු ඒ අම්මා ඇවිත් මට කාරණය පැහැදිළි කර දුන්නා. "මේ ඉඩම සඳහා මට ඔප්පුවක් තිබෙනවා; මම ගස් කොළං වවා තිබෙනවා; එහෙත් වෙන ඔප්පුවකින් වෙනත් කෙනෙකුට මෙම ඉඩම පවරා දී තිබෙනවා" යනුවෙන් ඇය මට කිව්වා. මේ ගැන විභාගයක් පැමිණි පසු මොකද කළේ? අර ඉඩමට අයත්ව තිබුණු අවුරුදු පහළොව විස්ස පැරණි කොස් ගස් සහ පොල් ගස් යනාදිය කපා පුච්චා දමා ඒ ඉඩමේ කිසිවක් නොතිබුණු හැටියට හරි ගැස්සුවා. ඉන් පසු අළුතින් ඔප්පුව දුන්න තැනැත්තාට ගොස් එහි පදිංචි වන්නැයි කිව්වා. කලින් ඔප්පුවක් දුන්නේ නැතැයි මට පිළිතුරු දුන්නා. මෙන්න මේ අන්දමටයි මිනිසුන්ට ඉඩම් දීගෙන යන්නේ.

තවත් හොඳ වැඩක් ගැන සඳහන් කරන්නට කැමතියි. මා මේවා සඳහන් කරන්නේ ඉඩම් ඇමතිතුමා හෝ ඉඩම් කොමසාරිස්තුමා හෝ මේවා ගැන සමහර විට නොදන්නා නිසායි. එම ප්‍රදේශයේ තණ බිමක් තිබුණා. ගැමියන් එය අල්ලා ගනු ලැබුවා. එම ප්‍රදේශයේ ගම් සභාවත් වෙනත් පළාත් පාලන ආයතනත් ඊට විරුද්ධත්වය පෑවා. එහෙත් මිනිසුන් ඒ ගැන නොතකා නොයෙකුත් අන්දමට ගෙවල් සාදාගෙන පදිංචි වුණා. ඒ අතර එම ප්‍රදේශයේ සිටි ග්‍රාම සේවක මහතා ඔය ඉඩමෙන් අක්කර කාල රුපියල් 25ට, බාගය රුපියල් 50 ට, අක්කරය රුපියල් 100 ට යනාදී වශයෙන් වික්කා. එසේ විකුණද්දී ඉඩම් නිලධාරියා ඇවිත් තාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

කාලික බලපත්‍ර වගයක් දුන්නා. අර අන්ද මට එම ඉඩම් අල්ලාගෙන සිටි මිනිසුන්ට එම බලපත්‍ර දීගෙන යන විට ඔවුන්ගෙන් හතර පස් දෙනෙක් පැත්තකට කර අර ග්‍රාම සේවක මහතාගේ ඕනෑකම උඩ වෙනත් කීප දෙනෙකුටත් එම බලපත්‍ර දුන්නා. දීලා ගණින් බැලුවා. එතකොට කලින් අල්ලාගෙන සිටි උදවිය එහෙමම සිටිනවා. වගා කර ගත් ඉඩම්වලින් ඔවුන් යන්නේ නැහැ. එම නිසා ග්‍රාම සේවක මහතාගේ ඕනෑකම උඩ බලපත්‍ර දුන් වෙනත් කීප දෙනාට යන්නට තැනක් නැති වුණා. ඒ පාර එක මිනිහෙක් එක් ඉඩමකට පැන්නා. එතැන දී අල්ලා ගෙන ගැහැව්වා. ඊළඟට තවත් ඉඩමකට පැන්නා. එතකොටත් අල්ලා ගෙන ගැහැව්වා. යළිත් ඉඩමකට පැන්නා. එතනදීත් අල්ලාගෙන ගැහැව්වා. ඒ අනුව පිටිගල උසාවියේ නඩු තුනක් දමා තිබෙනවා. මෙවැනි සිද්ධීන් සිය ගණනක් පෙන්වන්නට පුළුවනි. මා සඳහන් කළ අන්දමේ තණ බිම් වැනි පොදු ස්ථාන පිළිබඳව තීරණය කිරීම ඒ ඒ ගම්වල පිහිටි ගම්සභාවලටම පවරන ලෙස මා කියා සිටිනවා.

තවත් බොහොම ලස්සන සිද්ධියක් මතක් කරන්නට කැමතියි. ඒ පළාතේ වත්තෙහේන නමින් ගමක් තිබෙනවා. ඒ ගමේ අවසාන ගම් සැළැස්මේ සඳහන් වෙනවා සොහොන් පිටියකට ඉඩමක් වෙන් කර තිබෙන බව. එසේ වෙන් කර ඇති ඉඩමේ දුප්පත් මිනිසුන් දෙදෙනෙක් ගෙවල් හදාගෙන පදිංචිව සිටියා. ඒ කාලයේ එහි සිටි ගම් සභිකයා—ඔහුගේ මස්සිනායි සභාපති වශයෙන් සිටියේ—කළේ කුමක්ද? මේක තියෙන්නේ සොහොන් පිටියකට නිසා වහාම ගන්නට වුවමනා බව කිව්වා. අනේ, අර අවුරුදු හතක් අටක් තිස්සේ කොස් පොල් වවා ගෙන සිටි දුප්පත් මිනිසුන් දෙදෙනාට විරුද්ධව නඩු දමා, උසාවියෙන් පිස්කල් නිලධාරීන් ගෙනැවිත් ඒ දුප්පත් මිනිසුන් දෙදෙනාගේ ගෙවලුත් කඩා, වවා තිබුණු ගස් කොළන් ටිකත් කපා ඔවුන් ඒ ඉඩමෙන් පැන්නුවා. ඔහොම තිබෙන විට අර ගම් සභා නියෝජිතයා කළේ කුමක්ද? උන් නැහේ කියා නඩු දමා අර දුප්පත් මිනිසුන් දෙදෙනා පන්නා දැමුවාට පසුව ඔහු නැහෙ හෙමිහිට ඒ ඉඩමේ තේ වවන්නට පටන් ගත්තා. ඒ හිටපු ගම් සභා නියෝජිත මහත්මයා අද මේ ඉඩමේ තේ වවා තිබෙනවා. පසුව ගමේ තිබෙන සමිති සමාගම්, "අපට ඕනෑ මේ ඉඩම, ඇයි මේ ඉඩමෙ තේ වවන්නට ඉඩ දෙන්නෙ" කියා ප්‍රශ්න කර ලියුම් යැව්වා. එතකොට මේ හිටපු ගම්සභා නියෝජිත මහත්මයා, "මම මේ ඉඩමෙ කාලයක සිටම තේ වවනවා"ය කීව. දිසාපතිතුමා මේ ඉඩම බලන්නට ආවා. දිසාපතිතුමා එන බව දැනගත් විට ඔහු කළේ කුමක්ද? එක රැයකින් එම ඉඩමේ ගෙයක් සෑදුවා. ගෙය සම්පූර්ණයෙන්ම සෙවිළි කර ජනෙල් තබා ඒවාට ජනෙල් රෙදි, දොර රෙදි පවා දමා තිබුණා. ඒ ආකාරයට ඔහු එක රැයකින් ගෙයක් සාදා, මේ ඉඩමේ ගෙයකුත් සාදා තිබෙනවාය කියා දිසාපතිතුමාට කරුණු මවා පෙන්නුවා. නමුත් දිසාපතිතුමා ඒවාට රැවටුණේ නැහැ. දිසාපතිතුමා දැනගන්නට ඇති ඒක පෙර දින රාත්‍රියේ සෑදු ගෙයක් බව. ඒ කෙසේ හෝ වේවා මෙවැනි ප්‍රෝඩාවල් නිසා පොදු ජනතාවට අවශ්‍ය ඉඩකඩම් නැතිව යනවා. එවැනි අවස්ථාවලදී පාටක් ගැන නොබලා මේ රටේ මහජනතාව වෙනුවෙන් සර්ව සාධාරණ ලෙස ක්‍රියා කිරීම අවශ්‍යයි.

තවත් කාරණයක් තිබෙනවා. 1960 ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබෙන කාලයේදීත් ගරු ඇමතිතුමා නිතරම කියන දෙයක් තමයි මිනින්දෝරුවන් හිඟය යන්න. මිනින්දෝරුවන් හිඟය, වහ වහා මිනින්දෝරුවන් පුහුණු කරනවාය, කියා එතුමා ඒ කාලයේ සිටම කියනවා. නමුත් අදත් එතුමා කියන්නේ ඒ කථාවමයි. මේ රටට අවශ්‍ය පමණ මිනින්දෝරුවන් ඇති කරන්නේ කවදාද? ගම්වල සාමාන්‍ය මිනිසුන්ගේ ඉඩම් ආරාවුල් බේරන්නට ඒ කටයුතු කරන්නේ කවදාද? ඇත්ත වශයෙන්ම මේ කටයුතු කර අවසානයක් කරන්නට තව කොපමණ කාලයක් යයිද? මේ ඉඩම් ඇමතිතුමා ඒ කාරණය පිළිබඳව ස්ථිර පියවරක් ගනියිද? මේ ඇමතිතුමා සිටින තෙක් ඒ පිළිබඳව සම්පූර්ණ ක්‍රියා පිළිවෙළක් ගනියිද? ඒ ප්‍රශ්නවලට අපට පිළිතුරු සපයන්නට බැහැ. අවසාන වශයෙන් මේ ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව වහාම ක්‍රියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ඒ සමග ගම කෘෂිකර්ම කම්ටුවලට සම්පූර්ණ බලතල දී මේ රටේ ඉඩම් බෙදන්නට යෑම සම්පූර්ණයෙන්ම අන්තරායදායක බව මා නැවතත් මතක් කරනවා. මේ රටේ මහ ජනතාවගේ, සාමාන්‍ය දුප්පත් ගැමි ජනතාවගේ අනාගතය පිළිබඳව යම්කිසි ස්ථිර තත්ත්වයක් ඇති වන පිළිවෙළට මේ පනත් කෙටුම්පත සංශෝධනය කළ යුතුයි

හිනිදුම ගරු මන්ත්‍රීතුමා සිටින නිසා මා තවත් එක් කාරණයක් ගැන මතක් කරන්නට ඕනෑ. සෑම මිනිසකුටම ඉඩමක් හා ගෙයක් ලබා දෙනවාය කියා තමුන්නාන්සේ පොරොන්දුවක් දී තිබෙනවා. ඇමතිතුමාට කියා ඒ පොරොන්දුව ඉෂ්ට කරන මෙන් මා ඉල්ලා සිටිනවා. අප කිව්වාට ඇමතිතුමා කිසිම දෙයක් නොකරන නිසා අපට ඒ පොරොන්දුව ඉෂ්ට කරන්නට විධියක් නැහැ. එමනිසා තමුන්නාන්සේවත් කියා ඒ පොරොන්දුව ඉෂ්ට කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ඇමතිතුමාගේ ක්‍රියා පිළිවෙල නිසා, ඇමතිතුමාට තම අමාත්‍යාංශය හසුරුවා ගන්නට බැරි නිසා, මේ රටේ ඉඩම් ප්‍රතිපත්තිය අවුලෙන් අවුලට යන බව මා අවසාන වශයෙන් ප්‍රකාශ කරනවා.

අ. භා. 3.57

**එම්. එස්. අමරසිරි මයා.** (හිනිදුම)
*(திரு. எம். எஸ். அமரசிறி—ஹினிதும)*
(Mr. M. S. Amarasiri—Hiniduma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් උදෑසන සිටම ගරු ඉඩම් ඇමතිතුමා පෞද්ගලිකවත්, පොදුවේ මුළු අමාත්‍යාංශයත් විවේචනය කළා. නමුත් පසුගිය කාලය ඇතුළත මේ රටේ ඇතිවූ ඉඩම් ආරාවුල්වලට මූලික වශයෙන් හේතුවූ කරුණු මොනවාද කියා බලන විට ඇත්ත වශයෙන්ම ඉඩම් සංවර්ධන ආඥාපනතට යම් සංශෝධනයක් අවශ්‍ය වී තිබෙන බව පෙනී යනවා. මේ ඉඩම් සංවර්ධන සංශෝධන පනත ඉදිරිපත් කිරීමට හේතුවත් එයම බව මා කියන්න කැමතියි.

මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් රාජපක්ෂ මයා.) බොහෝම නරක විධියට ගරු ඉඩම් ඇමතිතුමා විවේචනය කළත් ඒ මන්ත්‍රීතුමාගේ විවේචනය පෞද්ගලික වේදනාවකින් කළ එකක් බව අපට පෙනී ගියා. ඉඩම් ඇමතිතුමා ඒ පැත්තේ වැඩ කළ කාලයේදී ඒ ගරු මන්ත්‍රීවරුන් මෙවැනි කරුණු සම්බන්ධ නිශ්ශබ්දව සිටියේ මන්දැයි මා අහන්නට කැමතියි.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

අප නිශ්ශබ්දව සිටියේ නැහැ. එදාත් විවේචනය කළා.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)

ඇමතිතුමා ඒ පැත්තේ වැඩ කරන විට හොඳයි; මේ පැත්තට ආවහම පමණක් නරකයි.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

නෑ; නෑ; එදාත් අප හොඳක් කීව්වේ නැහැ.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් සමග අපට එකඟ වන්නට බැරි කරුණ එයයි. පසුගිය දීර්ඝ කාලය තුළ ඉඩම් සංවර්ධන ආඥාපණත සංශෝධනය කළ යුතු අවස්ථා කීපයක්ම එළඹුණා. 1955 අවුරුද්දේදී ඉඩම් කොමිසමක් පත් කරන්නට යෙදුණේත් එකී සංශෝධනයේ අවශ්‍යතාව රටට පෙනී ගිය නිසායි. 1958 දී එම කොමිසමේ වාර්තාව පිට වුණාට පසු ඉඩම් සංවර්ධන ආඥා පණතට සංශෝධන පණතක් මෙම සභාවට ඉදිරිපත් වුණු පළමුවන අවස්ථාව මෙයයි. එම පණත සංශෝධනය කිරීමට තමන් බලයේ සිටි කාලයේ දී උනන්දු නොවුණේ මන්දැයි අප පසුගිය රජයේ සිටි අයගෙන් අහනවා. 1970 දී මැතිවරණයක් එන නිසා මැතිවරණ ගුණ්ඩුවක් වශයෙන් මේ සංශෝධන පණත ඉදිරිපත් කර තිබෙනවායයි විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් දූන් අපට චෝදනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරනවා. මැතිවරණයක් ආවත් නැතත් අපගේ කටයුතු නියමාකාරයෙන් කර ගෙන යන බව මා ඒ මන්ත්‍රීවරුන්ට කියන්නට කැමතියි.

මෙවැනි පණතක් ඉදිරිපත් කළ යුතුව තිබුණේ මීට අවුරුදු 10 කට පමණ කලිනුයි. යම් යම් හේතුන් නිසා එය අතපසු වීමෙන් අද මේ රටේ ලක්ෂ 6 කට අධික ගැමි ජනතාවට විශාල කරදරවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ඉඩම් ආරාවුල්, තඩු හබ හා දඩගැසීම් ආදී වූ නොයෙක් ප්‍රශ්නවලට මුහුණ පාන්නට ඔවුන්ට සිදු වී තිබෙන්නේ නිසි අවස්ථාවේදී ඉඩම් සංවර්ධන ආඥා පණත සංශෝධනය නොකිරීම නිසායි. දැන් ඒ අවශ්‍ය කටයුත්ත සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ පණත මුළු රටේම ඉතාම ජනප්‍රිය පණතක් බවට පත් වනවාට කිසිම සැකයක් නැහැ. ඒවාගේම මෙය, රටේ සංවර්ධනය කෙරෙහිද විශේෂයෙන් බලපාන පණතක් වනවා නොඅනුමානයි.

1935 දී ඇති කරන ලද ඉඩම් සංවර්ධන ආඥා පණතෙනුත්, 1947 දී ඇති කරන ලද රජයේ ඉඩම් ආඥා පණතෙනුත් අදහස් කෙරුණේ ඉඩම් නැති සෑම ගැමියකුටම ඉඩම් අක්කරය, දෙක, පහ, දහය බැගින් බෙදා දී ක්‍රමානුකූල සංවර්ධන සැලැස්මක් යටතේ, නියම ආර්ථික රටාවක් අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා වෙනත් දෙපාර්තමේන්තුවලත් සහාය ඇතිව එම ඉඩම් සංවර්ධනය කොට ඒවායින් ගැමියන්ට ආදායම් ලබා ගත හැකි මාර්ග යෙදීමයි. එහෙත් යම් යම් හේතුන් නිසා බොහෝ විට ඉඩම් ආරාවුල් හා බදු ඉඩම් දීමේදී නොයෙකුත් වැරදි සිදුවී තිබෙන බව අපට පෙනෙනවා. කලින් කලට යම් යම් ආණ්ඩු බලයට පත් වුණත් මෙකී අඩුපාඩුකම් හා දුර්වලකම් මඟහරවා ගත හැකි වන අන්දමට ඉඩම් සංවර්ධන ආඥා පණත සංශෝධනය කිරීමට ඒ ආණ්ඩු කටයුතු කෙළේ නැහැ. රාජාසන කථාද කීපයකම මේ ප්‍රශ්නය පිළිබඳව කරුණු සඳහන් වුණත් ඉඩම් අමාත්‍යාංශයෙන් මේ සඳහා අවශ්‍ය සංශෝධන පණත් මේ වනතෙක් ඉදිරිපත් වුණේ නැහැ.

මේ සම්බන්ධව පසුගිය රජය විසින් කරන ලද යම් යම් කටයුතු මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. බදු ඉඩමක ගෙයක් සාදා ගැනීමට රජයෙන් දෙනු ලබන ආධාර මුදල පසුගිය රජය විසින් රුපියල් දාහ දක්වා වැඩි කළායයි විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කිව්වා. එසේ රුපියල් 1,000 කෙළේ 1963 වර්ෂයේදීයි. එවකට රු. 800 ක් වශයෙන් ගෙවන ලද මුදල රුපියල් 1,000 කෙළේ පසු ගිය රජයේ කැබිනට් තීරණයක් අනුවයි. එදා එවැනි තත්ත්වයකින් කටයුතු කර අද ඒවායේ වැරදි සහ අඩුපාඩුකම් අපටයි කියන්නෙ. ඒ කාලයේ දුප්පත් ගැමියාට බදු ඉඩමක් සාදා ගැනීමට අවුරුදු දෙකයි කල් දුන්නේ. අද එය තවත් අවුරුද්දකින් දීර්ඝ කර අවුරුදු 3 ක් කල් දී තිබෙනවා. ඒකත් වැරදිය කියනවා. අප දැන් මේ විධියට කටයුතු කරන විට තමුන්නාන්සේලා වැරදියි කියනවා. එහෙත් තමුන්නාන්සේලා බලයේ සිටින කාලයේ ඇයි ඒ කටයුතු නොකළේ ?

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
ඇමතිවරයා කරන්නෙ නැත කියන එකයි අපි කියන්නෙ.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)
ඇයි තමුන්නාන්සේලා ඒ ආණ්ඩුවේ හිටියෙ ?

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
(මීගමුව)
*(திரு. என். டென்சில் பெர்னாண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)
අස් කෙළේ නැත්තෙ ඇයි ?

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
අස් කරන්න කියා තමයි අපි කියන්නෙ. ඔබ නොකරන හින්දා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)
ඒ කාලෙ තමුන්නාන්සේලාට හොඳයි, අද හොඳ නැහැ.

අනික් අතින් නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම්වල ස්ථිර වගාවක් කිරීමේ අවස්ථාව ගොවි ජනතාවට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනුයි. ඊට හේතුව නිතරම ඉඩම් ආරාවුල් ඇති වීමයි. හරි හැටි මායිම් සකස් කිරීමක් නැති නිසාත්, නිලධාරීන්ගේ අකාර්යක්ෂමතා සහ ඔවුන්ගෙන් සිදු වන අවහිර නිසාත් ගොවියන්ට නොයෙක් විධියේ අසහනයන්ට මුහුණ පාන්නට සිදු වෙනවා. ඒවා යථා පරිදි සකස් කිරීම පිණිස යම් කිසි සංශෝධන පනතක් ඉදිරිපත් නොකර සිට, අද මේ ආණ්ඩුව විසින් ඒවා ඉදිරිපත් කරන විට ආණ්ඩුවට දොස් කීම හරිද?

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
අපි ආණ්ඩුවට දොස් කියන්නෙ නැහැ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)
ඇයි නැත්තෙ, දොස් කිව්වා.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)
තමුන්නාන්සේලාගේ වලපනේ මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) දොස් කිව්වා. එහෙත් මා තමුන්නාන්සේලාට කියන්න කැමතියි, ඉඩම් ඇමතිතුමාගේ දූරදර්ශී ක්‍රියාමාර්ගය නිසා අද රටේ ඇති වේගන යන සංවර්ධන ව්‍යාපාර හේතු කොටගෙන විශාල පිරිසකට රක්ෂා සැපයෙන අතර ජාතික ධනය විශාල වශයෙන් ඉතුරු වී එය රටේ දියුණුවට ඉවහල් වන බව.

ඉඩම් අත්පත් කර ගැනීම ගැන සඳහන් කළ බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපි වතුකාරයන්ගේ ඉඩම් ගන්නෙ නැත කියා. එතුමා පෙනී සිටින්නේ මගේ ආසනයට අල්ලපු ආසනය වන බෙන්තර-ඇල්පිටිය ආසනය වෙනුවෙනුයි. මා එතුමාට කියන්න කැමතියි, නාකියදෙනිය වත්තෙන් අක්කර 200ක් අරගෙන දැන් ළඟදී ඉඩම් කච්චේරියක් පවත්වන්නට සූදානම් කර ඇති බව. ඒ වාගේම බෝමොදල වත්තෙන් අක්කර 100ක් අරගෙන ගම්මුන්ට බෙදා දෙන්නට යනවා. තව දුරටත් නාගොඩ වත්තෙන් අක්කර 50ක් අරගෙන බෙදා දෙන්නට යනවා. ඒවා වතුකාරයන්ගේ ඉඩම් නොවෙයිද? ඒ වාගේම ඒ මන්ත්‍රීතුමාගේ නිවස ළඟ පිහිටි තල්ගස්වල වත්තෙන් අක්කර 50ක් අරගෙන බෙදන්න යනවා. එසේ නම් ඉඩම් ඇමතිතුමා ප්‍රගතිශීලීව කටයුතු කරන්නේ නැද්ද කියා මා තමුන්නාන්සේලාගෙන් අහන්න කැමතියි. වතුකාරයන්ට පක්ෂව ක්‍රියා කරනවාය කියන කථාව සම්පූර්ණයෙන් බොරු කිරීමට අපට ඕනෑ තරම් උදාහරණ පෙන්වන්න පුළුවනි.

එපමණක්ද නොව, නියෝජ්‍ය කථානායකතුමනි, හිනිදුම ආසනයේ මනෝමනී නමැති වත්තෙන් අක්කර 48ක් ගැනීමේ කාර්යය සම්බන්ධයෙන් සුප්‍රීම් උසාවියේ පෙනී සිටින ලෙස ඉඩම් ඇමතිතුමාට සුප්‍රීම් උසාවියෙන් ආඥාවක් පවා එවා තිබෙන බව මා ඒ මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම සඳහා මතක් කරන්න කැමතියි. එම නිසා තමුනනාන්සේලාට පැහැදිලිවම පෙනී යනවා ඇති, දුප්පත් ගැමි ජනතාවට සහනයක් සැලැස්වීම සඳහා ඉතාමත් වේදනාවකින් ඉඩම් ඇමතිතුමා ක්‍රියා කරගෙන යන බව. එවැනි ක්‍රියා මාර්ගයක් ගෙන යන ඉඩම් අමතිතුමා තමුන්නාන්සේලා ඉතාම නරක ලෙස විවේචනය කළා. එතුමා තමුන්නාන්සේලා සමග සිටි කාලයේ තමුන්නාන්සේලාට එතුමා ප්‍රගතිශීලි ඇමතිවරයෙක්.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
කවුද කිව්වෙ?

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)
තමුන්නාන්සේලා ඕනෑ හැටියෙ ඒ දවස්වල රුස්වීම්වලදී කිව්වා. අපට නොයෙක් වර අසන්න ලැබුණා. එහෙත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]

අද මේ පැත්තට ආවාට පසු එතුමා ඉතා මත් ප්‍රතිගාමී ඇමතිතුමා වී තිබෙනවා. එසේ වී ඇත්තේ පක්ෂය මාරු වීම නිසයි. තමුන්නාන්සේලාගේ කාලයේදී එසේ කිව්වා නම්, එදා අවුරුදු 10ක් තිස්සේ කරන්නට බැරි වුණු වැඩ මේ අවුරුදු තුනක් ඇතුළත අපි කෙළේ නැත කියා අපට දොස් කියන්නේ ඇයි ? අවුරුදු 35ක කාලයක් තිස්සේ ගෙනෙන්නට බැරි වූ පනතක් අද මේ ආණ්ඩුව විසින් මේ අවස්ථාවේදී ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ බදු ඉඩම් ලබා සිටින හය ලක්ෂයක් පමණ වූ ගැමි ජනතාවට සහනයක් සැලැස්වීම සඳහා ඉදිරිපත් කර ඇති මෙම පනතට, ගැමි ජනතාව වෙනුවෙන් පෙනී සිටින තමුන්නාන්සේලා—විශෙෂයෙන් බෙන්තර-ඇල්පිටියෙ මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රීතුමන්ලා—සර්වප්‍රකාරයෙන්ම පක්ෂව ඡන්දය දිය යුතු බව මා මතක් කරන්න කැමතියි.

එපමණක් නොවෙයි, 1955 දී පත් කරන ලද ඉඩම් කොමිෂන් සභාව විසින් 1958දී ස්වකීය වාර්තාව ඉදිරිපත් කරන්නට යෙදුණු බව තමුන්නාන්සේලා දන්නවා ඇති. මේ රටේ ඉඩම් සංවර්ධනය කර, ගැමි ජනතාව අතර ආර්ථික රටාවක් ඇති කර, ඔවුන් නියම මධ්‍යම පාංතික ගැමියන් බවට පත් කිරීමට හැකි වන වැදගත් නිර්දේශ රාශියක් එම කොමිෂන් සභා වාර්තාවෙන් ඉදිරිපත් කරන්න යෙදුණා. ඒ එක නිර්දේශයක්වත් ක්‍රියාත්මක කිරීමට එවකට කටයුතු කළේ නැහැ. එහෙත් 1964 සභාග ආණ්ඩුවේ රාජාසන කථාවේ, ඒ කටයුත්ත කරන බව පැහැදිලි ලෙසම සඳහන් කර තිබුණා. එවකට සිටි මුදල් ඇමතිතුමා ඒ සඳහා වියදම් කිරීමට අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කළා. අප කළේ නැත කියා දැන් තමුන්නාන්සේලා කියනවා. තමුන්නාන්සේලාගේ කාලයේදී අවුරුදු 10ක් තිස්සේ තමුන්නාන්සේලා මොනවාද කළේ ? රටේ ඉඩම් ආරවුල් වැඩි කර, ගම්බද ජනතාව අතර භේද වැඩි කර අසහනය ඇති කර රටේ ජනතාව අන්තිම දුගී තත්ත්වයට හෙළීමට කටයුතු කර තිබෙන නිසයි, අද මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ, මේ පනත අවුරුදු 10 කට පෙර ගෙනාවා නම් අද සෑම ගමකම ඉඩම් ආරවුල් නැතිව, නිරවුල් ඉඩම් කට්ටි ඇතිව ජීවත් වන ජනතාවක් දකින්නට ලැබෙනවා.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
අප කියන්නෙත් ඒකයි.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)
ඇයි කළේ නැත්තෙ ? අප කරන්නයි, යන්නේ. ඒ නිසා මේ සංශෝධන පනත මේ රටේ ඇති කළ කුඹුරු පනත වගේම ජනප්‍රිය පනතක් වන බව මට නිසැකවම කියන්නට පුළුවනි. මේ කටයුතුවලදී අපි ගරු ඇමතිතුමාට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. එතුමාගේ කටයුතු සම්බන්ධව කොතරම් විවේචන ඇති කළත් ස්ථිර සංවර්ධන සැලැස්මක් ඇතිව එතුමා වැඩ කරගෙන යන නිසා පසුපස ආසනවල සිටින මන්ත්‍රීවරුන් වශයෙන් අප එතුමාට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා.

බෙන්තර-ඇල්පිටියේ මන්ත්‍රීතුමා කියන විධියට මේ සංශෝධන පනත අනුව ඉඩම් අක්කරයක් දී ඊට පසු එය අවලංගු කරන්නට පුළුවන්කමක් නැහැ. ස්ථිර බලපත්‍රයක් හෙවත් ප්‍රදානයක් ලැබීමෙන් ඒ කට්ටිකරුවාට ස්ථිර අයිතිවාසිකමක් ලැබෙනවා. ඒ කට්ටිකරුවාට අක්කර 2 ක ඉඩමක් ලැබෙනවා නම් තමන්ගේ පවුලේ හැඩගැස්ම අනුව—තමන්ගේ ආර්ථික තත්ත්වය අනුව—අක්කරයක තේ හෝ රබර් හෝ කෝපි හෝ කුරුඳු හෝ වවා අනික් අක්කරයෙන් භාගයක් ගෙවත්ත හැටියට තබාගෙන අනික් අක්කර භාගයේ ගෙයක් සාදා ගැනීම සඳහා ක්‍රමානුකූල සැලැස්මක් යොදා ගැනීමට පුළුවන් වෙනවා. අද තත්ත්වය කුමක්ද ? කෙනකුට ඉඩම් අක්කරයක් හෝ 2ක් සඳහා බලපත්‍රයක් ලැබුනත් සමහරවිට ඔහු නොදැනුවත්වම වෙනත් කෙනකුට ඒ ඉඩම ගිහින්. ජනතාව ඒ අසහනයෙන් මුදා ගැනීම සඳහා මේ සංශෝධන පනතෙන් විශාල ප්‍රයෝජනයක් ලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙවල් සෑදීම සඳහා දෙන කාලය අවුරුදු 3 දක්වා දික් කිරීම නිසා අද ගම්බද ජනතාවට විශාල සහනයක් සැලසී තිබෙනවා. යම් යම් හේතූන් උඩ දුප්පත් ගැමි ජනතාවට ඒ අවුරුදු තුනේ කාලයත් මදි වන අවස්ථා තිබෙනවා. අසනීප හෝ වෙනත් වැදගත් හේතූන් උඩ ගෙවල් සාදා ගැනීමට ප්‍රමාද වන අයට ඒ ගෙවල් සාදා ගැනීම සඳහා තවත් අවුරුද්දක් හෝ දෙකක් දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

පසුගිය කාලය තුළ දෙලක්ෂයකට කිට්ටු සංඛ්‍යාවක් නොයෙක් නොයෙක් පළාත්වලින් ගිහින් රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටියා. ඒ අය ස්ථිර වගාවන් දමා ගෙවල් සාදාගෙන ඒ ඉඩම්වල පදිංචි වී සිටි නිසා ඔවුන් එළවා ගන්නට බැරිව තිබුණා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා 1967 වර්ෂයේදී ඉඩම් අක්කර ලක්ෂයකට කිට්ටු ප්‍රමාණයක් ස්ථිර බලපත්‍ර ඇතිව ඒ අයට දී තිබෙනවා. මෙම පනතින් එවැනි අයට තමන්ගේ ඉඩම් සශ්‍රීක කර ගෙන යම් කිසි කාලසීමාවක් ඇතුළතදී එම ඉඩම් තමන්ටම අයිති කර ගැනීමට පුළුවන් වෙනවා. ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිය ස්ථිර කර ගැනීමට අවස්ථාවක් ලැබෙනවා. අද තිබෙන බදු ඉඩම් ආඥා පනත අනුව අක්කරයට රුපියල් 1ක් හෝ 2ක් වශයෙන්ද, එහෙම නැත්නම් රුපියල් 5ක්, 10ක් වශයෙන්ද, සමහර අවස්ථාවලදී රුපියල් 12ක් පමණද ගෙවීමට සිදු වෙනවා. එම බද්ද කවදා ඉවර වෙනවාද කියා දන්නෙත් නැහැ. අවුරුදු පතාම බදු ගෙවනවා. යම්කිසි විධියකින් බදු ගෙවීමට බැරි වුණොත් එසේ බදු නොගෙවීමේ හේතුව නිසාම ඔහුගේ බලපත්‍රය අවලංගු කිරීමට දිසාපතිතුමාට බලය තිබෙනවා. ඔන්න ඔය වගේ කරුණු නිසා අද බදු ඉඩම් හිමියන් අතරේ විශාල අසහනයක් පවතිනවා. මේ සම්බන්ධයෙන් ස්ථිර වැඩපිළිවෙළක් නොමැති කම නිසා ඒ අය අතරේ විශාල අසහනයක් පවතිනවා.

ඉස්සර කාලයේදී දී තිබෙන ඉඩම්වලට අද වන තෙක්ම—සමහර විට අවුරුදු 30ක් 40ක් පමණ ගත වී තිබෙන ඔප්පුවලට—තවමත් බදු ගෙවනවා. මේ ඉඩම්වල බදු මුදල ගණන් බලා තිබෙන්නේ ඒ ගම්වල තිබෙන මුඩු ඉඩම්වල අක්කරයක වටිනාකම අනුවයි. සමහර අවස්ථාවල යම් යම් ග්‍රාමසේවක මහත්වරුන්ගේ නොදැනුවත්කම නිසා හෝ සමහර විට ඔවුන්ගේ වුවමනාවෙන්ම හෝ එම ඉඩම්වල තක්සේරු මිල වැඩියෙන් දැමීම නිසා බද්ද වැඩි වීමට හේතු වෙනවා. මෙය ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන විය යුතු කාරණයක්. මෙය හැම පළාතකම වාගේ සිදු වෙන දෙයක්. කලින් කථා කළ වලපනේ මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) කිව්වා වාගේ එක් තරා සැලැස්මක් අනුව ඒ බදු අය කිරීම කළ යුතුයි. ආදායම් පාලක කොට්ඨාශ අනුව හෝ ගම් අනුව හෝ මිල තක්සේරු කර ඒ අනුව බද්ද අය කිරීමට කටයුතු කළ යුතුයි. එහෙම නැතිව එක ගමක බදු ඉඩම් කට්ටියකින් රුපියල් 5 බැගිනුත්, අල්ලපු ගමේ එම කැලයටම අයත් ඉඩමෙන් රුපියල් 12 බැගිනුත් අය කිරීමේ කිසිම සාධාරණත්වයක් ඇත්තේ නැහැ. මේ කටයුතු ගැන සමහර විට ඉඩම් ඇමතිතුමා හෝ ඉඩම් කොමසාරිස්තුමා නොදන්නවා ඇති. ග්‍රාමසේවක මහත්වරුන්ගේ සහ දිසාපති කාර්යාලවල වැඩ කරන සමහර නිලධාරීන්ගේ අඩුපාඩුකම් නිසා මෙවැනි දේවල් සිදු වෙනවා විය හැකියි. ඒ තත්ත්වය ඉතා මත් ඉක්මනින්ම බේරුම් කර දීමට කටයුතු කළ යුතුයි.

ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධන පනත අනුව ඉඩම් කට්ටිකරුවන්ට ඉඩම්වල අයිතිය පැවරෙනවා. ඒ මගින් ඔවුන්ට පහසුකම් රාශියක් ඇති වීමට ඉඩ තිබෙනවා. අද සාමාන්‍ය ගැමියෙකුට ප්‍රවේනි ඉඩම් තිබෙනවා නම් ඒවාට නොයෙක් විධියේ අයිතිකාරයන් සිටිනවා. සමහර විට සමහරුන්ට ලක්ෂයකින් පංගුවක් පමණ අයිති වෙන අවස්ථා තිබෙනවා. ඒ නිසා ඔවුන්ට යම්කිසි අවස්ථාවකදී ඇප ඔප්පුවක් වශයෙන් තැබීමට වත් ඒ ඉඩම් ප්‍රයෝජනවත් වන්නේ නැහැ. නමුත් මේ සංශෝධන පනත අනුව යම් කෙනෙකුට බදු ඉඩමක් අයිති වූ විට ඉදිරි කාලයේදී ඔවුන්ට විශාල සහනයක් සැලසෙනවා. ඇප ඔප්පුවක් හැටියට තැබීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]

එය ප්‍රයෝජනවත් වෙනවා. ඒ වගේම ඉඩම සශ්‍රීක කිරීමේදී හෝ වෙන යම් අවස්ථාවකදී කට්ටිකරුවන්ට ණය මුදලක් ගැනීමට අවශ්‍ය වුවහොත් ඔහුට එයටත් අවස්ථාව සැලසෙනවා. රජයෙන් දෙන ආධාර මුදල ප්‍රමාණවත් නොවීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ ඔහුට ණය මුදලක් ලබා ගැනීමට අවශ්‍ය වුවහොත් බදු ඉඩම වගා කර සශ්‍රීක වූ විට එය උගසට තබා ණය මුදලක් ලබා ගත හැකි වෙනවා. එය බැංකුවකට හෝ සමුපකාර සමිතියකට උකස්කරයක් වශයෙන් තබා මුදලක් ලබා ගත හැකි වෙනවා. මා දන්නවා අද සමහර ගැමියන් කෘෂිකර්ම කටයුතුවලින් පසුව වෙනත් කර්මාන්තයක් පටන් ගැනීමට පුරුදු වී සිටින බව. ඊට හේතුව අක්කරයක හෝ දෙකක ඉඩමක් වගා කිරීමෙන් පසුව ඔවුන්ට ඊටපසුව කළ යුතු දෙයක් නැතිව යාමයි. එවිට ඔවුන්ට වෙළ හෙළඳාම් කිරීමට හෝ කුඩා කර්මාන්තයක් පටන් ගැනීමට අවශ්‍ය වෙනවා. එවැනි දෙයක් සඳහා මුදලක් අවශ්‍ය වූ විට මෙම ඉඩම උගසට තබා මුදලක් ලබා ගන්න පුළුවනි. සමුපකාර සමිතියට හෝ ග්‍රාමීය බැංකුවකට මෙය උකසක් වශයෙන් තබා ඔවුන්ට මුදලක් ලබා ගැනීමට පුළුවන් වෙනවා.

ඊළඟට තවත් වාසියක් ඇති වෙනවා. මෙතෙක් තිබුණ ක්‍රමය අනුව මේ ඉඩම්වලට අවුරුදු පතා බදු ගෙවනවා. එහි කාල සීමාවක් ඇත්තේ නැහැ. සමහර විට බදු ඉඩම හිමි පුද්ගලයා මැරුණාට පසුව ඔහුගේ දරුවන්ට පවා එහි බදු මුදල ගෙවීමට සිදු වෙනවා. ඒ තත්ත්වය නැති කිරීමට අළුත් සංශෝධන පනතින් හැකි වෙනවා. යම් කිසිවෙකුට දෙන බදු ඉඩමේ වටිනාකම නියම අන්දමට තක්සේරු කර ආණ්ඩුවෙන් දෙන ආධාර මුදල් ආදිය ගැනත් සලකා බදු මුදල කොටස් වශයෙන් ගෙවීමට අවස්ථාව ලබා දීමෙන් බදු ඉඩම් හිමියාට ලොකු සහනයක් ලැබෙනවා. නියමිත කොටස් මුදල ගෙවා අවසාන වීමෙන් පසු එම ඉඩම ඔහුටම අයිති ඉඩමක් බවට පත් වෙනවා. අද ලංකාවේ තිබෙන ඉඩම් කට්ටි 8,000 කට පමණ මායිම් ගල් යොදා නැහැ. ඒ හැම එකකටම මායිම් ගල් දමා වෙන් කිරීමෙන් පසුවයි, මේ විධියට කටයුතු කරන්නට පුළුවන් වන්නේ. එසේ නැත්නම් තව තවත් ආරාවුල් ඇති වීමෙන් මේ සංශෝධන පනතින් ප්‍රයෝජනයක් නොවී යන්නට පුළුවනි.

ඉඩම් වගා කිරීමේදී ගැමියාට රජයෙන් දෙන ආධාර මුදල් නිසියාකාර අන්දමින් ලැබෙන්නේ නැහැ. බෙන්තර-ඇල්පිටියේ ගරු මන්ත්‍රීතුමා (එච්. ජී. ඒ. කාරියවසම් මයා.) කීවාක් මෙන් ඉඩම් කට්ටි ඕවර්සියර් මහතුන්ගෙන් ලැබෙන්නේ උපදෙස්වලට වඩා හිරිහැරයි. ඕවර්සියර් මහතුන්ගේ යුතුකම වන්නේ ඉඩම් කට්ටිවලට ගොස් වගා කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ඒ කට්ටිකරුවන්ට දීමයි. ඒ කට්ටිකරුවන්ගේ ගෙවල් සෑදීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වරින් වර යම් යම් රපෝර්තු ඉදිරිපත් කිරීමත් ඒ අයගේ කටයුත්තක්. එහෙත් ගෙවල් සාදන විට අත්තිවාරම් දමන අවස්ථාවේදී ඒවා පරීක්ෂා කිරීමෙන් පසුව නැවත ඒවා ගැන සොයා බලන්නේ ඒවා සාදා ඉවර වුණාට පසුවයි. ගෙවල් සඳහා දෙන ආධාර මුදල් සම්බන්ධයෙන්ද ඒ අයගෙන් අකටයුතුකම් කෙරෙන බව දැන ගන්නට තිබෙනවා. මේ වැරදි වැඩ නතර කිරීමට ගරු ඉඩම් ඇමතිතුමා ඉතා ඕනෑකමින් ක්‍රියා කරනැයි මා බලාපොරොත්තු වෙනවා.

මෙම සංශෝධන පනත නිසා ගොවි ජනතාවට විශාල සෙතක් සිදු වන බව නිසැකයි. අසහනයෙන් සිටින ගොවි ජනතාවට මේ පනතින් විශාල සෙතක් සිදු වෙනවා ඇති. ගරු ඉඩම් ඇමතිතුමා අනුගමනය කරගෙන යන යහපත් ක්‍රියා මාර්ගය අප අනුමත කරනවා. ඉඩම් කට්ටිකරුවන් වශයෙන් ලාංකිකයන්ම තෝරා ගැනීමට ක්‍රියා කිරීම ඉතාමත්ම වැදගත් කාරණයක් බව කාටත් පෙනී යා යුතුයි. මේ පනතින් ඒ සඳහා ඉඩකඩ සලසා තිබෙනවා. දැනට බල පවත්වන ඉඩම් ආඥාපනත අනුව නම් ලාංකිකයන් නොවන අයටත් ඉඩම් කට්ටි ලබා ගැනීමට පුළුවන් වුවත් මෙම පනතින් එය ලාංකිකයන්ට පමණක් සීමා කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා මීට වඩා කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. මෙම පනතෙන් හය ලක්ෂයකට අධික බදු ඉඩම් හිමි ගොවි ජනතාවට සැලසෙන සහනය නිසා ඔවුන්ට අනාගතයේදී ආර්ථික ප්‍රශ්න විසදාගෙන ක්‍රමවත් පරිදි ජීවිතය ගොඩ නඟා ගැනීමට අවස්ථාවක් ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 4.22

**ලීලාරත්න විජේසිංහ මයා.** (පොළොන්නරුව)

*(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)*

(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ඉඩම් බදු ගෙවන ජානපදිකයකු හැටියට, එසේ නැත්නම් අසනයට පත් වී සිටින කෙනකු හැටියට මාත් වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මුලින්ම හිනිදුම ගරු මන්ත්‍රීතුමාට වචන යක් කියන්නට ඕනෑ. ගෙයක් සාදා ගැනීම සඳහා රුපියල් 1,000 ක් දුන්නේ පසුගිය ආණ්ඩුව බවයි, එතුමා කීවේ. ඒ පිළිබඳව තීරණයක් ගත්තේ පසුගිය ආණ්ඩුව බව ඇත්තයි. එහෙත් ගෙවල් සෑදීමට අවශ්‍ය බඩුබාහිරාදිය අද එදාට වඩා හුඟක් මිළයි. රුපියලේ අගය අඩු කිරීම නිසා එදා දුන් රුපියල් 1,000 වටිනා කමෙන් රුපියල් 200 ක් අඩු වූ රුපියල් 1,000කැයි, අද ලැබෙන්නේ. එදා සිමෙන්ති කොට්ටයක් රුපියල් දහයයි, නැත්නම් දොළහයි. එහෙත් අද රුපියල් පහළොව කට, දාසයකටවත් සිමෙන්ති කොට්ටයක් ගන්නට බෑ. මේ තත්ත්වය යටතේ රුපියල් 1,000 කින් ගෙයක් සාදා ගැනීමට හිතන්නටවත් බෑ. ඒ සඳහා රුපියල් 2,000 ක් වත් දෙන්නට ඕනෑ.

අපි අවුරුදු 10 ක් තිස්සේ ආණ්ඩු බලයේ සිටිද්දී කළේ මොනවාදැයි අහනවා. අපි අවුරුදු දහය තිස්සේ කළ ඒවායේ ප්‍රතිඵල තමයි, අද මේ ආණ්ඩුව භුක්ති විඳින්නේ. අපි එදා වරාය ජනසතු නොකළා නම්, එදා පාසල් රජයට පවරා නොගත්තා නම්, එදා තෙල් ව්‍යාපාරය ජනසතු නොකළා නම්, එදා ටයර් පියුබ් නිපදවීමේ කම්හන්තශාලාව පටන් නොගත්තා නම්, එදා යකඩ කම්හන්තශාලාව පටන් නොගත්තා නම්, හාල් සේරුව කපලවත් අද මේ ආණ්ඩුවට ජීවත් වෙන්නට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරන්නේ නැහැ.

අද කම්කරු අසහන හුඟක් තිබෙනවා. අද මේ අවුල් සහගත පනත ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන්නේ ඒ අසහනයන්වලින් මේ රටේ ජනතාවගේ සිත් වෙනත් පැත්තකට යොමු කරවන්නට වෙන්ට ඕනෑ. එක අතකින් මේක ප්‍රෝඩාවක් වගෙයි. අනූනව අවුරුදු බදු වැනි නානාප්‍රකාර බදුවලින් මේ රටේ ගොවි ජනතාව මිරිකී සිටින මේ වකවානුවේදී නොයෙක් දෙනා ඉල්ලා සිටියේ බදුවලින් ගොවියා නිදහස් කර ඉඩම් සංවර්ධනය කර ගැනීම පහසු වන ආකාර යට මේ ඉඩම් සින්නක්කර ඔප්පු පිට ගොවීන්ට පවරා දෙන ලෙසයි. ගරු ඉඩම් ඇමතිතුමා ඇමති ධුරයට පත් වන්නට කලින් එතුමා 1952 දී පොළොන්නරුව ආසනය තරඟ කරන අවස්ථාවේ කිව්ව දේවල් මට තවම මතකයි. "මින්නේරියේ අක්කරයකට ශත 50 යි. පොළොන්නරුවේ රු. 10 ක් මොකද ? එහෙම නොවෙයි, මේ ඉඩම් සින්නක්කර ඔප්පු පිට පවරා දෙන්න ඕනෑ. මේ විධියේ අයුතුකම්වලට ඉඩ දෙන්න බැහැ. තමුන්නාන්සේලා මට ඡන්දය දෙනවා නම් මම තමුන්නාන්සේලාට මේ ඉඩම් සින්නක්කර ඔප්පු පිට ලබා දෙනවා" කියායි, එදා වර්තමාන ඉඩම් ඇමතිතුමා මේ සටනට බැස්සෙ. ලියකියවිලිවල පවා මේ විධියේ කරුණු ඇතුළත් කළා.

පසුගිය ආණ්ඩුව මොනවද කළේ කියා සමහරුන් අපෙන් අහනවා. එහෙත් පොළොන්නරු වැසියෙකු හැටියට මට ඇමතිතුමාගෙන් කෙළින්ම අහන්නට අයිතියක් තිබෙනවා, තමුන්නාන්සේ එදා සිට පොරොන්දු වුණු අන්දමට අපේ ඉඩම්වලට සින්නක්කර ඔප්පු ලබා දුන්නාද කියා. මමත් මේ පාර්ලිමේන්තුවට පත්ව ආව දවසෙ පටන් ඉඩම් ඇමතිතුමාගේ සෑම වැය ශීර්ෂයක් යටතෙම වගේ කථා කරද්දී ඉල්ලා සිටියා, මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

ඉඩම් සින්නක්කර ඔප්පු පිට ගොවීන්ට පවරා දෙන්න කියා. ඉඩම් සින්නක්කර ඔප්පු පිට පවරා දීම මේ පනතෙ සඳහන් කර තිබෙන්නෙ "වහෙන් ඔරෝ" කියන්න වගේ ඉතාම අවුල් සහගත විධියකටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වියළි ප්‍රදේශය ඉතා දුෂ්කර ප්‍රදේශයක්. කන්ද උඩරට පළාත්වල තිබුණු හොඳ ඉඩම් ටික අධිරාජ්‍යවාදී සුද්දන් විසින් මුඩුබිම් පනත යටතේ අල්ලා ගත්තා. අනික් හොඳ ඉඩම් ටික දේශීය ධනපතියන් අල්ලා ගත්තා. මේ රටේ ගොවීන්ට ඉතුරු වුණේ ගම්මැද තිබෙන කුඩා ඉඩම් ස්වල්පයක් පමණයි. දුෂ්කර ප්‍රදේශයක් වන වියළි ප්‍රදේශය අස්වද්දන්නට පටන් ගත්තේ දැනට අවුරුදු 35 කට විතර කලිනුයි. අලි, කොටි, වලසුන් වැනි සතුන් මැද, කොලරාව, මැලේරියාව වැනි භයානක රෝග තදින් පැවති ඒ ප්‍රදේශවලට ගොස් අද වන තුරු ගොවිතැන් කරන ඒ ගොවි ජනතාවගෙන් කිසිම බද්දක් අය නොකර ඒ ඉඩම් ඔවුන්ට සින්නක්කරව පවරා දෙන ලෙසයි, මම ඉඩම් ඇමතිතුමාගෙන් හා ආණ්ඩුවෙන් හැමදාම ඉල්ලා සිටින්නේ. මේ සටන ගැන අපි එදා සිටම කථා කර තිබෙනවා. එහෙත් කථාවට පමණක් මෙය සීමා කරන්නට පුළුවන්කමක් නැහැ. අවුරුදු තිස් ගණනකට පසු ඉඩම් සංවර්ධන ආඥපනත සංශෝධනය කරන මේ අවස්ථාවේදී මා විශේෂයෙන් බල කර ඉල්ලා සිටින්නේ, ඒ ඉඩම් ඒ දිස්ත්‍රික්කයේ ජනතාවට නොමිලයේම සින්නක්කර ඔප්පු පිට පවරා දෙන්න කියායි. ගොවියා බද්දෙන් නිදහස් නොකර රටේ සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යන්නේ කොහොමද? නැසීගිය ඩී. එස්. සේනානායක අගමැතිතුමා කෘෂිකර්ම ඇමති වශයෙන් සිටි කාලයේදී ඉඩම් එළිපෙහෙළි කර, නියරවල් දමා, වී වපුරා ගොයම් පැසෙන්නට පටන් ගත් විට තමයි, ගොවීන් ගෙන ගොස් පදිංචි කෙරෙව්වේ. ගොවීන්ට ඉස්සරවෙලාම කරන්නට තිබුණෙ ගොයම් ටික කපා ගැනීමයි.

අද පොළොන්නරු දිස්ත්‍රික්කයේ 1,15,000ක පමණ ජනගහනයක් සිටිනවා. අක්කර ලක්ෂයකට වඩා අස්වද්දී තිබෙනවා. ඔවුන් මේ ඉඩම් වගා කර ගත්තේ දහඩිය මහන්සියෙනුයි. ඔවුන්ට විශ්‍රාම වැටුප් ලැබෙන්නෙ නැහැ. ඒ මිනිසුන්ට නොයෙක් විධියේ පාරිතෝෂික දීමනා ලැබෙන්නෙ නැහැ. අද ඉතිරිව තිබෙන්නේ ඔවුන්ගේ ඇටකටු පමණයි. තව දුරටත් ඔවුන්ගෙන් බදු ඉල්ලමින් අවුරුදු දහය, පහළොහ, විස්ස, තිස්සේ රස්තියාදු කරවීම කෙසේවත් සාධාරණ නැති බව මා අවධාරණයෙන්ම කියනවා. ගොවීන් මගින් මේ රට සංවර්ධනය කිරීමට තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා. මේ රට සහලින් ස්වයම්පෝෂිත කරන්නට නම් ගොවියා බදු බරින් නිදහස් කරන්නට ඕනෑ. එහෙම නැතුව මේ කටයුත්ත කවදාවත් කරන්නට බැහැ.

ඇමතිතුමාගේ ඉඩම් තක්සේරුව මොන ආකාරයට සිදු වේදැයි මා දන්නේ නැහැ. තක්සේරු කිරීමේ සම්පූර්ණ බලය දිසාපතිතුමාට පවරා තිබෙනවා. ඔහු අක්කරය රුපියල් දාහකට තක්සේරු කරයිද; රුපියල් පන් දාහකට තක්සේරු කරයිද දන්නෙ නැහැ. මේ තක්සේරු කරන මුදල් ගෙවල අපේ දරු මුණුබුරන්ටවත් වේවායේ ප්‍රතිදානය නැත්නම් අයිතිය ලබා ගන්නට පුළුවන් වෙයිද? ඒ කාලය වන විට මේ මිනිසුන්ගේ ඇටකටුවත් ඉතුරු වෙයිද කියන්න බැහැ. දැන් තවත් ගසා කෑමක් පටන් ගන්නටයි යන්නේ. යම් යම් සමාගම් මගින් මාස්පතා මුදල් ගෙවීමේ ක්‍රමයට ඉඩම් වෙන්දේසි කරන ක්‍රම පත්‍රවල පළ වෙනවා. මේ ආණ්ඩුවටත් ඒ ක්‍රමය පුරුදු වෙලා වගෙයි. ඉඩම් වෙන්දේසිකාර ධනපතීන්ගේ මුදල්වලින් තාර වෙළීන් මේ ආණ්ඩුව කටයුතු කරනවා කියලයි මට හිතෙන්නේ. ඒ විධියේ ක්‍රමයක් තමයි මේ අනුගමනය කර තිබෙන්නේ. මේ රටේ ජාතික ධනයක් හැටියට තිබෙන, මේ රටේ ජනතාවට අයිතියක් ඇති මේ ඉඩම් මේ ජාතියටම උරුම වන්නට ඕනෑ. බදු ක්‍රමයකට හෝ වෙනත් සින්නක්කර ක්‍රමයකට විකුණන්නට—වෙන්දේසි ජාවාරමකට—මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට ඉඩ දෙනවා ඇත කියා මා හිතන්නේ නැහැ. අධිරාජ්‍යවාදී සුද්දන්ට මේ අය ඒ කාලයේදී අක්කරය සත 50 ට 60 ට ඉඩම් දුන්නා නම් මේවා රුපියල් සියයට හමාරට තක්සේරු කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට බැරි ඇයි? පොළොන්නරුව කච්චේරියේ දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදී ඉඩම් තක්සේරුවක් පසුගිය කාලයේ ඇති කළා. එහිදී අක්කර 8ක වටිනාකම රු. 12,000 කට තක්සේරු කළා. මා ඒ අවස්ථාවේදී එම තක්සේරුවට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. ඒ අවස්ථාවේදී මා කියා හිටියා ඒ තක්සේරුව සම්පූර්ණයෙන්ම වැරදිය, එය රුපියල් දාහට, දෙදාහට හෝ තුන් දාහට ගොවීන්ට දීමය සාධාරණ කියා. අද ඒවායේ වටිනාකමක් ඇතත් එදා ඒවායේ වටිනාකම තිබුණේ කොටි වලසුන්ටයි. එසේ තිබියදීත් ඒවාට ගොස් පදිංචි වූ මේ රටේ වීරෝදාර සිංහල පුත්‍රයන් නිසා තමයි අද ඒවා සරු සාර වී නැවේඃ්ද් කටට එමින් තිබුණු රටකට කැඳවත් දෙන්නට පුළුවන් වී තිබෙන්නේ. දැන් ආඩම්බරයෙන් කථා කරන්නේ ඒ අය ඒ අන්දමට දුක් විඳගෙන කටයුතු කළ නිසයි. ඒ ජනතාව ගරු ඉඩම් ඇමතිතුමා කෙරෙහි තබා තිබුණු බලාපොරොත්තු අලියකු ගිල්ල දිවුල් ගෙඩියක් සේ හිස් එකක් බවට පත් වී තිබෙනවා. ඒ නිසා අපට මේ පනත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂෂප කරන්නටයි සිදු වී තිබෙන්නේ.

**එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1968 දෙසැම්බර් 6 වන සිකුරාදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 4.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது. 1968 டிசம்பர் 6 ஆம் தேதி வெள்ளிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.*

*It being 4.30 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Friday, 6th December 1968.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී :**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු සී. පී. ද සිල්වා]

*" சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக " [கௌரவ சி. பி. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.*

*Motion made, and Question proposed,*

"That the House do now adjourn".—[*The Hon. C. P. de Silva*].

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Mr. Deputy Speaker, I have given notice to the Hon. Prime Minister about this matter which I am now raising.

This morning's "Daily News" carries the following announcement from the Superintendent of Police, Colombo.

> "Mr. J. Van Sanden, SP Colombo Division, said yesterday that no picketing or any demonstrations will be allowed during the period of the strike unless special permission is obtained. No rallies and processions will also be permitted."

Now, Sir, the Hon. Prime Minister has met the unions concerned and has had a number of discussions with them. Apprently the unions are not satisfied. I do not know what the present position is. But if the strike does take place I would like the Prime Minister to consider the desirability of permitting the trade unions to exercise their democratic right of peaceful picketing, because I do hope that this will be a peaceful strike.

The Hon. Prime Minister will agree with me that if there is a strike it will be a purely economic strike. The unions themselves are concerned about it and I think nobody seriously maintains that there is any political background to this proposed strike. I would like the Prime Minister to treat the matter on that basis and to see that the normal right that any striker has of peaceful picketing at his work- place will not be interfered with.

I have no objection to the normal laws of the land being enforced. I think nobody will seriously object to that. In other words, a demonstration cannot take place without prior permission from the police. That is a requirement of the law and I do not think anybody will seriously object to that. But I do want the Prime Minister to see that full freedom is granted to the workers to carry out

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

their normal legitimate activities. I do not know whether the Hon. Minister of State is objecting to this or whether he is seriously contemplating anything else.

All that I say is this; at the present moment certain unions are concerned about the matter and are likely to strike on the 28th. There are a large number of unions that are not going to join in this strike; but any undemocratic act on the part of the police can very well bring out a large number of other unions that are at present not likely to participate in the strike, if they feel that the normal rights of trade unions are being infringed upon.

I sincerely hope that it will be possible for you to come to a settlement on this question. I also sincerely hope that everything will be done to see that the strike is maintained on a peaceful plane.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Mr. Deputy Speaker, as the hon. Member for Yatiyantota is well aware, I have made every endeavour to see whether a solution can be arrived at. My position was that I am not totally rejecting the demands of the trade unions. Those demands, if granted, would entail an added expenditure of Rs. 220-odd million per annum in respect of extra salaries for central government public servants and local government employees only. Undoubtedly the demands of corporation employees will come in later. So Rs. 220 million is not a sum in respect of which a decision can be taken in a hurry in this manner.

In fact, since this Government came into office we have already granted a special allowance in the 1967 Budget and a devaluation allowance later in the same year, adding up to an extra expenditure of Rs. 150 million. Also, I had appointed the hon. Parliamentary Secretary to the Minister of Finance to give special attention to the difficulties of trade unions and their requests for various concessions; he has devoted a great part of his time to that work and already concessions have been given to the extent of Rs. 50 million.

Then, with regard to the Anomalies Commission, we are not waiting till the Anomalies Commission finalize their deliberations. As they finish dealing with each department, each department will implement their recommendations. That will involve the expenditure of another Rs. 25 million. So, within the period of this Government we have already made concessions costing well over Rs. 200 million to government servants and local government servants.

We have just passed the Budget. We have not had two months of the operation of that Budget, and the Government is called upon, as I said, during our term of office, to meet an extra expenditure of over Rs. 200 million resulting from the concessions we have granted.

The Public Service is an important sector, no doubt, of the community, but they comprise only 300,000 persons. This country consists of almost 12 million people. Before we think of acceding to a request of this nature a thorough examination of the whole position is necessary. The trade union representatives had their doubts as to whether the report of the Salaries Commission, which has been appointed and has started functioning already, would be available in time. I sent for the Salaries Commission and told them that I want an interim report and certain salary adjustments to be made within

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

six months so that it may be possible to incorporate any measures decided upon by the Government in the next Budget. There is no need to wait till we have the final report of the Salaries Commission. The Minister of Finance can then take into account the demands of all the sectors of the community without merely taking an *ad hoc* step involving an extra expenditure of Rs. 200-odd million benefiting only 300,000 people out of a total population of nearly 12 million in this country.

The trade union representatives were not willing to wait. I might say, some of them had no confidence in a salaries commission: they said that reports of salaries commissions are not implemented. I can think of only one salaries commission report that was not implemented, and that is the Wilmot Perera Salaries Commission Report, which the hon. Member for Yatiyantota as Finance Minister had the opportunity of implementing but did not implement, probably for very good reasons.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
You did not give me a chance.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
But you presented one Budget. And the Wilmot Perera Salaries Commission Report, if implemented at the proper time, would have meant Rs. 60 million extra.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
I had no chance.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
But you could have implemented it in your Budget.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
Does not follow.

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
You thought it was not possible.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
What about the "Twenty-one Demands"?

ගරු ඩඩ්ලි සේනානායක
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
We will not consider that as we are now dealing with the Salaries Commission.

I have already stated that we have given, since this Government came into office, over Rs. 200 million. In the circumstances I could give no other reply to the representatives of the trade unions, and that is the reply I gave.

So as far as the Government is concerned, just as there are the rights of the strikers, or those who do not want to work, there are also the rights of those who want to work, and it is the duty of the Government to see that the rights of both sections are ensured.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
Agreed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

So the Government will act in such a way that the rights of those who want to work will be ensured and the community at large is not unduly embarrassed because of the decision of these people to go on strike. I can give that assurance to the hon. Member. That is all I wish to say on the question raised by him.

කල් තැබීම

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 4.40 ට, 1968 දෙසැම්බර් 6 වැනි සිකුරාදා අ. භා. 2 තෙක් කල් ගියේය.

அதன்படி சபை, பி.ப. 4.40 மணிக்கு, 6, வெள்ளிக்கிழமை பி. ப. 2 1968 டிசம்பர் மணிவரை ஒத்திவைக்கப் பெற்றது.

*Adjourned accordingly at 4.40 P.M. until 2 P.M. on Friday, 6th December 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### පේෂකර්ම මධ්‍යස්ථාන

### நெசவு நிலையங்கள்

### TEXTILE CENTRES

288/68

**හේමචන්ද්‍ර සිරිසේන මයා.** (අකුරණ පළමුවන මන්ත්‍රී)

*(திரு. ஹேமச்சிந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*

(Mr. Hemachandra Sirisena—First Akurana)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද පේෂකර්ම මධ්‍යස්ථාන කොපමණ සංඛ්‍යාවක් දිවයින තුළ තිබේද? (ආ) මේවායින් අත්යන්ත්‍ර හා බලවේග මධ්‍යස්ථානයන් වෙන් වෙන් වශයෙන් කවරේද? (ඉ) ලියාපදිංචි කර ඇති මධ්‍යස්ථාන අතුරින්, රජයේ, ග්‍රාම සංවර්ධන සමිති වැනි පොදු ආයතන හා පෞද්ගලිකව පවත්වාගෙන යනු ලබන ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද? (ඊ) ප්‍රස්තුත ඒක් එක් මධ්‍යස්ථානය වෙනුවෙන් වාර්ෂිකව ලබාදෙන විදේශ විනිමය ප්‍රමාණයන් හා එකී විනිමය යොදවනුයේ කුමන නූල් වර්ග ආනයනය කිරීමටද යන වගත්, එම නූල් වර්ග ආනයනය කරනුයේ කුමන රටවලින්ද යන වගත් එතුමා සඳහන් කරනවාද? (උ) මෙම ලියාපදිංචි වී ඇති මධ්‍යස්ථාන වෙත ජාතික පේෂකර්ම ආයතනයෙන් නූල් ලබා ගැනීමට නිකුත් කර ඇති බලපත්‍රවල වටිනාකම අනු පිළිවෙලින් හා බලපත්‍රධාරීන් වෙත ලැබෙන නූල් වර්ග, ප්‍රමාණයන් අනුව වෙන් වෙන් වශයෙන් මෙම සභාවට එතුමා ඉදිරිපත් කරනවාද?

உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) கிராமாபிவிருத்தி, குடிசைக் கைத்தொழில் திணைக்களத்தில் பதிவுசெய்யப்பட்ட எத்தனை நெசவு நிலையங்கள் இத்தீவில் உண்டு? (ஆ) இவற்றில் கைத்தறி நெசவு நிலையங்களையும், மின்விசை நெசவு நிலையங்களையும் வெவ்வேறாகத் தருவாரா? (இ) பதிவு செய்யப்பட்ட நிலையங்களில், அரசாங்க நிலையங்களையும், கிராமாபிவிருத்திச் சங்க நிலையங்களையும், தனியார் துறை நிலையங்களையும் வெவ்வேறாகத் தருவாரா? (ஈ) மேற்கூறிய ஒவ்வொரு நெசவு நிலையத்தின் சார்பாக வருடாவருடம் பெறப்படும் வெளிநாட்டுச் செலாவணியையும், அச்செலாவணி எவ்வித நூல்வகையை இறக்குமதி செய்ய உபயோகிக்கப்பட்டதென்பதையும், அந்நூல்வகை எந்நாடுகளிலிருந்து வரவழைக்கப்பட்டதென்பதையும் அவர் குறிப்பிடுவாரா? (உ) பதிவு செய்யப்பட்ட நிலையங்களுக்கு தேசிய நெசவு நிறுவனத்திலிருந்து நூல் பெறுவதற்காக வழங்கப்பட்டிருக்கும் அனுமதிப்பத்திரங்களின் பெறுமதியை வரிசைக்கிரமமாகவும், பத்திரம் பெற்றவர்களுக்குக் கிடைக்கும் நூல்வகை, அளவு என்பவற்றை வெவ்வேறாகவும் அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

asked the Minister of Home Affairs: (*a*) What is the total number of textile centres in the Island which have been registered with the Department of Rural Development and Small Industries? (*b*) Will he specify which of these are handloom centres and which are powerloom centres? (*c*) Will he state which of these registered textile centres are maintained by the Government, which are maintained by public associations like rural development societies and also which of them are privately owned? (*d*) Will he state the amount of foreign exchange

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

allocated in respect of each of the said textile centres, the type of yarn imported by each centre with the foreign exchange allocated to it, and also the country from which such yarn is imported? (e) Will he state in order the value of the permit issued to each textile centre for obtaining yarn from the National Textile Corporation, the type of yarn issued and the quality of yarn issued to each permit-holder?

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**

(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

(අ) 5,259 කි. (ආ) අත්යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන 5,288 යි. බලවේග පේෂකර්ම මධ්‍යස්ථාන 31 යි. රජයේ මධ්‍යස්ථාන 541 යි. වියන්නන්ගේ සමුපකාර සමිති මඟින් පවත්වාගෙන යනු ලබන ආයතන 1,008 යි. පුද්ගලික ආයතන 3,710 යි. (ඊ) වියන්නන්ගේ සමුපකාර සමිතිවලට සහ පේෂකර්ම සමිති සංගම්වලට 1968 වර්ෂය සඳහා දී ඇති විදේශ විනිමය ප්‍රමාණය රු. 13,29,785.60 වන අතර, පුද්ගලික ආයතන වලට දී ඇති මුදල රු. 3,80,540.00 කි. මෙම විනිමය යොදවා ඇත්තේ රේයොන් හා කෘත්‍රිම නූල් වර්ගද, සායම්, රසායන වර්ග හා යන්ත්‍ර උපකරණ අමතර කොටස් ආදියද ආනයනය කිරීම සඳහාය. ඉහතකී ද්‍රව්‍ය ආනයනය කරනු ලබන්නේ, ජපානය, එංගලන්තය, ඉතාලිය, ප්‍රංශය, චෙකොස්ලෝවකියාව, ඕලන්දය, හා ජර්මනිය ආදී රටවලිනි. (උ) මෙම විස්තරය ජාතික පේෂකර්ම සංස්ථාවෙන් ලබාගත යුතුය.

(அ) 5259. (ஆ) கைத்தறி நெசவு நிலையங்கள், 5228; மின்சக்தி நெசவு நிலையங்கள், 31. (இ) அரசாங்க நிலையங்கள் 541; நெசவாளர் கூட்டுறவுச் சங்கங்களினால், நடாத்தப்படும் நிலையங்கள் 1008; தனிப்பட்ட நிலையங்கள் 3710. (ஈ) நெசவாளர் கூட்டுறவுச் சங்கங்கள் ஆகியவற்றின் நிலையங்களுக்கும் நெசவாளர் சங்கங்களின் சமாஜங்களுக்கும் 1968 ஆம் ஆண்டிற்கு வழங்கப்பட்ட வெளிநாட்டுச் செலாவணி ரூபா 13,29,785.60 ஆகும். தனிப்பட்ட நெசவு நிலையங்களுக்கு வழங்கப்பட்ட வெளிநாட்டுச் செலாவணி ரூ. 3,80,540 ஆகும். இச் செலாவணி றேயோன், செயற்கைப்பட்டு நூல் வர்க்கங்கள், சாயம், இரசாயன திரவியங்கள், யந்திர உதிரிப் பாகங்கள் ஆகியன இறக்குமதி செய்வதற்காக வழங்கப்பட்டது. மேற்கூறப்பட்டவைகள் ஜப்பான், இங்கிலாந்து, இத்தாலி, பிரான்ஸ், செக்கோஸ்லோவேகியா, ஒல்லாந்து, ஜேர்மனி ஆகிய நாடுகளிலிருந்து இறக்குமதி செய்யப்பட்டன. (உ) இந்த விபரங்களை தேசிய ஜவுளிக் கூட்டுத் தாபனத்தில் பெறல் வேண்டும்.

(a) 5,259. (b) Handloom textile units 5,228. Powerloom textile workshops 31. (c) Departmental units 541. Units run as registered co-operative textile societies 1,008. Private textile workshops 3,710. (d) Foreign exchange released for the year 1968 to weavers co-operative societies and textile unions is Rs. 1,329,785.60. Foreign exchange released for the year 1968 to private textile workshops amounted to Rs. 380,540 for the import of rayon and synthetic yarn including dyes, chemicals and textile accessories. Abovementioned imports of rayon and synthetic yarn are from Japan, England, Italy, France, Czechoslovakia, Holland and Germany. (e) The particulars required should be obtained from the National Textile Corporation.

## නුවරඑළිය මහ නගර සභාව : ජල බද්ද

நுவரெலியா மாநகரசபை : நீர்க்கட்டணம்.

NUWARA ELIYA MUNICIPALITY : WATER TAX

408/68

**ඩොනල්ඩ් ජේ. රණවීර මයා.** (නුවර එළිය)

(திரு. டொனல்ட் ஜே. ரணவீர—நுவரெலியா)

(Mr. Donald J. Ranaweera—Nurawa Eliya)

පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නුවර එළිය මහ නගර සභාව විසින් 1938.10.7 වන දින සිට එයට අයත් පාරිභෝගිකයින් ගෙන් ජල සේවා සඳහා මාපක මීටර් අනුව අය කළ ගාස්තු නීත්‍යානුකූල නොවන බව 1968 ජූලි මස 1 වන දින නිකුත් කරන ලද ඔඩිටර් ජනරාල්වරයාගේ වාර්තාවේ සඳහන් වින බව එතුමා දන්නේද? (ආ) පාරි භෝගිකයින් විසින් ගෙවන ලද මුදල් ආ පසු දීමටත් නැවත එලෙස මුදල් අය කිරීම වැළැක්වීමටත් එතුමා ගන්නා පියවර කවරේද? (ඉ) එම පියවර ක්‍රියාත්මක වන්නේ කවදා සිටද? (ඊ) නුවරඑළිය නගර සීමාවේ බදු ගෙවන්නන්ට මේ බව දැනුම් දෙන්නේ කෙසේද?

*உள்ளூராட்சி அமைச்சரும், தகவல் ஒலி பரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசியுமானவரைக் கேட்ட வினா: (அ) நுவ ரெலியா மாநகரசபையினர், அச்சபையின் நிர்வாகத்துக்குட்பட்ட நுகர்வாளர்களிட மிருந்து, நீர் வழங்க நீர்மானி அளவின் பிர காரம் 7.10.1938 ஆந் தேதி முதல் நீர்க்கட் டணம் அறவிட்டதானது சட்டவிரோதமாகு மென 1968 ஆம் ஆண்டு ஜூலை மாதம் 1 ஆந் தேதியன்று வெளியிடப்பட்ட கணக்குப் பரி சோதகர் மாஅதிகாரியின் அறிக்கையில் குறிப் பிடப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா? (ஆ) நுகர்வாளர்கள் செலுத்தியுள்ள பணத் தைத் திருப்பிக் கொடுப்பதற்கும் மீண்டும் இவ்வித கட்டணத்தை அறவிடுதலைத் தடுப் பதற்கும் அவர் எடுக்கவிருக்கும் நடவடிக்கை யாது? (இ) அந்நடவடிக்கை எப்பொழு திருந்து அமுலுக்குவரும்? (ஈ) நுவரெலியா மாநகரசபை எல்லைக்குட்பட்ட வரியிறுப் பாளர்களுக்கு இவ் விடயம் எவ்விதமாகத் தெரிவிக்கப்படும்?*

asked the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that the Auditor-General in his report of 1st July 1968 has stated that the charge levied by the Municipality of Nuwara Eliya on the water-meter with effect from 7.10.38 from its consumers for water service is illegal? (*b*) What action will he take to refund these moneys to the consumers concerned and to prevent this charge from being made in the future? (*c*) With effect from what date will his action be effective? (*d*) How does he propose to inform the ratepapers of the Nuwara Eliya Municipality about the action taken by him and its effective date?

**ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති ගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information & Broadcasting)

(අ) ඔව්. (ආ) මාපකගත ජලය සැපයීම සඳහා අයකරනු ලබන ගාස්තු දැනට පවත්නා අතුරු ව්‍යවස්ථා යටතේ වලංගු වන සභා සම්මත යෝජනාවක් මගින් නියම කර නැතැයිද, එබැවින් එය නෛතික වශයෙන් යුක්ති සහගත නැතැයි ද, 1966 වර්ෂය සඳහා වූ ඔඩිටර් ජනරාල් වරයාගේ වාර්ෂික වාර්තාවෙන් පෙන්නුම් කර ඇත. එනමුත්, 1968 නොවැම්බර් 21 දින දරණ ඔඩිටර් ජනරාල් වරයාගේ ලිපි යෙන්, 1952 දීත් මෙම කරුණම මතුකරන ලද අතර, 1956.6.29 දින දරණ සභා සම්මත යෝජනාවකින් ගාස්තු ක්‍රමය විධිමත් කරන ලදැයි ඔහු වාර්තා කර ඇත. (ඉ) පැන නොනගියි. (ඊ) පැන නොනගියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ප්‍රේමදාස]

*(அ) ஆம். (ஆ) கணக்குப் பரிசோதகர் மா அதிகாரி தமது 1966 ஆம் ஆண்டு வருடாந்த அறிக்கையில் தற்போதுள்ள உப விதிகளின் படி சபையானது ஒரு தகுதியான தீர்மானத்தின்மூலம், நீர்மானி உதவியைக்கொண்டு நீர் வழங்குவதற்கு அறவிடும் கட்டணம் நிர்ணயிக்கப்படவில்லை என்றும், எனவே அக்கட்டணம் சட்ட விதிகளுக்கு அமைவாகவில்லையென்றும் குறிப்பிட்டுள்ளார். ஆயினும் அவர் தமது 1968 நவம்பர் 21 ஆம் தேதிய கடித மூலம் இப்பிரச்சினை கணக்குப் பரிசோதனைத் திணைக்களத்தினால் 1952 ஆம் ஆண்டு எழுப்பப்பட்டதெனவும், ஆனால் 56.6.29 ஆம் தேதிய ஒரு தீர்மானத்தினால் இக்கட்டணங்கள் சபையினால் ஒழுங்குபடுத்தப்பட்டதெனவும் அறிவித்துள்ளார். (இ) இக்கேள்வி எழாது. (ஈ) இக்கேள்வி எழாது.*

(*a*) Yes. (*b*) The Auditor-General in his Annual Report for 1966 pointed out that the rates charged for supply of water through meters has not been fixed by a valid resolution of the council under the existing by-laws, and therefore was not legally justified. He has, however, reported by his letter of 21st November 1968 that the Audit has raised the same issue in 1952 and the charges have been regularised by a resolution of the council on 29.6.56. (*c*) Does not arise. (*d*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3051

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த.பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1)செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P.O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org